316 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 316 - இல. 6
Volume 316 - No. 6

2025 ජනවාරි 22වන බදාදා
2025 சனவரி 22, புதன்கிழமை
Wednesday, 22nd January, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ වාර්ෂික මහා සභා රැස්වීම [තීරුව 821]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 822]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 823-877]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
රුසියාවේ රැකියා සඳහා විදේශගත වූ තරුණයන් මුහුණ දෙන ගැටලු [තීරුව 877]

**වරප්‍රසාද:**
ලංකා විදුලිබල මණ්ඩලය පිළිබඳ සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම[තීරුව 879]

**කල් තැබීමේ යෝජනාව:**
ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන [තීරු 883 - 996]

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம் (இலங்கைக் கிளை), அனைத்துப் பாராளுமன்ற ஒன்றியம் (இலங்கைக் குழு) மற்றும் “சார்க்” பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் (இலங்கைக் கிளை) என்பவற்றினது இணைந்த வருடாந்த பொதுக் கூட்டம் [ப: 821]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 822]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 823-877]

**தனி அறிவித்தல் மூல வினா:**
ரஷ்யாவுக்கு வேலைவாய்ப்புக்குச் சென்ற இளைஞர்கள் முகங்கொடுக்கும் பிரச்சினைகள் [ப: 877]

**சிறப்புரிமை:**
இலங்கை மின்சார சபை பற்றிய தவறான தகவல்களை முன்வைத்தல் [ப: 879]

**ஒத்திவைப்புப் பிரேரணை:**
கிளீன் ஸ்ரீ லங்கா வேலைத்திட்டம் [ப: 883– 996]

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Joint Annual General Meeting of Commonwealth Parliamentary Association (Sri Lanka Branch), Inter- Parliamentary Union (Sri Lanka Group) and SAARC Parliamentarians' Association (Sri Lanka Branch) [Col. 821]

AUDITOR-GENERAL'S REPORT [Col. 822]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 823-877]

QUESTION BY PRIVATE NOTICE:
Issues Faced by Youth Migrated to Russia Seeking Employment [Col. 877]

PRIVILEGE:
Presentation of Inaccurate Facts about Ceylon Electricity Board [Col. 879]

ADJOURNMENT MOTION:
Clean Sri Lanka Programme [Cols. 883– 996]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ජනවාරි 22වන බදාදා***
*2025 சனவரி 22, புதன்கிழமை*
*Wednesday, 22nd January, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ වාර්ෂික මහා සභා රැස්වීම
### பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம் (இலங்கைக் கிளை), அனைத்துப் பாராளுமன்ற ஒன்றியம் (இலங்கைக் குழு) மற்றும் "சார்க்" பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் (இலங்கைக் கிளை) என்பவற்றினது இணைந்த வருடாந்த பொதுக் கூட்டம்
### JOINT ANNUAL GENERAL MEETING OF COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION (SRI LANKA BRANCH), INTER-PARLIAMENTARY UNION (SRI LANKA GROUP) AND SAARC PARLIAMENTARIANS' ASSOCIATION (SRI LANKA BRANCH)

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 ජනවාරි 22, එනම් අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම අවසන් වීමෙන් පසුව පාර්ලිමේන්තුවේ අංක 1 දරන කාරක සභා කාමරයේ දී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගි වන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXI හා XXXII සහ නවවැනි කාණ්ඩයේ XVIII කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayathissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයේ වනඅලි රැඳවුම් මධ්‍යස්ථාන ව්‍යාපෘතිය: විස්තර
### லுணுகம்வெஹெர தேசிய பூங்காவில் காட்டு யானைகள் தடுப்பு நிலைய கருத்திட்டம்: விபரம்
### WILD ELEPHANT DETENTION CENTRE PROJECT AT LUNUGAMWEHERA NATIONAL PARK: DETAILS

5/2024

**1.** ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය තුළ වනඅලි රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා මේ වනතෙක් වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ලද මූලාශ්‍ර කවරේද;

(iv) මේ වන විට එම ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බවට චෝදනා එල්ල වී ඇති බව දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) லுணுகம்வெஹெர தேசிய பூங்காவில் காட்டு யானைகள் தடுப்பு நிலையமொன்றை அமைப்பதற்கான கருத்திட்டமொன்று நடைமுறைப்படுத்தப்பட்டது என்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) இதுவரை அக்கருத்திட்டத்துக்காகச் செலவிடப் பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) அக்கருத்திட்டத்துக்கான நிதியளிப்பு எம்மூலங் களிலிருந்து பெறப்பட்டது என்பதையும்;

(iv) இன்றளவில் அக்கருத்திட்டம் வெற்றியளிக்க வில்லை என்ற குற்றச்சாட்டு முன்வைக்கப் பட்டுள்ளது என்பதை அவர் அறிவாரா என்பதையும்;

(v) ஆமெனில், அது தொடர்பாக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether he is aware that a project for the construction of a wild elephant detention centre was implemented in the Lunugamwehera National Park;

(ii) the amount of money that has been spent for the aforesaid project so far;

(iii) the sources from which funds were obtained for the said project;

(iv) whether he is aware that the aforesaid project is alleged to have failed by now; and

(v) if so, the steps that will be taken regarding it?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) රුපියල් මිලියන 431.8කි.

| අනු අංකය | කාරණය | මුදල (රුපියල්) |
|---|---|---|
| 01 | වැව් 20ක් ඉදිකිරීම සඳහා වියදම | 143,939,710.11 |
| 02 | ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ අලි රැඳවුම් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර මාර්ග (40 km) වියදම | 23,324,724.00 |
| 03 | අභ්‍යන්තර මාර්ගයන්හි සපත්තු පාලම් ඉදිකිරීම සඳහා වියදම | 17,709,849.90 |
| 04 | අලි රැඳවුම් මධ්‍යස්ථානයේ සේවා මාර්ග (30 km) ඉදිකිරීමේ වියදම | 17,709,849.90 |
| 05 | සේවා මාර්ගයේ සපත්තු පාලම් ඉදිකිරීමේ වියදම | 55,010,955.33 |
| 06 | මාර්ග දෙපස හෙක්ටෙයාර 400ක යටි කැලය හා ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමේ වියදම | 21,680,506.00 |
| 07 | අලි රැඳවුම් මධ්‍යස්ථානය වටා අගලක් ඉදිකිරීමේ වියදම | 136,700,573.21 |
| 08 | දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉවත් කරන ලද රේල්පීලි කැබලි 4,333ක් දුම්රිය මඟින් ප්‍රවාහනය කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් මුදල | 15,815,699.40 |
| | **මුළු එකතුව** | **431,891,867.85** |

(iii) ලෝක බැංකුවේ මූල්‍ය පහසුකම් යටතේ ක්‍රියාත්මක කළ පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් සහ වන සත්ව සංරක්ෂණ අරමුදලින්.

ලෝක බැංකුවෙන් රුපියල් මිලියන 279.3ක් සහ වන සත්ව සංරක්ෂණ අරමුදලින් රුපියල් මිලියන 152.5ක් වෙන් කරලා තිබෙනවා.

(iv) චෝදනා එල්ල වී ඇති බව දනී.

(v) ඔව්.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් මූලික කරුණු සොයා බැලීමක් කර, ඒ මඟින් අනාවරණය වන තොරතුරු අනුව ඉදිරි පියවර ගැනේ.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා පිළිතුරු ලබා දුන් ප්‍රශ්නය මීට පෙර කිහිප වතාවක් අසා තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්නයට ඒ හැම අවස්ථාවකදීම පිළිතුරක් ලැබුණේ නැහැ. එම නිසා මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ හදන්න යෝජිත මේ ව්‍යාපෘතිය අවශ්‍ය ව්‍යාපෘතියක්. නමුත් ඒක සිදු කරපු විධිය පිළිබඳව, ඒ වෙනුවෙන් ආණ්ඩුවත්, එවකට සිටි බලධාරිනුත් කටයුතු කරපු විධිය පිළිබඳව විශාල චෝදනාවක් තිබෙනවා. මම වත්මන් ගරු ඇමතිතුමාගෙන් මේ කාරණයත් දැනගන්න කැමැතියි. ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණු විධියට මේ අවශ්‍යතාව ඉටු කරන එක පැත්තකින් තියලා, තමන්ගේ අවශ්‍යතා ඉටු කර ගන්න යෑම තමයි මෙතැන සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි මෙවැනි ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනතාවගෙන් බොහෝ චෝදනා එල්ල වී තිබෙන්නේ. විශේෂයෙන්ම මේ රටේ අලි ගහනය ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. මම නියෝජනය කරන කොලොන්න මැතිවරණ කොට්ඨාසය, නැත්නම් රත්නපුර, උඩවලව ප්‍රදේශයේත් මෙවැනි මධ්‍යස්ථානයක් තිබෙනවා. හැබැයි, ඒකේ මූලික අවශ්‍යතා ටිකවත් ඉටු කරන්න සමහර අවස්ථාවලදී රජය අපොහොසත් වෙලා තිබෙනවා.

සංචාරක ආකර්ෂණය තිබෙන ප්‍රදේශවලට ඒවා ඉතා වැදගත්. ඒ වුණාට රජය විසින් ලබා දිය යුතු මූලික සම්පත් නොලැබීම නිසා ඒවා අකාර්යක්ෂමවයි පවත්වාගෙන යන්නේ.

ගරු ඇමතිතුමනි, සමස්ත ක්‍රියාවලිය තුළ මේ රටේ අලි, ඇතුන් ආරක්ෂා කිරීම සඳහා පසුගිය කාලයේ රජයන් ගත්ත ක්‍රියාමාර්ග පිළිබඳව අපට සතුටු වෙන්න බැහැ. ඔබතුමා මේ කෙටි කාලය තුළ ඒ වෙනුවෙන් කිසියම් වූ අදහසක් හඳුනාගෙන තිබෙනවාද, එතැනින් එහාට අරගෙන යන්න මොනවා හරි වැඩසටහනක් තිබෙනවාද, නැත්නම් පරණ නිලධාරින්, පරණ යෝජනා මේ විධියට ක්‍රියාත්මක වන මාර්ගයේම ඔබතුමාත් ගමන් කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම වනඅලි සහ මිනිසුන් අතර තිබෙන සමතුලිතතාව බිඳී යෑම සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩු විසින් සැලකිය යුතු පමණින් අරගෙන ගිය වැරදි ප්‍රතිපත්ති විසින් ඒ තත්ත්වය උග්‍ර කරලා තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් මේ මොහොතේ අධ්‍යයනයක් කරමින් ඉන්නවා. ඒ පසුගිය වැරදි අපිට යළි කරන්න බැහැ. මිනිසුන්, අලි, සංරක්ෂණය කළ යුතු අලි විශාල වශයෙන් අනතුරට මුහුණපාලා ඉන්නවා. ඒ නිසා අමාත්‍යාංශය හැටියට අපි මේ දිනවල මේ ක්ෂේත්‍රයේ විද්වතුන් මුණ ගැහෙමින් ඒ අදාළ තොරතුරු සොයා බලමින් අධ්‍යයනයක නිරත වෙලා ඉන්නවා. වනඅලි සංරක්ෂණය සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහාත්, මිනිසුන් සහ වනඅලි අතර තිබෙන සමතුලිතතාව බිඳී යෑම සම්බන්ධයෙන් මැදිහත්වීමටත් ඉක්මන් ක්‍රියාමාර්ග ගන්න අපි තීරණය කර තිබෙනවා.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මාධ්‍ය තුළින් සහ ජනතාවගේ ඉල්ලීම් අනුව අපි දකිනවා, මේ වනඅලි ගැටලුව පිළිබඳව විවිධ ප්‍රදේශවලින් විශාල වශයෙන් වාර්තා වන බව. පසුගිය දවස්වල මම දැක්කා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව පාරට බැහැලා උද්ඝෝෂණ කළ සිද්ධියක්. රජයන් පත් වුණාම මේ වෙනුවෙන් හැමදාම ගත්ත පියවර තමයි, අදාළ අමාත්‍යවරයා විසින් තාවකාලික පියවරක් අනුගමනය කිරීම. මට මතකයි, අම්පාර දිස්ත්‍රික්කයෙන් පත් වෙච්ච රාජ්‍ය ඇමතිවරයෙක් ඒකට පියවරක් වශයෙන් අගල් කපන්න පටන් ගත්ත බව. අන්තිමේදී කළේ අගල් ටිකක් කපන්න කියලා තමන්ගේ දේශපාලන හෙංචයියෝ ටිකකට රුපියල් බිලියන ගණනක මුදලක් විනාශ කර දැමීමයි. ඒ නිසා ඒක හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. මේ රජයටත් දැන් යම් කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත්, ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු ගන්න මේ කාලය ප්‍රමාණවත්. අලි ආරක්ෂා කිරීම, අලි ගම්වදින එක නතර කිරීම සහ ඒ වෙනුවෙන් නිලධාරින්ගේ මැදිහත්වීම ප්‍රමාණවත්ද කියන කාරණා පිළිබඳව හොයා බැලීම සඳහා මේ කාලය

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

ප්‍රමාණවත්. මේ පිළිබඳව ප්‍රතිපත්තිමය වශයෙන් ස්ථිර විසඳුමක් හොයන්න කාලයක් නොයෙදෙන්න පුළුවන්. නමුත් අපට මාධ්‍ය තුළින් ජේනවා, එන්න එන්නම ජනතාවගේ පීඩාව වැඩි බව. මම පසුගිය දිනවල මාධ්‍ය තුළින් දැකපු අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඒ සිදුවීම ගත්තොත්, ඒකට රජයෙන් කිසිම මැදිහත්වීමක් වෙනවා නම් අපි දැක්කේ නැහැ. මේ ගැටලුව නිසා ජනතාවගේ ජීවිත විනාශ වෙනවා. ඒ වාගේම අලින් විනාශ වෙනවා. ඒ නිසා මේ දෙපාර්ශ්වය පිළිබඳව හිතා බලා කටයුතු කරන්න ඔබතුමන්ලා ළඟ යම් වැඩසටහනක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, මෙය, ඔබතුමාත් හිටපු ආණ්ඩුව විසින් උග්‍ර කරපු ප්‍රශ්නයක්. ඒ, ඔබතුමන්ලාත් නියෝජනය කරපු ආණ්ඩු; පසුගිය ආණ්ඩු. *[බාධා කිරීමක්]*

ඔව්. දැනට විපක්ෂයේ ඉන්න, අවුරුදු 76ක් පුරා මේ රට පාලනය කළ පාලකයන් මේ ප්‍රශ්නය උග්‍ර කරන්න කටයුතු කර තිබෙනවා. දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා, ඒ වැරදි නොකර, එවැනි වැරදි යළිත් සිදු නොවන විධියට එක පැත්තකින් වනඅලිත්, අනෙක් පැත්තෙන් මිනිසුන්ගේ ජීවිතත් ආරක්ෂා කර ගන්න. ඒ නිසා මේ ආණ්ඩුවට ඒ සඳහා විද්‍යාත්මක විසඳුමක් සොයන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒ සම්බන්ධයෙන් කෙටිකාලීන සහ දීර්ඝකාලීන විසඳුම් අපට සොයන්න සිදු වෙලා තිබෙනවා.

මේ ආණ්ඩුව පත් වෙලා තවම ගත වෙලා තිබෙන්නේ මාස දෙකක් වාගේ කෙටි කාලයක්. අපි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් හොඳ අධ්‍යයනයක් කරමින් ඉන්නේ. ඔබතුමා භය වෙන්න එපා. අපි ඉක්මනින් මේ සඳහා ස්ථිරසාර විසඳුමක් ලබා දෙනවා. ඒ වාගේම අපි දැනටමත් මේ ප්‍රශ්නය තිබෙන ප්‍රදේශවලට ගිහිල්ලා, කෙටිකාලීන විසඳුම් හැටියට අපට මේ මොහොතේ කරන්න පුළුවන් දේවල් සම්බන්ධයෙන් මැදිහත් වෙලා තිබෙනවා.

## ශ්‍රී ලන්කන් ගුවන් සේවය: 2015 සිට ලාභ අලාභ
## ஸ்ரீலங்கன் விமான சேவை: 2015இலிருந்து ஈட்டிய இலாபம் / நட்டம்
## SRILANKAN AIRLINES: PROFIT / LOSS INCURRED FROM 2015

61/2024

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රීලන්කන් ගුවන් සේවය ලැබූ ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් කාල සීමාවේදී ශ්‍රීලන්කන් ගුවන් සේවය ලාභ/අලාභ ලැබීමට හේතු කවරේද;

(iii) ශ්‍රීලන්කන් ගුවන් සේවය අලාභ නොලබන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை ஸ்ரீலங்கன் விமான சேவை ஈட்டிய இலாபம்/ நட்டம் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியினுள் ஸ்ரீலங்கன் விமான சேவை இலாபம் / நட்டமடைந்தமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) ஸ்ரீலங்கன் விமான சேவையை நட்டமின்றி இயங்கச் செய்வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) amount of profit made/loss incurred by SriLankan Airlines from 2015 to date, separately according to each year;

(ii) reasons for the profit made/loss incurred by the SriLankan Airlines during the above-mentioned period; and

(iii) steps that will be taken to maintain SriLankan Airlines in a state of not incurring losses?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

Sir, on behalf of the Minister of Finance, Planning and Economic Development, I give the following Answer:

(a) (i) Amount of net profit/loss incurred by Sri Lankan Airlines from 2015

| Year | Rs. Mn. |
|---|---|
| 2014/2015 | (16,494.66) |
| 2015/2016 | (12,621.69) |
| 2016/2017 | (28,929.99) |
| 2017/2018 | (17,213.57) |
| 2018/2019 | (44,022.67) |
| 2019/2020 | (47,197.86) |
| 2020/2021 | (45,231.46) |
| 2021/2022 | (166,369.68) |
| 2022/2023 | (73,621.53) |
| 2023/2024 | 3,870.86 |

(ii) In the years 2014 and 2015, in addition to the mismanagement and politicization of the institution, there was a hike in global fuel prices.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,-

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
In addition to the previously mentioned reasons, in 2015/2016, the temporary closure of the Bandaranaike International Airport affected the profitability of the institution. Then, in 2016/2017, the institution had to pay compensation for cancellation of Aircraft Lease Agreements. In 2018/2019, there was an unexpected high interest cost, which the entity had to absorb. In addition to the previously mentioned reasons, in 2019/2020 - these are compounded and have been coming down year after year - due to the Easter attack and international travelling getting affected due to the COVID-19 outbreak, the situation further worsened and caused a lesser number of tourist arrivals.

In 2020/2021, due to the continuation of the previous reasons as well as the international travelling ban due to COVID-19 restrictions, a loss was incurred. In 2021/2022, there was a loss of Rs. 166 billion due to the compounding effect of the previously mentioned reasons such as mismanagement, politicization, hike of fuel costs and also the continued challenges due to the COVID-19 outbreak, resulting in reduced travels. In 2022/2023, in addition to the continuation of the compounding effect of previous reasons, the depreciation of our currency, the exchange rate crisis and the economic turmoil affected the profitability of the institution. Then in 2023/2024, there was an extraordinary exchange gain; as a result of the gradual recovery of the economy, the entity had recorded an exchange gain, resulting in a profit of Rs. 3.8 billion.

(iii) A comprehensive Business Plan approved by the Board of Directors will be submitted to the EGM for consideration and approval of the shareholders, and based on that, future courses of action will be decided.

(b) Does not arise.

Sir, I also **table*** the detailed Answer for the Question.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පිළිතුර ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාගේ දීර්ඝ පිළිතුර තුළ අන්තර්ගතව තිබෙනවා, ගුවන්යානා මිලදී ගැනීම සම්බන්ධයෙන් යම් යම් වර්ෂවලදී ගිවිසුම්ගත ගනුදෙනුවලදී අලාභ සිදුවෙලා තිබෙනවාය කියලා. එක්තරා වර්ෂයක් කිව්වා, ලාභ ලබපු. ඒක මට ඇහුණේ නැහැ. ඒක අහන්න අවසර ඉල්ලුවාට දුන්නේ නැහැ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

හැබැයි, මගේ ප්‍රශ්නයේ (iii) කොටසට පිළිතුරු දීමේදී ඒ ලාභ ලැබීම පිළිබඳව ඔබතුමා කථා කළා, මේ විනිමය අනුපාතයේ වෙනස් වීම හරහා ඒ ලාභ ලැබුණාය කියලා. හොඳයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. ඔබතුමන්ලා ඔය ඉදිරිපත් කරලා තිබෙන සැලසුම් ටික අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙනවා, මේ වෙනස්වීම් පිළිබඳව. ඒ වෙනස්වීම් පිළිබඳව ඒ අනුමැතිය ලැබෙනකල් රජයක් හැටියට ඔබතුමන්ලා පත් වෙන්න කලින් මේ ලාභ ලබා ගැනීම, -ඔබතුමා දැන් ඔය කමිටුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ ලාභ ලබා ගැනීමේ වැඩ පිළිවෙළ. ඒකට අනුමැතිය ලැබෙයි. ඒක හොඳයි. ඒක ඔබතුමන්ලා අනිවාර්යයෙන් කළ යුතුව තිබෙනවා. එතැනදී ප්‍රශ්නයක් වෙන්නේ නැහැ, අනුමැතියක් නේ ඉල්ලා තිබෙන්නේ, ඒක රහසක් නොවෙයි නේ. ඔබතුමන්ලා අදියරෙන් අදියර, මේ ලාභ ලබන වැඩ පිළිවෙළේ යම් නිශ්චිත, ක්‍රමයකට නේ යනවා ඇත්තේ. ඒ කියන්නේ මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් වෙන්න ඇති නේ. එතකොට මේ පාර්ලිමේන්තුවේ සහ රටේ දැනගැනීම සඳහා කෙටි කාලීන හා මධ්‍ය කාලීන වැඩ පිළිවෙළ ගැනවත් ඔබතුමාගේ දැනුම අනුව පොඩි දැනුවත් කිරීමක් කරන්න පුළුවන්ද මේ මොහොතේ?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු මන්ත්‍රීතුමනි, ඒ වැඩසටහන ඉදිරිපත් කරලා shareholder approval එක ලැබෙනකල් මේ අවස්ථාවේ අවශ්‍ය වැඩකටයුතු කෙරීගෙන යනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම අහන්නේ, ඒ shareholdersලාට කර තිබෙන යෝජනා මොනවාද කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නයට මම උත්තර දෙනවා. අලුතින් Board එකක් පත් කර තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට මයික් එක දෙනවා නම් හොඳයි. ගරු කථානායකතුමනි, ඔබතුමා ඇත්තටම මධ්‍යස්ථව කටයුතු කරන කථානායකවරයෙක් නිසා සමාජය තුළ තවම විවේචනයට ලක් වෙලා නැහැ. අපි ඒකට ගරු කරනවා. මොකද, ඔබතුමා වමට බර වෙන්නේ නැති කථානායකවරයෙක් හැටියට අපි බොහොම අගය කරනවා. තවම ඔබතුමා මැද ඉන්නේ. වමට බරවයි ඉස්සෙල්ලා-*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට මයික් එක දීලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මම අහන්නේ සරල කාරණයක්. මේක පෞද්ගලීකරණය කරන්න යෝජනා කරලා තිබුණේ ඔය බංකොලොත් කරපු උදවියම නේ. නමුත්, එය පෞද්ගලීකරණය නොකර ඔය කොටස්කරුවන්ට - shareholdersලාට - යෝජනා කර තිබෙන ලාභ ලබන එක වැඩ පිළිවෙළක් කියන්න.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
එකක් තමයි, දේශපාලනීකරණයෙන් මේ ආයතන මුදා ගැනීම.

කරුණාකර ඔබතුමාගේ ඊළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, විද්වතෙකු - වියතෙකු - හැටියට ඔබතුමාගේ ඔය උත්තරය සාධාරණ නැහැ, ඊයේ ඔබතුමා ජනමාධ්‍ය බැලුවා නම්. මුදල් ඇමතිතුමා යටතේ තමයි ශ්‍රී ලංකා රේගුව තිබෙන්නේ. රේගුවේ විශේෂ කාර්යභාරය තමයි ගුවන් තොටුපොළෙන් එන, බැහැර වන සමහර බහලු පරීක්ෂා කරලා, ඒවාට නිශ්චිත රේගු ගාස්තු අය කරලා, ඒවා රටට ඇතුළු වීම නුසුදුසු ද නැද්ද කියලා බැලීම වැනි කටයුතු. එවැනි විශාල කාර්යභාරයක් රට වෙනුවෙන්, රටේ පැවැත්ම වෙනුවෙන් සහ රටේ ආරක්ෂාව වෙනුවෙන් කරනවා. එය ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ. එය ගුවන් තොටුපොළේත් වෙනවා ඇති කියන විශ්වාසය තුළයි මම මෙය කියන්නේ, ගරු කථානායකතුමනි. ගුවන් තොටුපොළේත් රේගු නිලධාරින් ඉන්නවා; ගුවන් යානා මඟින් බඩු එනවා. හැබැයි වරාය බහලු - රතු ලේබලය සහිතව තිබිච්ච බහලු - ඊයේ දිනයේ දෙසිය ගණනකට එහා ප්‍රමාණයක්- *[බාධා කිරීමක්]* මුදල් විෂය පිළිබඳ රේඛීය අමාත්‍යාංශයේ ඇමතිවරයා ජනාධිපතිවරයායි. ඔබතුමා නියෝජ්‍ය ඇමතිවරයා. එතකොට, රටේ ජනාධිපතිගේ නියෝගය දේශපාලන නියෝගයක් නොවෙයි ද? එහෙම නැත්නම්, ඔබතුමාගේ නියෝගයක් ද ඒ ලැබුණේ, ඒ බහලු තුන්සිය ගණනට අදාළව එසේ කටයුතු කරන්න කියලා? ඒ නිසා ඔබතුමන්ලා විලිලජ්ජා නැතුව උඩ බලාගෙන කථා කරන්න එපා. කාගේ හෝ බලපෑමක් තිබෙන්න ඇති. ජනාධිපතිතුමාගේ නැත්නම්, ඔබතුමාගේ නැත්නම්, වෙනත් දේශපාලන අත පෙවීමක් යටතේ එම බහලු එළියට දාලා තිබෙනවා කියලා තමයි සමාජය කථා කරන්නේ. මොකද, රේගු නිලධාරින් කියනවා, අපි දැන් අපේ කටයුතු,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ප්‍රශ්නය ටිකක් දිගයි. හැබැයි, ප්‍රශ්නය වැදගත්; කාලීනයි. ඒ නිසා මට තත්පර කීපයක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
රිදෙන කොට නතර කරන්න එපා. ඒක ඔබතුමාට හරි නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා එහෙම දේශපාලනීකරණය කරලා නැහැ කියලා. දේශපාලනීකරණය කරලා නැත්නම්, විපක්ෂයේ බලපෑමක් ද, නැවත වතාවක් එවැනි බහලුම් නිදහස් කරන්න එහෙම බලය දීලා තිබීම?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මුල් ප්‍රශ්නය යොමු කරලා තිබුණේ ශ්‍රීලන්කන් ගුවන් සේවය සම්බන්ධයෙන්. තොරතුරු සූදානම් කරලා තිබුණේ ඒ ගැනයි. නමුත්, ඔබතුමා දැන් අහන්නේ රේගුව පිළිබඳව නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නැහැ, මා අහන්නේ ගුවන් තොටුපොළේ-

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ඒ සම්බන්ධ තොරතුරු මෙතැනට සූදානම් කරගෙන ඇවිල්ලා නැහැ. නමුත්, අදාළ විධිමත් කාර්ය පටිපාටියක් යටතේ, දේශපාලන අත පෙවීම්වලින් තොරව රාජ්‍ය ආයතනවල වැඩකටයුතු කරන බව කියන්න සතුටුයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 33 (1) යටතේ පැහැදිලි කිරීමක් කර ගන්න අවසර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 33 (1) දෙවන ඡේදය යටතේ පැහැදිලි කර ගැනීමක් කර ගැනීමට අපට නීත්‍යානුකූල අවසරයක් දීලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න අවස්ථාව දුන්නා. ඒ ප්‍රශ්න දෙකට උත්තර ලැබුණා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේක ප්‍රශ්නයක් නොවෙයි, ගරු කථානායකතුමනි. මම දන්නවා ඒක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉතින්, දෙවන ප්‍රශ්නයට පැහැදිලි කර ගැනීමක් කියන්නේ මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන් නීතිමය අවසරයක් තිබෙනවා. ඔබතුමා ස්ථාවර නියෝග 33 (1)හි දෙවන ඡේදය කියවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි 3වන ප්‍රශ්නයට යමු.

## වවුනතිව් නිවාස යෝජනා ක්‍රමයේ ඉදිකිරීම්: නිම නොවීම
## வவுணதீவில் வீடமைப்புத் திட்ட நிர்மாணம்: நிறைவு பெறாமை
## CONSTRUCTION OF HOUSING SCHEME IN VAVUNATIVU: NON-COMPLETION

68/2024

**3. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පසුගිය යහ පාලන රජය සමයේ මඩකලපුව මන්මුනෙයි-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වවුනතිව්හි නිවාස ඒකක 50කට අධික සංඛ්‍යාවකින් සමන්විත නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකරන ලද බවත්;

(ii) එහි ඇති සමහර නිවාසවල ඉදිකිරීම් අවසන් කර ඇතත් සමහර නිවාසවල ඉදිකිරීම් මේ දක්වා අවසන් කර නොමැති බවත්;

(iii) ඉන් පසුව බලයට පැමිණි රජයන් විසින් එම නිවාස නැවත ප්‍රතිසංස්කරණය කර ජනතාවට ලබා නොදුන් බවත්;

(iv) ඒ අනුව, වර්ෂ 8කට වඩා අධික කාලයක සිට එම ප්‍රදේශයේ ජනතාව ඒ හේතුවෙන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, ඉහත නිවාස යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නිම කරනු ලබන කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த நல்லாட்சி அரசாங்க காலப்பகுதியில் மட்டக்களப்பு, மண்முனை - மேற்குப் பிரதேச செயலகப் பிரிவிலுள்ள வவுணதீவுப் பிரதேசத்தில் 50க்கும் மேற்பட்ட வீடுகளைக்கொண்ட வீட்டுத் திட்டமொன்று நிர்மாணிக்கப்பட்டது என்பதையும்;

(ii) அதிலுள்ள சில வீடுகளின் நிர்மாணப் பணிகள் நிறைவுசெய்யப்பட்டு உள்ளபோதிலும், மேலும் சில வீடுகளின் நிர்மாணப் பணிகள் இதுவரை நிறைவுசெய்யப்படவில்லை என்பதையும்;

(iii) அதன்பின் ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் அவ்வீடுகளைப் புனரமைத்து மக்களிடம் கையளிக்கவில்லை என்பதையும்;

(iv) அதன் காரணமாக 8 ஆண்டுகளுக்கும் மேலாக அப்பகுதி மக்கள் பல்வேறு சிரமங்களுக்கு முகங்கொடுத்து வருகின்றனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், மேற்படி வீட்டுத் திட்டத்தை முழுமையாக நிறைவுசெய்வதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) எக்காலப்பகுதியில் அவ்வீட்டுத்திட்டம் முழுமையாக நிறைவுசெய்யப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Is he aware that -

(i) a housing scheme consisting of more than 50 housing units was launched in Vavunativu within the Manmuni-West Divisional Secretary's Division in Batticaloa during the previous "Good Governance" Government;

(ii) the construction of some houses has been completed, but the construction of some other houses has not been completed; and

(iii) the governments that came into power subsequently neither restored those houses nor handed them over to the people;

(iv) the people in those areas have been facing various hardships for more than eight years accordingly?

(b) If so, will he inform this House -

(i) whether action will be taken to fully complete this housing scheme; and

(ii) the timeframe within which it will be completed?

(c) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යොමු වෙලා තිබෙන්නේ මඩකලපුව මන්මුනෙයි-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස ව්‍යාපෘතියක් පිළිබඳවයි. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(iv) ඔව්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට පසුව හරි අවස්ථාව දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඉඳගන්න. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට පසුව හරි අවස්ථාව දෙන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් දෙන්න මට අවස්ථාව නොලැබුණොත් එය ඒ මන්ත්‍රීතුමාට කරන අසාධාරණයක් වෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මම හිතනවා ඔබතුමා ඒ මන්ත්‍රීතුමාට බාධාවකින් තොරව පිළිතුර අහගෙන ඉන්න අවස්ථාව හදලා දෙයි කියලා.

(ආ) (i) මෙම ව්‍යාපෘති නිම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇති අතර, ඒ සඳහා අනුමැතිය ද ලැබී තිබෙනවා. ඒ අනුව භාණ්ඩාගාරය වෙතින් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දුන් පසු මෙම ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියේදී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වෙනවා.

මීට අමතරව, මේ පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක වන පස් අවුරුදු සැලැස්මට ද ඇතුළත් කර තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ ලැබී ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් කෝරළේ පත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොමතලමඩු නිවාස 20ක් හා එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොප්පවේලි -ii, තුම්පලංචෝලෙ ආදර්ශ ගම්මානයේ නිවාස 25ක් සහ මාන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔලිමඩු ආදර්ශ ගම්මානයේ නිවාස 05ක් මේ වන විට නිම කරමින් පවතින බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් වාර්තා කර තිබෙනවා.

(ii) මේ මොහොත වන විට අවශ්‍ය ප්‍රතිපාදන ලැබී නැහැ. නමුත් ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන අනුව මේ නිවාස ව්‍යාපෘතියේ කටයුතු නිම කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා නිශ්චිත කාල සීමාවක් සඳහන් කරන්න අපහසුයි.

(ඇ) අදාළ නොවේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நன்றி!

கௌரவ சபாநாயகர் அவர்களே! இந்த வீட்டுத் திட்டங்கள் அனைத்தும் கடந்த நல்லாட்சி அரசாங்கத்தின் காலப்பகுதியிலே எங்களுடைய மதிப்புக்குரிய எதிர்க்கட்சித் தலைவர் சஜித் பிரேமதாஸ அவர்கள் வீடமைப்பு அமைச்சராக இருந்தபொழுது உருவாக்கப்பட்டவை. மட்டக்களப்பில் மட்டுமல்ல, இலங்கை முழுவதும் அவரால் இவ்வாறான வீட்டுத் திட்டங்கள் உருவாக்கப்பட்டது. ஆனால், கடந்த 2019ஆம் ஆண்டில் வந்த கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கம், ஏதோ சஜித் பிரேமதாஸ அவர்களைப் பழிவாங்குவதென்ற அடிப்படையில் அந்த வீட்டுத் திட்டங்களை முடிவுறுத்தாமல் அரைகுறையாகவே விட்டிருந்தது. பல வீடுகள் கட்டி முடிக்காமல் குறையில் இருக்கின்றன; சிலர் கடனாளிகளாக மாற்றப்பட்டிருக் கின்றார்கள். ஏனென்றால், குறிப்பிட்டளவு வேலையைச் செய்தால்தான் உங்களுக்கு அடுத்த கட்ட நிதித் தொகை கிடைக்குமென்று அவர்களுக்குச் சொல்லப்பட்டது. ஆனால், துரதிருஷ்டவசமாக, போரதீவுப்பற்றாக இருக்கட்டும், வாகரையாக இருக்கட்டும், வவுணதீவுப் பிரதேச செயலகப் பிரிவாக இருக்கட்டும், மட்டக்களப்பு மாவட்டம் முழுவதுமாக எத்தனையோ வீடுகள் இன்னும் கட்டிமுடிக்கப்படாமல் அரைகுறையில் இருக்கின்றது. நீங்கள் அளித்த பதிலில், "ஒதுக்கீடுகள் வரும்பொழுது அதைச் செய்யலாம்" என்று குறிப்பிட்டீர்கள். ஆனால், இந்த மக்கள் தற்போது வீடும் இல்லாமல், கடனையும் வாங்கிக் கடனாளிகளாகவும் இருக்கின்றார்கள். கடந்த கோட்டாபய அவர்களின் ஆட்சிக் காலத்தில் தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையிடம் முதற்கட்டமாக அந்த வீடுகளை முடிக்கச்சொல்லி நாங்கள் கேட்டிருந்தோம். எனினும் அது நடைபெறவில்லை.

இப்போது உங்களுடைய அரசாங்கத்தில், நிதி வரும்பொழுது இந்த வீடுகளை முடித்துத் தருவதாக நீங்கள் சொல்கின்றீர்கள். இது திருப்தியடையக்கூடிய வகையான ஒரு பதில் அல்ல. "ஒதுக்கீடுகள் வரும்பொழுது செய்யலாம்" என்ற பதிலைக் கேட்டுக் கேட்டுச் சலிப்படைந்திருக்கின்ற எங்களுடைய மக்களும் அதனை ஏற்றுக்கொள்ள மாட்டார்கள். ஒரு பொறுப்புள்ள அரசாங்கம் என்ன சொல்லவேண்டும் என்றால், "நாங்கள் ஆறு மாதத்திற்குள், இல்லையென்றால் ஒரு வருடத்திற்குள் முடித்துத் தருவோம்!" என்று. இல்லையென்றால், "இதை நாங்கள் முடித்துத் தரமாட்டோம்" என்று சொல்லவேண்டும். ஏனென்றால், இந்த மக்கள் இன்னும் எவ்வளவு காலத்திற்குள் தமது வீடு பூரணமாகக் கட்டி முடிக்கப்படும் என்று தெரியாது எதிர்பார்த்துக்கொண்டு இருக்கவேண்டியிருக்கின்றது. அந்த வகையில், "ஒதுக்கீடுகள் வரும்பொழுது இந்த வீட்டுத் திட்டங்களை முடித்துத் தருவோம்" என்று சொல்வதைவிட, ஒரு குறிப்பிட்ட காலப்பகுதிக்குள் அதாவது, 6 மாதம், அல்லது ஒரு வருடம், அல்லது இந்த 2025 முடிவதற்குள் என்று இந்த வீட்டுத் திட்டங்களை முடித்துத் தருவது பற்றி ஒரு காலத்தைக் குறிப்பிட்டுச் சொல்ல முடியுமா? என்பதுதான் என்னுடைய முதலாவது கேள்வி.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාව ගැන ඔබතුමා දක්වන උනන්දුව මට තේරුම් ගන්න පුළුවන්. ඒ පිළිබඳ මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

නිවාස සංවර්ධන අධිකාරියෙන් අපි ලබාගත් තොරතුරු අනුව පසුගිය කාලය පුරා විවිධ කාලවල විවිධ නම්වලින් ව්‍යාපෘති ආරම්භ කරලා සම්පූර්ණ නොකළ නිවාස 48,000 ගණනකට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ 48,000 ගණනක ප්‍රමාණය අතරින් මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන නිවාස ව්‍යාපෘති කිහිපයක් ගැන තමයි ඔබතුමා මේ සඳහන් කරලා තිබෙන්නේ. ඔබතුමා සඳහන් කර තිබෙනවා වාගේම, මේ නිවාස 48,000න් සමහර ඒවා අත්තිවාරම් දමලා තිබෙන ඒවා. සමහර ඒවා බිත්ති බැඳලා තිබෙන ඒවා. ඒ වාගේම ඒ නිවාසලාභීන්ගෙන් බොහෝදෙනෙක් නිවාස ණය අරගෙන තිබෙනවා; ණයකරුවන් හැටියට ඉඳලා තිබෙනවා. නමුත් නිවාසවල වැඩ සම්පූර්ණ කරන්න ලැබිලා නැහැ. ඒක මම පිළිගන්නවා. නිවාස සංවර්ධන අධිකාරියත් එක්ක අපේ අමාත්‍යාංශය කරපු සාකච්ඡාවලට අනුව, දැනට විවිධ නම්වලින් ව්‍යාපෘති ආරම්භ කරලා වැඩ අවසන් නොකර තිබෙන ඒ නිවාස ව්‍යාපෘතිවල වැඩ අදියරෙන් අදියර, ප්‍රතිපාදන ලැබෙන ආකාරයට නිම කරන්න අපි වැඩ පිළිවෙළක් සකස් කරමින් ඉන්නවා. ඒ වාගේම අපි කල්පනා කරමින්

ඉන්නවා, නැවත වරක් රාජ්‍ය බැංකු එක්ක සාකච්ඡා කරලා කිසියම් ණය ව්‍යාපෘතියක් නැවත ආරම්භ කරලා මේ අයගේ නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා අවස්ථාවක් ලබා දෙන්න පුළුවන්ද කියන එක ගැන.

ඒ වාගේම වාර්ෂික අය වැයෙන් නිවාස සංවර්ධන අධිකාරියට යොමුවන ප්‍රතිපාදනවලින් කිසියම් කොටසක් අදියරෙන් අදියර මේ නිවාස ව්‍යාපෘතිවලට සම්බන්ධ කරන්න තිබෙන හැකියාව ගැනත් අපි මේ වන විට සැලසුම් සකස් කරමින් ඉන්නවා. නමුත් මේ නිවාස 48,000ම සම්පූර්ණ කරන්න විශාල මුදලක් වැය වෙනවා. ඔබතුමා ඒක තේරුම් ගනීවි. අපට ඒ නිවාස සම්පූර්ණ කරන්න පුළුවන්කම තිබෙන්නේ කොපමණ කාලයකින්ද, මොන ව්‍යාපෘතියටද ප්‍රමුඛතාව ලබා දෙන්නේ කියන කාරණා සඳහන් කරන්න පුළුවන්කම තිබෙන්නේ ලැබෙන මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය අනුවයි. ඒ නිසා නිශ්චිතව අහවල් දවස වෙනකොට මේ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන්න පුළුවන් කියලා සඳහන් කිරීමට අපහසුයි. ඒ පිළිබඳව මම පෞද්ගලිකව කනගාටු වෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි. ගරු අග්‍රාමාත්‍යතුමියනි, නිවාස අවශ්‍යතා සම්බන්ධයෙන් කැබිනට් එකේදී කථා කරලා වැඩිපුර ප්‍රතිපාදන වෙන් කර දෙන්න ගරු ඇමතිතුමාට.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා අහනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මම නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ඇමතිතුමාගේ අවධානයට මේ අතුරු ප්‍රශ්නය යොමු කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, කොළොන්නාව 101 වත්ත ප්‍රදේශයේ ගෙවල් 5ක් ඊයේ UDA එකෙන් කඩා ඉවත් කරලා තිබෙනවා. මාධ්‍යයට UDA එකෙන් කියා තිබුණා, ඒ මිනිස්සුන්ට ගෙවල් දුන්නා, නමුත් ගියේ නැහැ කියලා. ගරු ඇමතිතුමනි, ඒක අසත්‍යයක්. එතැන ගෙවල් 118ක් තිබෙනවා. ගිය ආණ්ඩුව කාලයේ, සරත් වීරසේකර හිටපු ඇමතිතුමාගේ කාලයේ ඒ අය බලෙන් එතැනින් යවන්න UDA එකෙන් ගෙවල් offer කළේ ලක්ෂ 10ක් කියලා. එදිනෙදා කුලී රස්සාව කරන මිනිස්සුන්ට රුපියල් ලක්ෂ 10ක් දෙන්න බැහැ. ඊට පසුව UDA එකත් එක්ක නැවත සාකච්ඡාවක් තිබුණා. මමත් පෞද්ගලිකව එයට සහභාගි වුණා. ඒ අය ඒ අවස්ථාවේ කිව්වා, ලක්ෂ 5ක් ගෙවන්න කියලා. ලක්ෂ 5ක් තියා ලක්ෂයක්වත් ගෙවා ගන්න බැරි මිනිස්සු එතැන ඉන්නේ. ඒ කඩපු එක ගෙදරක පිළිකා රෝගියෙක් ඉන්නවා. තව ගෙදරක පපුවේ සිදුරක් තිබෙන ළමයෙක් ඉන්නවා. තව ගෙදරක wheelchair එකේ යන කෙනෙක් ඉන්නවා. හෙට දවසේ තව ගෙවල් 15ක් කඩන්න නියමිතයි. මම කියන්නේ නැහැ, ඒ අයට එතැන ඉන්න දෙන්න කියලා. මොකද, ඒ භූමිය නාගරික සංවර්ධන අධිකාරියට අත්‍යවශ්‍ය භූමියක්. ඒක මම පිළිගන්නවා. නමුත් මේ අය පාරට දමලා කරන සංවර්ධනයෙන් වැඩක් නැහැ. මොකද, ඒ අය මේ සමාජයේ දරිද්‍රතා රේඛාවෙන් පහළම ඉන්න මිනිස්සු.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරනවා. කොළොන්නාව "සංහිඳ සෙවණ" සහ අනෙක් නිවාස ව්‍යාපෘතිවල තව ගෙවල් ඉතුරු වෙලා තිබෙනවා. UDA එකට හැකියාව තිබෙනවා, Board approval එකක් අරගෙන අවශ්‍යතාවක් තිබෙනවා නම් ලක්ෂයක් හෝ අය කරගෙන ඉතුරු මුදල් වාරික වශයෙන් ගෙවීමේ පදනමින් අරගොල්ලන්ට ඒ නිවාස ලබා දෙන්න. දැන් එතැනට ගිහිල්ලා බලන්න. ඒ කඩා දමපු ගෙවල්වල බිම -පොළොවේ- ඒ අය වාඩි වෙලා ඉන්නේ. ඉතාම දුක්ඛිත තත්ත්වයක් ඒක. ඔබතුමන්ලාගේ නියෝජ්‍ය ඇමතිවරයෙකු වන ගරු එරංග ගුණසේකර මැතිතුමාටත් මම තේරුම් කළා, මේකට ලබා දෙන්න තිබෙන විසඳුම මේකයි කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, UDA එකට උපදෙස් දෙන්න කියලා ටිකක් මානුෂිකව බලලා අර මිනිස්සුන්ගෙන් ලක්ෂයක් හෝ කීයක් හෝ අරගෙන අර නිවාස ව්‍යාපෘතිවල ඉතුරු වෙලා තිබෙන ගෙවල් ඒ අයට ලබා දෙන්න කියලා. ඒ සම්බන්ධව මොකක් හරි කරන්න පුළුවන්ද ඇමතිතුමා?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔබතුමාගේ මුලික ප්‍රශ්නයෙන් නම් අහලා තිබුණේ මඩකලපුව නිවාස ව්‍යාපෘතියක් සම්බන්ධයෙන්. නමුත් ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය යොමු වෙන්නේ කොළොන්නාව ප්‍රදේශයේ මීතොටමුල්ල කුණු කන්ද ආසන්නයේ තිබෙන වැල්ලම්පිටිය, කොළොන්නාව, පොතුවිල්කුඹුර 101 වත්ත තුළ පිහිටි අනවසර නිවාස ඉවත් කිරීම සම්බන්ධයෙන්. මේ පිළිබඳව අපට ලැබී තිබෙන තොරතුරු අනුව, මේ ප්‍රදේශයේ ඉන්න විකල්ප ඉල්ලුම්කරුවන් 140දෙනෙක් හඳුනා ගෙන තිබුණා.

2018 වර්ෂයේ තමයි මුලික සමීක්ෂණය කරලා තිබෙන්නේ. ඒ අනුව ඉල්ලුම්කරුවන් 140දෙනෙක් හඳුනාගෙන 2020 වර්ෂය වෙන කොට ඔවුන්ට විකල්ප නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් කරලා තිබුණා. මෙහිදී විසිදෙනෙකුට අදාළ නිවාස ව්‍යාපෘතියෙන් නිවාස දෙන්න බැහැ කියලා 2023දී තීරණය කරලා තිබෙනවා. ඒ විසිදෙනාට අදාළව අභියාචනා කමිටුවකින් ඔවුන්ගේ ඉල්ලීම් සලකා බලා තිබුණා. ඒ අභියාචනා කමිටුවෙන් යම් යම් යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් වෙලා තිබුණා. එහිදී සපුරා ඇති සියලු සුදුසුකම් සලකා අභියාචනා කමිටුව විසින් මව සහ පුතාගේ නමින් එක් නිවසක් පමණක් ලබා දීමට තීරණය කර ඇතත්, නිවාස ඒකක දෙකක් ලබා ගැනීමේ අරමුණින් විෂයගත ඉඩමේ තවදුරටත් රැඳී සිටිනවා. මේ වාගේ කරුණු ගණනාවක් වාර්තා වෙලා තිබුණා. මම පිළිගන්නවා, ඒ අයගෙන් සමහර වෙලාවට අනුපවුල් දෙකක්, තුනක් එකම නිවසේ ජීවත් වෙනකොට එක ප්‍රතිලාභියෙකුට පමණයි අදාළ ව්‍යාපෘතියෙන් නිවාසය ලැබෙන්නේ කියලා. "පදිංචිය තහවුරු කිරීමට ප්‍රමාණවත් ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් නිවාස ඉල්ලුම්කරුවන්ට සහ එම ඉල්ලුම්කරුවන්ගේ ඥාතිත්වයක් නොමැති බාහිර පාර්ශ්ව පදිංචිව සිටින නිවාස" ආදී වශයෙන් සලකා බලා තමයි විසිදෙනෙකුට අදාළ නිවාස ව්‍යාපෘතියෙන් නිවාස දෙන්න බැහැ කියලා 2023දී තීරණය කර තිබෙන්නේ. ඒක අපේ කාලයේ වෙච්ච දෙයක් නොවෙයි. නමුත් මේ පිළිබඳව සානුකම්පිතව සලකා බලා ඉදිරියේදී නිවාස ව්‍යාපෘතිවලින් මේ අයට නිවාස ලබා දෙන්න කටයුතු කරනවා. සමහර නිවාස ව්‍යාපෘතිවල හිස් නිවාස කිහිපයක් තිබෙනවා කියලා අපි කරපු සමීක්ෂණවලින් දැන ගන්න ලැබී තිබෙනවා. ඒ අනුව මේ අයගේ නීත්‍යානුකූල තත්ත්වය සලකා බලා ප්‍රමුඛතාව අනුව සහ හිස් නිවාස තිබෙන ආකාරය අනුව නිවාස ලබා දෙන්න කටයුතු කරන්න අපට පුළුවන්. දැනට නිවාස විස්සක් තමයි දෙන්න තිබෙන්නේ.

ඒ නිවාස ඉවත් කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ තීරණයක් මත වෙච්ච දෙයක් නොවෙයි. මේ සම්බන්ධයෙන් නඩුවක් තිබෙනවා. උසාවි නියෝගයක් තිබෙනවා. උසාවි

[ගරු අනුර කරුණාතිලක මහතා]

නියෝගයෙන් තීරණය වෙලා තිබෙනවා, ඒ පදිංචි වෙලා ඉන්නේ අනවසර පදිංචිකරුවන් කියලා. ඔවුන් ඉවත් කිරීම සඳහා උසාවි තීන්දුවක් ලබා දීලා තිබෙනවා. උසාවි තීන්දුවට පිටුපා කටයුතු කරන්න නාගරික සංවර්ධන අධිකාරියට හැකියාවක් නැහැ. ඒ අනුව තමයි මේ ඉවත් කිරීමේ කටයුතු කරලා තිබෙන්නේ. මම කලින් සඳහන් කළා වාගේ, අවස්ථාව ලැබෙන පිළිවෙළට සහ අවශ්‍යතාවල ප්‍රමුඛතාව අනුව ඒ සම්බන්ධයෙන් සානුකම්පිතව බලා කටයුතු කරන්න ජාතික නිවාස සංවර්ධන අධිකාරියත්, අපේ අමාත්‍යාංශයත් සූදානම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න. පැහැදිලි කිරීමක් කරගන්නයි අවස්ථාව ඉල්ලන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම පැහැදිලිව කියන්න ඕනෑ මෙතැන සිද්ධ වෙන්නේ විවාදයක් නොවෙයි කියන එක. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න කියන්නේ විවාදයක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද අයිතිය රකින්න තිබෙන්නේ ගරු කථානායකතුමාටයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කරුණාකර Standing Order No. 33(1) යටතේ තිබෙන කොටස කියවන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 33 (1)හි දෙවන ඡේදය අනුව අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒකේ තුන්වන ඡේදයත් කියවන්න.

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්: වංචනිකව අත්පත් කර ගැනීම

காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள்: மோசடியான கையகப்படுத்தல்

LANDS OWNED BY LAND REFORM COMMISSION: FRAUDULENT ACQUISITION

81/2024

**4. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(ii) එම කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේ අරමුණ කවරේද;

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් මේ වන විට විවිධ පුද්ගලයන්/ආයතන විසින් වංචනික ආකාරයෙන් අත්පත් කරගෙන තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම කොමිෂන් සභාව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணி மறுசீரமைப்பு ஆணைக்குழு தாபிக்கப் பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி ஆணைக்குழு தாபிக்கப்பட்டதன் நோக்கம் யாது என்பதையும்;

(iii) காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள் தற்போது பல்வேறு ஆட்கள்/நிறுவனங்களால் மோசடியான முறையில் கைப்பற்றப்பட்டுள்ளன என்பதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அந்த ஆணைக்குழுவுக்குச் சொந்த மான காணிகளைப் பாதுகாத்துக் கொள்வதற் காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the date on which the Land Reform Commission was established;

(ii) the objectives of establishing that Commission;

(iii) whether he is aware that the lands owned by the Land Reform Commission have been fraudulently acquired by various persons / institutes by now; and

(iv) if so, the measures that are taken to protect the lands owned by the said Commission;

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 1972 අගෝස්තු මස 26වැනි දින ජාතික රාජ්‍ය සභාවේ සම්මත කරන ලද 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව, 1972 සැප්තැම්බර් මස 8වැනි දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

(ii) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 2වන වගන්තියට අනුව කොමිෂන් සභාවේ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.

- උපරිමයට වැඩි කෘෂි කාර්මික ඉඩම් ප්‍රමාණයක් කිසිම තැනැත්තෙකු විසින් අයිතිව තබා නොගැනීම සුරක්ෂිත කිරීම.
- යම් තැනැත්තෙකුට අයිති උපරිමයට වැඩි කෘෂි කාර්මික ඉඩම් පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම්වලින් ඇතිවන රැකීරක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය ගෙන දෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනයට ගැනීම.

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව "උපරිමය" යනු,

(අ) එම ඉඩම් තනිකරම කුඹුරුවලින් සමන්විත නම්, අක්කර 25ක්විය යුතුය.

නැතහොත්,

(ආ) එම ඉඩම් තනිකරම කුඹුරුවලින් සමන්විත නොවේ නම්, අක්කර පනහක් විය යුතුය. එහෙත්, ඒ අක්කර පනහට කුඹුරු කිසිවක් අඩංගු නොවේ නම් ඒ කුඹුරුවල මුළු ප්‍රමාණය (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කුඹුරු පිළිබඳ උපරිමයට වැඩි නොවිය යුතුය.

(iii) ඔව්.

(iv) පහත සඳහන් පුද්ගලයින්/ආයතන ඉඩම් අයථා පරිදි හා වංචනික ලෙස අත්කර ගැනීමට ක්‍රියා කර ඇති බවට කරුණු තහවුරු කර ගැනීමෙන් පසු එම ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇත.

| අනු අංකය | ඉඩමේ නම | පිහිටීම | වංචනිකව අත්කරගෙන ඇති පුද්ගලයා/ ආයතනය | ගෙන ඇති පියවර |
|---|---|---|---|---|
| 1. | ගිරිඋල්ල වත්ත | ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ලෝල්ලුවේගොඩ, ගොඩකලාන, තලාහේන සහ ගිරිඋල්ල | ජෝන් ලියෝ ද කෘස් භාරය | අත්තනගල්ල දිසා අධිකරණයෙහි අංක 538/එල් දරන ඉඩම් සහ නෙරපීම් නඩුව ගොනු කරනු ලැබ ඇත. |
| 2. | කන්දගොඩැල්ල වත්ත | මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වාහුවගම | ජොනික්කු හේවා ආරියරත්න | මාතර දිසා අධිකරණ නඩු අංක එල්/13322 නඩුව පවරා ඇත. |
| 3. | ඇපීන් ෆොරස්ට් | කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මාපුටුගල ගම | 1.වාඩිය රාළලාගේ උපාලි ගුණසේකර 2.ගමගේ රංජිත් ගුණරත්න 3.නිමල් රත්නසිරි ගල්කේන 4.පී.ජී. ඉංජිනියරින් පුද්ගලික සමාගම | හොරණ දිසා අධිකරණයේ නඩු අංක එල්/3056/2020 දරන නඩුව ගොනු කර ඇත. |
| 4. | හන්තාන වත්ත | මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දෙයියන්නේවෙල ගම | ප්‍රසාද් මුදිත වනිගසිංහ | මහනුවර දිසා අධිකරණයේ ඩී.එස්.පී.44/2020 සහ මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ 14283 සහ 14284 දරන නඩු පවරා ඇත. |
| 5. | ලෝලන්ඩ් වත්ත / වුන්දකාඩු | නැඟෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්තලෙයි | එස්.එන්.සී.ඩබ්ලිව්.එම්.බී.සී. කන්දෙගෙදර | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පියවර ගනිමින් පවතී. |
| 6. | උප්පාරුකාඩු වත්ත | නැඟෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කින්නියා ගම | කළුතොට ෆිනෑන්ස් පුද්ගලික සමාගම | නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අපේක්ෂාවෙන් පසුවේ. |
| 7. | වෝටර්ලන්ඩ් වත්ත | කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෝරුවදණ්ඩ ගම | ඥාණධර්ම රණසිංහ | රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ අනවසරකරුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනිමින් පවතී. |

දිවයින පුරා පිහිටි මෙම කොමිෂන් සභාව සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීමට පියවර ගනු ලබන පුද්ගලයන්ට එරෙහිව රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ පියවර ගෙන ඇති අතර, දැනටද පියවර ගනිමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

පිළිතුර ලබා දීම පිළිබඳව ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව ලංකාවේ ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි ලංකාවේ තිබෙන සම්පූර්ණ ඉඩම් පිළිබඳව මේ වෙනකොට නිසි අධ්‍යයනයක් සහ නිසි ලෙජරයක් ඔබතුමන්ලාගේ ආයතනය තුළ තිබෙන බවක් අපට පේන්න නැහැ. පසුගිය කාලයේ අපි දැක්කා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මුදල්වලින් කොම්පෝස්ට් පොහොර හදන ආකාරය. විශේෂයෙන්ම අනුරාධපුරය දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් කාබනික පොහොර හැදුවාද, හැදුවා නම් ඒවා ගියේ කොහේටද, ඒවා කවුද බෙදුවේ කියන කරුණු සම්බන්ධයෙන් තොරතුරු නැහැ. පොහොර හදපු ඒ තැන්වලට ගෙනාපු මැෂින් ටික පවා ගලවාගෙන ගිහින් තිබෙනවා. එහෙම නැත්නම් ඒවා තිබෙන තැන්වල කැලැ වැවිලා තිබෙනවා. ඒ වාගේම අපි දැක්කා, හිතවතුන්ට, මාධ්‍යවේදීන්ට, විශ්‍රාමික හමුදා නිලධාරීන්ට, ව්‍යාපාරිකයන්ට විශාල වශයෙන් මේ ඉඩම් බෙදාදීම් සිද්ධ වුණු ආකාරය. රත්නපුර දිස්ත්‍රික්කය, අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු ඕනෑම ප්‍රදේශයක කොහේ හරි LRC ඉඩම් තිබෙනවා නම්, ඒ ලැයිස්තුව ගෙනැල්ලා දුන්නාම ඒ ඉඩම් ලබා දෙන තැනට තමයි කටයුතු සිද්ධ වුණේ. අපි දැනුවත්ව මේ දේ විශාල වශයෙන් වෙලා තිබෙනවා. වර්තමානයේ දූෂණ, වංචා මහ හැරීම සඳහා, එහෙම නැත්නම් ඒවාට දඬුවම් ලබා දීම වෙනුවෙන් විශේෂ ප්‍රතිඥාවක් දීලා බලයට ආපු කණ්ඩායමක් විධියට ඔබතුමන්ලාගෙන් මේ කරුණු ටික දැනගන්න මම කැමැතියි.

ප්‍රධාන වශයෙන් මම ඉස්සෙල්ලාම කියපු විධියට මේ සම්බන්ධව අධ්‍යයනය කරලා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද කියන එක මේ ගරු සභාවට දැනගන්න අවස්ථාව සලසා දෙන්න. ඒ වාගේම මම කලින් කියපු පසුගිය කාලයේ කළ පොහොර සෑදීම, ඉඩම් බෙදීම තුළ යම්කිසි අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා නම් ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙලා අදාළ පුද්ගලයන්ට දඬුවම් ලබා දෙන්න කටයුතු කරන්නත් ඔබතුමන්ලා සූදානම්ද කියන එකත් මට පොඩ්ඩක් දැනගන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමා කියන කාරණය හරි. මේ විෂයය පැවරිලා තිබෙන නියෝජ්‍ය ඇමතිවරයා විධියට මම LRC එකත් එක්ක මේ ගැන කථා කළා. ඔබතුමාගේ පළමුවැනි ප්‍රශ්නයෙන් ඇහුවේ LRC එක සතු ඉඩම් කීයක් තිබෙනවාද කියලායි. නමුත් ඒකට හරි උත්තරයක් මට එතැනින් ලැබුණේ නැහැ. ඒ සම්බන්ධයෙන් තොරතුරු නැහැ වාගේම ඒකේ සංකීර්ණතාවක් තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, LRC එකට අහවල් ඉඩම පැවරෙනවා කියලා දුන්නාම ඒ ඉඩමේ පත්ඉරුවේ අක්කර 10ක් තිබෙනවා කියලා අපි හිතමු. නමුත් මැනලා බැලුවාම අක්කර 10ක් නැහැ. ඒ වාගේම තමයි සමහර විට අක්කර 10ක් තිබෙනවා කියලා ඉඩම පවරාගන්නවා. නමුත් ඒ ප්‍රමාණය අක්කර 10ට වැඩියි. ඒ නිසා සමහර තැන්වල සංකීර්ණතාවක් තිබෙනවා, LRC එකට අයත් ඉඩම්වල ප්‍රමාණය කොච්චරද කියන එක සම්බන්ධයෙන්.

ඒ වාගේම නිසි ලේඛන නැතුව මේ ආයතනය හරි විධියට ක්‍රියාත්මක නොවන නිසා අවිධිමත් ප්‍රශ්නයකුත් මෙතැන තිබෙනවා. ඒ නිසා ඇත්තටම LRC එක දන්නේ නැහැ, LRC එකේ ඉඩම් මොනවාද කියලා. සමහර විට මේවා අවුරුදු 30කට බදු දෙන ඒවා. ඒ නිසා වසර ගණනාවක් ගත වන විට LRC එකට වාර්තා වෙන්නේ නැහැ, මේවායේ තත්ත්වය කොහොමද කියලා. ඒක තමයි අපිළිවෙළ. එහෙම තමයි මේ ආයතනය පවත්වාගෙන ගිහිල්ලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන කාරණය හරි. ඒ නිසා මේ විධිමත් කිරීම අනිවාර්යයි. අපි ඒ සඳහා මැදිහත් වෙමින් ඉන්නවා.

විශේෂයෙන්ම ඔබතුමා කිව්වා වාගේ LRC එකේ අරමුදලේ මුදල් යොදා ගනිමින් කාබනික පොහොර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබෙනවා. කැබිනට් තීරණයක් අනුව තමයි ඒක පටන් ගෙන තිබෙන්නේ. ඒ වාගේම ඒ ව්‍යාපෘතිය අසාර්ථක වුණා කියලා එහි වැඩකටයුතු නවත්වා තිබෙන්නේත් කැබිනට් තීරණයක් අනුවයි. ඒ සම්බන්ධව හොයන්න කමිටුවක් පත් කරලා තිබෙනවා. මෙම කාබනික වගා ව්‍යාපෘතියේ අසාර්ථකත්වය සහ එහිදී සිදුවෙච්ච අකටයුතුකම් සම්බන්ධයෙන් ඒ කමිටුව විසින් දැනට කරුණු හොයමින් පවතිනවා. ඒ කමිටුව මන්දගාමී එකක් කියලා අපි පිළිගන්නවා. එම නිසා ඒ සඳහාත් අපි ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණය හරි. ජනාධිපතිගේ සිට ඔට්ටු වෙන්නේ ඉඩම් එක්ක. ඉඩම් ගන්නවා, හිතවතුන්ට දෙනවා, විකුණනවා, කොමිස් ගන්නවා. ඔන්න ඔය වාගේ දේවල් තමයි වෙන්නේ. ඉඩම් කියන්නේ, ප්‍රධාන දෙයක්. ඒකෙන් තමයි මේ ගේම යන්නේ. ඉඩම් සම්බන්ධව වෙච්ච දේවල් ගොඩක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි කටයුතු කරමින් ඉන්නවා. අපි මේ ආයතනය විධිමත් කරනවා.

ඒ වාගේම තමයි 2015 වර්ෂයේ ඉඳලා මේ දක්වාම LRC එකෙන් ලබා දී තිබෙන ඉඩම් කාටද දුන්නේ, මොන පදනමක් මතද දුන්නේ, ඔය කියන ව්‍යාපෘතිය සිද්ධ වෙනවාද කියලා සොයා බැලීම සඳහා අපි කමිටුවක් පත් කර තිබෙනවා. ඒ අනුව ඉඩම් ලබා දීම මාස 3ක කාලයකට තාවකාලිකව අපි නවත්වා තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කරලා අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්නත් සූදානම් වෙනවා. ඒක තමයි LRC එක සම්බන්ධයෙන් අපි කටයුතු කළ විධිය.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිබඳව දැනගන්න අපටත් අවස්ථාව ලබා දෙනවා නම් සතුටු වෙනවා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි ඔබතුමාත් දන්නවා, පසුගිය රජය කාලයේ හිටපු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් ඔප්පු ලබා දීම සම්බන්ධව යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ බව. මේ රටේ ජනතාවට තිබුණු දැවෙන ප්‍රශ්නයක් තමයි, තමන් පදිංචි වෙලා ඉන්න ඉඩමට හෝ තමන් අත්පත් කරගෙන ඉන්න ඉඩමට සින්නක්කර ඔප්පුවක් නොමැති වීම. විශේෂයෙන්ම ඔබතුමාත් දන්නවා, මෙය අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු ලංකාව පුරාම විශාල වශයෙන් තිබෙන දැවෙන ප්‍රශ්නයක් බව. තමන් පදිංචි ඉඩමට, තමන් සතු ඉඩමට නිසි බලපත්‍රයක්, නිසි ඔප්පුවක් නොමැති තත්ත්වයට ඒ ජනතාව අද පත් වෙලා තිබෙනවා.

පසුගිය කාලයේදී "උරුමය" වැඩසටහන ක්‍රියාත්මක වුණා. එහිදී ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය වේගවත් වුණා. එලෙස ඔප්පු ලබා දෙන්න තෝරා ගත්තේ ඉඩම් සඳහා මොකුත්ම බලපත්‍රයක් නොමැති අය නොවෙයි. "ජය භූමි" ඔප්පු හෝ "ස්වර්ණ භූමි" ඔප්පු හෝ මොකක් හෝ බලපත්‍රයක් තිබිච්ච අය තමයි එතැනදී තෝරා ගත්තේ. හැබැයි, ඔවුන් මේ වෙනකොට ඒකෙන් බැට කාලා තිබෙනවා. සින්නක්කර ඔප්පු ලබා ගැනීමේ අභිලාෂයෙන් ඒ බොහෝ පිරිස් තමන් ළඟ තිබිච්ච "ජය භූමි" ඔප්පුව, "ස්වර්ණ භූමි" ඔප්පුව රජයට භාර දීලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පසුගිය අප්‍රේල්වල ඉඳලා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔව්. දැන් අවුරුද්දකට ආසන්න කාලයක් වෙනවා, ජනතාව සතුව ඔප්පුවක් නැහැ. ඔප්පුවක් ලබා ගන්න මෙච්චර වෙර වීරිය දරන්නේ, අද තිබෙන ආර්ථික තත්ත්වයත් එක්ක ඒ ඔප්පුව උගස් කරලා තමන්ගේ ව්‍යාපාර දියුණු කරගන්න, එහෙම නැත්නම් තමන්ගේ දරුවෙක් පිට රට යනකොට ඒ දරුවා වෙනුවෙන් funds සපයා ගන්න වෙන්න පුළුවන්. ඒ සඳහා බොහෝ අවස්ථාවල පාවිච්චි කරන්නේ තමන් සතු ඉඩම. ඒ නිසා අද විශාල පිරිසක් අපහසුතාවට පත් වෙලා ඉන්නවා. ආණ්ඩු වෙනස්වීම, මැතිවරණ ක්‍රියාවලිය යන කාරණාත් එක්ක ජනාධිපතිතුමාට අත්සන් කිරීම සඳහා ඔප්පු විශාල ප්‍රමාණයක් ගොඩ ගැහිලා තිබෙන බව කියනවා. ඒ නිසා හැකි ඉක්මනින් ඒ ඔප්පු ටික ලබා දීමේ වැඩ පිළිවෙළක් ඔබතුමන්ලා විසින් ක්‍රියාත්මක කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු මන්ත්‍රීතුමනි, පර්චස් 10ක, 15ක, 20ක වාගේ නිවාස හදාගෙන තිබෙන ඉඩම්වලට දෙන සමහර ඔප්පු LRC එකේ දැනටමත් සූදානම්න් තිබෙනවා. නමුත්, අපි LRC එකේ ඉඩම් සම්බන්ධව කරන පරීක්ෂණය නිසා ඒ ඔප්පු ලබා දීමත් නතර වෙලා තිබෙන බව මම පිළිගන්නවා. ඒ කටයුත්ත විධිමත් කිරීම සඳහා කාලයක් යනවා. මම මෙය අවස්ථාවක් කර ගන්නවා, ඒ අපහසුතාවට පත්වන ජනතාවට කනගාටුව ප්‍රකාශ කරන්නත්. නමුත් LRC එකෙන් දෙන පෞද්ගලික මට්ටමේ ඔප්පු, ඒ කියන්නේ නිවාස සඳහා ඔප්පු ලබා දීම -ඒ ටික විතරක් නිදහස් කිරීම- කඩිනම් කරන්න අපි කටයුතු කරනවා. අපි පරීක්ෂණයට භාජන කරන්නේ විශාල ව්‍යාපෘති සඳහා ලබා දුන් ඉඩම් පමණයි. සාමාන්‍ය මිනිසුන්ට ඔප්පු ලබා දෙන එක ඉක්මනින් clear කර ගන්න අපි කටයුතු කරනවා. ඒ අනුව LRC එකෙන් ලබා දෙන ඔප්පු නුදුරේදීම අපි නිදහස් කරනවා.

ඔබතුමා, "උරුමය" වැඩසටහන සම්බන්ධයෙනුත් ඇහුවා. උරුමය වැඩසටහන යටතේ ලබා දෙන නිදහස් දීමනා පත්‍රය සම්බන්ධයෙනුත් විශාල ගැටලුවක් තිබෙනවා. මොකද, ඒ යටතේ ලබා දෙන නිදහස් දීමනා පත්‍රයේ කිසිදු කොන්දේසියක් නැහැ. මේ සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ කියන කාරණය ගැන මම පෞද්ගලිකව ඉඩම් කොමසාරිස්වරු කිහිපදෙනෙකු සමඟ කථා කළා. ඉඩම් සම්බන්ධයෙන් ප්‍රවීණතාවක් දක්වන ප්‍රාදේශීය ලේකම්වරුන් කිහිපදෙනෙකු සමඟත් කථා කළා, ඉඩම් නිලධාරින් 10දෙනෙක්, 12දෙනෙක් එක්කත් කථා කළා. සමහර අයගෙන් ලිඛිතවත් ඊට අදාළ තොරතුරු ගත්තා. ඒ හැමදෙනාම කියන්නේ කිසිදු කොන්දේසියක් නැතිව නිදහස් දීමනා පත්‍ර ලබා දීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙන බවයි. එතකොට ඉඩම් අවභාවිත කරන්න, විකුණන්න, අන්සතු කරන්න හැකි වෙනවා. අපි මේ ගැන ක්‍රියාමාර්ග ගන්න ගියාම ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරින් ඇවිල්ලා මට කිව්වා, ඒක කරන්න එපා, නිදහස් දීමනා පත්‍රය ලබා දීම ඉඩම් සම්බන්ධයෙන් හරිම අනතුරුදායකයි, ඒ නිසා විකල්පයකට යන්න පුළුවන් නම් හොඳයි කියලා. ඒ අනුව, උරුමය වැඩසටහන යටතේ නිදහස් දීමනා පත්‍රයක් ලබා දීම ඇත්තටම ගැටලුවක් වෙලා තිබෙනවා. අපි දැන් මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් යනවා. දැන් උරුමය වැඩසටහන යටතේ ඔප්පු 27,000ක් එළියට ගිහිල්ලා තිබෙන්නේ. ඒ වාගේම තවත් applications විශාල සංඛ්‍යාවක් මේ වනකොට අරගෙන තිබෙනවා. ඒක කොහොමද විසඳන්නේ කියන එක සංකීර්ණ ගැටලුවක් වෙලා තිබෙනවා. මේ ගැන අපි ඉඩම් විෂයය සම්බන්ධ ප්‍රවීණයන්ගේ අදහස් ලබා ගනිමින් සිටිනවා. ඇත්තටම අපි මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ක්‍රියාත්මක වෙමින් සිටිනවා. ඒ අනුව නුදුරේදීම ඒ ඔප්පු ලබා දීමට අවශ්‍ය පියවර අපි ගන්නවා කියලා ඔබතුමාට කියන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අපේ නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙනකොට කියපු කාරණය ඉතාම නිවැරැදියි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දන්නේ නැහැ, ඔවුන් සතු ඉඩම් ප්‍රමාණය කොපමණද කියලා. ඒක බරපතළ ගැටලුවක්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ වාගේම මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, අක්කර 50 ඉඩම් නීතිය යටතේ පරම්පරාගතව ඉඩම්වල අයිතිය ලැබුණු අයට, ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ ඉඩම් ලබා දිය යුතු පවුල් 500ක්, 600ක් විතර සිටි බව.

මමත් ඉඩම් ඇමති ලෙස කටයුතු කළ කාලයේ ඒක කාල සීමාවක් දාලා, දීලා අවසන් කරන්න හැදුවා. හැබැයි, අපේ ආණ්ඩුව නැති වුණා. අපි පසුගිය ආණ්ඩුවේ ඇමතිවරුන්ට ඒ ගැන දිගින් දිගටම මතක් කළා. ඇත්තවශයෙන්ම ඉඩම් හිමියන් හැටියට හොඳට හිටපු අය අසරණ වෙලා බස්වල එනවා. ඒ වාගේම ඔවුන් ඉතාම දුක්ඛිත ජීවිත ගත කරනවා. ඒ ප්‍රශ්නය ඉතා ඉක්මනට ඔබතුමන්ලා විසඳලා දෙනවා නම් ඒක ලොකු පින්කමක්.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, ඒ ඉඩම් හිමියෝ සම්බන්ධයෙන් විතරක් නොවෙයි, LRC එකට සම්බන්ධ සියලු ඉඩම් හිමියන්ගේ ඔප්පු ලබා දීම, ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් අපි විධිමත් වැඩ පිළිවෙළක් හදන්න සාකච්ඡා කරනවා. ඒක අපි විධිමත් පරිදි කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -89/2024- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කින්නියා ලංවීම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය: විදුලිය ඇනහිටීම්
## கிண்ணியா மின் பாவனையாளர் சேவை நிலைய ஆளுகைப் பிரதேசம்: மின் விநியோகத் துண்டிப்பு
KINNIYA CEB CONSUMER SERVICE CENTRE AREA: POWER OUTAGES

319/2024

**6. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2023.01.01 සිට 2024.12.20 දක්වා කින්නියා විදුලි පාරිභෝගික මධ්‍යස්ථාන බලප්‍රදේශය තුළ විදුලි සැපයුම විසන්ධි කරන ලද පැය සංඛ්‍යාව එක් එක් ප්‍රදේශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

(ii) ඉහත විසන්ධි කිරීම් හේතුවෙන් අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනය හදාරන සිසුන් හා රැකියා කරන්නන් ඇතුළු එම ප්‍රදේශවල මහ ජනතාව දැඩි ලෙස පීඩාවට පත් වූ බව පිළිගන්නේද;

(iii) මෙම බලප්‍රදේශයේ විදුලි සැපයුම විසන්ධි කිරීම් නිරතුරුවම සිදු වන බව දන්නේද;

(iv) එසේ නම්, එයට හේතු කවරේද;

(v) ඒ සඳහා විසඳුම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මුද්‍රිත විදුලි බිල්පත වෙනුවට කෙටි පණිවිඩ මාර්ගයෙන් මාසික විදුලි බිල නිකුත් කිරීමේ ක්‍රමවේදයක් තිබෙන බව පිළිගන්නේද;

(ii) ඒ හේතුවෙන් ස්මාට් ජංගම දුරකථන නොමැති මෙන්ම වයෝවෘද්ධ විදුලි පාරිභෝගිකයන් දැඩි අපහසුතාවකට ලක් වන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ වෙනුවට පෙර පරිදි මුද්‍රිත බිල්පතක් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2023.01.01ஆம் திகதி தொடக்கம் 2024.12.20ஆம் திகதி வரையான காலப்பகுதியில் கிண்ணியா மின் பாவனையாளர் சேவை நிலைய ஆளுகைப் பிரதேசத்தில் மின் விநியோகம் துண்டிக்கப்பட்ட மணித்தியாலங்களின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேசத்துக்கு அமைவாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி மின் துண்டிப்புக் காரணமாக இணையத்தளம் ஊடாகக் கல்வி கற்கும் மாணவர்கள் மற்றும் வேலைக்குச் செல்வோர் உள்ளிட்ட அப்பிரதேசங்களில் வாழும் பொதுமக்கள் கடுமையாகப் பாதிக்கப்பட்டமையை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) தொடர்ச்சியாக இவ்வாளுகைப் பிரதேசத்தில் மின் விநியோகம் துண்டிக்கப்படுகிறது என்பதை அவர் அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) அதற்கான தீர்வுகள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அச்சிடப்பட்ட மின்கட்டணப் பட்டியலுக்குப் பதிலாக குறுஞ்செய்தி ஊடாக மாதாந்த மின்கட்டணப் பட்டியலை வழங்கும் முறையொன்று நடைமுறையில் உள்ளதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) அதன் காரணமாக சூட்டிகை (ஸ்மார்ட்) கைத்தொலைபேசிகளைக் கொண்டிராதோர் மாத்திரமன்றி வயோதிப மின் பாவனையாளர்களும் மிகுந்த சிரமத்துக்கு உள்ளாகின்றனர் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், அதற்குப் பதிலாக முன்னர் போன்றே அச்சிடப்பட்ட கட்டணப் பட்டியலை வழங்க நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the number of hours for which power supply had been disconnected in the Kinniya CEB Consumer Service Centre area from 01.01.2023 to 20.12.2024, separately for each area;

(ii) whether he accepts that the public in these areas including the students studying and people engaged in their jobs online were severely inconvenienced due to the disconnections referred to above;

(iii) whether he is aware that disconnection of the power supply to this area occurs frequently;

(iv) if so, the reasons for the frequent power outages referred to above; and

(v) whether remedial measures have been taken regarding the matter so far?

(b) Will he also inform this House -

(i) whether he accepts that there is a mechanism of issuing the monthly electricity bill via SMS instead of the printed electricity bill;

(ii) whether he accepts that the system in question causes significant inconvenience for elderly citizens as well as those without smartphones; and.

(iii) if so, whether he will take action to issue the printed electricity bill instead, as per the previous practice?

(c) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) විදුලි සැපයුමෙහි ගුණාත්මකභාවය තීරණය කිරීම සඳහා විදුලි ඇනහිටීමක කාල සීමාව හෝ බලපෑමට ලක් වූ පාරිභෝගිකයින් සංඛ්‍යාව පමණක් නිවැරදි මිනුමක් ලෙස යොදා ගත නොහැකි බැවින්, විදුලිබල අංශයේ SAIDI (System Average Interruption Duration Index) සහ SAIFI (System Average Interruption Frequency Index) යන දර්ශක භාවිත කරයි.

විදුලි පාරිභෝගිකයන්හට ගුණාත්මක, විශ්වාසදායී විදුලි සැපයුමක් ලබා දීම සඳහා, මෙම දර්ශක

ලංකා විදුලිබල මණ්ඩලය තුළ ද කාලානුරූපව අධීක්ෂණය කරන අතර, ත්‍රිකුණාමලය ප්‍රදේශය සහ කින්නියා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ එම අගයන් මෙසේයි.

| දර්ශකය | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | ත්‍රිකුණා මලය ප්‍රදේශය | කින්නියා පාරිභෝගි ක සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය | ත්‍රිකුණා මලය ප්‍රදේශය | කින්නියා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය |
| SAIDI (මසකට එක් ගනුදෙනුකරු වෙකුට සිදුවන සාමාන්‍ය බාධා කිරීම් පැය ගණන) | 5.62 | 1.81 | 5.36 | 1.34 |
| SAIFI (මසකට එක් ගනුදෙනුකරු වෙකුට සිදුවන සාමාන්‍ය බාධා කිරීම් වාර ගණන) | 3.09 | 1.328 | 2.18 | 0.876 |

විවිධ හේතුන් මත විදුලිය විසන්ධිවීම් සිදු වන අතර ඒවා නම්;

1. උපපොළ පෝෂක විසන්ධිවීම්.
2. අයහපත් කාලගුණය, අනතුරු වැනි හේතුන් මත සිදුවන බිඳ වැටීම්.
3. නඩත්තු කටයුතු හා නව ඉදිකිරීම් සඳහා සැලසුම් කර සිදු කරන විසන්ධි කිරීම්. (පාරිභෝගිකයෙකුහට මසකට දින දෙකක උපරිමයකට යටත්ව දින තුනකට පෙර පාරිභෝගිකයන් දැනුවත් කිරීමෙන් පසු සිදු කරයි.)

මෙසේ කින්නියා පාරිභෝගික සේවා බලප්‍රදේශය තුළ 2023 හා 2024 වසරවල විසන්ධිවීම් පහත පරිදි වේ.

| වසර | උපපොළ පෝෂක විසන්ධිවීම් | බිඳ වැටීම් | සැලසුම් කර සිදු කරන විසන්ධි කිරීම් |
|---|---|---|---|
| 2023 | පැය 3 විනාඩි 4 | පැය 363 විනාඩි 16 | පැය 478 විනාඩි 26 |
| 2024 | පැය 0 විනාඩි 36 | පැය 213 විනාඩි 52 | පැය 264 විනාඩි 19 |

සැලසුම් කර සිදු කරන විසන්ධි කිරීම් අවස්ථාවන්හිදී විකල්ප සැපයුම් මාර්ග භාවිත කර විදුලි පාරිභෝගිකයන්ට සිදු වන බලපෑම අවම කිරීමට කටයුතු කරන බැවින් බිඳ වැටුම් සහ සැලසුම් කළ විසන්ධි කිරීම් දීර්ඝ වුවද කින්නියා පාරිභෝගික සේවා බලප්‍රදේශය තුළ පාරිභෝගිකයින් බලපෑමට ලක් නොවේ.

(ii) ගුණාත්මක විදුලි සැපයුමක් ලබා දීම සඳහා ඉහත (i) සඳහන් පරිදි විදුලිය විසන්ධි කරන අතර, රජයේ විභාග පැවැත්වෙන කාල සීමාවන් හා විශේෂ අවස්ථාවන්වලදී හදිසි බිඳ වැටුමකදී හැරෙන්නට විදුලිය විසන්ධි කිරීමක් සිදු කරනු නොලබයි.

(iii) ඉහත (අ) (i) පිළිතුර අදාළ වේ.

(iv) ඉහත (අ) (i)න් පිළිතුරු සපයා ඇත.

(v) ඉහත (අ) (i)න් පිළිතුරු සපයා ඇත.

(ආ) (i) පිළිගනිමි. සමහර ප්‍රදේශවල එසේ ක්‍රියාත්මක නොවේ.

(ii) එසේ බිල්පත් ඉල්ලුම් කරන විදුලි පාරිභෝගිකයන් වෙත ලිඛිත සටහනක් ලබා දීමට හා ඉදිරියේදී එවැනි විදුලි පාරිභෝගිකයන් වෙත බිල්පත් සටහනක් (A hang card) මනුව අසල රඳවා තැබීමට ද කටයුතු සූදානම් කර ඇත.

(iii) ඉහත (ii) සඳහන් පරිදි කටයුතු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, தரவின்படி திருகோணமலை மாவட்டத்தில் எங்களுடைய கிண்ணியா பிரதேசத்தில்தான் கூடுதலான மின் விநியோகத் துண்டிப்பு இடம்பெறுவதாகக் கிடைத்த தகவலுக்கு இணங்கத்தான் என்னால் இந்த வினா கேட்கப்பட்டது. திருகோணமலை மாவட்டத்தில் அநேகமான உள் வீதிகளில் கம்பி மூலம்தான் மின் விநியோகம் வழங்கப்பட்டிருக்கின்றது. இதனால் சிலர் மின்சாரத் தாக்குதலுக்கு உள்ளாகி இருக்கின்றார்கள். அதுமட்டுமல்ல, அங்குள்ள மக்கள் சில அசௌகரியங்களையும் எதிர்நோக்குகின்றார்கள். எனவே, மின்கம்பிகளை அகற்றி, 'வயர்' மூலம் மின் விநியோகத்தைச் செய்வதற்கான செயற்பாடுகளை முன்னெடுக்க முடியுமா? அதற்கான நடவடிக்கைகள் இப்பொழுது உங்களுடைய அமைச்சால் முன்னெடுக்கப்படுகின்றதா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු මන්ත්‍රීතුමනි, මට ඒ ගැන සොයා බලන්න වෙනවා. මොකද, විදුලි කම්බි තමයි ගොඩක් තැන්වල තිබෙන්නේ. ඒ කියන්නේ overhead එක. ගෙදරට සම්බන්ධ කරනකොට insulate කරපු කේබල් එකක් තමයි දෙන්නේ. ඔබතුමා කියන්නේ නිවසට හෝ ව්‍යාපාර ස්ථානයට සම්බන්ධ කරන කේබල් එක ගැනද? ඒ ගැන මම සොයා බලන්නම්. මොකද, සාමාන්‍යයෙන් ලංකාවේ හැම තැනකටම දෙන්නේ insulate කරපු එකක්. ඒක මටත් විශ්වාස කරන්න බැරි ප්‍රශ්නයක්. ඒ නිසා මම ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගන්නම්.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

ගරු ඇමතිතුමනි, Muslim areas කියන්නේ ගොඩක් කට්ටිය එකට ඉන්න ප්‍රදේශයක්. ඒ වාගේ ප්‍රදේශවල කම්බි නිසා ගොඩක් incidents වෙලා තිබෙනවා. පරණ තොරතුරු ලබා ගත්තා නම් ඔබතුමාට ඒ සම්බන්ධයෙන් පැහැදිලි වෙයි. ඒ වාගේම ගොඩක් තැන්වල මම හිතන විදියට දැන් අලුතින් wiring system එකත් දමාගෙන එනවා. ඒ නිසා පළමුවැනි වතාවේ කරනකොට මිනිස්සු වැඩිපුර ඉන්න ප්‍රදේශවලට ප්‍රමුඛතාව දුන්නා නම් හොඳයි කියන එක තමයි අපේ අදහස.

கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினா:

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

இன்று தெற்காசியாவிலேயே அதிக மின் கட்டணம் அறவிடப்படுகின்ற நாடாக எங்களுடைய நாடு காணப்படுகின்றது. மின் கட்டணத்தைக் குறைப்பதாக அரசாங்கம் பல்வேறு சந்தர்ப்பங்களில் சொல்லியிருக்கிறது. அந்த அடிப்படையில், மின் கட்டணக் குறைப்பு நடவடிக்கைகளை எந்தளவில், எவ்வாறு சம்பந்தப்பட்ட அமைச்சு முன்னெடுக்கிறது என்பதைத் தெளிவுபடுத்த முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ජනවාරි 17වැනි දා රෑ 12.00න් පස්සේ විදුලි බිල අඩු කිරීමට අපි කටයුතු කරලා තිබෙනවා. ඊළඟ බිල්පතත් එක්ක හැමෝටම එහි ප්‍රතිඵලය ලැබෙයි. එහිදී ඒකක 0-30 දක්වා රුපියල් 6ක්ව තිබුණු ඒකකයක මිල රුපියල් 4ක් වෙනවා; ඒකක 31-60 දක්වා රුපියල් 9ක්ව තිබුණු ඒකකයක මිල රුපියල් 6ක් වෙනවා; ඒකක 61-90 දක්වා රුපියල් 18ක්ව තිබුණු ඒකකයක මිල රුපියල් 14ක් වෙනවා; ඒකක 91-120 දක්වා රුපියල් 30ක්ව තිබුණු ඒකකයක මිල රුපියල් 20 දක්වා අඩු වෙනවා; ඒකක 121-180 දක්වා රුපියල් 42ක්ව තිබුණු ඒකකයක මිල රුපියල් 33 දක්වා අඩු වෙනවා; ඒකක 180ට වැඩි ගෙවල් හෝ ආයතන සඳහා රුපියල් 65ක්ව තිබුණු ඒකකයක මිල රුපියල් 52ට අඩු වෙනවා. ඒ විධියට සාමාන්‍යයෙන් ගත්තොත් විදුලි ගාස්තුව අඩුවීම සියයට 21ක් වුණාට, කර්මාන්ත හා හෝටල් අංශයට සියයට 31ක මිල අඩුවීමක් වෙනවා. 17වැනි දා රෑ 12.00 සිට එම මිල ක්‍රමය ක්‍රියාත්මක වෙනවා.

## කල්මුණේ - උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය: පරිපාලන තත්ත්වය
### கல்முனை - வடக்கு பிரதேச செயலகம்: நிர்வாக நிலை
### KALMUNAI-NORTH DS DIVISION: ADMINISTRATIVE STATUS

320/2024

**7. ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කල්මුණේ - උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, 1989දී උප දිසාපති කොට්ඨාසයක් ලෙස ස්ථාපිත කර, පසුව 1993.03.17 දිනැති අංක 93/600/034 හා 1993.03.31 දිනැති අංක 93/600/034(I) යන අමාත්‍ය මණ්ඩල සන්දේශ සහ 1993.07.09 දිනැති අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ වාර්තාව ද පදනම් කරගෙන 1993.09.28 දිනැති අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද බවත්;

(ii) ඒ අනුව, එය ස්වාධීන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ලෙස වර්ෂ 34කට වැඩි කාලයක් ක්‍රියාත්මක වන බවත්;

(iii) කල්මුණේ-උතුර (දෙමළ කොට්ඨාසය) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, කල්මුණේ-දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප කාර්යාලයක් ලෙස පහත හෙළීමට උත්සාහ කරන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත (අ) (iii)හි සඳහන් පහත හෙළීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, එම පහත හෙළීමේ පදනම කවරේද;

(iv) අමාත්‍ය මණ්ඩල තීරණයක් අබිබවා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්, උප කාර්යාලයක් ලෙස පහත හෙළීමට අමාත්‍යාංශ ලේකම්වරයෙකුට/ රජයේ නිලධාරියෙකුට හැකියාවක් තිබේද;

(v) එසේ නම්, එහි නීත්‍යානුකූලභාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவானது, 1989இல் உப மாவட்ட செயலகப் பிரிவாக தாபிக்கப்பட்டதன் பின்னர் 1993.03.17ஆம் திகதிய 93/600/034ஆம் இலக்க மற்றும் 1993.03.31ஆம் திகதிய 93/600/034(I) ஆம் இலக்க அமைச்சரவை நிருபங்கள் மற்றும் 1993.07.09ஆம் திகதிய அமைச்சரவை உபகுழுவின் அறிக்கை என்பவற்றை அடிப்படையாகக் கொண்டு 1993.09.28ஆம் திகதிய அமைச்சரவையின் அங்கீகாரத்துடன் ஒரு பிரதேச செயலகமாகத் தரமுயர்த்தப்பட்டது என்பதையும்;

(ii) அதற்கமைய, 34 வருடங்களுக்கும் மேலாக அது ஒரு சுயாதீனமான பிரதேச செயலகமாக இயங்கி வருகின்றது என்பதையும்;

(iii) கல்முனை - வடக்கு (தமிழ்ப் பிரிவு) பிரதேச செயலகத்தை, கல்முனை - தெற்கு பிரதேச செயலகத்தின் ஓர் உப அலுவலகமாகத் தரமிறக்குவதற்கான முயற்சிகள் மேற்கொள்ளப் பட்டு வருகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேலே (அ)(iii)இல் குறிப்பிடப்பட்டுள்ளவாறு தரமிறக்குவதற்கு அமைச்சரவைத் தீர்மான மொன்று மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி அமைச்சரவைப் பத்திரம் சமர்ப்பிக்கப்படுமா என்பதையும்;

(iii) இன்றேல், இத்தகைய தரமிறக்கத்தின் அடிப்படை யாது என்பதையும்;

(iv) அமைச்சரவைத் தீர்மானத்தை விஞ்சி, பிரதேச செயலகமொன்றை, உப பிரதேச செயலகமாகத் தரமிறக்குவதற்கு ஓர் அமைச்சின் செயலாளருக்கு/அரச அலுவலரொருவருக்கு இயலுமையுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அதன் சட்டபூர்வ தன்மை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) Kalmunai North, which was established as an Assistant Government Agent Division in 1989, has been upgraded to a Divisional Secretary's Division with Cabinet Approval dated 28.09.1993 given based on the Cabinet Memoranda No. 93/600/034 dated 17.03.1993 and No. 93/600/034(I) dated 31.03.1993 and the Cabinet Subcommittee Report dated 09.07.1993;

(ii) it has been functioning as an independent Divisional Secretariat for more than 34 years accordingly; and

(iii) that there are attempts to downgrade the Kalmunai-North Divisional Secretary's Division (Tamil Division) to the level of a sub-office of the Kalmunai-South Divisional Secretary's Division?

(b) Will he inform this House -

(i) whether a Cabinet decision has been taken to downgrade the Divisional Secretary's Division mentioned in (a)(iii) above;

(ii) if so, whether he will submit the said Cabinet Paper;

(iii) if not, the basis for the decision regarding such downgrading;

(iv) whether a Ministry Secretary/Government official is vested with the authority to override a Cabinet decision and downgrade a Divisional Secretary's Division to the level of a sub-office; and

(v) if so, the legal basis of such measure?

(c) If not, why?

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)

(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) කල්මුණේ - උතුර ඇතුළුව සහකාර ආණ්ඩුවේ ඒජන්ත කාර්යාල 28ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් ක්‍රියා කිරීම පිණිස පරිවර්තනය කිරීම සඳහා 1993.07.28 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

(ii) එලෙස අනුමැතිය ලබා දී තිබුණද මේ දක්වා එම කාර්යාලය ක්‍රියාත්මක වී ඇත්තේ උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙසිනි.

(iii) කල්මුණ - උතුර උප කාර්යාලය, කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උප කාර්යාලයක් ලෙස මේ වනවිටත් ක්‍රියාත්මකව පවතින අතර, කල්මුණ - උතුර උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ප්‍රාදේශීය ලේකම් තනතුරක් අනුමතව නොමැත. ඒ සඳහා සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරක් පමණක් අනුමතව ඇති අතර, මේ දක්වා සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් එහි රාජකාරි කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව කල්මුණ - උතුර උප කාර්යාලය පහත හෙළීමට උත්සාහයක් ගෙන නොමැත.

(ආ) (i) පහත හෙළීමට තීරණයක් ගෙන නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) නැත.

(v) අමාත්‍ය මණ්ඩල තීරණ පදනම් කර ගනිමින් අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීමා මායිම් ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

තවද, කල්මුණේ උතුර උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ වන තෙක් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස ක්‍රියාත්මක වන අතර, මේ සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩු 03ක් ගොනු වී ඇත. අභියාචනාධිකරණ නඩු අංක CA/Writ/300/2018, අභියාචනාධිකරණ නඩු අංක CA/Writ/67/2023, අභියාචනාධිකරණ නඩු අංක CA/Writ/645/2023.

(ඇ) අදාළ නොවේ.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)

(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ அமைச்சர் அவர்களே, நான் உங்களிடம் கேட்ட கேள்விக்கு நீங்கள் சரியான பதிலைத் தரவில்லை என்றுதான் நினைக்கின்றேன்.

1993ஆம் ஆண்டு அமைச்சரவையின் அனுமதியுடன் இப்பிரதேச செயலகமானது முழுப் பிரதேச செயலகமாகத் தரமுயர்த்தப்பட்டதாக அறிவிக்கப்பட்டது. இந்த விடயம் Cabinet Memorandum, Cabinet Paperஇல் குறிப்பிடப்பட்டு இருக்கின்றது. இந்தப் பிரதேச செயலகமானது, கிட்டத்தட்ட 34 வருடங்களாக 29 GN Divisions, பிரதேச செயலாளர், 329 staffs, கட்டிடங்கள் என முழு வளங்களையும் உள்ளடக்கியதாக இருக்கின்றது. இந்தப் பிரதேச செயலகத்தை உப பிரதேச செயலகமாகத் தரமிறக்குவதற்கு அமைச்சின் செயலாளருக்கு அல்லது அரசாங்க அதிபருக்கு அனுமதி உண்டா? அல்லது இந்தப் பிரதேச செயலகம் கல்முனை தெற்கு பிரதேச செயலகத்தோடு இணைந்துதான் செயற்படவேண்டுமென Cabinet approval இருக்கின்றதா? அல்லது இதனை உப அலுவலகமாகத் தரமிறக்குவதற்கான ஏதேனும் தீர்மானமொன்று அமைச்சரவையால் நிறைவேற்றப்பட்டு இருக்கின்றதா? என நான் கேட்கின்றேன்.

2019க்கு முதல் பொதுநிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சின் websiteஇல் வெளியிடப்பட்டிருந்த 331 பிரதேச செயலகங்களில் இந்தப் பிரதேச செயலகமும் உள்ளடக்கப்பட்டு இருந்தது. அதாவது, இந்தப் பிரதேச செயலகம் முழுப் பிரதேச செயலகமாகக் குறிப்பிடப்பட்டு இருந்தது. ஆனால், தற்போது அது உப பிரதேச செயலகமாக மாற்றப்பட்டு இருக்கின்றது. நீதிமன்றத்தில் case இருக்கும்பொழுது, இவ்வாறு மாற்ற முடியாது. ஆனாலும், மாற்றப்பட்டிருக்கின்றது. இது எப்படி? எனக் கேட்கின்றேன்.

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

அதுமாத்திரமன்றி, இலங்கையில் 27 பிரதேச செயலகங்கள் எல்லை நிர்ணயம் செய்யப்படாமல், Cabinet approval உடன் முழுப் பிரதேச செயலகங்களாக இயங்குகின்றன. அப்படி இருக்கையில், ஏன் கல்முனை வடக்கு பிரதேச செயலகத்துக்கு மட்டும் இந்தச் செயற்பாடு? எனக் கேட்கின்றேன். இந்த விடயம் தனிப்பட்ட அரசியல் நோக்கத்துக்காக முன்னெடுக்கப்படுகின்றதா அல்லது அந்தப் பிரதேசத்திலுள்ள மக்களுக்கு நிருவாக ரீதியிலான விடயங்கள் கிடைக்கப்பெறாமல் இருப்பதற்காக மேற்கொள்ளப்படுகின்றதா என்பதைத் தெளிவுபடுத்த முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධයෙන් දැනට අධිකරණයේ නඩු තුනක් විභාග වෙනවා. අධිකරණයේ විභාග වන නඩු තුනක් තිබෙන නිසා, විශේෂයෙන් කල්මුණේ උතුර සහ දකුණ කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක විධියට වෙන් වෙන්න,- දැනට උප කාර්යාලයක් විධියටයි තිබෙන්නේ. කොහොම වුණත් දෙපැත්තේම තිබෙන යෝජනා සහ ඉහත සඳහන් කළ නඩු නිසාම ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා එම අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වුණු ගමන් ඒ සම්බන්ධයෙන් ඉතා කඩිනමින් මැදිහත් වීමක් කරන්න රජය බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම එම අධිකරණ ක්‍රියාමාර්ග නිසා තමයි මේ පිළිබඳව අවසන් තීරණයක් ගන්න බැරිවෙලා තිබෙන්නේ.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ அமைச்சர் அவர்களே, இது Writ Application. நீதிமன்றத்தால் இன்னும் இடைக்காலத் தடையுத்தரவு வழங்கப்படவில்லை. அரசாங்கம் நினைத்தால் இதனை வழங்க முடியும். இதனை வழங்காமல் இருப்பதற்கு எந்தத் தடையுத்தரவும் இல்லை என சட்ட மா அதிபர் திணைக்களத்தால் சட்டத்தரணிகளுக்குச் சொல்லப்பட்டு இருக்கின்றது. அரசாங்கம்தான் இது தொடர்பில் முடிவு எடுக்கவேண்டும். Cabinet approvalஉடன் 30 வருடங்களுக்கும் மேலாக இயங்கும் இந்தப் பிரதேச செயலகத்துக்கான முழுமையான அதிகாரத்தைக் கொடுக்காமல் இருப்பது நியாயமா? எனக் கேட்கின்றேன். எல்லை நிர்ணயம் செய்யப்படாமல் எத்தனையோ பிரதேச செயலகங்கள் இருக்கின்றன. அதேபோன்று, இந்தப் பிரதேச செயலகத்துக்கும் செய்திருக்கலாம். அங்கு 2019ஆம் ஆண்டு கணக்காளருக்கான பதவி - cadre creation உருவாக்கப்பட்டு இருக்கின்றது. ஆனாலும், இன்றுவரை நிரந்தர கணக்காளர் ஒருவர் நியமிக்கப்படவில்லை; தற்காலிக கணக்காளர் ஒருவரே வந்து போகின்றார்.

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ඇත්තටම ඔබතුමා මතු කරන ප්‍රශ්නය නිවැරදියි. අපි මේ පිළිබඳව සාකච්ඡා කරලා අවසන් තීරණයක් ලබා දෙන්නම් පාර්ලිමේන්තුවට. මොකද, ඒ පිළිබඳ, ඒ ප්‍රදේශයේ ජනතාවට තිබෙන ගැටලු පිළිබඳවත් අපි සාකච්ඡා කරමින් සිටිනවා. මේකට කිසියම් සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ. ඒ නිසා අපි මේ පිළිබඳව අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරලා ඉදිරි පාර්ලිමේන්තු දිනයේදී ඔබතුමාට නිසි පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -323/2024- (1), ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## නිමි තේ සඳහා සෙස් බද්ද: 2024දී ඉපැයූ ආදායම
## தேயிலைக்கான 'செஸ்' வரி: 2024இல் ஈட்டப்பட்ட வருமானம்
## CESS LEVIED ON FINISHED TEA: INCOME EARNED IN 2024

324/2024

**9. ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව අපනයනය කරනු ලබන නිමි තේ සඳහා සෙස් බද්දක් අය කරනු ලබන බව දන්නේද;

(ii) මේ වනවිට තේ කිලෝ ග්‍රෑම් එකක් සඳහා අය කරනු ලබන සෙස් බද්ද කොපමණද;

(iii) 2024 වර්ෂයේදී එම සෙස් බද්ද මඟින් උපයන ලද ආදායම කොපමණද;

(iv) එම ආදායමෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ තේ පර්යේෂණ ආයතනය යන ආයතන වෙත ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් එම මුදල් වියදම් කර ඇති ආකාරය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலிருந்து ஏற்றுமதி செய்யப்படுகின்ற தேயிலைக்கு 'செஸ்' வரி அறவிடப்படுவதை அறிவாரா;

(ii) தற்பொழுது ஒரு கிலோகிராம் தேயிலைக்காக அறவிடப்படுகின்ற 'செஸ்' வரி எவ்வளவு;

(iii) 2024ஆம் ஆண்டில் மேற்படி 'செஸ்' வரி மூலமாக ஈட்டப்பட்ட வருமானம் எவ்வளவு;

(iv) மேற்படி வருமானத்திலிருந்து, இலங்கை தேயிலைச் சபை, சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபை மற்றும் தேயிலை ஆராய்ச்சி நிலையம் ஆகிய நிறுவனங்களுக்கு வழங்கப்பட்டுள்ள பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

(v) மேலே குறிப்பிடப்பட்ட ஒவ்வொரு நிறுவனமும் மேற்படி பணத்தொகையை செலவு செய்துள்ள விதம் தொடர்பிலான அறிக்கையொன்றைச் சமர்ப்பிப்பாரா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether he is aware that a cess is levied on finished tea exported from Sri Lanka;

(ii) the amount of cess levy that is imposed on one kilogram of tea at present;

(iii) the income that was earned through the imposition of the cess during the year 2024;

(iv) the amounts that have been given to the Sri Lanka Tea Board, the Tea Small Holdings Development Authority and the Tea Research Institute from that income, separately; and

(v) whether he will present a report on how each of the aforementioned institutes have spent those amounts of money?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) තේ සඳහා පහත පරිදි සෙස් බද්ද අය කරනු ලබයි.

- තේ තොග - bulk packaging - කිලෝග්‍රෑම් 10ට වැඩි ඇසුරුම් සඳහා සෙස් බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 10යි.
- කිලෝග්‍රෑම් 10ට අඩු අගය එකතු කළ ඇසුරුම් - value-added packs - සඳහා සෙස් බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 4යි.
- අපනයන සඳහා තේ කිලෝග්‍රෑම් 100ක් සඳහා Tea Medical Cess වශයෙන් ශත 35යි.
- ආනයන තේ සඳහා CIF අගය මත සියයට 10ක ප්‍රතිශතයක සෙස් බද්දක් අය කරනු ලබයි.

(iii) ශ්‍රී ලංකා රේගුවෙන් ලබා ගත් දත්ත අනුව 2024 වර්ෂයේදී තේ සඳහා සෙස් බද්ද මඟින් උපයන ලද මුළු ආදායම රුපියල් 1,618,237,620.00ක් වේ.

| සෙස් බද්ද (රු.) | |
|---|---|
| ආනයන | අපනයන |
| 8,538,154 | 1,609,699,466 |

(iv) සෙස් මුදල් ශ්‍රී ලංකා රේගුව විසින් එකතු කරන අතර එම මුදල් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යන ආයතන වෙත සෙස් බදු ආදායමෙන් මුදල් වෙන් කිරීමක් සිදු නොකෙරේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මට මතක හැටියට, සෙස් බදු මුදල් මා ප්‍රශ්නයේ සඳහන් කරපු ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ තේ පර්යේෂණ ආයතනය කියන ආයතන තුන සඳහා ඉතා දීර්ඝ කාලයක් තිස්සේ නිකුත් කරනු ලැබුවා. ගරු ඇමතිතුමනි, එය නැවතුණේ කුමන වසරේද, එම නැවතීමට ඉවහල් වූ කාරණය කුමක්ද කියන එක ගැන ඔබතුමාට අදහසක් තිබෙනවාද?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඔව්. එය එවකට පැවැති රජයන් ගත් තීන්දුවක් සහ මුදල් අමාත්‍යාංශය ඉල්ලීම් කරපු ආකාරයටයි සිදු වෙලා තිබෙන්නේ. කොහොම නමුත්, ඔබතුමා කිව්වා වාගේ 2011 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට සෙස් අරමුදලෙන් කිසිදු බදු මුදලක් ලැබිලා නැහැ.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඉතිහාසය පුරා සෙස් අරමුදල තේ කර්මාන්තයේ උන්නතිය සඳහා යොදා ගනු ලැබුවා. විශේෂයෙන් ලක්ෂ 30කට ආසන්න හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එම කර්මාන්තයේ නියැළෙනවා. කුඩා තේ වතු හිමියන්, තේ කර්මාන්තශාලා හිමියන් සහ සේවක සේවිකාවන් විශාල ප්‍රමාණයක් එම කර්මාන්තයේ නියැළෙනවා. ඒ අයට එකී ප්‍රධාන ආයතන තුන හරහා ඔවුන්ගේ උන්නතිය සහ අවශ්‍යතා සඳහා මුදල් වෙන් කරනු ලැබුවා. හැබැයි, මේ වන කොට රට පුරා නැඟෙන මැසිවිල්ලක් තිබෙනවා. පසුගිය කාලවල ඔවුන්ට අවශ්‍ය පොහොර ටික කලට වේලාවට ලැබුණේ නැහැ, නැවත වගාව සඳහා සහනාධාර ලැබුණේ නැහැ වාගේම, නැවත වගාව සඳහා එම පැළ තවාන්වලට ආධාර කිසිවක් ලැබෙන්නේ නැහැ කියන මැසිවිල්ල රට පුරා මේ ක්ෂේත්‍රයේ සිටින අයගෙන් නැඟෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා, පසුගිය කාලයේ MOP පොහොර ගොවීන්ට ලැබීමට සැලැස්වීම ගැන. ඒ පිළිබඳව ගොවීන්ගේ විශාල ප්‍රසාදයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මා විමසා සිටිනවා, මේ විශාල මුදල ඉදිරියේදී තේ කර්මාන්තයේ උන්නතිය සඳහා යොදා ගන්නවාද කියලා. විශේෂයෙන් තේ කර්මාන්තය ඩොලර් බිලියන ගණනින් රටට ආදායම් ගෙන දෙන කර්මාන්තයක්; මේ මොහොතේ සංකල්පයක් හැටියට තිබෙන tea tourism මේ රටට තවත් ආදායමක් ගෙනෙන්න පුළුවන් කර්මාන්තයක්. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ පැත්තෙන් වැඩ පිළිවෙළක්, යෝජනාවක්, උත්සාහයක් තිබෙනවාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු මන්ත්‍රීතුමනි, තේ සඳහා අය කරන සෙස් බද්ද 2011 සිට මහා භාණ්ඩාගාරයට යනවා. ඇත්තටම ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අය වැයෙන් පවා මුදල් වෙන් වන්නේ නැහැ. වෙනත් අරමුදලක් මඟින් තමයි තේ මණ්ඩලය අදාළ වියදම් පියවා ගන්නේ.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර මේකයි. රජය හැටියට අපි සූදානම් වෙනවා මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා මෙවර අය වැයෙන් කුඩා තේ වතු හිමියන් සහ මහා පරිමාණ තේ වතු නගා සිටුවීම සඳහා වැඩ පිළිවෙළක් හදන්න. විශේෂයෙන්ම මේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයපු කර්මාන්තයක්, තේ කර්මාන්තය. ඇත්තටම මේ වන කොට ලංකාවේ මුළු තේ නිෂ්පාදනයෙන් සියයට 75කට අධික ප්‍රමාණයක් සපයන්නේ කුඩා තේ වතු හිමියෝ. ඉතින් ඔවුන්ට යම් සහනයක් සැලසීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මොකද, සමහර වගාවන් දැන් කල් ඉකුත් වෙලා. එම නිසා නැවත වගා කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. සාමාන්‍යයෙන් අක්කරයක් නැවත වගා කරන්න රුපියල් ලක්ෂ 9කට ආසන්න මුදලක් වැය වනවා. සමහර ඒවායේ පාළු සිටුවීමේ අවශ්‍යතාවක් ද තිබෙනවා. අපි මෙවර අය වැයෙන් බලාපොරොත්තු වෙනවා, ඒ සඳහා යම් පමණකට දායකත්වය සපයන්න. මොකද, පසුගිය කාලයේ රටේ ඇති වෙච්ච අර්බුදත් එක්ක ඒක කර ගන්න අපහසු වුණා. දැනටත් යම් ආර්ථික අර්බුදයක් තිබුණත් තේ කර්මාන්තය නගා සිටුවීමේ අවශ්‍යතාව තිබෙනවා.

ඊයේ දවසේත් අපි ලංකාවේ මහා පරිමාණ තේ වතු හිමියන් සමඟ සාකච්ඡා කළා. රජය මඟින් බදු දීපු තේ වතු 21ක් තිබෙනවා. ගරු කම්කරු අමාත්‍යතුමාත්, මාත් එකතු වෙලා ඒ සියලු වතු හිමියන් සමඟ සාකච්ඡාවක් පැවැත්වුවා. මහා පරිමාණ වතුවලත් යම් යම් වෙනස්කම් ඇති කර ගන්න ඕනෑ. ඒවාත් විශාල වශයෙන් පාළු වෙච්ච තැන් තිබෙනවා; නැවත වගාව කරපු නැති තැනුත් තිබෙනවා. ඒවාත් සශ්‍රීක කරන්න බලනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ පොහොර ප්‍රශ්නයත් මේ කර්මාන්තයට විශේෂයෙන් බලපෑවා. ඒ නිසා විශාල වශයෙන් අස්වැන්න අඩුවීමක් පසුගිය කාලයේ සිටම සිදු වුණා. පසුගිය ආණ්ඩු ගත්තු සමහර වැරදි තීන්දුත් එක්ක මේ කර්මාන්තය විශාල අර්බුදයකට ගිහින් තිබෙනවා. ඒ හින්දා පසුගිය කාලයේ කුඩා තේ වතු හිමියන්ට ලබා දිය යුතු පොහොර ඉල්ලුම යම් හිරවීමක තිබුණා. නමුත් අපි පොහොර සංස්ථාවත් එක්ක සාකච්ඡා කරලා ඒ සියලු පොහොර මේ වන කොට ලබා දීලා අවසන් බව දැනුම් දෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මතක් කළා වාගේ අපේ අමාත්‍යාංශයත් -විශේෂයෙන් වැවිලි අමාත්‍යාංශයත්- අනෙක් පැත්තෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයත් පොහොර ප්‍රශ්නයට දිගටම මුහුණ දුන් අවස්ථාවේ රජය හැටියට අපි සාකච්ඡා කරලා රුසියාවෙන් සහනාධාර ලෙස පොහොර මෙට්‍රික් ටොන් 55,000ක් මේ රටට ලබා ගත්තා. අපි රුසියාවට ස්තුතිවන්ත වෙනවා, රට අර්බුදකාරී තත්ත්වයකට පත් වෙලා තිබුණු මොහොතේ සහන සැපයිය යුතු ගොවි ජනතාවට සහන සැපයීම සඳහා එම පොහොර ලබා දීම සම්බන්ධයෙන්. රුසියාවෙන් ලබා දීපු ඒ පරිත්‍යාගයෙන් හරි අඩක් - MOP පොහොර පොහොර මෙට්‍රික් ටොන් 27,500ක් - අපි අපේ අමාත්‍යාංශයට ලබා ගත්තා. මේ අර්බුදකාරී තත්ත්වය තුළ විශේෂයෙන්ම පොල් ප්‍රශ්නයකුත් තිබෙනවා. ඉතින් පොල් වතු සම්බන්ධවත් මම ඊයේ මතක් කළා. රජය සතු පොල් වතු අක්කර 38,000කට වඩා තිබෙනවා. ඒවාටත් අවුරුදු 5කින් පොහොර දාලා නැහැ. අපි ඒ MOP පොහොර විශේෂයෙන් පොල් වගාව සඳහා යොදවන්න මේ වන කොට කටයුතු කර තිබෙනවා.

## කඩුවෙල, කොතලාවල පිහිටි LRC ඉඩම: බිම් කොටස් අන්සතු කිරීම

## கடுவலை, கொத்தலாவலவிலுள்ள LRC காணி: பராதீனப்படுத்தப்பட்ட துண்டுகள்

## LRC LAND IN KOTALAWALA, KADUWELA: ALIENATION OF PLOTS

327/2024

**10. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පැවති කඩුවෙල, කොතලාවල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි 'පට හා සේද කර්මාන්ත ශාලාවක්' තිබූ ඉඩමෙන් සී/ස ධර්මායතන ආරක්ෂණ සභාවට සහ වෙනත් පාර්ශ්ව වෙත ඉඩම් කොටස් නිදහස් කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) නිදහස් කරන ලද ඉඩම් කොටස් හැර ඉතිරි ඉඩම් ප්‍රමාණයෙන් නේවාසික කටයුතු සඳහා අන් සතු කර ඇති ඉඩම් කොටස් සංඛ්‍යාව;

(ii) මාර්ග හා රක්ෂිත සඳහා වෙන් කර ඇති ඉඩම් කොටස් සංඛ්‍යාව;

(iii) පොදු කටයුතු සඳහා වෙන් කර ඇති කොටස් සංඛ්‍යාව;

(iv) එම එක් එක් කොටසේ විශාලත්වය ඉඩම් මිනුම් ඒකක වර්ග ප්‍රමාණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) ඉහත (ආ)හි සඳහන් ඉඩම්, අන්සතු කර ඇති පදනම සහ කාල වකවානුව කවරේද;

(ii) එම අවස්ථාවේදී පර්චසයක වටිනාකම සහ වර්තමාන වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (ආ) (ii)හි සඳහන් ඉඩම් කොටස් සලකුණු කර ඇති ඉඩම් සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(iv) පොදු කටයුතු සඳහා ඇති ඉඩම් කොටස් වර්තමානයේ භාවිත කරනු ලබන අරමුණු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) காணி மறுசீரமைப்பு ஆணைக்குழு வசமிருந்த கடுவலை, கொத்தலாவல கிராம அலுவலகர் பிரிவில் 'பட்டுத் தொழிற்சாலை' அமைந்திருந்த காணியிலிருந்து வ/ப தர்மாயதன பாதுகாப்புச் சபைக்கும் ஏனைய தரப்பினருக்கும் காணித் துண்டுகள் விடுவிக்கப்பட்டுள்ளனவா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) விடுவிக்கப்பட்டுள்ள காணித் துண்டுகள் தவிர்ந்த எஞ்சியுள்ள காணியில் குடியிருப்புகளை அமைப்பதற்காகக் கையுதிர்க்கப்பட்ட காணித் துண்டுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) வீதிகள் மற்றும் ஒதுக்குப் பிரதேசங்கள் நிமித்தம் ஒதுக்கப்பட்டுள்ள காணித் துண்டுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) பொதுப் பணிகளுக்காக ஒதுக்கப்பட்டுள்ள காணித் துண்டுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அத்தகைய ஒவ்வொரு காணித் துண்டினதும் விஸ்தீரணமானது, நில அளவீட்டு அலகுகளுக்கு ஏற்ப தனித்தனியாக யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேலே (ஆ)இல் குறிப்பிடப்பட்டுள்ள காணிகள் கையுதிர்க்கப்பட்ட அடிப்படை மற்றும் காலகட்டம் யாது என்பதையும்;

(ii) அச்சந்தர்ப்பத்தில் 'பேர்ச்சஸ்' ஒன்றின் பெறுமதியும், தற்போது 'பேர்ச்சஸ்' ஒன்றின் பெறுமதியும் தனித்தனியே யாது என்பதையும்;

(iii) மேலே (ஆ)(ii)இல் குறிப்பிடப்பட்டுள்ள காணித் துண்டுகள் அடையாளமிடப்பட்டுள்ள காணி வரைபடத்தைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) பொதுப் பணிகளுக்கான காணித் துண்டுகள் இன்றளவில் எத்தகைய நோக்கங்களுக்காகப் பயன்படுத்தப்படுகின்றன என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state whether parcels of land have been released to the Dharmayathana Protection Council Limited and other parties from the land located in Kothalawala Grama Niladhari Division in Kaduwela, which belonged to the Land Reform Commission and on which the 'Silk Factory' had existed;

(b) Will he state the number of plots of land -

(i) alienated for residential purposes, out of the remaining part of the land apart from those released as aforesaid;

(ii) set aside for roads and reservations;

(iii) set aside for common purposes; and

(iv) extent of each such plot in terms of units of measurements used in land survey?

(c) Will he further state -

(i) the basis and time of alienating the lands referred to in (b) above;

(ii) the value of a perch of land at that time and at present, separately;

(iii) whether he will present the cadastral plan in which the plots of land mentioned in (b) (ii) above have been demarcated; and

(iv) the purposes for which the plots of land available for common purposes are used at present?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) 46කි.

(ii) 15කි.

(iii) 04කි.

(iv)

- නේවාසික කටයුතු සඳහා; කැබලි 46, ප්‍රමාණය - අක්කර: 03 රූඩ්: 0 පර්චස්: 3.7
- මාර්ග හා රක්ෂිත සඳහා; කැබලි 15, ප්‍රමාණය - අක්කර: 0 රූඩ්: 2 පර්චස්: 18.45
- පොදු කටයුතු සඳහා; කැබලි 04, ප්‍රමාණය - අක්කර: 0 රූඩ්: 2 පර්චස්: 3.7

(2023හි කැබලි අංක 02, 03, 04 හා 05)

(ඇ) (i) නිවාස අරමුණු සඳහා අන්සතු කර ඇති අතර, 2000.08.27 දින ඉඩම් කොටස් බෙදා දීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වා ඇත. ඊට අමතරව කම්කරු විනිශ්චය සභාවේ සභාපතිවරුන්ගේ සංගමයේ ඉල්ලීම පරිදි 2007 වර්ෂයේදී ඉඩම් කොටස් බෙදා දීම සඳහා කටයුතු කර ඇත.

2000 වර්ෂයේ තක්සේරු වාර්තාව ඇමුණුම 01 වශයෙන් ඉදිරිපත් කරමි.

(ii) 2007 වසරට අදාළ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව කැඳවා ඇති අතර, ඊට අදාළ වාර්තාව අමුණා ඇත. එම බිම් කොටස් බැහැර කර ඇති බැවින් ඒ සඳහා වර්තමාන වටිනාකම තක්සේරු කර ඇත.

* 2007 වර්ෂයේ තක්සේරු වාර්තාව ඇමුණුම 02 වශයෙන් ඉදිරිපත් කරමි.

(iii) ඔව්.

(ආ) (ii) හි සැලැස්ම අමුණා ඇත.

* පිඹුරු අංක 142 ඇමුණුම් 03 වශයෙන් ඉදිරිපත් කරමි.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

(iv) මේ වන විට ක්ෂේත්‍රය නිදහස්ව පවතී.

(ඈ) අදාළ නොවේ.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අසන පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මීට පෙර මේ පාර්ලිමේන්තුවේ අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දීමේදී කළ පැහැදිලි කිරීමකට යටත්වයි මා මේ කාරණය නඟන්නේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව තමයි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා මේ ඉඩම් පවරා ගැනීම සිද්ධ කරලා තිබෙන්නේ. ඒ බව අපි කවුරුත් දන්නවා. අක්කර 50ට වැඩි සියලු ඉඩම් පවරා ගත්තා. ඒ පනතේම 18 වන වගන්තියට යටත්ව ඉඩම්වලින් අක්කර 50කුත්, කුඹුරු ඉඩම්වලින් අක්කර 25කුත් නැවත ඒ හිමිකරුවන් වෙත මුදා හැර තිබෙනවා. ඉතිරිය වන්දි ගෙවා පවරා ගෙන තිබෙනවා. ඒ ඉඩම් තමයි LRC ඉඩම් විධියට 1972 ඉඳලා වර්තමානය දක්වා පවතින්නේ. පවරා ගත් ඒ ඉඩම්වලින් විවිධ වතු වැවිලි වගාවන් සිදු කළ ඉඩම් කළමනාකරණය සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා තිබෙනවා. මෙහි ගැටලුව වී තිබෙන්නේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට කළමනාකරණය සඳහා පවරපු ඉඩම් එහි මුල් හිමිකරු වෙච්ච LRC එකේ අනුදැනුමකින් තොරව ඉහත කී ආයතන දෙක විසින් නැවත පැවරීම් කරමින් තිබීමයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, කතරගම ඉඩමක් පිළිබඳව මේ දවස්වල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙන බව. ඒක විශාල ඉඩමක්. හිමිකරු ලෙස ජී. රාජපක්ෂ නමින් තමයි මේ ඉඩම පවතින්නේ. දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මේ සම්බන්ධයෙන් පරීක්ෂණයකුත් පැවැත්වෙනවා. ඒ ඉඩමත් LRC ඉඩමක් ද කියන ගැටලුව මතු වෙලා තිබෙනවා. වත්මන් ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ විශේෂයෙන් ජනාධිපතිවරයා විසින් ඉඩම් අමාත්‍යවරයාට නියෝග කරනු ලැබුවා, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යාලයක් LRC එක තුළ ස්ථාපිත කරන්න. දැන් ඒ ප්‍රතිපත්තිමය තීන්දුව ගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, මා අහන්නේ මේකයි. මේ ගරු සභාවේදීත් මේ කාරණය මතු වුණා. 1972 ඉඳලා විවිධ ආණ්ඩු මේ රට පාලනය කර තිබෙනවා. එතකොට හැම ඇමතිවරයෙක්ම කියනවා, ඉඩම් සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රතිපත්තියක් හෝ ඒවා නිශ්චිතව හඳුනාගත හැකි ලේඛන හෝ නැහැ කියලා. ඒකට වග කියන්න ඕනෑ කවුද? වග කියන්න ඕනෑ 1972 ඉඳලා මෙතෙක් LRC එක පාලනය කළ, පසු ගිය ආණ්ඩුවල හිටපු ඉඩම් ඇමතිවරු. ඒ නිසා වත්මන් ආණ්ඩුව - ජනාධිපතිතුමා - ඉතා හොඳ තීන්දුවක් ගෙන තිබෙනවා; LRC ඉඩම් නැවත පැවරීම වහාම නතර කර තිබෙනවා. ඒ වාගේම විගණකාධිපතිතුමාගේ කාර්යාලයක් ද විවෘත කර තිබෙනවා. ඒ නිසා අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දීලා පූර්ණ පරීක්ෂාවක් කළ යුතුව තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය මොකක්ද? අදාළ ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන තිබෙනවා. නමුත්, ඊට අදාළ කරන ඉක්මන් ක්‍රියාකාරිත්වයක් සහිතව කටයුතු ආරම්භ කරලා පූර්ණ පරීක්ෂණයක් සිදු කිරීම සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියා මා අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

මීට පෙර අපේ ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාට ලබා දුන් පිළිතුරේ මම ඔය කාරණය පිළිබඳවත් අන්තර්ගත කළා. අපි දැන් පරීක්ෂණයක් පවත්වා ගෙන යනවා, LRC එකේ ඉඩම් සම්බන්ධයෙන් අකටයුතුකම් සිද්ධ වෙලා තිබෙනවාද කියා සෙවීම සඳහා. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා; ඊට අදාළව කටයුතු කරමින් යනවා.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. කඩුවෙල අසනයේ තිබෙන අම්බලන්වත්ත ඉඩම පිළිබඳව තිබෙන ප්‍රශ්නය මා ඉදිරිපත් කරන්න හේතුවක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා දුන් පිළිතුරේ සඳහන් වෙලා තිබෙනවා, පොදු කටයුතු සඳහා ඉඩම් කැබලි 4ක් වෙන් කර තිබෙනවා කියලා. ඊට අමතරව, තවත් අක්කරයකට ආසන්න ඉඩමක් පොදු පහසුකම් සඳහා වෙන් කර තිබෙනවා කියලා මීට අදාළ documentsවල සඳහන් වෙනවා.

ගරු කථානායකතුමනි, මම අද උදේත් ඒ ස්ථානයට ගිහිල්ලා පොදු පහසුකම්වලට වෙන් කළ ඉඩම්වල ඡායාරූප ප්‍රමාණයක් අරගෙන ආවා. පොදු පහසුකම්වලට කළ ඉඩම් මේ වෙනකොට විවිධ පුද්ගලයන් සඳහා මුදාහැර තිබෙනවා; විවිධ ඉදිකිරීම් කර තිබෙනවා. මේ මා අත තිබෙන්නේ ඒ ඡායාරූප. මේ ඉඩම් විශාල ප්‍රමාණයක් නැවත පුද්ගලයන් වෙනුවෙන් මුදාහැර තිබෙනවා. ඒ නිසා LRC එක, හිටපු ආණ්ඩුවල ගජ මිතුරන් සනසන්න, ඔවුන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් ඉඩම් යොදා ගන්න පාවිච්චි කරපු ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා; අන්ත දූෂිත ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, ඔබතුමා මේ පොදු පහසුකම්වලට වෙන් කළ ඉඩම් නැවත ඒ ජනතාවට ලබා දීම වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා. නිලධාරින් සම්බන්ධ කරගෙන ස්ථාන පරීක්ෂාවක් කරලා, වගකිව යුත්තන් හඳුනාගෙන ඒ ඉඩම් නැවත පොදු ජනතාව වෙත ලබා දීම සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලාත් මම දැනගන්න කැමතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

මේ නිශ්චිත කාරණයේදී නිවාස සඳහා ඉඩම් බෙදා කරලා තිබෙනවා. ඒත් එක්කම ඒ නිවාස සඳහා අවශ්‍ය පොදු පහසුකම් වෙනුවෙන් තමයි මේ ඉඩම් කැබලි හතර වෙන් කරලා තිබෙන්නේ. ඒ ඉඩම් කැබලි හතර දැනට ක්ෂේත්‍රයේ නිදහස්ව තිබෙනවා කියලා තමයි මේ පිළිතුරේ සඳහන් කරලා තිබෙන්නේ. ඒක එහෙම වෙන්නේ නැතිව ඒ ඉඩම් ටික දැනට වෙනත් කෙනෙක් පාවිච්චි කරනවා නම්, පොදු කටයුතුවලට යොදවන්නේ නැතිව වෙනත් දෙයක් සඳහා අල්ලාගෙන ඉන්නවා නම් ඒ සම්බන්ධයෙන් විපරම් කරන්න LRC එක යොමු කරන්න මම කැමතියි. ඒ ඉඩම් පොදු පහසුකම් සඳහා නොවෙයි නම් පාවිච්චි කරලා තිබෙන්නේ, ඒවා පවරා ගැනීමට LRC එකට බලතල තිබෙනවා. ඒ සඳහා ක්‍රියාත්මක වෙනවා කියන පොරොන්දුව මම ලබා දෙන්න කැමතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## ශ්‍රී ලංකාවේ ගංගා දූෂණය: අවම කිරීම
### இலங்கையில் ஆறுகள் மாசடைதல்: குறைத்தல்
### POLLUTION OF RIVERS IN SRI LANKA: MINIMIZATION

89/2024

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Kins Nelson)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ගංගා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගංගාවල නම් කවරේද;

(iii) එම ගංගා බොහෝමයක් දූෂණයට ලක් වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, එම ගංගා පවිත්‍ර කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) ගංගා දූෂණය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள ஆறுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி ஆறுகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஆறுகளில் பெரும்பாலானவை மாசடைந்துள்ளன என்பதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி ஆறுகளைச் சுத்தம் செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) ஆறுகள் மாசடைவதைக் குறைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of rivers in Sri Lanka;

(ii) the names of those rivers;

(iii) whether he knows that most of those rivers have been polluted;

(iv) if so, what measures will be taken to clean such rivers; and

(v) the measures that will be taken to minimize the pollution of rivers;

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ගංගා 103ක් ඇත.

(ii) ඇමුණුම 01- a සහ ඇමුණුම 01 - b මඟින් ගංගාවල නම් සහ පිහිටි ස්ථානයන් දක්වා ඇත.

ඇමුණුම 01- a

| No | Name of the River |
|---|---|
| 1 | Kelani Ganga |
| 2 | Bolgoda Ganga |
| 3 | Kalu Ganga |
| 4 | Benthota Ganga |
| 5 | Madu Ganga |
| 6 | Madampe Lake |
| 7 | Telwatta Ganga |
| 8 | Ratgama Lake |
| 9 | Gin Ganga |
| 10 | Koggala Lake |
| 11 | Polwatta Ganga |
| 12 | Nilwala Ganga |
| 13 | Seenimodara Oya |
| 14 | Kirama Oya |
| 15 | Rekawa Oya |
| 16 | Urubokka Oya |
| 17 | Kachigala |


| No | Name of the River |
|---|---|
| 53 | Miyangolla Ela |
| 54 | Maduru Oya |
| 55 | Pulliyanpota Aru |
| 56 | Kirimechchi Odai |
| 57 | Bodigoda Aru |
| 58 | Mandan Aru |
| 59 | Makarachchi Aru |
| 60 | Mahaweli Ganga |
| 61 | Kantalai Aru |
| 62 | Palampotta Aru |
| 63 | Panna Oya |
| 64 | Pankulam Aru |
| 65 | Kunchikumban Aru |
| 66 | Palakutti Aru |
| 67 | Yan Oya |
| 68 | Mee Oya |
| 69 | Ma Oya |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

| No | Name of the River |
|---|---|
| 18 | Walawe Ganga |
| 19 | Karagan Oya |
| 20 | Malala Oya |
| 21 | Embilikala Oya |
| 22 | Kirindi Oya |
| 23 | Bambawe Aru |
| 24 | Mahasiliwa Oya |
| 25 | Butawa Oya |
| 26 | Menik Ganga |
| 27 | Katupila Aru |
| 28 | Kurunda Ara |
| 29 | Nabadagas Aru |
| 30 | Karambe Aru |
| 31 | Kumbukkan Oya |
| 32 | Baguru Oya |
| 33 | Girikula Oya |
| 34 | Helawa Aru |
| 35 | Wila Oya |
| 36 | Heda Oya |
| 37 | Karanda Oya |
| 38 | Semani Aru |
| 39 | Tandiadi Aru |
| 40 | Kangikadichi Aru |
| 41 | Rufus Kulam |
| 42 | Pannel Oya |
| 43 | Ambalam Oya |
| 44 | Gal Oya |
| 45 | Andella Oya |
| 46 | Thumpankeni |
| 47 | Namakada Aru |
| 48 | Mandipattu Aru |
| 49 | Pathanthoddathne Aru |
| 50 | Vett Aru |
| 51 | Magalavatavan Aru |
| 52 | Mundeni Aru |

| No | Name of the River |
|---|---|
| 70 | Churiyan Aru |
| 71 | Chavar Aru |
| 72 | Palladi Aru |
| 73 | Mannal Aru/ Munadal Aru |
| 74 | Kodalikallu Aru |
| 75 | Per Aru |
| 76 | Pali Aru/ Kalmaduru Aru |
| 77 | Maruthapillay Aru |
| 78 | Pheravil Aru |
| 79 | Piramenthal Aru |
| 80 | Nethalil Aru |
| 81 | Kankarayan Aru |
| 82 | Kalawalappu Aru |
| 83 | Akkarayan Aru |
| 84 | Mandekal Aru |
| 85 | Pallavarayan Kadu Aru |
| 86 | Pali Aru |
| 87 | Chappai Aru |
| 88 | Paranki Aru |
| 89 | Nay Aru |
| 90 | Malwathu Oya/ Kadamba Nadee/ Aruvi Aru |
| 91 | Kal Aru |
| 92 | Moderagama Aru |
| 93 | Kala Oya |
| 94 | Moongil Aru |
| 95 | Mi Oya |
| 96 | Madurankuli Aru |
| 97 | Kalagama Oya |
| 98 | Rathambala Oya |
| 99 | Deduru Oya |
| 100 | Karambalan Oya |
| 101 | Ratmal Oya |
| 102 | Maha Oya |
| 103 | Attanagalu Oya |

ඇමුණුම 01– b


Major Rivers of Sri Lanka
80°0'0"E
81°0'0"E
82°0'0"E
10°0'0"N
9°0'0"N
8°0'0"N
7°0'0"N
6°0'0"N
Legend
River
Tank
Watershed Boundary
0 10 20 40 60 80
Kilometers

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iii) - මෙම ගංගා 103 සැලකූ විට ඒවා බොහොමයක් ආරම්භ වන්නේ මධ්‍ය කඳුකරයෙනි. අනෙක් ඒවා ශේෂ කඳු ආශ්‍රිතව ආරම්භ වේ. ඒවා ආරම්භයේදී වනාන්තර ප්‍රදේශ හරහා ගලා බසින අතර එහෙත් නාගරික ප්‍රදේශ හරහා ගමන් කරන ගංගාවන් බොහොමයක් දූෂණයට ලක්වී ඇත. නාගරීකරණය, කර්මාන්ත බහුලවීම, මළ අද්‍රව්‍ය හා කැළි කසළ අවිධිමත් ලෙස ජලයට බැහැර කිරීම, අවිධිමත් වැලි කැණීම්, ගං ඉවුරු හා ජල මූලාශ්‍ර ආශ්‍රිත අනවසර ඉදිකිරීම්, කඩොලාන විනාශ කිරීම් ආදිය හේතුවෙන් ගංගා ජලය දූෂණය වී ඇති බවට නිරීක්ෂණය කළ හැකිය.

- මීට අමතරව ග්‍රාමීය ප්‍රදේශවල කෘෂි කර්මාන්ත කටයුතු සඳහා අවිධිමත් ලෙස පොහොර හා පළිබෝධනාශක භාවිතය, එම රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් පසු ඉවතලන භාජන හා ඇසුරුම් ජල මූලාශ්‍රවලට බැහැර කිරීම, විධිමත් වැසිකිළි පහසුකම් නොමැතිවීම, කඩොලාන හා අනෙකුත් ගං ඉවුරු රක්ෂිත ශාක විනාශ කිරීම හේතුවෙන් ජල පෝෂක ප්‍රදේශ හා ජල මාර්ග දූෂණය ප්‍රධාන ලෙස සිදුවේ.

- තවද, සංවර්ධන කටයුතුවලදී මෙන්ම වගා කටයුතුවලදී කඳුකර ප්‍රදේශවල වන වැස්ම ඉවත් වීම නිසා පාංශු ඛාදනය සිදුවී ජල මූලාශ්‍ර අපවිත්‍රවීම ද දැකිය හැකිය.

(iv) ශ්‍රී ලංකාවේ ගංගා, වැව් හා අනෙකුත් ජල මූලාශ්‍ර සංරක්ෂණය, කළමනාකරණය සහ ජල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා වගකීම මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ජල සම්පත් මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වැනි ආයතන වෙත පැවරී ඇත. වරින්වර මෙම ගංගාවල ජලය දූෂණය වීම වැළැක්වීම උදෙසා කෙටිකාලීන වැඩසටහන් ක්‍රියාත්මක වී ඇතත්, දීර්ඝකාලීන වැඩසටහන් ක්‍රියාත්මක වී නැත. මෙතෙක් ප්‍රධාන වැඩසටහන් ලෙස පරිසර අමාත්‍යාංශය මඟින් "පිවිතුරු ගංගා" වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

(v) - ඉහත පිළිතුරු අංක (iv) දක්වා ඇති ආයතන ඒ සඳහා ඔවුන් වෙත පැවරී ඇති නීතිමය රාමුව තුළ ක්‍රියාත්මක වේ. මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ජල දූෂණය වැළැක්වීම, සංරක්ෂණ, කළමනාකරණය සහ ජල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ජාතික පාරිසරික පනතේ රෙගුලාසි යටතේ පහත කටයුතු සිදුකරනු ලැබේ.

1. ජල තත්ත්ව විශ්ලේෂණය

- දැනට ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන ජල දේහ 16ක ජල තත්ත්ව විශ්ලේෂණ කටයුතු මේ වන විට මධ්‍යම පරිසර අධිකාරිය මඟින් සිදුකරමින් පවතී.

- එනම්, 2003 සිට කැලණි ගඟේ ස්ථාන 12ක මාසිකව ජල තත්ත්ව විශ්ලේෂණය සිදු කරයි. මෙයට සමගාමීව ජාතික ජල සම්පාදන මණ්ඩලය හා එක්ව කැලණි ගඟේ ජල තත්ත්ව විශ්ලේෂණය, කර්මාන්ත පසු විපරම් කිරීම නිරතුරුව සිදු වන අතර, අවශ්‍ය අවස්ථාවලදී කර්මාන්ත සඳහා උපදෙස් ලබා දීම සිදු වේ.

- 2017 සිට මහ ඔය, දියවන්නා ඔය, නිල්වලා ගඟ, කළු ගඟ, මැණික් ගඟ, මහවැලි ගඟ, නුවරවැව, තිස්ස වැව, අත්තනගලු ඔය, දැදුරු ඔය, කුරුණෑගලවැව, වෙන්නරුව වැව, බඳුලු ඔය, ග්‍රෙගරි වැව හා බෝගම්බර වැව යන ජල මූලාශ්‍රවල ජල තත්ත්වය මාස 04කට වරක් විශ්ලේෂණය කටයුතු සිදු කර අදාළ වර්තා ලබාගෙන, ඒ අනුව අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ අංශවලට යොමු කිරීමට කටයුතු කර ඇත.

- ප්‍රධාන වශයෙන් මෙම ජල දේහවල ජලයේ තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී බොහෝ ජලාශවල ජලය දූෂණයට ලක්වීම සිදුවී ඇත්තේ ගෘහස්ථ අපද්‍රව්‍ය ජලදේහවලට එකතුවීම හා කැළි කසළ මඟින් බව විශේලේෂණ දත්ත අනුව පෙනී යයි. එසේම ජලාශවල අවිලතාවය - turbidity - වැඩිවීමක්ද නිරීක්ෂණය කර ඇත. මේ තත්ත්වය බෙහෝවිට රොන්මඩ ජලාශවලට එකතුවීම නිසා සිදු විය හැකි තත්ත්වයකි. (විශේෂයෙන්ම වැසි කාලගුණික තත්ත්වයන්වලදී.)

- විශ්ලේෂණය කරනු ලබන පරාමිතීන්ගෙන්, අවිලතාවය සහ මළ අපද්‍රව්‍ය මඟින් සිදුවන ජල දූෂණය හැර අනෙකුත් පරාමිතීන් හිතකර තත්ත්වයක පවතී.

- කෘෂිරසායන ද්‍රව්‍ය හා පොහොර භාවිතයෙන් ජලයට එකතු වන අවශේෂ පළිබෝධනාශක, කෘෂිරසායන ද්‍රව්‍ය විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් මධ්‍යම පරිසර අධිකාරිය සතුව නොපවතී.

- එසේම ජලාශ, ජලමූලාශ්‍ර සංරක්ෂණයේදී ආයතන අතර, ක්‍රමවත් සම්බන්ධතාවයක් නොමැතිවීම හා පවතින නීති රීති ශක්තිමත් නොමැති බව අධ්‍යයනවලදී අනාවරණය වී ඇත.

02. නීතිමය පියවර

- ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර - EPLs - නිකුත් කිරීමේ ක්‍රියාවලිය මඟින් ජල මූලාශ්‍ර වෙත අපද්‍රව්‍ය පැහැර කිරීම කිරීම හා ඒ අවට පරිසර පද්ධතීන් සුරැකීම ප්‍රධාන ලෙස සිදුවේ.

  * ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 2264/18 දරන 2022.01.27 දිනැති ගැසට් නිවේදනය මඟින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සහ ඒ හරහා කර්මාන්ත මඟින් බාහිර පරිසරයට බැහැරලන අපජලය නිසි ප්‍රමිතියට අනු බැහැරලීමට අවසර ලබාදෙන අතර, මෙමඟින් කර්මාන්ත අපජලය මඟින් සිදුවන දූෂණය පාලනය කිරිම සඳහා කටයුතු කර ඇත. එසේම පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම හා ඒවා පසුවිපරම් කර බලපත්‍ර කොන්දේසි කඩ කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සිදු කරයි.

- ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 772/22 දරන ගැසට් පත්‍රය මඟින් නියමිත ව්‍යාපෘති සඳහා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රමවේදය -EIA/IEE- අනුගමනය කර එම ව්‍යාපෘති මඟින් ජලාශ/ජල පෝෂක හා ඒ අවට රක්ෂිත කලාපවලට හා සංවේදී පරිසර පද්ධතිවලට සිදුවිය හැකි හානිය අවම කිරීම සිදුවේ.

- ජාතික පාරිසරික පනතට අනුව ජලයේ තත්ත්වය පවත්වා ගැනීම සහ කර්මාන්ත අපජලය මඟින් සිදුවවන ජල දූෂණය වළක්වා ගැනීම සඳහා නීති රෙගුලාසි පැනවීම සිදුකරන අතර, ගැසට් අංක 2264/17 දරන 2022.01.27 දරන ගැසට් නිවේදනය මඟින් කර්මාන්තවලින් බැහැරලන අපජලය සඳහා ප්‍රමිති හා උපමාන ප්‍රකාශයට පත් කර ඇත.

- ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 2148/20 දරන 2019.11.05 දිනැති ගැසට් නිවේදනය මඟින් සංසරණ ජල තත්ත්වයන් සඳහා ප්‍රමිති හා උපමාන ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව තම බලප්‍රදේශයට අයත් ගංගාවල ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාම සඳහා පළාත් පාලන ආයතන සමඟ කටයුතු කිරීමට යෝජනා වී ඇත.

- හානිකර අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 1534/18 දරන 2008.02.01 දිනැති ගැසට් පත්‍රය අනුව බලපත්‍රයක් ලබා ගත යුතු අතර මෙමඟින් පරිසරයට බැහැරලන හානිකර අපද්‍රව්‍ය පාලනය හා කළමනාකරණය සිදුවේ.
- පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ගැසට් මඟින් ප්‍රකාශකර එම සංවේදී පරිසර පද්ධතිවලට මානව ක්‍රියාකාරකම්වලින් සිදුවිය හැකි බලපෑම් අවම කිරීමට පියවර ගෙන ඇත. එමඟින් ජල මූලාශ්‍රවල පැවැත්ම තහවුරු කර ඇත.

03. අනෙකුත් පියවර

- කාර්මික අපජලය ජනනය වන මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත, ගංගා හා අනෙකුත් ජල දේහවල සංවේදී කලාප තුළ ස්ථානගත කිරීම සඳහා නිර්දේශ ලබාදීමට ප්‍රථම, එම යෝජනා අදාළ අනෙකුත් පාර්ශ්වකාර ආයතනවල නිලධාරින්ගෙන් සමන්විත විශේෂ කමිටුවක් - H&M කමිටුව - වෙත යොමු කෙරේ. මෙහි නිර්දේශ ක්‍රියාත්මක කර, කර්මාන්ත ස්ථානගත කිරීම තුළින් කර්මාන්ත අපජලය මඟින් ගංගා ජලය දූෂණය වීම පාලනය කෙරේ.
- ගලි බවුසර් මඟින් ප්‍රවාහනය කරනු ලබන කාර්මික අපජලය ගංගාවලට හා අනෙකුත් ජලමූලාශ්‍රවලට බැහැරලීම පාලනය කිරීම සඳහා ගලි බවුසර් සේවාවන් සපයන ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කිරීම් ආරම්භ කර ඇත.
- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ආදි ආයතන සමඟ සම්බන්ධ වී ජල සම්පත සුරැකීමට කටයුතු කිරීම සහ මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- "සුරකිමු ගංගා" ජාතික වැඩසටහන යටතේ දිවයිනේ ප්‍රධාන ගංගාවල ජලය සංරක්ෂණය සඳහා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ද සහයෝගය ඇතිව විවිධ ක්‍රමෝපායයන් සැලසුම් කර තිබූ අතර මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මෙම වැඩසටහන තාවකාලිකව ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇත.
- ජාතික පාරිසරික පනතේ ඉදිරි සංශෝධන සඳහා, අපජලය පරිමාව මත පදනම්ව දූෂකාරක ධාරිතාව අනුව කර්මාන්තකරුගෙන් රජයට ගාස්තු අයකර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. මේ හරහා ද ගංගා හා අනෙකුත් ජල මූලාශ්‍රවල සිදුවන පරිසර දූෂණ පාලනය කර ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

මීට අදාළව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින්ද ගංගා දූෂණය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග පහත දක්වා ඇත.

ඉහත සඳහන් ගංගා ඇතුළුව එම ගංගා ද්‍රෝණි තුළ ජල සම්පත් සංවර්ධනය වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ආරම්භයේ සිටම සිදු කරන ලදී. ඒ අනුව ගංගා ආශ්‍රිතව වැව් අමුණු ඉදිකිරීම, කෘෂි කර්මන්තය සඳහා ජලය රැස්කිරීම, බෙදා හැරීම (ජල සම්පාදනය වැනි කටයුතු) වැනි ක්‍රියාවන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ සිදුකර ඇත. නමුත් මෙහි ජල දූෂණය වැනි දේ පිළිබඳව සෘජුව මැදිහත්ව නොමැත. එහෙත් මුළු ගංගා පද්ධතියම තවදුරටත් අවධානයෙන් කළමනාකරණය කළ යුතු බැවින් 2018 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ සඳහා නව උප අංශයක් - branch - පිහිටුවන ලදී. එය ගංගාධාර කළමනාකරණ අංශය ලෙස හැඳින්වේ.

එම අංශය හා දෙපාර්තමේන්තුවේ පාරිසරික අධ්‍යයන අංශය හා එක්ව මේ වන විට ගංගා පද්ධතියට ප්‍රධානව හානි වන වැලිගොඩ දැමීම සහ කුඩා ජල විදුලි ත්පාදනය මඟින් වන හානි අවම කිරීමට සක්‍රියව දායක වෙමින් පවතී. මීට අමතරව පරිසර දූෂණය වීම සිදු විය හැකි ස්ථාන වල ජලයේ ගුණාත්මක බව - water quality - වරින් වර පරීක්ෂා කිරීම් ද දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. ස්ථාන කිහිපයක ඝණ අප ද්‍රව්‍ය ගංගා තුළට එකතු නොවන ආකාරයට, බාධක ලෙස ක්‍රියා කළ හැකි සරල ක්‍රම අත්හදා බලමින් සිටියි. (උදා - වීරකැටිය ඌරුබොකු ඔය කටුවන පාලම අසල)

ගංගාවලට අපද්‍රව්‍ය එකතු කරන ජන කොට්ඨාස සමඟ එක්ව මූලිකව පිරිසිදු කර ඉන් පසු ඔවුන් විසින්ම අපද්‍රව්‍ය ගංගා තුළට බැහැර නොකර එය පවත්වා ගෙන යන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කර ඇත. (උදා - අත්තනගලු ඔය)

මෙලෙස ගංගා නිසි පරිදි නියාමනය කිරීම සඳහා ඒ වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ බිම් මට්ටමේ නිලධාරින් පත්කිරිමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් වාරිමාර්ග කලාප මට්ටමින් පසුගිය වසරේදී ආරම්භ කරන ලදී.

ඒ අනුව දැනට කලාප කිහිපයක් දැනුවත් කර ඇති අතර, නිලධාරින් වෙත අදාල කොටස් බෙදා දීමට සිතියමක්ද නිර්මාණය කර තිබේ. අනුරාධපුර පොළොන්නරුව, කුරුණෑගල, ත්‍රිකුණාමලය, කොළඹ, මහනුවර සහ බදුල්ල එම කලාප වේ.

ඒ අනුව බිම් මට්ටමමේ නිලධාරියෙකු විසින් වරින් වර නිසිපරිදි ගංගා නිරීක්ෂණය කිරීමට යොමු වේ. දැනටමත් යම් යම් හඳුනාගත් ස්ථාන සම්බන්ධව එම පාර්ශ්වකරුවන් වෙත දැනුවත් කිරීම් සිදුකර ඇත. එසේ හඳුනාගන්නා ස්ථානවල පුද්ගලයින්, කර්මාන්තශාලා අදාළ පළාත් පාලන ආයතන සමඟ එක්ව නියාමනයටත් නිසිපරිදි පවත්වා නොගන්නා ඒවා වෙත නීති මඟින් කටයුතු කිරීමටත් බලාපොරොත්තු වේ.

ඉදිරි වසර කිහිපය තුළ දැනට අපවිත්‍ර වී ඇති ස්ථාන කිහිපයක් තෝරා ගෙන ක්‍රමිකව පැරණි පිරිසිදු පවිත්‍ර මට්ටම ළඟා කරගැනීමට කටයුතු සැලසුම් කරමින් පවතියි. තවද පහත කරුණු පිළිබඳව අපගේ අවධානය යොමු වී ඇත.

1) රක්ෂිත පවත්වා ගැනීම
2) වැලි ගොඩ දැමීම නියාමනය
3) කුඩා ජල විදුලි බලාගාර නියාමනය
4) ගංගා රක්ෂිත ආරක්ෂා කිරීම
5) කුඩා ව්‍යාපෘති සඳහා පරිසර හානි අධ්‍යයන වාර්තා ලබා දීමේදී කමිටු සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
6) ගංගා ආශ්‍රිතව සහ ද්‍රෝණිය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා නිර්දේශ නිකුත් කිරීම.
7) ගංගා ආසන්න නිවාස සහ කර්මාන්තශාලා ආදිය නිසි පරිදි නියාමනය නොවීම/අපද්‍රව්‍ය සෘජුව බැහැර කිරීම.
8) අපද්‍රව්‍ය යොමු කරන නිවාස සහ කර්මාන්තශාලා දැනුවත් කිරීම සහ නඩු පැවරීම.
9) දැනට ඝණ අපද්‍රව්‍ය සහ අනවසර ජලජ පැලෑටි ඇති ස්ථාන පිරිසිදු කිරීම.
10) ශ්‍රමදාම
11) දැනුවත් කිරීම

තවද දැනට ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති තුළ ගංගා ආශ්‍රිතව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන විට පරිසර අධ්‍යයන වාර්තා ලබාගැනීමේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව ද එක් පාර්ශ්වකරුවෙක් වේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාරිසරික අධ්‍යයන අංශය මඟින් ඒ සඳහා නිසි නිර්දේශ ලබා දීම සිදු කරයි. එමඟින් ඉදිරියේදී පරිසර දූෂණය වළක්වා ගැනීමට කටයුතු කරයි.

(ආ) අදාළ නොවේ.

## පොලිස් අශ්වාරෝහක කොට්ඨාසයට අශ්වයන් ආනයනය: විස්තර

## பொலிஸ் குதிரைப் படைப் பிரிவுக்கு குதிரைகள் இறக்குமதி: விபரம்

## IMPORT OF HORSES FOR POLICE MOUNTED DIVISION: DETAILS

323/2024

**8. ගරු ඔෂානි උමංගා මහත්මිය (ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா - மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி சார்பாக)
(The Hon. (Mrs.) Oshani Umanga on behalf of the Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා පොලිසියේ, පොලිස් අශ්වාරෝහක කොට්ඨාසයක් තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට එම කොට්ඨාසයේ සිටින අශ්වයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව වයස් කාණ්ඩ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පොලිස් අශ්වාරෝහක කොට්ඨාසයට ජීව අශ්වයන් 15දෙනෙකු ආනයනය කිරීම සඳහා LA/SJ/300/2024 දරන අංකය යටතේ ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ ටෙන්ඩර් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අශ්වයන් ආනයනය කිරීම සඳහා තෝරා ගන්නා ලද සැපයුම්කරු කවුරුන්ද;

(iv) ඉහත සඳහන් ටෙන්ඩරය අනුව එම අශ්වයින් 15දෙනා ආනයනය කිරීම සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை பொலிஸில், பொலிஸ் குதிரைப் படைப் பிரிவொன்று உள்ளதா;

(ii) ஆமெனில், தற்பொழுது அப்பிரிவிலுள்ள குதிரைகளின் எண்ணிக்கை எத்தனை;

(iii) மேற்படி எண்ணிக்கையானது வயதுப் பிரிவுகளின் அடிப்படையில் வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பொலிஸ் குதிரைப் படைப் பிரிவுக்கு 15 இனவிருத்திக்குரிய ஆண் குதிரைகளை இறக்குமதி செய்வதற்காக LA/SJ/300/2024 என்ற இலக்கத்தின்கீழ் விலைமனு கோரப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், அதற்காகச் சமர்ப்பிக்கப்பட்ட விலைமனுக்களின் எண்ணிக்கை எத்தனை;

(iii) மேற்குறித்த குதிரைகளை இறக்குமதி செய்வதற்காகத் தெரிவுசெய்யப்பட்ட வழங்குநர் யார்;

(iv) மேற்குறிப்பிடப்பட்ட விலைமனுவுக்கமைய மேற்குறித்த 15 குதிரைகளை இறக்குமதி செய்வதற்காக செலவு செய்யப்படும் பணத்தொகை எவ்வளவு;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether there is a Police Mounted Division in Sri Lanka Police;

(ii) if so, the number of horses in possession of that division at present; and

(iii) the number of horses according to the age categories, separately?

(b) Will he also inform this House -

(i) whether tenders have been called under number LA/SJ/300/2024 to import 15 live horses to the Police Mounted Division;

(ii) if so, the number of tenders presented;

(iii) the supplier who has been selected to import those horses; and

(iv) the amount to be spent to import those 15 horses, as per the above tender?

(c) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 36කි.

(iii)

| අනු අංකය | වයස් කාණ්ඩය - අවුරුදු | අශ්වයින් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 10-11 | 14 |
| 2 | 12-13 | 01 |
| 3 | 14-15 | 10 |
| 4 | 16-17 | 04 |
| 5 | 18-19 | 06 |
| 6 | 20-21 | - |
| 7 | 22-23 | 01 |

(ආ) (i) ඔව්.

(ii) 01

(iii) මැජෙස්ටික් කම්පැනි ලංකා පුද්ගලික සමාගම.

(iv) රු. 138,944,973.80 (වැට් සහිත) මුදලක් වැය කිරීමට අපේක්ෂා කළ නමුත් කාර්යය සාධන බැඳුම්කරය ඉදිරිපත් කර ද්විපාර්ශ්වික ගිවිසුම අත්සන් කිරීමට මැජෙස්ටික් කම්පැනි ලංකා පුද්ගලික සමාගම ඉදිරිපත් නොවන බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර අදාළ ප්‍රසම්පාදනය අවලංගු කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරමින් ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### රුසියාවේ රැකියා සඳහා විදේශගත වූ තරුණයන් මුහුණ දෙන ගැටලු
### ரஷ்யாவுக்கு வேலைவாய்ப்புக்குச் சென்ற இளைஞர்கள் முகங்கொடுக்கும் பிரச்சினைகள்
### ISSUES FACED BY YOUTH MIGRATED TO RUSSIA SEEKING EMPLOYMENT

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர் கௌரவ விஜித ஹேரத் அவர்களிடம் பின்வரும் முக்கியமான விடயம் தொடர்பில் விபரங்களைக் கேட்க விழைகின்றேன்.

தமது குடும்பங்களின் பொருளாதார மேம்பாடு கருதிய வேலைவாய்ப்பின் பொருட்டு, இலங்கைப் பிரஜைகளான இளைஞர்கள் பலர், சட்ட ரீதியாகவும் சட்டவிரோதமாகவும் வெளிநாடுகளுக்குச் செல்ல முற்படும்போது, வெளிநாட்டு முகவர்களால் ஏமாற்றப்படும் சம்பவங்கள் தொடர்ச்சியாகப் பதிவாகின்றன. இத்தகைய முகவர்களை நம்பி, பெருந்தொகைப் பணச் செலவில் வெளிநாடு செல்ல முற்பட்ட தமிழ், சிங்கள இளைஞர்களில் பலர், அத்தகைய முகவர்களால் ரஷ்ய இராணுவத்தில் பலவந்தமாக இணைக்கப்பட்டுள்ளதால், தம்முடன் தொடர்பற்று இருப்பதாகவும் தமது பிள்ளைகளை மீட்டுத் தருமாறும் பாதிக்கப்பட்டவர்களின் குடும்பத்தினர் எம்மிடம் முறைப்பாடு செய்துள்ளனர். இதன் அடிப்படையில் யாழ்ப்பாணத்தைச் சேர்ந்த அதிஷ்டராஜா கோமஸ் விதுசன்; யாழ்ப்பாணம், கரவெட்டியைச் சேர்ந்த சுதனிகாந் பகிர்தன்; முல்லைத்தீவு, முள்ளியவளையைச் சேர்ந்த சுந்தரலிங்கம் பாலச்சந்திரன்; யாழ்ப்பாணத்தைச் சேர்ந்த கீத பொன்கலன் பிரதாப், ஸ்டீவன் சிவேஸ் ஆகியோரினதும், 2022.10.20ஆம் திகதி ரஷ்ய எல்லையான பெலாரஸில் வைத்துக் காணாமற்போன கமலகிரி, கற்பக்குணை, உடுவிலைச் சேர்ந்தவ விஜயகுமார் முகுந்தன் என்பவரினதும் தகவல்கள் இன்றுவரை கிடைக்கவில்லை. இவருடைய தந்தை பொன்னுத்துரை விஜயகுமார் ஓர் ஆசிரியர். இதைவிட, இவ்வாறு வெளிநாடுகளுக்குச் சென்ற பல சிங்கள இளைஞர்களும் காணாமற்போயிருக்கிறார்கள். அவர்களும் அந்த இராணுவத்தில் இணைக்கப்பட்டிருக்கலாம். இவர்கள் தொடர்பில் பின்வரும் வினாக்களுக்கு அமைச்சரவர்களிடம் பதிலை எதிர்பார்க்கிறேன்:

01. மேற்குறித்த அடிப்படையில் வெளிநாடுகளுக்குச் செல்ல முற்பட்ட எத்தனை இளைஞர்கள் ரஷ்ய இராணுவத்தில் இணைக்கப்பட்டுள்ளனர்?

02. இவர்களில் யாராவது இறந்துள்ளமை உறுதி செய்யப்பட்டுள்ளதா? அவ்வாறெனில், அவர்கள் பற்றிய விபரங்களை அறிய முடியுமா?

03. இருநாட்டுத் தொடர்பாடல் மூலம் குறித்த இளைஞர்களை மீட்டு, நாட்டுக்குத் திருப்பியழைப்பதற்கான முயற்சிகள் இதுவரை மேற்கொள்ளப்பட்டுள்ளனவா?

04. தமது பிள்ளைகளுடனான தொடர்பை ஏற்படுத்த முடியாது தவிக்கும் அவர்களின் குடும்பங்களுக்கு உள ஆறுதலை வழங்கும் வகையில், இது விடயம் சார்ந்து அரசாங்கத்தின் நடடிவக்கைகள் எவ்வாறு அமைந்துள்ளன என்பதைத் தெரியப்படுத்த முடியுமா?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

கௌரவ சபாநாயகர் அவர்களே, குறித்த விடயம் தொடர்பாக வெளிநாட்டு அலுவல்கள் அமைச்சு என்ற ரீதியில் நாங்கள் இராஜதந்திர ரீதியாக அணுகி வருகிறோம். இந்தக் கேள்விகள் தொடர்பில் புள்ளிவிபரவியல் அடிப்படையிலான தகவல்களை வழங்குவதற்கு ஒரு வார கால அவகாசம் தருமாறு கேட்டுக்கொள்கிறேன்.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே! இதனை ஒரு மிக முக்கியமான விடயமாகக் கருதி, கௌரவ பிரதி அமைச்சர் அவர்கள் கேட்டுக்கொண்டதுபோல, sincereஆக ஒரு வார காலத்தில் இதற்கான சரியான பதிலை அந்தக் குடும்பங்களுக்கு ஆறுதல் அளிக்கக்கூடிய வகையில் தருமாறு கேட்டுக்கொள்கிறேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න. ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු දයාසිරි ජයසේකර මහතා.

# වරප්‍රසාද: ලංකා විදුලිබල මණ්ඩලය පිළිබඳ සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම
## சிறப்புரிமை: இலங்கை மின்சார சபை பற்றிய தவறான தகவல்களை முன்வைத்தல்
## PRIVILEGE: PRESENTATION OF INACCURATE FACTS ABOUT CEYLON ELECTRICITY BOARD

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වරප්‍රසාද කඩවීම පිළිබඳ මෙම කාරණය ඉදිරිපත් කරමි.

2025.01.09 වන දින මා විසින් ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයාගෙන් විදුලි බිල අඩු කිරීම පිළිබඳව ප්‍රශ්නයක් විමසන ලදී. එම ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්නයක් ලෙස මා විසින් මතු කරන ලද්දේ 2024දී විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 167ක් ලාභ ලබා තිබෙන බවයි. විදුලිබල අමාත්‍යවරයා එය ප්‍රතික්ෂේප කරන ලද අතර, ඔහු ප්‍රකාශ කරන ලද්දේ විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 332ක ණයකින් පෙළෙන බවත්, ඒ කියන ලද ලාභය ඔප්පු කර පෙන්වන ලෙසත්ය.

එහිදී නැගී සිටි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා Mid-Year Fiscal Position Report - 2024හි 36වන පිටුව අනුව විදුලිබල මණ්ඩලය 2024.06.30 වනවිට උපයා තිබෙන ලාභය රුපියල් බිලියන 119.209ක් බව ප්‍රකාශ කළා. එමඟින් මූලිකවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන වාර්තාවකින් පෙන්වා දී ඇති ලාභ ඉපැයීමක් ප්‍රතික්ෂේප කර අසත්‍ය තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පාර්ලිමේන්තුව දැඩි ලෙස නොමඟ යැවීමක් පමණක් නොව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මාගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමකි.

එසේම මහජන උපයෝගිතා කොමිසම හා විදුලිබල මණ්ඩලය අතර හුවමාරු වූ ලිපි අනුව ද, 2024 ජනවාරි 24 සිට 2024 දෙසැම්බර් 24 දක්වා විදුලිබල මණ්ඩලයේ ලාභය රුපියල් බිලියන 140.59ක් පමණ වන බවත්, ක්ෂය වීම් මත ලැබුණු රුපියල් බිලියන 37ක් ද සමඟ 2024 වසරේ විදුලිබල මණ්ඩලයේ සමස්ත ලාභය රුපියල් බිලියන 177.6ක් වන බවත් පැහැදිලි වෙනවා.

එසේම ජාතික විගණන කාර්යාලය විසින් 2024 දෙසැම්බර් 30 විගණන විමසුම මඟින් පැහැදිලිව සඳහන් කර තිබෙන්නේ අලාභ සම්බන්ධ finance cost එක ඇතුළත් කර මේ ගණන් සාදා තිබෙන බවයි. "Equity Support to CEB from Government" කියන document එකෙන් ඒ අනුව මම කියවන්නම්. පොඩි කාරණා කිහිපයක් තිබෙන්නේ ඒකේ. 2022, 2වන කාර්තුවේ Equity Investment for CPC fuel payments සඳහා මිලියන 45,000ක් දෙනවා. Equity Investment for CPC fuel payments සඳහා මිලියන 35,000ක් දෙනවා, 2022, 3වන කාර්තුවේ. 2022, 3වන කාර්තුවේ Puttalam Coal Power Project එකට මිලියන 1,215ක් දෙනවා. 2022, 3වන කාර්තුවේ Debt Equity Conversion සඳහා මිලියන 9,612ක් ලබා දෙනවා, ආණ්ඩුව විධියට නැත්නම් භාණ්ඩාගාරය විධියට. 2022, 4වන කාර්තුවේ Puttalam Coal Power Project එකට මිලියන 119,260ක් ලබා දෙනවා. Debt Equity Conversion සඳහා ආපසු 2022, 4වන කාර්තුවේ බිලියන 242ක් ලබා දෙනවා. 2023, 4වන කාර්තුවේ Equity Investment for CPC fuel payments සඳහා මිලියන 126,271ක් ලබා දෙනවා. මේ අනුව ගත්තාම සමස්තයක් විධියට ආණ්ඩුව දරා තිබෙනවා, විදුලිබල මණ්ඩලයේ - CEB එකේ - පාඩුව විධියට බිලියන 578.376ක්. ඒ අනුව බොහොම පැහැදිලියි 2022, 2වන කාර්තුවේ ඉඳලා 2023, 4වන කාර්තුව දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් සඳහා රාජ්‍ය භාණ්ඩාගාරය බිලියන 206.271 equity investment ලෙස ලබා දී තිබෙන බව. ඒ නිසා විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 332ක ණය බරකින් පෙළෙනවා කියන එක සම්පූර්ණ අසත්‍යයක්. ගරු කථානායකතුමනි, මෙම වාර්තාව මම **සභාගත*** කරනවා.

ඒ අනුව 2013 සිට කළ යුතුව තිබුණු විදුලි ගාස්තු සංශෝධන සිදු නොකිරීම, විදුලිබල මණ්ඩලයේ පාඩු, දූෂණ, අක්‍රමිකතා, නොසැලකිල්ල මත සිදු වූ සියලු පාඩු භාණ්ඩාගාරය හෙවත් ජනතාව දරාගෙන තිබෙනවා. ඒ අනුව තමයි මම ප්‍රකාශ කළ රුපියල් බිලියන 177.6ක ලාභයක් ඔවුන් ලබා තිබෙන්නේ. ඒ වාගේම මේ විදුලි ගාස්තු සංශෝධනය දිගින් දිගටම පැහැර හැරීමට විදුලිබල මණ්ඩලය කටයුතු කර තිබෙනවා. අවශ්‍ය තොරතුරු ලබා දීම ප්‍රමාද කර තිබෙනවා. නමුත් පසුගිය වසරේ ඔවුන් සියයට 25ක වැටුප් වර්ධකයක්ද ලබා ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම මේ කාරණය විශේෂයෙන්ම කියන්න කැමැතියි. 2023 වසරේ අපේ විදුලි පාරිභෝගිකයන් ලක්ෂ 75කින් සියයට 14කගේ විදුලිය විසන්ධි කර තිබෙනවා. අධික විදුලි බිල ගෙවා ගැනීමට නොහැකිවීම එයට හේතුවයි. ඒ ප්‍රමාණය, විදුලි පාරිභෝගිකයන් 977,933ක්. එය මාසයකට ගත්තොත් 80,911ක ප්‍රමාණයක්. දිනකට ගත්තොත් 2,660ක්. විදුලි බිල ගෙවා ගන්න බැරිව විදුලිබල මණ්ඩලය විදුලි පාරිභෝගිකයන් ලක්ෂ 75න් සියයට 14කගේ විදුලිය විසන්ධි කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2024 මුල් කාර්තුව ගත්තාම ඒක ඊට වඩා බරපතළයි. එහිදී ලංකාවේ විදුලි පාරිභෝගිකයන්ගෙන් සියයට 30ක්, ඒ කියන්නේ 628,286කගේ විදුලිය විසන්ධි කරලා තිබෙනවා. ඒ වාගේම විදුලිබල මණ්ඩලයට විදුලි බිල් නොගෙවීම නිසා දිනකට 3,443කගේ, මාසයකට 104,714කගේ විදුලිය විසන්ධි කරලා තිබෙනවා. මේ අය අමාරුවෙන් ජීවත් වෙන මිනිස්සු. ඒක නිසා තමයි අපි දිගින් දිගටම පසුගිය වසරේ හතර වතාවකට කළ යුතුව තිබුණු විදුලි බිල සංශෝධනය කරන්න කියන ඉල්ලීම මේ පාර්ලිමේන්තුව තුළදීත්, එළියේදීත් කළේ.

ජනාධිපතිතුමා තම ජනාධිපති මැතිවරණ ව්‍යාපාරයේත්, ඉන් පසුව ජනාධිපති වූ පසුවත් තුනෙන් එකකින් විදුලි බිල අඩු කරන බව කිව්වා. අමාත්‍යවරු ගණනාවක් මේ පොරොන්දුව රටට දුන්නා. නමුත් විදුලිබල අමාත්‍යවරයා එවැනි ප්‍රකාශයක් කිසිවකු නොකළ බවත්, විදුලි බිල අඩු කළ හැක්කේ අවුරුදු තුනකින් පමණ පසුව බවත් මේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ප්‍රකාශ කළා. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම ලංකාව පුරාම ගිහිල්ලා විදුලි පාරිභෝගිකයන්, වෘත්තිය සමිති ඒ වාගේම ජනතා නියෝජිතයන්ගේ කරුණු දැක්වීම මත විදුලි බිල සියයට 20කට අඩු කරන මෙන් දැන් නිර්දේශයක් කරලා තිබෙනවා. අපිත් ඒ කොමිෂන් සභාවේ sessionsවලට ගිහිල්ලා පෞද්ගලිකව කථා කළා. එබැවින් මම ඔබතුමාට විශේෂයෙන් කියන්න කැමැතියි, මෙම වැරැදි ගණන් හිලව් ලබා දීමෙන් -

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නය ඉක්මනට ඉදිරිපත් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඉදිරිපත් කරන්නම්.

මම ගරු ඇමතිතුමාට මේ කාරණය කියන්න කැමැතියි. මේක මමත්, ඔබතුමාත් අතර තිබෙන පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. කරුණාකරලා විදුලිබල මණ්ඩලයට කියන්න, ඒ ගොල්ලන්ගේ 2023 වාර්තාවවත් තවම වෙබ් එකට දාලා නැහැ කියන එක. ඔබතුමා හොයා බලන්න. මම මෙච්චර වෙලා උත්සාහ කළා. මේක ඔබතුමාගේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. විදුලිබල මණ්ඩලයේ ඉන්න අය වැඩ කරන්නේ මේ විධියට නම්, රට ඉදිරියට යන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, මේ සම්පූර්ණ ක්‍රියාදාමය පිළිබඳව අපේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන වාර්තාවෙන් මම කියවන්නම්. Final Budget Position Report (Annual Report) 2023 states, I quote:

> "Even though the cost recovery tariff is being implemented since 2022 and the balance sheet was restructured through the transfer of CEB debt to the Government Balance Sheet with the approval of the Cabinet of Ministers, the General Treasury made an equity investment of Rs. 126.3 billion in 2023 as a cross settlement mechanism to settle the long outstanding payable to CPC and Independent Power Producers (IPPs) to further strengthen the balance sheet of CEB. As a result, the debt outstanding to CPC and IPPs stood as Rs. 78.4 billion at the end of 2023, a decline from Rs. 191.8 billion at the end of 2022."

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපට උත්තර දෙන්නේ ඒ නිලධාරින් නිවැරැදිව ඒ තොරතුරු ටික දීලා ඇති කියලා විශ්වාස කරන නිසා. එතුමා ඒ ගැන හොයලා බලලා අපට උත්තර දෙන්නේ. බලාගෙන ගියාම ඒ තොරතුරු සම්පූර්ණයෙන් බොරු. මේ ටික ගත්තේ මම නිකම් ඒවායින් නොවෙයි. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තා තුළින්. ඒක නිසා ගරු කථානායකතුමනි, මම මේ කාරණය කියන්න කැමැතියි. කරුණාකරලා මේ තොරතුරු ලබා දුන් විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු නිලධාරින් වහාම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව හමුවට ගෙනෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. නැත්නම් ඒක නතර වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. සෑම ඇමතිවරයෙකුටම මේක අදාළ වෙනවා. මේ වාගේ අසත්‍ය කිව්වාම ඇමතිවරුනුයි පාර්ලිමේන්තුව ඇතුළේ අපහසුතාවට පත් වෙන්නේ. ඒ නිසා ඒ අයව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව හමුවට ගෙනෙන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. කවුද වැරැද්ද කරලා තිබෙන්නේ, කවුද නිවැරැදි තොරතුරු දීලා තිබෙන්නේ කියලා අපි ඔප්පු කරලා පෙන්වමු. ඔබතුමා මට මේ වෙලාව වෙන් කරලා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම වරප්‍රසාද ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරනවා.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මට ඉතා වැදගත් කාරණයක් සම්බන්ධයෙන් විමසන්න අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය සමුපකාර සංවර්ධන ඇමතිතුමාටයි මම යොමු කරන්නේ. බුලත්කොහුපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

2025.01.21වන දින කල් තබන ලද විවාදය තවදුරටත් පැවැත්වීම, ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

## ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන
### *கிளீன் ஸ்ரீ லங்கா வேலைத்திட்டம்*
### CLEAN SRI LANKA PROGRAMME

[පූ.භා. 11.03]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ගරු කථානායකතුමනි, මට ලබා දුන් කාලය තුළ මම මුලින්ම අවධානය යොමු කරනවා, මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි බිල අඩු කිරීම සම්බන්ධව ගෙන ඇති තීරණය පිළිබඳව. මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ගෙන ඇති තීරණයට ආණ්ඩුව එකඟ වෙලා තිබෙනවා, විදුලි බිලේ සහනය ජනතාවට ලබා දෙන්න. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම මේකේ ලාභය කර්මාන්තවලට, නිෂ්පාදකයන්ට වාගේම අපේ පවුල්වල ගෘහනියන්ටත් ලබා දෙන්න කියලා. අපි විදුලිය භාවිතයෙන් නිෂ්පාදනය කරන ආහාර ද්‍රව්‍ය පිළිබඳව ගත්තොත්, පවුලක් විධියට ඒ පවුලේ මවට ආහාරවල වියදම සම්බන්ධයෙන් බලපෑමක් තිබෙනවා. ඒ නිසා මම නිෂ්පාදකයන්ගෙනුත් ඉල්ලීමක් කරනවා, ගෘහනියන් ඇතුළු සාමාන්‍ය ජනතාවට භාණ්ඩවල හා සේවාවල මිල අඩු කර ලබා දෙන්න කියලා.

මම දැන් යොමු වෙනවා, ඊයේ දවසේත් පැවැත්වුණු, අද දවසේත් පැවැත්වෙන Clean Sri Lanka වැඩසටහන පිළිබඳ විවාදයට. ගරු කථානායකතුමනි, අපට මේ Clean Sri Lanka කියන project එක ගෙනෙන්න ඕනෑ ඇයි? එවැනි project එකක් ගෙනාවේ මේ ආණ්ඩුවට වෙනත් යෝජනාවක් නැති නිසා ද? නැහැ. අද වෙද්දී අපේ රටේ ජනතාවගේ ජීවන පද්ධතියට, පරිසරයට, චර්යා ධර්මවලට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා අපි දන්නවා. ගරු කථානායකතුමනි, ඒ නිසා ශ්‍රී ලාංකීය ජාතියක් විධියට අපේ මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට පත් කරන්න අපට ඕනෑ වෙලා තිබෙනවා. ඒ නිසා ඇත්තටම පාරිසරික වශයෙනුත්, සාමාජයීය වශයෙනුත්, ආචාර ධර්ම පද්ධතිය වශයෙනුත් අපේ රට ඉහළට ඔසවන්න ඕනෑ වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ ආකාරයට අපේ රට ඉහළට ඔසවන්න නම් අපට ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. මොකද, මේ රටේ විවිධ ආයතන තිබෙනවා; පළාත් පාලන ආයතන, රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන ගොඩක් තිබෙනවා. හැබැයි, මේ රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන කොතෙක් තිබුණත්, පසුගිය කාලය තුළ අපේ රටේ ජන ජීවිත හා මිනිසුන්ගේ ආකල්ප, මිනිසුන් හිතන පතන විධිය, මිනිසුන්ගේ චර්යා ධර්ම මොන තැනකට ද වැටිලා තිබුණේ කියලා අපි දැක්කා. ඒ නිසා රටකට නැඟිටින්න නම් අපට බලපාන මේ ආකල්පමය වෙනස අනිවාර්යයෙන්ම ඇති කර ගන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ නිසා යහපත් ආහාර පුරුදු අපට ඕනෑ. ජනතාවට දැනෙන්න ඕනෑ, අපි හොඳ ආහාර වේලක් ගත යුතුයි, ඒක ගන්න අපට අයිතියක් තිබෙනවා කියලා. ඒකට වැඩ පිළිවෙළක් වාගේම ජීවන තත්ත්වය උසස් කිරීමේ වැඩ පිළිවෙළකුත් සමාජයීය වශයෙන් අපේ රටට ඕනෑ වෙනවා. මොකද, අපේ රට තමයි වස විස වැඩි වශයෙන් ආහාරයට ගන්නා ජනතාව සිටින රටවලින් අංක එක. අපි ඉන්නේ සල්ලි දීලා වස විස කන රටක. ඒකට හේතු ගණනාවක් තිබෙනවා. හැබැයි ඒ හේතු ගණනාව තුළ අපි හිතනවා, ජීවන තත්ත්වය උසස් කරන්න නම් පුරවැසියා ශක්තිමත් කරන්න ඕනෑ කියාත්, පාරිසරික වශයෙන් ඒකට බලපාන හේතු අහිමි කරන්න ඕනෑ කියාත්.

අප අවට පරිසරය අරගෙන බලමු. අපි දන්නවා, අපේ රටේ තිබෙන සියලු ගංගා, ඇළ, දොළ, කානු පද්ධති අපවිත්‍ර වෙලා තිබෙන බව. ඒ අපවිත්‍ර වෙලා තිබෙන්නේ ස්වාභාවික සිද්ධීන් නිසාම නොවෙයි, මනුෂ්‍ය ක්‍රියාකාරකම් ද ඊට බලපානවා. මේ මනුෂ්‍ය ක්‍රියාකාරකම් හරහා දිගින් දිගටම සිද්ධවන මේ අපවිත්‍රතාව නිසා ආයෙත් සෘජුවම බලපෑමට ලක් වෙන්නේ අපේ ජීවිත සහ අපේ පරිසරයයි. ඒ නිසා සමහරුන්ට ජීවිතවලින් පවා වන්දි ගෙවන්න සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන් අපිරිසිදු පරිසරයක් තුළ ජීවත්වන මිනිස්සුන්ට ජීවිත පවා අහිමි වෙලා තිබෙනවා. මේකේ වටිනාකමක්, සහසම්බන්ධතාවක් අපේ රටේ ජනතාව තුළ ඇති කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මොකද, අද වැඩි වශයෙන් ඉන්නේ සහකම්පනයක් නැති මිනිස්සු. මේ විධියට අද සහකම්පනයක් නැති ජීවිත ඇති වෙලා තිබෙන්නේ ඇයි? අපට ජීවිතවල වටිනාකමක් නැහැ. අපේ අම්මා කෙනෙක්, එහෙම නැත්නම් රාජකාරියකට යන කාන්තාවක් උදේ පාන්දර 4ට, 5ට නැඟිටලා, උයලා පිහලා, තමන්ගේ දරුවන්ට කවලා පොවලා, අසරණ වෙලා ඉන්න තමන්ගේ අම්මාගේ, තාත්තාගේ වැඩ ටිකත් කරලා, ගෙදර අනෙකුත් වැඩත් කරලා එළියට බහිද්දි දකින්නේ හැම තැනම කුණු දාලා තිබෙන ආකාරය. ඊට පස්සේ ඒ කාන්තාව ඉක්මනින් ගිහිල්ලා බසයකට හෝ දුම්රියකට නඟිනවා. සමහර විට ඇය ඒකේ යන්නේත් බොහෝ අපහසුතා මැද. එහෙම යනකොටත් ඇයට බොහෝ ප්‍රශ්න ඇති වෙනවා. ඇයට මහන්සියි. හැබැයි ඇය රාජකාරියට යනවා. එසේ රාජකාරියට ගියාට පස්සේත් අපේ රටේ මිනිස්සුන්ගේ සිතුම්-පැතුම් අනුව ගැහැනිය ඔවුන්ට ඕනෑ විධියට අවභාවිත කරනවා. අපේ රටේ කාන්තාවන්ගෙන් සියයට 97ක් පොදු ප්‍රවාහන සේවය තුළ ලිංගික හිංසනවලට ලක් වෙනවා. ඒක තමයි ලෝකයම පිළිගත් වාර්තාව. අපට, දරුවෙකුට පරිසරයේ නිදහසේ හැසිරෙන්න බැරිනම්, දරුවෙකුගේ, කාන්තාවකගේ වටිනාකම දැනෙන්නේ නැත්නම්, අපට ඒ ගැන සහකම්පනයක් ඇති වෙන්නේ නැත්නම් මේ රට සංවර්ධනය වෙනවාද කියලා අපි දන්නේ නැහැ. සිතුම්-පැතුම් අතින් සහකම්පනයක් තිබෙන ජනතාවක්, අනෙකා ගැන හිතන ජනතාවක් වාගේම ගැහැනියකට ගරු කරන්න ඕනෑය කියන පරිසරයක් මේ සමාජය තුළ හදලා ආකල්පමය වෙනසකුත් ඇති කරන්න ඕනෑ. ඒකත් අපේ ආචාර ධර්ම පද්ධතිය තුළ ඇති වෙන්න ඕනෑ වෙනසක්.

ගරු කථානායකතුමනි, අපි මේ Clean Sri Lanka වැඩසටහන හරහා සමාජයීය වශයෙන් වාගේම අපේ පරිසරයට හා චර්යා ධර්ම පද්ධතියටත් අපේ වැඩ පිළිවෙළ එකතු කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, මේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා සමහර අයට තේරෙන්නේ නැහැ කිව්වා. මම ඒ වැඩ පිළිවෙළ ගැන මගේ අත්දැකීමෙන්ම කථා කරන්නම්. මම ජීවත් වෙන දෙහිවල-ගල්කිස්ස ප්‍රදේශය ලක්ෂ ගණනක ජනතාවක් ජීවත් වෙන ප්‍රදේශයක්; අධි නාගරික ප්‍රදේශයක්. හැබැයි ඔවුන් උදේ පාන්දර තමන්ගේ සේවා කටයුතුවලට එළියට බැහැලා නගරයට ආවාට පස්සේ නගරයේ හැම තැනකම දකින්න ලැබෙන්නේ මොනවාද? පොදු පහසුකම් නැති නිසා හැම ගලක්, හැම තාප්පයක් ගානෙම මුත්‍රා කරලා තිබෙන තත්ත්වයක් තමයි දකින්න ලැබෙන්නේ. ඒ නිසා ඒ ප්‍රදේශයේ මිනිස්සුන්ට එළියට බැහැලා යන්න බැහැ. මොකද, ඒ සඳහා හොඳ පරිසරයක් ඒ ප්‍රදේශයේ නැහැ. ඒකට හේතුව මොකක්ද කියලා ඇහුවාම ඔවුන් කියපු දේ ඔබතුමන්ලා දන්නවාද? දෙහිවල නගරයෙන් ආරම්භ වන බස් රථ 150ක් විතර තිබෙනවා. හැබැයි ඒ බස් රථ නවත්වන්න තැනක් නැහැ. ඒ නවත්වන බස්වල රියදුරන්ට වැසිකිළි පහසුකම් නැහැ. පිරිසිදු වතුර ටිකක් බොන්න තැනක් නැහැ. පිරිසිදුව කෑම කන්න තැනක් නැහැ. අපි මේවා දැක්කා. ජීවිත ලස්සන කරන්න නම් මේ මිනිස්සු ජීවත් වන පරිසරය හදන්න ඕනෑ. ඔවුන්ට වටිනාකමක් දෙන්න ඕනෑ. ඔවුන්ට අවශ්‍ය පහසුකම් සපයන්න ඕනෑ. ඒ වාගේම ඔවුන් තුළ ආකල්පමය වෙනසකුත් ඇති කරන්න ඕනෑ. ඒක අපි අභියෝගයක් විධියට දැක්කා. ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

ඒ වාගේම තමයි නගරයකට ගිය පසු අපි කාටත් දකින්න පුළුවන්, ඒ අවට තිබෙන සුපර්මාර්කට්වලින් අයින් කරන එළවලු ටික කුණු බක්කිය තුළ සොයමින්, අවුස්සමින් ඒවා අරගෙන ගිහිල්ලා අසල තිබෙන කඩේකට විකුණන අපේ රටේ සිටින තවත් ජන කොට්ඨාසයක්. අපි හදලා තිබෙන රට මොකක්ද? අපේ දරුවන්ට හොඳ ආහාර ටිකක්, පිරිසිදු ආහාර ටිකක් දෙන්න ඕනෑ නැද්ද? අවට තිබෙන කඩවලින් අපේ දරුවන් කන්නේ, ජනතාව ආහාර විධියට ලබා ගන්නේ අපිරිසිදු ආහාර නම්, ඉන් එහාට ගිහිල්ලා ජනතාවට හොඳ ආහාර ටිකක් ලබාගන්න, ඒ වෙනුවෙන් සුරක්ෂිත පරිසරයක් හදන්න අපට වුවමනා නැද්ද? මේ ලස්සන රට තුළ ඒකත් අපට අනිවාර්යයි.

ඒ වාගේම තමයි දුම්රිය ස්ථානයට - Railway Station එකට - ගියාම අපි දකිනවා, එතැනට විදේශිකයන් එන ආකාරය. ඒ විදේශිකයන්ට අවශ්‍ය පොදු පහසුකම් එතැන නැහැ. වැසිකිළියකට යන්න බැරි වුණාම ඒ පහසුකම් ඒ ස්ථානයේ නැති වුණාම ඔවුන් දෙහිවල ඉඳන් නැවත කොටුව Railway Station එකට එනවා. මොකටද? වැසිකිළියකට යන්න. මේක තමයි අපි සංචාරක කර්මාන්තය තුළ හදලා තිබෙන විප්ලවය. ඒ නිසා අපට මේ දේවල් සම්බන්ධව අභියෝගයක් තිබෙනවා. අද දෙහිවල, ගල්කිස්ස වැනි ප්‍රදේශ අතහැරලා වෙනත් ප්‍රදේශවලට -දකුණට, වෙනත් පැතිවලට- සංචාරකයන් යනවා. ඇයි ඒ? මේක අන්ත දූෂිත පරිසරයක් වෙලා තිබෙන නිසා. ඒ දූෂිත පරිසරය, මිනිස්සු හිතන විධිය අපි ලස්සන කරන්න ඕනෑ. ඒ සඳහා වැඩ පිළිවෙළක් ඕනෑ. ඒ නිසා ඊට අවශ්‍ය ව්‍යාපෘතිය අපි හඳුනා ගත්තා.

අපේ ආර්ථිකයට, අපේ ජනතාවට, සේවා සපයන ජනතාවට හා විශේෂයෙන්ම කාන්තාවන්ට අවශ්‍ය ඒ පොදු පහසුකම් නැත්නම් ඒක ප්‍රධාන ගැටලුවක්. මේ ගැටලු ටික අපි හඳුනා ගෙන ඒවා නිරීක්ෂණය කරලා අදාළ අයත් එක්ක ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. ගරු කථානායකතුමනි, පළාත් පාලන ආයතන මෙච්චර කල් ඒ වැඩේ කළා තමයි. හැබැයි, ප්‍රශ්න ගොඩක් ඉතිරි වෙලා තිබෙනවා. තම තමන්ට අයිති ආයතන තම තමන් බේරාගත්තා මිසක් ජන ජීවිත උසස් මට්ටමට ගේන්න, ඒ ජීවිතවලට වටිනාකමක් දෙන්න වැඩ පිළිවෙළක් හදලා තිබුණේ නැහැ. ඒකට තමයි අපි මේ වැඩ පිළිවෙළ ගෙනාවේ. ඒ නිසායි අපි මේ වැඩ පිළිවෙළ තෝරා ගත්තේ. ඒ ප්‍රශ්න ටික සම්බන්ධයෙන් අපි අදාළ පාර්ශ්ව එක්ක සාකච්ඡා කළා. සාකච්ඡා කර අපි ඒ ගැටලු ටික හඳුනා ගත්තා. ජනතාවට පොදු පහසුකම් නැහැ. වතුර ටිකක් බොන්න තැනක් නැහැ. පිරිසිදු ආහාර ටිකක් ගන්න තැනක් නැහැ. ඒ වාගේම ආබාධිත පුද්ගලයන්ට අවශ්‍ය පහසුකම් පොදු ස්ථානවල නැහැ. ආබාධිත පුද්ගලයන්ට අවශ්‍ය පිවිසුම් මාර්ග නැහැ. ඒ නිසා අපි අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු අදාළ සංවිධානවල සියලුදෙනා සමඟ මේ ගැන සාකච්ඡා කළා. අපි කිව්වා, මේ ප්‍රශ්නවලට උත්තර හොයන්න ඕනෑ කියලා. ඒ සඳහා නිල ව්‍යුහයක් අපි ලබා ගත්තා. ඒ වාගේම ප්‍රජාව, සංවිධාන ඇතුළු සියලුදෙනා ඒකට එකතු කර ගත්තා. අපි ඒ යෝජනා ටික දිස්ත්‍රික් ලේකම් කාර්යාලයටත් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ප්‍රශ්න ටිකට විසඳුම් හොයා ගන්න අපි ජනතාවගෙන් උදව් ඉල්ලුවා. වැසිකිළි පද්ධතිය හදන්නේ කොහොමද, බීමට හොඳ වතුර ටිකක් ලබා දෙන්නේ කොහොමද, ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරන්නේ කොහොමද කියලා අපි ඔවුන් සමඟ සාකච්ඡා කළා. ඒ වාගේම අපි මේ ප්‍රදේශ පිරිසිදු කරලා, ඒක රැක ගැනීමේ වටිනාකම සහ මේ ප්‍රදේශවලට ජනතාව ගෙන්වා ගැනීමේ අවශ්‍යතාව ඇති කරලා, ප්‍රජාව සංවිධානය කරලා දැන් එය රැක ගැනීම ඔබ සතු කාර්යයක් කියලා ඔවුන්ට ඒ වගකීම භාර දුන්නා. අපි මුලින්ම ජනතාව දැනුවත් කළා. දෙවනුව ප්‍රශ්න හඳුනා ගත්තා. තුන්වෙනුව රාජ්‍ය ආයතනත් එක්ක එකතු වුණා. ඊට පස්සේ සියලු ආයතනත් එක්ක එකතු වී මේ සඳහා විසඳුම් සෙව්වා. අපි කෙටි කාලීන උත්තර හෙව්වා; මධ්‍ය කාලීන උත්තර හෙව්වා. නමුත්, දීර්ඝ කාලීන උත්තරය තමයි මිනිස්සුන්ගේ වටිනාකම් එකතු කරන, හර පද්ධතීන් එකතු කරන සමාජයක් ඇති කර ගැනීම.

මේ වැඩසටහන ආරම්භ කිරීමේදී අපට ලැබුණු ප්‍රතිචාර මොනවාද කියලා මම ඔබතුමන්ලාට කියන්නම්. දුම්රිය ස්ථානාධිපතිවරයෙකු තබා තිබෙන සටහනක් මම කියන්නම්. "හෙට දිනයේ මෙපුර මත ඉදිවන නවමු දුම්රිය නිකේතනයක සේවාව ලබමින් පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගෙවන්නට රිසි වූ ජන සමූහයක වෙර වෑයමෙන් දියත් වූ සාමූහික ශ්‍රම මෙහෙයුම සාර්ථකව නිම කිරීමට දායක වූ පුරවැසි ඔබට මාගේ ගෞරවනීය ප්‍රණාමය. සාමූහික ශ්‍රම මෙහෙයුම සාර්ථකව නිම කිරීමට දායක වූ පුරවැසි ඔබට මගේ ගෞරව ප්‍රණාමය" එහි එසේ සඳහන් වුණා.

මේක තමයි දුම්රිය ස්ථානාධිපතිතුමාගේ ප්‍රතිචාරය. මේ ධෛර්යය තමයි රටට ඕනෑ; මේ අලුත් බලාපොරොත්තුව තමයි රටට ඕනෑ; මේ කැපවීම තමයි රටට ඕනෑ. ආකල්පමය වෙනසක් ඇති කරන්න නම් රාජ්‍ය හා රාජ්‍ය නොවන පුද්ගලයා හැඟීමක් ඇති කර ගන්න ඕනෑ. ආකල්පමය වශයෙන් වෙනස් වෙලා මේ රට සදාචාරාත්මක රටක්, මනුස්සකම අගයන රටක්, සමාජයට, පරිසරයට ආදරය කරන රටක් බවට පත් කර ගන්න සාමූහිකව එකතු වෙන්න කියා පුරවැසියන්ට ආරාධනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.17]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන ආයතනවලින් කෙරෙන්න ඕනෑ වැඩකොටස්වලින් නොකෙරුණු වැඩ ටික Clean Sri Lanka වැඩසටහන යටතේ ජනාධිපති කාර්ය සාධක බලකායක් හදලා හරි අලුතින් කරනවා නම් අපි ඒ ගැන සතුටු වෙනවා. හැබැයි, Clean Sri Lanka වැඩසටහන තුළින් කරන්න ඕනෑ ඒවා විතරක් නොවෙයි. ත්‍රී වීලර්වල අමතර gadget ගලවන එකයි, බස්වල පොඩි පොඩි කෑලි අයින් කරන එකයි විතරක් නොවෙයි ඒකෙන් කරන්න ඕනෑ. Clean කරන්න ඕනෑ දේවල් clean කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනවාරි මාසයේ 06වන සඳුදා "දිවයින" පුවත් පතේ තිබෙනවා, "පිරිපහදු නොකළ තෙල් ආනයනයෙන් රජයට කෝටි පන්දහසක බදු පොල්ලක්" කියලා. එය නිවැරදි විය යුතුයි, "කෝටි 500ක්" කියලා. ඒ වාගේම, ඒකට

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

අදාළව 12වන දා "The Sunday Times" පුවත් පතේ තිබෙනවා, "Coconut oil import scam leaks Rs. 5 bn in tax evasion" කියලා. ඒ වාගේම, "මව්රට" පුවත්පතේ ඒ ගැන දීර්ඝ විස්තරයක් පළ කරලා තිබෙනවා. ඒ දීර්ඝ විස්තරයට අනුව 2024 ජනවාරි මාසයේ 01වන දාට කලින් පිරිපහදු නොකළ පොල් තෙල් ආනයනය කරලා, පිරිපහදු කරලා විකිණීමේදී VAT එකට යටත් වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක පැහැදිලිව ඒ ගැසට්වල තිබෙනවා, VAT exemption කියලා. නමුත් 2024 ජනවාරි මාසයේ 01වන දා ගැසට් එක අනුව VAT exempt කරපු list එකේ ඒක නැහැ. ඒ කියන්නේ, ගෙවන්න ඕනෑ. ඒ අනුව 2024 ජනවාරි 01වැනි දා ඉඳලා ඔක්තෝබර් මාසයේ අග දක්වා පොල් තෙල් කිලෝග්‍රෑම් 38,814,918ක් මේ රටට ගෙනැල්ලා තිබෙනවා. ඒ, Amro Refiner Pvt. Ltd. එකෙන් කිලෝග්‍රෑම් මිලියන 12.9ක්, Amro Sugars කියන කොම්පැනියෙන් කිලෝග්‍රෑම් මිලියන 1.1ක්, RG Brothers කියන කොම්පැනියෙන් කිලෝග්‍රෑම් 624,000ක්, Sena Refineries කියන කොම්පැනියෙන් කිලෝග්‍රෑම් මිලියන 18.8ක් සහ Sena Mills Refineries (Pvt.) Ltd. එකෙන් කිලෝග්‍රෑම් මිලියන 4.2ක් ආදී වශයෙන්.

ඇත්තවශයෙන්ම මේ තෙල් ලංකාවට ගේනකොට විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද යටතේ පිරිපහදු නොකළ තෙල් කිලෝග්‍රෑම් එකකට රුපියල් 125,000කුත්, පිරිපහදු කළ තෙල් කිලෝග්‍රෑම් එකකට රුපියල් 150,000කුත් වශයෙන් බදු අය කරනවා. ලංකාවට තෙල් ගෙනැල්ලා පිරිපහදු කර විකුණනවා නම් අනිවාර්යයෙන්ම කිලෝග්‍රෑමයකට සියයට 18ක VAT එකක් සහ සියයට 2.5ක සමාජ ආරක්ෂණ බද්දකුත් ගෙවන්න ඕනෑ. ඒ අනුව පිරිපහදු නොකර මේ රටට ගෙන්වපු කිලෝග්‍රෑම් මිලියන 38.8 පිරිපහදු නොකර වික්කා නම් අනිවාර්යයෙන්ම ඒගොල්ලන් රටේ නීතිය කඩ කරලා ජනතාවට වස විස කන්න දීලා තිබෙනවා, සෞඛ්‍ය ඇමතිතුමනි. එසේ නොකර පිරිපහදු කර විකුණා තිබෙනවා නම් දළ වශයෙන් රුපියල් බිලියන 5කට අධික බදු ප්‍රමාණයක් ගෙවන්න ඕනෑ. හොඳම වැඩේ මේකයි. එවකට හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මේ එක සමාගමකින් ලියුමක් යවනවා, tax exemption එක ඉල්ලලා. ඒ අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව 2024.07.31වන දා ආදායම් බදු දෙපාර්තමේන්තුවට මෙහෙම කියලා යවනවා:

> "This refers to the letter dated July 17, 2024 addressed to His Excellency the President by the Managing Director of Sena Mills Refineries (Pvt.) Ltd. on the above."

මේවා ගෙන්වපු පුද්ගලයෝ බදු ගෙවන්නේ නැතිව බදුවලින් තමන්ව නිදහස් කරලා දෙන්න කියලා හිටපු ජනාධිපතිගෙන් ලිඛිතව ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ ලිඛිත ඉල්ලීම අනුව තමයි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැනුම් දීමක් කර තිබෙන්නේ. ඒ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2024.08.29වැනි දා රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවට ඒ බව ලිඛිතව දැනුම් දී තිබෙනවා. එම ලිපියේ මෙසේ සඳහන් වෙනවා:

> "Therefore, IRD is in a position that the Sena Mills Refineries (Pvt.) Ltd. imports crude coconut oil to Sri Lanka and manufactures refined coconut oil is a process of manufacturing and the supply of refined coconut oil liable to VAT with effect from January 1, 2024."

මෙහෙම දැනුම් දීමක් කරලා, ඊට යටින් තවත් කරුණක් මේ විධියට සඳහන් කර තිබෙනවා:

> "IRD recommends that the observations from Sena Mills Refineries (Pvt.) Ltd. should also be taken into account when formulating any policy direction on this matter."

එහෙම අවශ්‍යතාවක් නැහැ, ඒ විධියට ගෙන්වලා බදු නොගෙවන කෙනාගේ මතයක් ගන්න ඕනෑද, බදු ගෙවන්න ඕනෑද, නැද්ද කියලා, ගැසට් පත්‍රයේ පැහැදිලිව තිබෙනවා නම්. විශේෂයෙන්ම එවකට හිටපු ජනාධිපතිවරයාගේ කාර්යාලයෙන් මේ රටේ නීති කඩන්න පුළුවන්ද කියලා බලන්න තමයි මේක දාලා තිබෙන්නේ. මේකේ අපූරු කාරණේ මොකක්ද දන්නවාද? වර්තමාන ජනාධිපතිතුමා ආවාට පසුවත් මේක තවම කෙරෙනවා, ගරු ඇමතිතුමනි.

උදාහරණයක් වශයෙන් කියනවා නම්, ඔක්තෝබර් මාසයේ කිලෝග්‍රෑම් මිලියන 1.65ක් ගෙන්වලා තිබෙනවා. මේ, ගරු අනුර කුමාර දිසානායක මහත්තයා ජනාධිපති වුණාට පස්සේ. දළ වශයෙන් ගත්තොත්, ඒ තුළින් සිදු වූ පාඩුව රුපියල් මිලියන 247යි. ඒ වාගේම නොවැම්බර් මාසයේ ගෙන්වලා තිබෙනවා, කිලෝග්‍රෑම් මිලියන 1.7ක්; දළ වශයෙන් එහි පාඩුව රුපියල් මිලියන 255ක්, වැට් එකෙන්. දෙසැම්බර් මාසයේ කිලෝග්‍රෑම් මිලියන 1.48ක් ගෙන්වලා තිබෙනවා; පාඩුව රුපියල් මිලියන 225යි. එතකොට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ කාලයේ බදු නොගෙවූ ප්‍රමාණය දළ වශයෙන් රුපියල් බිලියන 5යි; ඒ කියන්නේ රුපියල් කෝටි 500ක්. මම දැක්කා ඊයේ ජනාධිපතිතුමා කියනවා, ඊළඟ කන්නයේ වී මිලදී ගන්න වෙන් කරලා තිබෙන්නේත් රුපියල් කෝටි 500යි කියලා. එතකොට මේ පොල් තෙල් සමාගම් පහ මාස 10කට බදු නොගෙවපු ප්‍රමාණයත් රුපියල් කෝටි 500යි.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා මතු කළේ වැදගත් ප්‍රශ්නයක්. ඒ නිසා එතුමාට මේ ප්‍රශ්නයට උත්තරයක් ලබා දිය යුතුයි. මේ ප්‍රශ්නය මම දැන් Sri Lanka Customs එකේ DGටත් යොමු කළා. බදු වංචාවක් කරලා තිබෙනවාද කියන එකත්, ඒ වාගේම මේ සිදු වෙලා තිබෙන සිද්ධිය සම්බන්ධයෙන් ඔබතුමා මතු කරන ප්‍රශ්නයට අදාළව විස්තරාත්මක පිළිතුරකුත් මම ඔබතුමාට හෙට දවසේදී ලබා දෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු අමාත්‍යතුමනි, "මව්රට" පුවත්පතේ මේ සම්බන්ධව විස්තරාත්මකව තිබෙනවා. ඔබතුමා ඒ සම්බන්ධව පිළිතුරක් ලබා දෙන්න. *[බාධා කිරීමක්]* නැහැ. "දිවයින" පුවත් පතේ තිබෙනවා, "The Sunday Times" පුවත් පතේ තිබෙනවා. ඔබතුමා හෙට පිළිතුරක් ලබා දෙන්න. *[බාධා කිරීමක්]* හොඳයි. ඔබතුමා හෙට පිළිතුරක් ලබා දෙන්න. දැන් මගේ කථාවට නියමිත වෙලාව නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you may proceed, please.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් කියන මාස තුනේ විතරක් දළ වශයෙන් රුපියල් මිලියන 700ක බදු ගෙවීම් පැහැර හැරලා තිබෙනවා. ඒ, වර්තමාන

ජනාධිපතිතුමා පත් වුණාට පස්සේ. ඒ නිසා clean කරනකොට මේවාත් clean කරගෙනම යන්න. මොකද, එහෙම නැතිව පාරේ කුණු තිබෙන තැන් clean කරලා, කානු clean කරලා, මදුරුවෝ බෝ වෙන තැන් clean කරලා පමණක් මදි. මූලා වංචා, බදු නොගෙවීම් වාගේ දේවලුත් clean කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා clean කරද්දී අසත්‍ය කියන එකත් clean කරන්න ඕනෑ. ජනාධිපතිවරණයට පෙර කිව්වා, විදුලි බිල රුපියල් 9,000 ඉඳලා රුපියල් 6,000ට අඩු කරනවා කියලා. ගල්ගමුවේ රැස්වීමේදීත් කිව්වා, රුපියල් 6,000 ඉඳලා රුපියල් 4,000ට විදුලි බිල අඩු කරනවාය කියලා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. මම එතැනට එන්නම්. විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කියලා තමයි කිව්වේ. හැබැයි, ඊට පස්සේ ගිය සතියේදී කිව්වා, නැහැ, විදුලි බිල සියයට 37කින් වැඩි කරන්නයි වෙන්නේ කියලා. එහෙම කරන්න බැහැ. රුපියල් බිලියන 139ක් ලාභ ලබලා තිබියදීත් විදුලි බිල වැඩි කරන්න වෙනවාය කිව්වා. නමුත්, ජනතාවගේ සහ විපක්ෂයේ පීඩනය නිසා -මහ ජනතාවගේ බලපෑම මත- මහජන උපයෝගිතා කොමිසමට සිද්ධ වුණා, විදුලි බිල සියයට 20කින් අඩු කරන්න. ඒක මදි ඇත්තටම. හැබැයි, කමක් නැහැ, සියයට 20ක් හරි අඩු වුණා නේ.

අපිට මතකයි, පසුගිය වතාවේ විදුලි බිල වැඩි වනකොට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයත් විදුලි බිල වැඩිවීම නිසා ඒගොල්ලන්ගේ බිලත් වැඩි කරන්න වෙනවාය කියලා කිව්වා. පසුගිය දවසක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ Mid-Year Fiscal Position Report - 2024 අනුව මට මතක විධියට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රුපියල් බිලියන 24ක් ලාභ ලබා තිබෙනවා. ඒ නිසා විදුලි බිල වැඩි කරද්දී ජල බිල්පත වැඩි කළා නම් අද විදුලි බිල අඩු වෙද්දී ජල බිල්පත අඩු කිරීමට කටයුතු කිරීම ආණ්ඩුවේ වගකීමක්. ඒ පිළිබඳවත් හෙට උත්තරයක් දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද මේවාත් කරන්න ඕනෑ.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉස්සර වෙලා රාසමාණික්කම් මන්ත්‍රීතුමාගෙන් අවස්ථාව ඉල්ලාගෙන නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් ඇහුවා; එතුමා ඒකට හරි උත්තරයක් දුන්නේ නැහැ. එතුමාට ඒ සම්බන්ධව වැරදි තොරතුරු ලබා දීලා තිබෙනවාය කියලා තමයි මට නම් හිතෙන්නේ. ඇත්ත වශයෙන්ම ඊයේ මීතොටමුල්ල 101 වත්තේ ගෙවල් 5ක් කඩලා අයින් කළා. නඩු තීන්දුවක් අනුව තමයි අයින් කරලා තිබෙන්නේ. තව ගෙවල් 15ක් තිබෙනවා. ඒ නඩුව දැම්මේ මිනිස්සු නොවෙයි. UDA එකෙන් දාපු නඩුවකටයි තීන්දුව දුන්නේ. UDA එකෙන් දාපු නඩුවට දීපු තීන්දුව අනුව මමත් පිළිගන්නවා, ඒක commercial land එකක්; ඒක UDA එකට අයිති විය යුතුයි; එතැන මහා පරිමාණ සංවර්ධන වැඩකටයුත්තක් විය යුතුයි; ඒ මිනිස්සු යවන්න ඕනෑ කියන එක. ඒක ඇත්ත. හැබැයි ඒ අයින් කළ විධියයි වැරදි. මොකද, මෙහි නිධාන කථාවක් තිබෙනවා. ඒ නිධාන කථාව එතුමා දන්නේ නැහැ, එතුමාට තේරුම් කරලාත් නැහැ. ඒ මිනිස්සු බලෙන් අයින් කරන එක ආරම්භ කළේ, හිටපු අමාත්‍ය සරත් වීරසේකර. ඔහුගේ දැඩි වෛරයක් තිබුණා, ඒ මිනිස්සු එක්ක; ඒ අයව එතැනින් අයින් කරන්න. රුපියල් ලක්ෂ 10ක් ගෙවලා ගෙයක් ගන්න කිව්වාට එදිනෙදා කුලී වැඩ කරන, පිටකොටුවට ගිහිල්ලා පේමන්ට් එකේ බිස්නස් කරන මිනිසුන්ට එහෙම ගන්න බැහැ. අර හිටපු අනුපවුල් ඔක්කෝටමත් - පසුගිය කාලයේ ඒ දුන්නු 80න් - රුපියල් ලක්ෂ 10 ගෙවනවා නම් ගන්න පුළුවන්කම තිබුණා. ඒ අයට ගෙවන්න බැරි නිසා පසුව හිටපු අධ්‍යක්ෂ ජනරාල් එක්ක පවත්වපු සාකච්ඡාවේදී බස්නාහිර පළාත් අධ්‍යක්ෂ යෝජනා කළා, රුපියල් ලක්ෂ 10ක් ගෙවන්න බැරි නම් රුපියල් ලක්ෂ 5ක් ගෙවන්න, අපි ඒ මිනිසුන්ට ගෙවල් දෙන්නම් කියලා. රුපියල් ලක්ෂ 5ක් තියා රුපියල් 50,000ක්වත් ගෙවා ගන්න බැහැ ඒ මිනිසුන්ට. ඒ නිසා තමයි ඒ මිනිස්සු එතැන රැඳිලා හිටියේ. ඒ අයට පදිංචිය තහවුරු කරන්න අමුතුවෙන් දේවල් අවශ්‍ය නැහැ. ග්‍රාම නිලධාරිගෙන් සහතිකය ගන්න පුළුවන්. වරිපනම් බිල් තිබෙනවා. වතුර බිල් තිබෙනවා. Electricity bills තිබෙනවා. මාර වැඩේ කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දවසක ඒ මිනිස්සුන්ගේ වතුර කපලා ගියා, එතැනින් එළවන්න. නමුත් කොළොන්නාව සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී එහි සභාපති එරංග ගුණසේකර මැතිතුමාත් මමත් දෙදෙනාම එකට ඉඳගෙන විසඳුමක් යෝජනා කරලා, විසඳුම ක්‍රියාත්මක කරන්න සම්බන්ධීකරණ කමිටුවේ බලතල ප්‍රකාරව උපදෙස් දුන්නා. හැබැයි, ඒක සත පහකට මායිම් කළේ නැහැ. වතුර දුන්නේ නැහැ. ජල සම්පාදන මණ්ඩලය සම්බන්ධීකරණ කමිටුවේ තීරණය සත පහකට මායිම් කරලා නැහැ. අන්න එහෙමයි දැන් කටයුතු සිදු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ලක්සඳ සෙවණ" නිවාස ව්‍යාපෘතියේ නිවාස තිබෙනවා. මේ කඩලා තිබෙන්නේ පිළිකා රෝගියෙකුගේ ගෙයක්; රෝද පුටුවක ඉන්න කෙනෙකුගේ ගෙයක්; පපුවේ සිදුරක් තිබෙන දරුවෙක් හිටපු ගෙයක්. තවත් 15දෙනෙකුගේ ගෙවල් කඩන්න තිබෙනවා. ඒ නිසා නඩු තීන්දුවයි ඒ අයට ගෙවල් ලබා දීමයි කියන්නේ කාරණා දෙකක්. ඒ දෙක එකක් වෙන්නේ නැහැ. මේ ආණ්ඩුව හැම වෙලාවේම ජන වරමේ තරම ගැන කථා කරනවා නේ. ජන වරමේ තරම ගැන කථා කරමින්, මිනිස්සු මහ පාරට ඇද දමලා කරන සංවර්ධනය මොකක්ද? මොකක්ද ඒකේ තේරුම? ලස්සන ජීවිතයක් දෙනවාය කියලා නේ බලයට ආවේ. ඉන්න ගෙයින් එළියට ඇද දැම්මාම කොහොමද ලස්සන ජීවිතයක් ලබා දෙන්නේ? ඒ නිසා UDA විෂය භාර ඇමතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. UDA එකේ හදපු ගෙවල් තිබෙනවා. කොළොන්නාවේම ගෙවල් තිබෙනවා. ඒවා ලබා දෙන්න පුළුවන්. ලබා දීම සඳහා කළ යුත්තේ එක දෙයයි; UDA එකට උපදෙස් දෙන්න, Board decision එකක් ගන්න විතරයි තිබෙන්නේ. ඕනෑ නම් රුපියල් 100,000ක මූලික ගෙවීමක් කරලා ඉතුරු ටික වාරික වශයෙන් ගෙවන්න පුළුවන් විධියට ලබා දෙන්න පුළුවන්. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, ප්‍රගතිශීලී දේශපාලන අදහස් පිරිවරාගෙන ආපු ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා දුප්පත් මිනිසුන්ට මේ අපරාධය කරන්න එපා, මේ කෙනෙහිලිකම් කරන්න දෙන්න එපා කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම කථාව අවසන් කරනවා.

උසාවි තීන්දුවට ගරු කරලා ඒවා කඩපු බව ඇත්ත. හැබැයි ඒ මිනිස්සු මහ පාරට ඇද දමලා දරු පවුල් අනාථ කරන්නේ නැතුව ඒ අයට ගෙවල් ලබා දීම සඳහා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නය සම්බන්ධයෙන් මම දැනුම් දුන්නාම Sri Lanka Customs එකේ DG මට කථා කළා. එතුමා කිව්වා, තව පැයක් ඇතුළත මට සියලු විස්තර ලබා දෙන්නම් කියලා, ඒ කියන්නේ මේ සමාගම් පහ ආනයනය කරන ලද පොල් තෙල් සහ ඒ අය refine

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කරලා export කළා නම් ඒ export කළ ප්‍රමාණය -මොකද, ඒ ගොල්ලන්ට SVAT පහසුකම දෙන්න ඕනෑ, ආනයනය කිරීම සඳහා - සහ ලංකාවේ විකිණුවා නම් ඒ ප්‍රමාණය පිළිබඳවත්, ඒ අතරම වංචාවක් සිදුවෙලා තිබෙනවා නම් ඒ පිළිබඳවත් අද හවස් වෙනකොට උත්තරයක් දෙනවා. ඔබතුමාට පාර්ලිමේන්තුවේ ඉන්න කියලා මම දැනුම් දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Anton Jayakody, please. You have 12 minutes.

[පූ.භා. 11.32]

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ උදෑසන ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා Clean Sri Lanka වැඩසටහන සම්බන්ධයෙන් මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කරලා විවාදයක් ඉල්ලුවා. ඒ අනුව ඒ සඳහා දින දෙකක කාලයක් ලබා දුන්නා. ඊයේ මට හිතුණා, මේකට දින දෙකක කාලයක් වැඩියි නේද කියලා. නමුත් දැන් හිතෙනවා, දින දෙකක කාලය ප්‍රමාණවත්ම නැහැයි කියලා. මොකද, Clean Sri Lanka වැඩසටහනට අදාළව ඉදිරිපත් කරන කරුණු විපක්ෂය තේරුම් ගන්නේ නැහැ. ඒවා තේරෙන්නේ නැහැම කියනවා. ඉතින් ආණ්ඩු පක්ෂය හැටියට අපට වගකීමක් තිබෙනවා, ඔවුන්ට තේරෙනකල්ම මේ ගැන කියන්න. අන්න ඒ අර්ථයෙන් ගත්තොත්, මේකට දින දෙකක කාලය ප්‍රමාණවත් නැති වෙයි කියලායි මම හිතන්නේ.

ජාතික ජන බලවේගය, ආණ්ඩුවක් හදන්න මීට මාස දෙකකට කලින් ඡන්දයකට ඉදිරිපත් වුණා. එම ඡන්දයේදී මේ රටේ සමස්ත පුරවැසියන්ගෙන් බහුතරය අපේ වැඩ පිළිවෙළට කැමැත්ත දුන්නා. ඒ වාගේම පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගතකිරීම සඳහා අපේ රටේ ජනතාවගෙන් - මේ රටේ පුරවැසියන්ගෙන් - බහුතරයක් ඒ වැඩ පිළිවෙළට කැමැත්ත දුන්නා. එහි ප්‍රතිඵලයක් හැටියට පාර්ලිමේන්තුව නියෝජනය කරන අපේ මන්ත්‍රී ධුර සංඛ්‍යාව 159ක් බවට පරිවර්තනය වුණා. සමහර දිස්ත්‍රික්කවලින් ඡන්ද 400ක්, 500ක් වාගේ වැඩි වුණා නම් තවත් මන්ත්‍රී ආසන 4ක්, 5ක් වැඩි වෙන්නත් තිබුණා.

මේ රට පොහොසත් රටක් බවට පරිවර්තනය කරන අපේ මේ වැඩ පිළිවෙළ බිමෙහි ක්‍රියාත්මක කර ගැනීම සඳහා තමයි Clean Sri Lanka කියන වැඩ පිළිවෙළ හඳුන්වා දෙන්නේ. මේ වැඩසටහන දැනටමත් ක්‍රියාත්මකයි. මෙම වැඩ පිළිවෙළ ප්‍රධාන කුලුනු තුනක් මත ගොඩනැඟුණු වැඩ පිළිවෙළක්. ඒ තමයි, සමාජයීයව, පාරිසරිකව සහ සදාචාරාත්මකව කියන කුලුනු තුන. මෙන්න මේ කුලුනු තුන මත අපි, ආණ්ඩුව - රජය - සහ මහජනතාව කියන මේ තුන්ගොල්ලන්ම එකතුවෙලා, මේ රට පොහොසත් රටක් බවට පරිවර්තනය කිරීමේ වැඩ පිළිවෙළට දායක වෙන්න ඕනෑ. එහිදී මම නියෝජනය කරන පරිසර අමාත්‍යාංශයටත් වැඩි වැඩ කොටසක් තිබෙනවා.

මේ රටේ පරිසරය අරගෙන බැලුවොත්, ශේෂ පත්‍රයක් හැටියට අපට මොන වාගේ පරිසරයක්ද ඉතිරිවෙලා තිබෙන්නේ කියලා බැලිය යුතුයි. ඒ පිළිබඳව මට උදාහරණ දෙකකින් තුනකින් කියන්න පුළුවන්. එකක් තමයි උමා ඔය ව්‍යාපෘතිය. උමා ඔය ව්‍යාපෘතිය නිසා සිදු වුණු පාරිසරික විනාශය මොකක්ද කියලා අපි පාරිසරික විගණනයක් සිදු කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ඔලුවිල්හි වරායක් ඉදි කළා. ඒ ප්‍රදේශයේ හිටපු ඇමතිවරයාගේ හිතුමතයට තමයි ඔලුවිල් වරාය ඉදි කළේ. එම ස්ථානය ඒ වරාය සඳහා සුදුසු ස්ථානයක් නොවෙයි. එහි site investigation එක සිදු කළේ කොහොමද කියන එකත් ප්‍රශ්නකාරියි. දැන් ඒක අතහැර දමා තිබෙනවා. Oluvil beach එකට ගියොත්, ඒ වරාය නිසා සිදු වුණු හානිය, ඒ වරාය නිසා සිදු වුණු මුදල් නාස්තිය, ඒ නිසා සිදු වන දැවැන්ත මුහුදු ඛාදනය අපට පෙනෙනවා. ඉඩම් පිටින් මුහුදට ගලවාගෙන යන හැටි අපට පෙනෙනවා.

ඔලුවිල් විශ්වවිද්‍යාලයත් ඒ වාගේමයි. අපි විශ්වවිද්‍යාල ආරම්භ කරන්න ඕනෑ. ඒකේ දෙකක් නැහැ. හැබැයි, සුදුසු ස්ථානවල. පසුගිය මාස දෙක ඇතුළත ඔලුවිල් විශ්වවිද්‍යාලය, ඒ කියන්නේ South Eastern University එක දෙවතාවක් වතුරෙන් යටවෙලා වසා දමා තිබෙනවා. මේ වෙනකොටත් එය වහලා තිබෙන්නේ. ඉතින්, මේ රටේ සංවර්ධන ක්‍රියාවලියේදී හිතුමතේට වැඩ කිරීම නිසා සිද්ධ වෙලා තිබෙන අලකලංචි ගැන මට ඕනෑ තරම් කියන්න පුළුවන්. මේ විනාඩි 12 තුළ විතරක් නොවෙයි, පැයක් තුළ වුණත් ඒ සම්බන්ධයෙන් විග්‍රහ කරන්න මට පුළුවන්. මෙන්න මේ ශේෂ පත්‍රය තුළ තමයි අපි කථා කරන්නේ. මෙන්න මේ ව්‍යාපෘති, ඒ වාගේම මේ පරිසරය clean කරන්නේ කොහොමද කියන වගකීම අපට තිබෙනවා. මිනිසාටත්, මේ රටේ සතා සිවුපාවාටත් ජීවත් විය හැකි ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීමේ වගකීම වර්තමාන ආණ්ඩුවට පැවරී තිබෙනවා. අපි ඒ වගකීම ඉටු කරමින් ඉන්නවා. Clean පරිසරයක් තුළින් අවසානයේ නිර්මාණය කරන්නේ මොකක්ද? Clean මනසක්, clean මනසක් සහිත සමාජයක්, clean මනසක් සහිත පුරවැසියන් පිරිසක් ඒ තුළින් මේ රටේ නිර්මාණය කරනවා. Clean mind එකක් - පිරිසිදු මනසක් - සහිත පුරවැසියන් ඉන්න ලංකාවක් නිර්මාණය වුණොත් එහි සංස්කෘතිය ඉහළ ගුණාත්මක සංස්කෘතියක් බවට පරිවර්තනය වෙනවා; එහි ජනතාව ඉහළ රස වින්දනයක් සහිත ජනතාවක් බවට පරිවර්තනය වෙනවා. හැබැයි එතකොට බැහැ, ඒ ජනතාව අන්දන්න.

විපක්ෂයේ ඉන්න මේ මන්ත්‍රීවරුන් ජනතාවගේ රස වින්දනයේ තත්ත්වය ඒ දවස්වල කොහොමද මැන්නේ කියා අපට මතකයි. වරායක් හදලා ඒ වරායේ වතුර පුරවන්න කලින් එහි පතුල බලලා සතුටු වන සංස්කෘතියක් එදා නිර්මාණය කළා. ගම්වල ඉඳන් එන්න බස් පවා දැම්මා. ගම්වල මිනිසුන් ඒ බස්වලින් ඇවිත් වරායේ පතුල බලලා සතුටු වන, වින්දනයක් ලබන තත්ත්වයක් ඒ රජය ඇති කළා. Expressway එක ගත්තත් එහෙමයි. අධිවේගී මාර්ගයේ පයින් යන අවසන් දිනයක් නම් කරලා මිනිසුන්ට එන්න කිව්වා; බස් පවා දැම්මා. මිනිසුන් ඇවිත් ඒ පාරේ ගිහින් වින්දනයක් ලබන තත්ත්වයක් ඇති කළා. මේ රටේ, මේ සමාජයේ පුරවැසියන්ගේ රස වින්දනය විය යුත්තේ මොකක්ද කියලා හරිහැටි අවබෝධයක් නැතිව කරපු ඒ වැඩ නිසාම ජනතාවට තම මනස ඉතා ඉහළ රස වින්දනයක් සහිත මනසක් බවට පරිවර්තනය කර ගන්න තිබුණු අවස්ථාව මෙතුමන්ලා වැළැක්වූවා කියලා මම හිතනවා. අපේ රටේ ජනතාව clean mind එකක් සහිත, ඉහළ රස වින්දනයක් සහිත මිනිසුන් බවට පරිවර්තනය කරන්න ඕනෑ. ඒ වගකීම අපට තිබෙනවා.

ඒ වාගේම, තර්කානුකූලව හිතන සමාජයක් බවට අපි මේ සමාජය පරිවර්තනය කරන්න ඕනෑ. තර්කානුකූලව හිතන සමාජයක් අත්‍යවශ්‍යයි කියා මම හිතනවා. පොළොව පළාගෙන නයෙක් ආවාම ඒ නයාට ප්ලාස්ටික් බෝතලය පළාගෙන යන්න බැරි ඇයි කියලා හිතන සමාජයක් අපි නිර්මාණය කරන්න ඕනෑ.

එකී සමාජයක් දැන් නිර්මාණය වෙමින් පවතිනවා. අප එවැනි සමාජයක් නිර්මාණය කළොත්, ඊළඟ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා විපක්ෂය පැත්තේ තිබෙන තවත් පේළි දෙකක් වෙන් කරන්න මෙහි කාර්ය මණ්ඩලයට සිදු වෙයි කියා මම හිතනවා.

ඉදිරියේදී අපි මෙම වැඩ පිළිවෙළ සාර්ථකව නිම කරනවා. නිර්මාණශීලී ජනතාවක්, නිර්මාණශීලී සමාජයක්, ඉහළ රස වින්දනය සහිත සමාජයක් හදලා අපි ඒ අය හොඳ ආර්ථික වැඩ පිළිවෙළකට ගොනු කර ගන්නවා. ඒ වාගේම, හොඳ නිෂ්පාදන ආර්ථිකයක් සහිත රටක් බවට මේ රට පරිවර්තනය කරන්න ඕනෑ; තර්කානුකූලව හිතන, ඉහළ නව නිපැයුම් සිදු කරන ජනතාවක් බවට මේ ජනතාව පත් කර ගන්න ඕනෑ. ඒ සඳහා clean mind එකක් - clean මනසක් - සහිත පුද්ගලයින් නිර්මාණය කර ගන්න ඕනෑ. Clean mind එකක් නිර්මාණය කර ගන්නේ කොහොමද? Clean mind එකක් නිර්මාණය කර ගන්න නම් clean පරිසරයක් තිබෙන්න ඕනෑ. අන්න ඒ වැඩ පිළිවෙළ තමයි මෙහි තිබෙන්නේ.

Clean Sri Lanka වැඩ පිළිවෙළ ගත්තොත්, මෙය හුදු නගරයේ තිබෙන කුණු ටික ඉවත් කිරීම සිදු කරන වැඩ පිළිවෙළක් පමණක් නොවෙයි. මේක දැවැන්ත වැඩ පිළිවෙළක්. Clean Sri Lanka කියන මේ දැවැන්ත වැඩ පිළිවෙළේ සාර්ථකත්වය අපේ අමාත්‍යාංශවලටත්, මේ රටේ තිබෙන සියලු කොටස්වලටත් බලපානවා. මේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මෙහි සිටින අපේ මන්ත්‍රීවරුන් 159 දෙනාම අදහස් දක්වද්දී ඒ ඒ කොටස්වලට අදාළව ඒ ඒ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි, විපක්ෂයට ඒක තේරුම් ගන්න බැහැ. එතුමන්ලා ඒවා තනි තනි හැටියට අරගෙන ඒ එකිනෙක ගැළපෙන්නේ නැහැ කියලා කියනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා, මෙහි තනි තනි වචනය වෙනුවට සමස්ත වැඩ පිළිවෙළම තේරුම් ගන්න කියලා. එහෙම වුණොත් ඉතාම පහසුයි මෙය තේරුම් ගන්න. අපේ නිෂ්පාදන ආර්ථිකයට Clean Sri Lanka කියන වැඩ පිළිවෙළ ඉතාම යෝග්‍ය වන ආකාරයට තමයි අපි එය සකසා තිබෙන්නේ.

කෘෂි කර්මාන්තය ගත්තොත්, කෘෂි කර්මාන්තයේ හොඳ productivity එකක් අපට අවශ්‍ය වෙනවා. උදාහරණයක් විධියට වී ගොවිතැන ගත්තොත්, අපේ බලාපොරොත්තුව තමයි වී ගොවිතැනින් හෙක්ටෙයාර එකකට දැන් ලැබෙන වී අස්වැන්න මෙට්‍රික්ටොන් 6ක් දක්වා ඉහළ දමා ගැනීම. එහිදී අපට පොහොර අවශ්‍ය වෙනවා. ඒ පොහොර අවශ්‍යතාව සැපිරීමට එප්පාවල පොස්පේට්වලින් single super phosphate හදන කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමේ මූලික අඩිතාලම අපි මේ වන විට දමමින් ඉන්නවා. ඒ වාගේම, මධ්‍ය කාලීන හෝ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් හැටියට අපි මේ රටේ යූරියා නිෂ්පාදනය පටන් ගන්න ඕනෑ. අපි යූරියා නිෂ්පාදනය පටන් ගන්නවා. කෘෂි කර්මාන්තය සඳහා, අස්වැන්න වැඩි කර ගැනීම සඳහා වතුර අවශ්‍යයි. වතුර අවශ්‍ය නම් ඇළ, වේලි හොඳට තිබෙන්න ඕනෑ. ඒ වාගේම වැව් හොඳට තිබෙන්න ඕනෑ. වැව් පිළිසකර කිරීමත්, පිරිසිදු කිරීමත් මෙහි එක වැඩක්. වැවක් පිරිසිදු කළා කියලා දැවැන්ත විවේචන ඉදිරිපත් කරන්න එපා. Clean mind එකක් - පිරිසිදු මනසක් - සහිත පුරවැසියන් ඉන්න ලංකාවක් නිර්මාණය වුණොත් එහි සංස්කෘතිය ඉහළ ගුණාත්මක සංස්කෘතියක් බවට පරිවර්තනය වෙනවා; එහි ජනතාව ඉහළ රස වින්දනයක් සහිත ජනතාවක් බවට පරිවර්තනය වෙනවා. හැබැයි එතකොට බැහැ ඒ ජනතාව අන්දන්න.

විපක්ෂයේ ඉන්න මේ මන්ත්‍රීවරුන් ජනතාවගේ රස වින්දනයේ තත්ත්වය ඒ දවස්වල කොහොමද මැන්නේ කියා අපට මතකයි. වරායක් හදලා ඒ වරායේ වතුර පුරවන්න කලින් එහි පතුල බලලා සතුටු වන සංස්කෘතියක් එදා නිර්මාණය කළා. ගම්වල ඉඳන් එන්න බස් පවා දැම්මා. ගම්වල මිනිසුන් ඒ බස්වලින් ඇවිත් වරායේ පතුල බලලා සතුටු වන, වින්දනයක් ලබන තත්ත්වයක් ඒ රජය ඇති කළා. Expressway එක ගත්තත් එහෙමයි. අධිවේගී මාර්ගයේ පයින් යන අවසන් දිනයක් නම් කරලා මිනිසුන්ට එන්න කිව්වා; බස් පවා දැම්මා. මිනිසුන් ඇවිත් ඒ පාරේ ගිහින් වින්දනයක් ලබන තත්ත්වයක් ඇති කළා. මේ රටේ, මේ සමාජයේ පුරවැසියන්ගේ රස වින්දනය විය යුත්තේ මොකක්ද කියලා හරිහැටි අවබෝධයක් නැතිව කරපු ඒ වැඩ නිසාම ජනතාවට තම මනස ඉතා ඉහළ රස වින්දනයක් සහිත මනසක් බවට පරිවර්තනය කර ගන්න තිබුණු අවස්ථාව මෙතුමන්ලා වැළැක්වූවා කියලා මම හිතනවා. අපේ රටේ ජනතාව clean mind එකක් සහිත, ඉහළ රස වින්දනයක් සහිත මිනිසුන් බවට පරිවර්තනය කරන්න ඕනෑ. ඒ වගකීම අපට තිබෙනවා.

ඒ වාගේම, තර්කානුකූලව හිතන සමාජයක් බවට අපි මේ සමාජය පරිවර්තනය කරන්න ඕනෑ. තර්කානුකූලව හිතන සමාජයක් අත්‍යවශ්‍යයි කියා මම හිතනවා. පොළොව පළාගෙන නයෙක් ආවාම ඒ නයාට ප්ලාස්ටික් බෝතලය පළාගෙන යන්න බැරි ඇයි කියලා හිතන සමාජයක් අපි නිර්මාණය කරන්න ඕනෑ. එකී සමාජයක් දැන් නිර්මාණය වෙමින් පවතිනවා. අප එවැනි සමාජයක් නිර්මාණය කළොත්, ඊළඟ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා විපක්ෂය පැත්තේ තිබෙන තවත් පේළි දෙකක් වෙන් කරන්න මෙහි කාර්ය මණ්ඩලයට සිදු වෙයි කියා මම හිතනවා.

ඉදිරියේදී අපි මෙම වැඩ පිළිවෙළ සාර්ථකව නිම කරනවා. නිර්මාණශීලී ජනතාවක්, නිර්මාණශීලී සමාජයක්, ඉහළ රස වින්දනය සහිත සමාජයක් හදලා අපි ඒ අය හොඳ ආර්ථික වැඩ පිළිවෙළකට ගොනු කර ගන්නවා. ඒ වාගේම, හොඳ නිෂ්පාදන ආර්ථිකයක් සහිත රටක් බවට මේ රට පරිවර්තනය කරන්න ඕනෑ; තර්කානුකූලව හිතන, ඉහළ නව නිපැයුම් සිදු කරන ජනතාවක් බවට මේ ජනතාව පත් කර ගන්න ඕනෑ. ඒ සඳහා clean mind එකක් - clean මනසක් - සහිත පුද්ගලයින් නිර්මාණය කර ගන්න ඕනෑ. Clean mind එකක් නිර්මාණය කර ගන්නේ කොහොමද? Clean mind එකක් නිර්මාණය කර ගන්න නම් clean පරිසරයක් තිබෙන්න ඕනෑ. අන්න ඒ වැඩ පිළිවෙළ තමයි මෙහි තිබෙන්නේ.

Clean Sri Lanka කියන වැඩ පිළිවෙළ ගත්තොත්, මෙය හුදු නගරයේ තිබෙන කුණු ටික ඉවත් කිරීම සිදු කරන වැඩ පිළිවෙළක් පමණක් නොවෙයි. මේක දැවැන්ත වැඩ පිළිවෙළක්. Clean Sri Lanka කියන මේ දැවැන්ත වැඩ පිළිවෙළේ සාර්ථකත්වය අපේ අමාත්‍යාංශවලටත්, මේ රටේ තිබෙන සියලු කොටස්වලටත් බලපානවා. මේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මෙහි සිටින අපේ මන්ත්‍රීවරුන් 159 දෙනාම අදහස් දක්වද්දී ඒ ඒ කොටස්වලට අදාළව ඒ ඒ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි, විපක්ෂයට ඒක තේරුම් ගන්න බැහැ. එතුමන්ලා ඒවා තනි තනි හැටියට අරගෙන ඒ එකිනෙක ගැළපෙන්නේ නැහැ කියලා කියනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා, මෙහි තනි තනි වචනය වෙනුවට සමස්ත වැඩ පිළිවෙළම තේරුම් ගන්න කියලා. එහෙම වුණොත් ඉතාම පහසුයි මෙය තේරුම් ගන්න. අපේ නිෂ්පාදන ආර්ථිකයට Clean Sri Lanka කියන වැඩ පිළිවෙළ ඉතාම යෝග්‍ය වන ආකාරයට තමයි අපි එය සකසා තිබෙන්නේ.

කෘෂි කර්මාන්තය ගත්තොත්, කෘෂි කර්මාන්තයේ හොඳ productivity එකක් අපට අවශ්‍ය වෙනවා. උදාහරණයක් විධියට වී ගොවිතැන ගත්තොත්, අපේ බලාපොරොත්තුව තමයි වී ගොවිතැනින් හෙක්ටෙයාර එකකට දැන් ලැබෙන වී අස්වැන්න මෙට්‍රික්ටොන් 6ක් දක්වා ඉහළ දමා ගැනීම. එහිදී අපට පොහොර අවශ්‍ය වෙනවා. ඒ පොහොර අවශ්‍යතාව සැපිරීමට එප්පාවල පොස්පේට්වලින් single super phosphate හදන

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමේ මූලික අඩිතාලම අපි මේ වන විට දමමින් ඉන්නවා. ඒ වාගේම, මධ්‍ය කාලීන හෝ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් හැටියට අපි මේ රටේ සූර්යා නිෂ්පාදනය පටන් ගන්න ඕනෑ. අපි සූර්යා නිෂ්පාදනය පටන් ගන්නවා. කෘෂි කර්මාන්තය සඳහා, අස්වැන්න වැඩි කර ගැනීම සඳහා වතුර අවශ්‍යයි. වතුර අවශ්‍ය නම් ඇළ වේලි හොඳට තිබෙන්න ඕනෑ. ඒ වාගේම වැව් හොඳට තිබෙන්න ඕනෑ. වැව් පිළිසකර කිරීමත්, පිරිසිදු කිරීමත් මෙහි එක වැඩක්. වැවක් පිරිසිදු කළා කියලා දැවැන්ත විවේචන ඉදිරිපත් කරන්න එපා. කෘෂි අස්වැන්න වැඩි කර ගැනීමත් Clean Sri Lanka වැඩ පිළිවෙළ තුළ තිබෙන එක වැඩක්. Clean Sri Lanka කියන වැඩ පිළිවෙළට ඒකත් අදාළයි.

අස්වැන්න වැඩි කර ගැනීමත් Clean Sri Lanka වැඩ පිළිවෙළ තුළ තිබෙන එක වැඩක්; Clean Sri Lanka කියන වැඩ පිළිවෙළට ඒකත් අදාළයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ -ගිය මාසයේ- මේ රටේ පොල්වල මිල ඉහළ ගිය ආකාරය අපි දැක්කා. පොල්වල මිල ඉහළ යෑම සම්බන්ධයෙන් මා යමක් කිව යුතුයි. පොල් මලේ ආරම්භයේ සිට පොල් ගෙඩියක් කඩන තැන දක්වා මාස 39ක කාලයක් යන බව අපි දන්නවා. එම ක්‍රියාවලිය සිදු වන මාස 39ක කාලය ඇතුළත පොහොර ටික හරියට වැටුණේ නැත්නම්, අවසාන ප්‍රතිඵලය තමයි ඒ ගස්වල පොල් අස්වනු පහළ යෑම. පොල් ත්‍රිකෝණය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මා ඒ ගැන දන්නවා. මීට මාස 39කට පෙර අතීතය ගත්තොත්, පොල් පොහොර මිටියක මිල කීයට ද තිබුණේ කියලා අපි දන්නවා. පොහොර මිටියක් රුපියල්, 20,000යි, රුපියල් 25,000යි, රුපියල් 30,000යි. කවුද පොල් වගාවට පොහොර යෙදුවේ? පොල් වගාවට පොහොර යෙදුවේ නැහැ. අන්න ඒ වැඩවල එක ප්‍රතිඵලයක් තමයි පොල් ගෙඩියක මිල රුපියල් 200 දක්වා ඉහළ යෑම. අපි මේ ක්‍රියාවලිය clean කරන්න ඕනෑ. ඉදිරියේදී පොල් වගාවට පොහොර දමන, නැවත යටි වගාව සිදු කරන මට්ටමට අපි අපේ කෘෂි කර්මාන්තය clean කරන්න ඕනෑ. එම clean කරන වැඩේ අපි ආරම්භ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" උදා කර ගැනීම සඳහා අපට අවශ්‍යයි දේශපාලනයේ පිරිසිදුකම; දේශපාලනයේ clean බව. අපේ ජනාධිපතිතුමාගේ දිවුරුම් දීම කොහොම දිවුරුම් දීමක්ද කියලා අපි හොඳින්ම දැක්කා. එහිදී එතුමා රටට ආදර්ශයක් දුන්නා; දේශපාලනය clean කරන වැඩේ කළා.

අපි මේ ආණ්ඩුව භාර ගත්තාට පසුව අපරාධකාරයන් එළියට දමන්න කියලා කිසිදු පොලීසියකට, කිසිදු call එකක් දුන්නේ නැහැ. නමුත්, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා අපරාධකාරයන් එක්ක හිටියේ කොහොමද කියලා පොඩ්ඩක් මතක් කරලා දෙන්න මම කැමතියි. අපි දන්නවා එදා සුරාබදු කොමසාරිස් ජනරාල්තුමා ගෙනැල්ලා කරපු දේ. නම් හැටියටම මම කියන්නම්. ජොන්ස්ටන් ප්‍රනාන්දු, අර්ජුන් ඇලෝසියස් එක්ක එකට ඉඳලා එම නිලධාරියාට තර්ජනය කළා, "කොහොමද මගේ මිනිසුන්ට තමුසේ කරදර කරන්නේ, මෙහෙම කරදර කරන්න එපා" කියලා. අන්තිමට මොකක්ද කළේ? බදු පැහැර හැරපු එවැනි ව්‍යාපාරිකයන් එක්ක එකතු වෙලා, හිටපු ජනාධිපති අර නිලධාරියාට ඉල්ලා අස් වෙලා යන තැනටම වැඩ කළා. අන්න එහෙම රටක්, අපරාධකාරයන් අන්න ඒ විධියට රකින රටක් තමයි තිබුණේ. ඒක, හිටපු ජනාධිපතිවරයාගේ ආදර්ශය. අපි ඒ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. අපි එය clean කරන්න ඕනෑ. අන්න ඒ clean කිරීමේ වැඩේ අපි මේ වන කොටත් ආරම්භ කරලා තිබෙනවා.

පසුගිය ආණ්ඩුව කාලයේ මහජන උපයෝගීතා කොමිසම විදුලි බිල සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කළාම කරපු දේ අපි දැක්කා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is over.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න.

එම නිර්දේශ නිකුත් කළ නිසාම ඒ නිලධාරියා එළවා දැම්මා. මම අහනවා එවැනි පාලන ක්‍රමයක් අපි clean කරන්න ඕනෑ නැද්ද කියලා. මම හිතනවා එම clean කිරීමේ වැඩේට අප සියලුදෙනා එකතු වෙලා සම්බන්ධ වෙන්න ඕනෑ කියලා. මෙන්න මේ clean කරන වැඩේ, Clean Sri Lanka කියන වැඩසටහන, හුදු එක දෙයකට සීමා වන එකක් නොවෙයි. ටොයිලට් එකක් පිරිසිදු කිරීම පවා, වැවක් පිළිසකර කිරීම පවා, වැවක් පිරිසිදු කිරීම පවා ඊට අයත් වෙනවා. ඒ වාගේම, අනෙක් හැම පැත්තකම තිබෙන දේවල් clean කරන්න ඕනෑ. එහෙම clean කළාම තමයි අපට පොහොසත් රටක් නිර්මාණය කරන්න පුළුවන්; හොඳ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නඟන්න පුළුවන්. ඒ පොහොසත් රටේ ලස්සන ජීවිතයක් ගත කරන්න පුළුවන් සමාජයක් නිර්මාණය කරන්න පුළුවන්, හොඳ ජාතියක් නිර්මාණය කරන්න පුළුවන් බව කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the Opposition Sajith Premadasa. You have 12 minutes.

[පූ.භා. 11.46]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ප්‍රතිපත්තිය වන්නේ පොහොසත් රටක්, ලස්සන මාතෘ භූමියක් බිහි කිරීමයි. රජය ඒ සඳහා යන ගමනේදී අද පවත්වන මේ විවාදයට එකතු වෙමින් මම යෝජනාවක් කරන්න කැමැතියි. අපේ ගරු සභානායකතුමාත්, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් සභාවේ සිටින මේ මොහොතේ විවිධ ක්ෂේත්‍රවල දුක්ගැනවිලි ගණනාවක් ඉදිරිපත් කරමින් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම විශේෂයෙන් අදහස් කරනවා.

මම පළමුවෙන්ම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, මනුෂ්‍ය ඝාතන, නීති විරෝධී මත් ද්‍රව්‍ය ජාවාරම් ආශ්‍රිත ක්‍රියාකාරකම් අද ඉතා වේගයෙන් වර්ධනය වෙලා තිබෙනවා කියන කාරණය කෙරෙහි. පොලිස් දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව 2024 වර්ෂයේ පමණක් වෙඩි තැබීමේ සිද්ධි 101ක්, මරණ 60ක් සිදු වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ නීතිය හා සාමය පිළිබඳ ක්ෂේත්‍රය ගැන රජයේ අවධානය යොමු කරලා මේ ක්‍රියාදාම නවත්වන්නට කටයුතු කිරීම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ විදේශ ගමන් බලපත්‍ර ගැටලුවත් ඇත්ත වශයෙන්ම තවත් බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙලා දුරදිග ගිහිල්ලා තිබෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ මේ විදේශ ගමන් බලපත්‍ර හිඟයට මුහුණ දුන් ජනතාව තවදුරටත් දුෂ්කරතාවට ලක් වෙලා තිබෙනවා. මේකට විසඳුමක් ලබා දෙන්නට රජය අපොහොසත් වෙලා තිබෙනවා. මොකද, online ක්‍රමය හරහා මේ ගැටලුවට, මේ ප්‍රශ්නයට විධිමත් විසඳුමක් ලැබිලා නැහැ. ඇස් දෙකට පෙනෙන දීර්ඝ පෝලිම වෙනුවට දැන් online පෝලිමක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමේදී ඉතාම දීර්ඝ කාලයක් ගත වෙනවා කියන මැසිවිල්ලට රජය විසඳුමක් ලබාදීම ඉතාම වැදගත් වෙනවා.

ඒ වාගේම මේ සභාවේ සඳහන් වූ පොල් තෙල් ආනයන ක්ෂේත්‍රය කේන්ද්‍රීයව, 2024 ජනවාරියේ සිට පිරිපහදු නොකළ පොල් තෙල් ආනයනය කර පිරිපහදුකොට නිකුත් කිරීමේදී සියයට 18ක වැට් එක සහ සියයට 2.5ක සමාජ ආරක්ෂණ බද්දක් ගෙවිය යුතුව තිබුණත්, ආනයනය කරන ලද පිරිපහදු නොකළ පොල් තෙල් පිරිපහදුකොට වෙළඳපොළට නිකුත් කිරීමට අදාළව ගෙවිය යුතු බදු ප්‍රමාණය රටටත්, රජයටත්, ජනතාවටත් අහිමි වෙලා තිබෙනවා. මා දන්නා විධියට රුපියල් බිලියන 5ක පමණ පාඩුවක් එහිදී ඇස්තමේන්තු කරනවා. මේ ප්‍රශ්නයටත් රජය ඉදිරිපත් වෙලා විසඳුම් ලබා දෙන්න කියා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම වරාය තුළ බහලුම් නිෂ්කාශනය වේගවත් නොකිරීම සහ ට්‍රක් රථ තදබදය ඇති වෙලා තිබෙනවා. මේ මොහොත වන විට සඳහන් වෙන ආකාරයට නැව් විශාල ප්‍රමාණයක් කොළඹ වරාය මඟ හැර ගිහිල්ලා තිබෙනවා. තවමත් නිෂ්කාශනය නොකළ බහලුම් 4,000ක් පමණ කොළඹ වරාය තුළ ගොඩගැසී තිබෙනවා. විශේෂයෙන්ම මේ රට logistics hub එකක් බවට පත් කිරීම අපි හැමදෙනාගේම අරමුණ වී තිබෙන මොහොතක, මේ වරායේ තිබෙන තදබදයට ඉක්මන් විසඳුමක් ලබාදීම වැදගත් කියන කරුණ ගරු අමාත්‍යතුමාට මම මේ අවස්ථාවේ මතක් කරන්නට කැමැතියි.

ඒ වාගේම ඉතුරුම් සඳහා වැඩිහිටි ප්‍රජාව තම ඉතුරුම් ගිණුම් සඳහා විවිධ ආණ්ඩු යටතේ සියයට 15ක පොලී අනුපාතයක වාසියක් භුක්ති වින්දා. ඒක බිහිවුණු බොහෝ රජයන් පක්ෂ භේදයෙන් තොරව ක්‍රියාත්මක කළා. නමුත් 2022 පමණ සිට ඒ වාසිය වැඩිහිටි ප්‍රජාවට අහිමිවෙලා ඒ ඉතිරි කිරීම් ගිණුම්වලට දැන් ලබා දෙන ඒ පොලී අනුපාතය සියයට 8, සියයට 7 දක්වා අඩු වෙලා තිබෙනවා. මෙවන් තත්ත්වයක් තුළ රඳවා ගැනීමේ බදු ප්‍රතිශතය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම රාජ්‍ය ප්‍රතිපත්තිය වී තිබීම නිසාත්, ඒ ඉතිරි කිරීමට ලැබුණු පොලී අනුපාතයේ වාසිය නොලැබී යනවා. විශේෂයෙන්ම මම කථා කරන්නේ වැඩිහිටි ප්‍රජාව පිළිබඳව. වැඩිහිටි ප්‍රජාව ඉලක්ක කරගෙන ඒ සියයට 15 පොලී අනුපාතය ලබාදීම ඉතාම යෝග්‍ය බව මම මේ අවස්ථාවේ යෝජනා කරමින්, රජයෙන් ඉල්ලීමක් කරනවා මේ ප්‍රශ්නයටත් අවධානය යොමු කරලා පැහැදිලි විසඳුමක් ඉක්මනින්ම ලබා දෙන්න කියලා.

ඒ වාගේම අපි දුටුවා, ත්‍රිරෝද රථ, බස් රථ කේන්ද්‍ර කරගෙන යම් යම් වෙනස්කම් කිරීම් සිදු වෙමින යන බව. විශේෂයෙන්ම මම අවධානය යොමු කරන්නට කැමැතියි, අපේ සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව. සංචාරක ක්ෂේත්‍රය තුළ ජාතික වනෝද්‍යාන කේන්ද්‍රීයව ජීප් රථ සේවාව අද ඉතාම ප්‍රචලිත වෙලා තිබෙනවා. ඒ ජීවනෝපාය තුළින් විශාල පිරිසක් හොඳ ආදායමක් ලබනවා. සංචාරක ක්ෂේත්‍රයේ දිනෙන් දින වර්ධනයක් ඇති වෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. ඒ සංචාරකයන් ජාතික වනෝද්‍යානවලට යනකොට ඒ අය පාවිච්චි කරන ජීප් රථවල තිබෙන අඩුපාඩුකම් හොයලා බලලා, ඒ ගැනත් යම් පියවරක් ගන්න. අඩුපාඩුකම් කියන්නේ, ඒ ජීප් රථයක් නිර්මාණය කරනකොට ඒ ගමන් කරන අයට පහසු වන විධියට යම් යම් අලුත් සැකසීම් තිබෙනවා. ඒ අය තුළ බියක් තිබෙනවා, සැකයක් තිබෙනවා, ත්‍රිරෝද රථ රියැදුරන්ටත්, බස් රථ රියැදුරන්ටත් සිදු වුණු වෙනස්කම ම සිදු වෙයි කියලා. බැරි වෙලාවත් එහෙම සිද්ධවෙලා ඒ අයගේ ජීප් රථ ඒ ව්‍යාපාරයෙන් ඉවත් වුණොත් සංචාරක කර්මාන්තයට හානියක් සිද්ධ වෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් මම අවධානය යොමු කරවනවා.

මම ඔබතුමාට මේ කාරණය කියන්නේ මේ නිසායි. පසුගිය කාලවලදී විශේෂයෙන්ම 2015-2019 කාල වකවානුව තුළ RMV එක මේ ජීප් රථ ධාවනයට තහංචි පැනවූ මොහොතක අපි ඉදිරිපත් වෙලා ඒ තහංචි පැනවීම නතර කළා. ඒ නිසා රජයේ - ඔබතුමන්ලාගේ- අවධානය යොමු කරමින් එවන් හානියක් සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන ඒ ජීප් රථ රියදුරන්ට සිදු නොකරන්නය කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද 35,000කට, 40,000කට ආසන්න උපාධිධාරීන් ප්‍රමාණයක් රැකියා විරහිතව සිටිනවා. ඒ අයට රැකියා ලබා දීම ඔබතුමන්ලාගේ න්‍යාය පත්‍රයේ විශේෂයෙන්ම මැතිවරණ කාල වකවානුව තුළ ප්‍රමුඛතම යෝජනාවක් වුණා. ඒ 35,000ක්, 40,000ක් වන රැකියා විරහිත උපාධිධාරීන්ගේ දුක්ගැනවිල්ලට සවන් දීලා එයටත් විසඳුමක් ලබා දීම ඉතාම වැදගත් කියන එක මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම සංවර්ධන නිලධාරීන් 22,000කට ආසන්න පිරිසක් උපාධිධාරී පත්වීම් හැටියට පත්වීම් ලබලා, අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරු හිඟය මඟ හරවා ගන්නට ලොකු කාර්යභාරයක් ඉෂ්ට කළා. ඒ අයට ගුරු සේවයට ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබාදෙන බවට විවිධ අවස්ථාවලදී පොරොන්දු වුණා. නමුත්, අද වන විට ඒ අයට ඒ අවස්ථාව අහිමි වෙලා තිබෙනවා. රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරමින්, සංවර්ධන නිලධාරි ක්ෂේත්‍රය නියෝජනය කරමින් මහජන මන්ත්‍රීවරයෙක් පත් වෙලා සිටින මොහොතක, 22,000ක් වූ සංවර්ධන නිලධාරීන් අධ්‍යාපන ක්ෂේත්‍රයට -ගුරු සේවයට- ඇතුළු වීමට කරන ලද ඉල්ලීම ක්‍රියාත්මක කරන්නට රජයේ මැදිහත්වීම අපි බලාපොරොත්තු වනවා. අපි දන්නවා, ඒ අය උද්ඝෝෂණය කරන්නට ගිහිල්ලා බරපතළ ප්‍රශ්නවලට ලක් වුණු බව. බොහෝදෙනෙක් විවිධ හිංසනවලට ලක් වුණා. මම ඔබතුමන්ලාට යෝජනා කරනවා, සංවේදීව ඒ ප්‍රශ්නය ගැන හිතලා, විශේෂයෙන්ම කොරෝනා අවධියේ සිට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ලොකු කාර්යභාරයක් ඉෂ්ට කළ සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් ඒ යුතුකම ඉෂ්ට කිරීමට කටයුතු කරන්න කියලා.

ඒ වාගේම ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පුරප්පාඩු 706ක් සඳහා 2020 වසරේ තමයි පළමුවෙන්ම ගැසට් කළේ. ඒ විභාග ප්‍රතිඵල නිකුත් වුණා, 2023 හයවෙනි මාසයේ 20වැනි දා. නමුත්, අද වනකල් ඒ බඳවා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙලා නැහැ. විශේෂයෙන් ප්‍රතිඵල නිකුත් කරලා ගුරු අධ්‍යාපනඥ සේවයේ බඳවා ගැනීම් කඩිනමින් ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න කියා මම රජයෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම සිසු හෙද පුහුණු ගැටලුවත් සෞඛ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න මම කැමැතියි. අවසන් වරට සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගත්තේ 2023 වර්ෂයේ. 2019, 2020 වසරවල උසස් පෙළ හදාරලා අවසන් වුණු සිසුන්ට ඒ සඳහා අයදුම් කිරීමේ අවස්ථාව ලැබුණා. මේ වනවිට 2021, 2022, 2023 වසරවල උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන් සඳහා සිසු හෙද පුහුණුව සඳහා වන ගැසට් පත්‍රය නිකුත් වෙලා නැහැ. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරලා කඩිනම් විසඳුමක් ලබා දෙන්නට කටයුතු කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ වාගේම විද්‍යා පීඨ සිසු ගැටලුව කේන්ද්‍ර කරගෙන, කුලියාපිටිය විද්‍යා පීඨයෙන් පමණක් තාක්ෂණ විද්‍යාවට අදාළව අධ්‍යාපනවේදී උපාධි - B.Ed. Degree - පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ ගැසට් නිවේදනය නිකුත් කර තිබීම පිළිබඳව අපි සතුටු වෙනවා. අපි සෙසු විද්‍යා පීඨ වෙනුවෙනුත් යෝජනා කරනවා, අදාළ සුදුසුකම් කේන්ද්‍රීයව උපාධි හිමි කරන වැඩසටහනකට යොමු වෙන්න කියලා. ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් - ඒ ප්‍රජාවගෙන් - ලොකු ඉල්ලීමක් තිබෙනවා. ඒ ඉල්ලීම ඉෂ්ට කරන්නය කියා මම මේ අවස්ථාවේ බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම වසර ගණනාවක් මුළුල්ලේ ග්‍රාම නිලධාරි ක්ෂේත්‍රයේ නියැළී සිටින අයට ගැටලු තිබෙනවා. දීමනා ගැටලුව, සේවා ව්‍යවස්ථා ගැටලුව, අස්වැසුම වැඩසටහන කේන්ද්‍රීයව ක්‍රියාත්මක වෙන ගැටලු, ජන සංගණනයෙන් ග්‍රාම නිලධාරින් ඉවත් වීම ආදි වශයෙන් ග්‍රාම නිලධාරි වසමේ ලොකු කාර්යභාරයක් ඉෂ්ට කරන ග්‍රාම නිලධාරිතුමන්ලාට, නිලධාරිතුමියලාට ගැටලු රැසක් තිබෙනවා. ඒ කාරණාව පිළිබඳවත් රජයේ අවධානය යොමු කරලා කටයුතු කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමතියි. විදුලි බිල අඩු කිරීමේ ක්‍රියාවලියට කේන්ද්‍රගතව සිදුවුණු ක්‍රියාකාරකම් අපි හැමෝම දන්නවා. තුනෙන් එකකින් විදුලි බිල අඩු කරන්නට රජය පොරොන්දු වුණා. අදාළ ඇමතිවරයා කිව්වා, තිබෙන තත්ත්වය තුළ විදුලි බිල අඩු කිරීම නොවෙයි වැඩි කිරීමක් තමයි සිදු කරන්නට වෙන්නේ, නමුත් රජය ඒකත් මැඩ පවත්වාගෙන සිටිනවා කියලා. ඇත්තටම විදුලිබල මණ්ඩලය Public Utilities Commission එකට ඉදිරිපත් කළ යෝජනාව තමයි මාස හයකට විදුලි බිල අඩු කරන්නට බැහැ කියන එක. නමුත් විදුලිබල මණ්ඩලය ලබපු අධික ලාභය හමුවේ විශේෂයෙන් ජනතා කේන්ද්‍රීයව එල්ල වුණු පීඩනය තුළ මහජන උපයෝගිතා කොමිසමට සිදුවුණා, අඩුම තරමේ සියයට 20කින් විදුලි බිල අඩු කරන්න. විදුලි බිල අඩු කරපු අවස්ථාවේත් විදුලිබල මණ්ඩලය කියා සිටියා, මේවා ගැන අවසන් තීන්දුව ගන්නට ඕනෑ මුදල් අමාත්‍යාංශය කියලා. විදුලි බිල අඩු කිරීම මැතිවරණ පොරොන්දුවක්. ඒ මැතිවරණ පොරොන්දුව ඒ ආකාරයෙන්ම ඉෂ්ට සිද්ධ කිරීම සඳහා ඔබතුමන්ලාට දැන් අවස්ථාව ලැබිලා තිබෙනවා. දැන් සියයට 20කින් ඒ අඩු කිරීම සිද්ධ වෙලා තිබෙනවා. ඒ කියපු ආකාරයට සියයට 33ක අඩු කිරීම ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියා මම රජයෙන් ඉල්ලීමක් කරනවා. මේ විවාදය වෙනුවෙන් මට ලැබී තිබුණු කාලය මම උපයෝගි කර ගත්තේ ජන සමාජයේ විවිධ ක්ෂේත්‍රවල, විවිධ කොටස්වල ජනතාව මුහුණ දෙන ගැටලු ඉදිරිපත් කරන්නටයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, your time is up now.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, give me one more minute, please.

මොකද, අලුත් සංස්කෘතියක්, අලුත් වැඩ පිළිවෙළක් ගැන කථා කරනකොට මේ බරපතළ ප්‍රශ්නවලට, ගැටලුවලට විසඳුම් ලබා දීම අපි සියලු දෙනාගේම වගකීම වෙනවා.

විශේෂයෙන්ම රාජ්‍ය පාර්ශ්වය ඒ වගකීම භාර ගන්නට ඕනෑ. මේ උත්තර සැපයීම, විසඳුම් ලබා දීම උදෙසා ප්‍රගතිශීලීව ඒ වාගේම ධනාත්මකව, ගුණාත්මකව, හරයාත්මකව රටට අගයක්, ජනතාවට අගයක් එකතු වන ආකාරයට සිදු කරන ඕනෑම ක්‍රියාදාමයකට, රටට සෙතක් සැලසෙන ඕනෑම ක්‍රියාදාමයකට අපි සහයෝගය ලබා දෙනවා. ඒ වාගේම මේ පොරොන්දු ඉටු නොකිරීම තුළ ඔබ බලාපොරොත්තු වෙන පොහොසත් ලස්සන ශ්‍රී ලංකාව නිර්මාණය වීම අඩාළ වෙනවා කියන එකත් ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දුන් ගරු නියෝජ්‍ය කථානායකතුමාට මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Dinindu Saman. You have 12 minutes.

[අ.භා. 12.02]

**ගරු දිනිඳු සමන් මහතා**
(மாண்புமிகு தினிந்து சமன்)
(The Hon. Dinindu Saman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Clean Sri Lanka වැඩසටහන පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළ ඉතා හරවත් විවාදයක් ඇති වේ යැයි අපට බලාපොරොත්තුවක් තිබුණත්, විපක්ෂය ඊයේ දවසේ පැවැති විවාදයට මැදිහත් වුණු ආකාරය සහ අද දවස තුළ මේ විවාදයට මැදිහත් වන ආකාරය දකිනකොට අපට මොනවාද හිතෙන්නේ? විපක්ෂය මේ විවාදයේදී Clean Sri Lanka වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඒකට අදාළ සාධනීය කාරණා මතු කරාවි කියලා අපි විශ්වාස කළා. හැබැයි, විපක්ෂය විසින් මේ Clean Sri Lanka කියන මාතෘකාවවත් අදාළ කර ගන්නේ නැතුව, ඒකට අදාළ මැදිහත්වීමක්වත් කරන්නේ නැතුව විපක්ෂයේ විවාදය දිගින් දිගටම වෙන පැත්තකට තල්ලු කරමින් සිටින බවයි අපි දකින්නේ.

මම දන්නේ නැහැ, අද විපක්ෂ නායකතුමාට විපක්ෂ නායක කාර්යාලයෙන් වැරදිලාවත් ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න අහන ෆයිල් එක දීලාද කියලා. මොකද, විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ කණ්ඩායම Clean Sri Lanka වැඩසටහන සම්බන්ධ විවාදය වෙනුවට ප්‍රශ්න වැලක් අහන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපිට නිදාගෙන සිටින මිනිස්සු නැඟිට්ටවන්න පුළුවන්. හැබැයි, හොරට නිදාගෙන සිටින මිනිස්සු නැඟිට්ටවන්න අපට බැහැ. අද විපක්ෂය හොරට නිදා ගෙන ඉන්නවා. හොරට නිදා ගෙන සිටින අතරේ ඇවිල්ලා අර වළන් කඩේට පැනපු ගොන්නු වාගේ, මොනවා හෝ දෙයක් කියලා මේ විවාදය වෙනත් පැත්තකට තල්ලු කරන්න උත්සාහ කරමින් ඉන්නවා. අපි කියනවා, Clean Sri Lanka වැඩසටහන සම්බන්ධයෙන් පවතින මේ විවාදය අත්‍යවශ්‍ය වෙන්නේම අන්න ඒ වාගේ තත්ත්වයක් තිබෙන නිසා බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ සියලු දේවල් clean කිරීමේ අවශ්‍යතාව මතුවෙලා තිබෙනවා කියා අපි විශ්වාස කරනවා. මේ රටේ සංස්කෘතිය හායනයට ලක් වෙලා තිබෙනවා. මේ රටේ දේශපාලනය හායනයට ලක් වෙලා තිබෙනවා. මේ රටේ ආර්ථිකය හායනයට ලක් වෙලා තිබෙනවා. පරිසර පද්ධතිය විනාශ වෙලා තිබෙනවා. ඒ සියල්ල clean කිරීමේ වගකීම අපේ ආණ්ඩුව අතට ඇවිල්ලා තිබෙනවා. අපේ ආණ්ඩුවට ජනතාව ජන බලය ලබා දුන්නේ නිකම් නොවෙයි. අපේ ආණ්ඩුවට ජනතාව ජන බලය ලබා දීලා බලාපොරොත්තු වුණේ, මේ සියල්ල clean කරන එකයි. ඒක නිසා අපි Clean Sri Lanka කියන වැඩසටහන සම්බන්ධයෙන් පැවැත්වෙන මේ විවාදයේදී Clean Sri Lanka

කියන මාතෘකාව ගැන මෙතැනදී කථා කරන්නේ මීට අදාළව අප සිදු කරන ජාතික සැලසුම් ටික සංවිධානය කරගන්නයි. අපි මේ විවාදය එක දවසකින් නතර කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අද දවසේ අපි මේ ගැන සාකච්ඡා කරලා හෙට දවසේ ජාතික ප්‍රතිපත්ති බවට මේ සියල්ල සැලසුම් කරන්න ඕනෑ. මෙච්චර කාලයක් මේ රටේ පැවැති ආණ්ඩු තමන්ට අදාළ තමන්ගේ හීන, තමන්ගේ දැක්ම විතරක් දේශපාලනය කරගෙන දැඟලුවා. හැබැයි, මේ රටට ජාතික ප්‍රතිපත්ති ඕනෑ බව අපි විශ්වාස කරනවා. මේ රටට නොවෙනස් වන ජාතික ප්‍රතිපත්තිවල අවශ්‍යතාව තිබෙනවා. මෙච්චර කාලයක් ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. ඒක නිසා ජාතික ජන බලවේගයේ අපි මේ දැවැන්ත ජනවරම සමඟ ඒ ජාතික ප්‍රතිපත්ති සහිත වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න සැලසුම් සහගතවමැදිහත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි දන්නවා, අපට තිබෙන්නේ ආර්ථික වශයෙන් බංකොලොත් වුණු රාජ්‍යයක් බව. ආර්ථික වශයෙන් කඩා වැටුණු මේ රාජ්‍යය නැවත නඟා සිටුවන්නේ කොහොමද? ක්‍රමානුකූලව ඒකට පියවර තබන්නේ කොහොමද? Clean Sri Lanka වැඩසටහන ඇතුළේ අපි ඒ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. නැවත මේ රටේ ආර්ථිකයට පණ දෙන්න, නැවත මේ රටේ ආර්ථිකයට මිනිස්සුන්ගේ දායකත්වය ලබා ගන්න, මහජන සහභාගිත්වයක් සහිත ආර්ථිකයක් ගොඩනඟන්න මේ Clean Sri Lanka වැඩසටහන ඇතුළේ අපි පෙරමුණ ගන්න ඕනෑ. ඒක තමයි අපේ වැඩසටහන ඇතුළේ තිබෙන්නේ. එක පැත්තකින් අපේ රටේ සංස්කෘතිය විනාශයට පත් වෙලා, දේශපාලන සංස්කෘතිය හායනයට ලක් වෙලා තිබෙනවා. අද වනවිට විපක්ෂය ඇතුළේත් මම මුලින් සඳහන් කළ ආකාරයේ තත්ත්වයක් තමයි අපට දකින්න ලැබෙන්නේ. නමුත් අපේ පැත්තෙන් අපි ආදර්ශයක් දීලා තිබෙනවා. පත් වෙලා මාස කිහිපයක් ඇතුළේ වංචාව, දූෂණය, නාස්තිය නැති ආණ්ඩු පක්ෂයක් නිර්මාණය කරන්න අපි සමත් වෙලා තිබෙනවා. හැබැයි, විපක්ෂය තවම ඒ පරණ සිරිත අනුවම තමයි යන්නේ, පරණ පුරුද්දෙන්ම තමයි යන්නේ. ඒක වෙනස් කරන්න ඕනෑ.

ඊයේ පෙරේදා දවස්වල දිගටම කථා වුණා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ නිල නිවස නැවත පවරා ගන්න එක සම්බන්ධව. එතුමා පාවිච්චි කරන වර්ග අඩි 35,000ක නිවසට අදාළ වටිනාකම් ගැන කියන කොට විපක්ෂය ඇතුළේ විවිධ කථාබහ ඇති වුණා, ඇයි එහෙම කරන්නේ, එතුමාගේ ආරක්ෂාව සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා, ඒක නිසා ඒ නිල නිවාසය ගන්න එපා කියලා. අපි අහනවා, හිටපු ජනාධිපතිවරුන් ඔක්කෝටම ආරක්ෂාව සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවාද කියලා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියට එහෙම ප්‍රශ්නයක් තිබෙනවාද? සිරිසේන මහත්තයාට එහෙම ප්‍රශ්නයක් තිබෙනවාද? ඒ අයට එහෙම ප්‍රශ්න නැහැ. මේ තිබෙන්නේ පාදඩ දේශපාලන සංස්කෘතියේ එක ප්‍රතිඵලයක්. මේ රටේ ජනතාවගේ ආදායම, ජනතාවගේ සම්පත් මංකොල්ලකමින් තමයි ඒ ආණ්ඩු කරගෙන ගියේ. අපි ඒක වෙනස් කරනවා. ඒකට තමයි Clean Sri Lanka වැඩසටහන ගෙනැල්ලා තිබෙන්නේ.

එක පැත්තකින් මේ රට ඇතුළේ වංචාව, දූෂණය, නාස්තිය ඉහවහා ගිහිල්ලා තිබෙන්නේ. දේශපාලන සංස්කෘතිය ගත්තත් එහෙමයි. මේ රටේ දේශපාලනය ක්‍රියාත්මක වුණේ ඒගොල්ලන්ට අදාළ හීන මේ රටේ සමස්ත ජනතාවගේ පිට පටවමින්. කාලයක් මේ රාජ කුමාරවරුන් ඒගොල්ලන්ට අදාළ වන විධියට මේ රටේ ක්‍රීඩාව තීරණය කළා. ඒගොල්ලන් කැමැති ක්‍රීඩාව තමයි මේ රටේ ක්‍රීඩාව බවට පත් වෙන්න ඕනෑ කියලා තීන්දු කළා. ඒ අනුව හැම තැනම රගර් ගහන තත්ත්වයක් ඇති කළා. රගර් ගහන එක ප්‍රශ්නයක් නැහැ. රටේ ක්‍රීඩාව මේ රටේ යහපත වෙනුවෙන්, තරුණයාගේ අනාගතය වෙනුවෙන්, රටේ සෞඛ්‍ය සම්පන්න තරුණ නායකත්වයක් ගොඩනැඟීම වෙනුවෙන් යොමු වෙනවා වෙනුවට තමන්ගේ හීන ඉෂ්ට කරන ක්‍රීඩාවක් බවට පරිවර්තනය කරලා තිබුණා. ඒක වළක්වන්න ඕනෑ. අපි විශ්වාස කරනවා, ක්‍රීඩාව ඇතුළේ සහකම්පනය සහිත මිනිස්සු බිහි කරන්න ඕනෑ කියලා. තාජුඩීන් ඝාතනය තුළ අපි දැක්කා, තමන්ට ඉන්න ප්‍රතිවාදී ක්‍රීඩකයා අරගෙන ගිහිල්ලා, දත් ගලවලා, වාහනවලට දාලා ගිනි තියන්න තරම් නරුම මානසිකත්වයක් තිබෙන මිනිස්සු මේ දේශපාලනයෙන් බිහි වෙලා තිබෙන ආකාරය. ඒ දේශපාලන හායනයට තිත තියන්න ඕනෑ. ඒ තිත තියන තැන බවට මේ Clean Sri Lanka කියන ව්‍යාපෘතිය අපි පටන් ගන්න ඕනෑ. නිකම් නොවෙයි මේවා ඇති වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේ රට පාරිසරික පැත්තෙන් සෑහෙන විනාශයකට ලක් වෙච්ච රටක් කියලා. මිනිස්සු විසින් සිදු කරන ව්‍යසනය ඇතුළේ එක පැත්තකින් මාර්ග අනතුරු වැඩි වෙලා තිබෙනවා. වර්ෂයකට 2,321ක්, දවසකට මරණ 6ක් රිය අනතුරු නිසා සිදු වෙනවා. අපි විශ්වාස කරනවා, රියදුරන්ට අදාළ විනයත්, මඟීන්ට අදාළ විනයත් අපි හදන්න ඕනෑ බව. ඒ සියල්ල සැලසුම් සහගතව හදන වැඩ පිළිවෙළ Clean Sri Lanka ව්‍යාපෘතිය ඇතුළේ තිබෙනවා. නීති දාන්න, නීති දාලා බලහත්කාරයෙන් මේක කරන්න, නගර සභාවට, ප්‍රාදේශීය සභාවට නීති දාලා බලහත්කාරයෙන් මේක කරන්න කියන ඉල්ලීම විපක්ෂයෙන් කළා. හැබැයි අපි කියනවා, Clean Sri Lanka ව්‍යාපෘතිය කියන්නේ බලහත්කාරය පාවිච්චි කරන ව්‍යාපෘතියක් නොවෙයි කියලා. මහජන සහභාගිත්වය සහිතව ආකල්ප සංවර්ධනය කරලා, මිනිස්සු ස්වේච්ඡාවෙන් මැදිහත් වෙලා වැඩ කරන ව්‍යාපෘතියක් ලෙස Clean Sri Lanka ව්‍යාපෘතිය ඇතුළේ මේ සියල්ල පාලනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒකට ජනතා සහභාගිත්වය සහිත වැඩ පිළිවෙළක් අපි ලෑහැස්ති කරලා තිබෙනවා. ඒ සියල්ල Clean Sri Lanka ව්‍යාපෘතිය ඇතුළේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ජීවත් වෙන බදුල්ල දිස්ත්‍රික්කය ස්වාභාවික ආපදාවලට වැඩි වශයෙන් ලක්වන දිස්ත්‍රික්කයක්. ලංකාවේ වර්ෂයකට 475,225ක් ස්වාභාවික ආපදා නිසා අවතැන් වෙනවා. හැබැයි, එය ආපදා චක්‍රයක් විධියට නිතර ක්‍රියාත්මක වෙනවා. හැමදාම සහනාධාර දෙන්න, හැමදාම සහන වැඩ පිළිවෙළ හදන්න වර්ෂයකට ඩොලර් මිලියන 300කට වැඩි ප්‍රමාණයක් වැය වෙනවා. ඒ, මේ රටේ ජනතාවගේ මුදල්. අපි විශ්වාස කරනවා, Clean Sri Lanka ව්‍යාපෘතිය ඇතුළේ මහජනතාවට අලුත් වැඩ පිළිවෙළක් හදලා දෙන්න ඕනෑය කියලා. මිනිසාගේ වරදින් වන ආපදා වළක්වන්න නම්, ඔවුන්ට අදාළ මඟ පෙන්වීමක් හදලා දෙන්න ඕනෑ. බුද්ධිමත් දියුණු මිනිස්සු කණ්ඩායමක් නිර්මාණය කරන්න ඕනෑ. ඒක මේ වැඩ පිළිවෙළ ඇතුළේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනකොට අපේ ස්වාභාවික පරිසරය හායනයට ලක්වෙලා තිබෙන්නේ. අපේ රට ගංගා ද්‍රෝණි 103කින් සමන්විත රටක්. ඒ ගංගා ද්‍රෝණි පෝෂණය කරන්න දිය උල්පත් 3,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, මේ අවුරුදු 76ක දේශපාලන හායනය වාගේම අපේ ජල උල්පත් ටිකත් විනාශ වෙලා තිබෙන්නේ. හෙට දවසේ දරුවන්ට බොන්න වතුර ටිකක් නැති වෙන තැනට, හෙට දවසේ දරුවන්ට හුස්ම ටිකක් ගන්න බැරි වෙන තරමට අපේ පරිසර පද්ධතිය හායනයට ලක් වෙලා තිබෙන්නේ. ඒක නැවත යථාවත් කිරීමේ වගකීම රජයක් විධියට අපට තිබෙනවා. Clean Sri Lanka වැඩසටහන ඇතුළේ අපි ඒක සැලසුම් සහගතව කරනවා.

බදුල්ල දිස්ත්‍රික්කය තුළ දැනටත් අපි ඒ කටයුත්ත පටන් අරගෙන ඉවරයි. Clean Sri Lanka ව්‍යාපෘතියට සමගාමීව

[ගරු දිනිඳු සමන් මහතා]

දිස්ත්‍රික්කයේ තිබෙන සියලුම ජල උල්පත් පිළිබඳ සමීක්ෂණයක් කරලා, ඒවාට අදාළ රක්ෂිත මායිම් වෙන් කරලා, ඒවා සුරක්ෂිත කරන්න අවශ්‍ය සැලසුම් අපි හදලා ඉවරයි. ඒ වාගේම අපි මේ සභාවට යෝජනා කරනවා, අප සියලුදෙනාම මේ ජල සම්පත ආරක්ෂා කරන්න ඕනෑ කියලා. සියලු උල්පත්වලට අදාළ ජල ආරක්ෂණ සැලසුම් හදන වැඩ පිළිවෙළක් අපි Clean Sri Lanka ව්‍යාපෘතිය ඇතුළේ සැලසුම් සහගතව කරනවා. අප සියලුදෙනාම අද දවසේ වතුර පරිභෝජනය කරනවා වාගේම, හෙට දවසේ මේ රටේ ජීවත් වන අපේ දරුවන්ගේ පරිභෝජනය සඳහාත් වතුර ටික ඉතිරි කරන්න ඕනෑ. ඒකට අදාළ මැදිහත්වීම අපි කරන්න ඕනෑ. ඒ සියල්ල මේ Clean Sri Lanka වැඩසටහන ඇතුළේ සැලසුම් සහගතව කරන්න අපි ලැහැස්ති කරලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ Clean Sri Lanka ව්‍යාපෘතිය ආරම්භ කරපු තැන ඉඳලාම ඊට විරුද්ධව දැවැන්ත හඬක් විපක්ෂයෙන් එන ආකාරය අපි දැක්කා. මේ ව්‍යාපෘතියට විරුද්ධව ඒ හඬ එන්නේ වෙන එකක් නිසා නොවෙයි. මේ ව්‍යාපෘතිය සාර්ථකව කිරීම තුළ විපක්ෂයට තිබෙන සියලු බැඳියාවන් නැතිවෙලා යනවා. ඊළඟ වතාවේ ආණ්ඩුව තෝරන මැතිවරණය එනකොට අපට තිබෙන බලවේග මීට වඩා අපිත් එක්ක එකතුවෙලා, විපක්ෂයේ සුද්ද කළ යුතු කණ්ඩායම තවත් සුද්ද වෙලා යනවා. අපේ බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන චාමර සම්පත් මහත්මයා Clean Sri Lanka ව්‍යාපෘතිය පටන් ගන්නකොටම අසත්‍යයක් කිව්වා, රුපියල් ලක්ෂ 70ක මුදලක් Clean Sri Lanka ව්‍යාපෘතියට වැය වුණා කියලා. අපි එතුමාගේ අධ්‍යාපන තත්ත්වය ගැන දන්නා නිසා එතුමාට මොනවත් කියන්නේ නැහැ. ඒ තත්ත්වයේ ඉන්න මනුස්සයෙකුගෙන් අපට ඊට වඩා දෙයක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ බලාපොරොත්තු වෙන්නත් බැහැ. ගොනා අර වළං කඩ බිඳගෙන, බිඳගෙන ගියා වාගේ ඊයේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ හැසිරුණු ආකාරය අපි දැක්කා. ඒ වාගේ තත්ත්වයක් නැවත පාර්ලිමේන්තුව ඇතුළේ ඇති නොවෙන්න ඕනෑ. Clean Sri Lanka ව්‍යාපෘතියට දැවැන්ත ලෙස මඩ ගහන එතුමාට අපි මේ කාරණයත් කියන්න ඕනෑ. එතුමන්ලා ජාතික තරුණ සේවා සභාවට අයත් සල්ලිවලින් රුපියල් කෝටි 32ක් වියදම් කරලා තිබෙනවා. මේ රටේ මිනිසුන්ගේ සල්ලිවලින්, මේ රටේ තරුණ තරුණියන්ගේ කුසලතා සංවර්ධනය කරන්න තිබුණු සල්ලිවලින් හරින් ප්‍රනාන්දුලාත් එක්ක එකතු වෙලා මැතිවරණ කරද්දි ඒ මන්ත්‍රීතුමාට මතක් වුණේ නැහැ, ඒ වියදම් වෙන සල්ලි කාගෙද කියලා. ළමයින්ට ශිෂ්‍යත්ව දෙනවා කියලා ජාතික ලොතරැයි මණ්ඩලයේ සල්ලි ටික අරගෙන වියදම් කරලා බදුල්ලේ විල්ස් පාර්ක් එකේ දේශපාලන රැස්වීම් තිබ්බා. එතකොටත් ඒ මන්ත්‍රීතුමාට මතක් වුණේ නැහැ, ඒ වියදම් කරන්නේ මේ රටේ මහජනතාවගේ බදු මුදල් කියලා. හැබැයි, Clean Sri Lanka ව්‍යාපෘතිය පටන් ගත්තාට පස්සේ ඒකට යම්කිසි මුදලක් වෙන් කරද්දී තමයි ඒ අයට දැන් මතක් වෙන්නේ, රටේ මුදල් අපතේ යනවා කියලා. අපි රටේ මුදල් ශත 5ක්වත් අපතේ යවන්නේ නැහැ. ඒ දේශපාලන හායනයට තිත තියන්න ඕනෑ. ඒ දේශපාලන හායනයට තිත තියන නව දේශපාලන ගමනක්, නව සංස්කෘතියක් ඇති කරන්න අපි ලැහැස්තියි. මේ රටේ දූෂ්පත්කම නැති කරන නව වැඩ පිළිවෙළක් Clean Sri Lanka ව්‍යාපෘතිය තුළින් ඇති කරන්න අපි ලැහැස්තියි කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have 16 minutes.

[பி.ப. 12.14]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, Clean Sri Lanka தேசிய வேலைத்திட்டம் தொடர்பாக இங்கு பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு மகிழ்ச்சியடை கின்றேன். உண்மையில் இது எங்களுடைய நாட்டுக்குத் தேவையான ஒரு வேலைத்திட்டம்! இதனூடாக இந்த நாட்டில் பல விடயங்கள் clean செய்யப்படவேண்டிய தேவையிருக் கின்றது. இந்த நாட்டினுடைய அரசியல், பொருளாதாரம், சமூகக் கட்டமைப்பு எனப் பல விடயங்கள் சார்ந்து இந்த வேலைத்திட்டம் முன்னெடுக்கப்பட வேண்டும். இத்திட்டத்தினூடாக அரசாங்கம் மேற்கொள்ளுகின்ற நல்ல விடயங்களுக்கு ஆதரவாகச் சேர்ந்து பணியாற்றுவதற்கு நிச்சயமாக நாங்கள் என்றும் தயாராக இருக்கின்றோம்.

இந்த வேலைத்திட்டத்தின் தொலைநோக்கு மற்றும் பணிக்கூற்று போன்ற விடயங்களைப் பார்க்கும்போது, 'நீண்டகாலம் நிலைத்திருக்கக்கூடிய சமூக, கலாசார மாற்றங்களை இலங்கையில் வாழும் மக்களிடையே ஏற்படுத்தல்' என்பதே இதன் நோக்கமெனப் புலப்படுகின்றது. இது ஓர் இன மக்களுக்கு மாத்திரம் உரியதல்ல. இதனை இந்த நாட்டில் வாழுகின்ற அனைத்து இன மக்களுக்குமான ஒரு வேலைத்திட்டமாகக் கருதி உங்களுடன் இணைந்து பணியாற்றுவதற்கு நாங்கள் விரும்புகின்றோம். இந்த வேலைத்திட்டத்தின் குறிக்கோள்கள் என்பதில் - objectivesஇல் மிகவும் பிரயோசனமான விடயங்களை நீங்கள் குறிப்பிட்டிருக்கின்றீர்கள். நல்ல நடத்தை மாற்றத்தை ஏற்படுத்தாமல் எங்களால் இந்தத் திட்டத்தை முன்னெடுக்க முடியாது. நடத்தை மாற்றம் என்பது நீண்டதொரு செயன்முறை - long process. இது உடனடியாக ஏற்படுத்தக்கூடிய ஒரு விடயமல்ல; இதற்கு நீண்ட காலம் எடுக்கும் என்பது உங்களுக்குத் தெரியும்! இந்த நடத்தை மாற்றமானது எங்களிலிருந்து தொடங்கவேண்டுமெனவும் இதனை நாங்கள் முதலில் செய்துகாட்ட வேண்டுமெனவும் நான் நினைக்கின்றேன்.

இந்த Clean Sri Lanka வேலைத்திட்டம் சம்பந்தமான Power Point presentation ஒன்றை நான் பார்க்கக்கூடியதாக இருந்தது. அதில் நல்ல விடயங்கள் குறிப்பிடப்பட்டிருக்கின்றன. தவறுதலாகவோ என்னவோ, இரண்டு மொழிகளில் மாத்திரம்தான் அந்த presentation செய்யப்பட்டிருக்கின்றது; அதில் தமிழ் மொழியைக் காணவில்லை. எனவே, நாங்கள் நடத்தை மாற்றத்தை இங்கு முதலில் ஆரம்பிப்போம்! நான் இதனைக் குற்றமாகச் சொல்லவில்லை, அதில் தமிழ் மொழியையும் உள்ளடக்குமாறுதான் சொல்கின்றேன். நடத்தை மாற்றம் ஏற்படுவதற்கு நீண்டகாலம் தேவையென நான் ஏற்கெனவே சொன்னேன். ஆகவே, எதிர்காலத்தில் இந்த நடத்தை மாற்றப்பட்டு, தமிழ் மொழியும் அதில் சேர்க்கப்படுமென நான் நம்புகின்றேன்.

அடுத்து, அரசாங்கத்தின் வேலைத்திட்டங்களுக்கு இடப்பட்டிருக்கும் பெயர்களின் அர்த்தம் மக்களுக்குப் புரியவேண்டும். ஆனால், தமிழ் பேசுகின்ற மக்களுக்கு அதிலுள்ள சொற்களின் அர்த்தம் புரிவதில்லை. ஒரு வேலைத்திட்டத்தின் தலைப்பு - பெயர் புரியாத நிலையில், அந்த வேலைத்திட்டம் வெற்றியளிக்கும் என்பது சந்தேகமே! உதாரணத்துக்கு, 'அஸ்வெசும' திட்டத்தை எடுத்துக் கொள்வோம். 'அஸ்வெசும' என்பதன் தமிழாக்கம் என்ன?

அரசியலமைப்புக்கான 16வது திருத்தத்தினூடாக தமிழ் பேசும் மக்கள் அதிகம் வாழுகின்ற வடக்கு, கிழக்குப் பிரதேசங்களில் ஆட்சிமொழி தமிழ் என மாற்றப்பட்டது. எனவே, தயவுசெய்து, இவ்வாறான சொற்களைப் பயன்படுத்தும்போது, அதற்குரிய தமிழாக்கத்தையும் இடுங்கள்!

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, -

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Sir, please do not deduct it from my time.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා language issue එක ගැන අහපු ප්‍රශ්නයට මම කෙටි පිළිතුරක් දෙන්නයි හදන්නේ. ඒ වෙනුවෙන් ගතවන කාලය ආණ්ඩු පක්ෂයේ කාලයෙන් අඩු කරගන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමාගේ කාලය ගන්න එපා. ගරු මන්ත්‍රීතුමනි, Clean Sri Lanka website එක ගත්තාම, ඒක දෙමළ භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන් තිබෙනවා. මම කනගාටු වෙනවා, ඔබතුමා කියපු කරුණ ගැන. මම දැනගන්න කැමැතියි, දෙමළ භාෂාවෙන් නැතුව ඒ PowerPoint presentation එක කවුද කළේ, කොහේදීද කළේ කියන එක.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
I can share with you that presentation I got. I think it is the official presentation made by the Government.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Hon. Member, you mentioned that the PowerPoint presentation was only in Sinhala and English. It is a big insult to us and also a discrimination against the Tamil people. So, we would like to know which government institution did this wrong PowerPoint presentation.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
I will share it with you.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
We will correct it.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You may proceed, Hon. Member.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
அதேபோல, 'உறுமய' திட்டம் என்கிறார்கள்; "ඔබට ගෙයක් - රටට හෙටක්" என்கிறார்கள். இவற்றின் தமிழாக்கத்தையும் நீங்கள் இட்டால், நாங்கள் எத்திட்டத்தை நோக்கிப் பயணிக்கின்றோம் என்பதைத் தமிழ் மக்களும் தமிழ் பேசுகின்ற மக்களும் புரிந்துகொள்வார்கள். நாங்கள் இந்த அரசாங்கத்தினூடாகப் பல நல்ல விடயங்களை எதிர்பார்த்து நிற்கின்றோம். உதாரணத்துக்கு, இங்கு புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு உருவாக்கப்பட்டு இருக்கின்றது. கடந்த கால அரசாங்கங்களில் இந்த நாட்டிலுள்ள பிரதான மூன்று மதங்களுக்குமெனத் தனித்தனி அமைச்சுகள் இருந்தன. ஆனால், இப்போது புத்தசாசன அமைச்சு மாத்திரம் காணப்படுகின்றது. ஆகவே, அனைத்து மதங்களையும் சமமாக மதிக்கக்கூடிய வகையில், Clean Sri Lanka வேலைத்திட்டத்தினூடாக புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சை மத நல்லிணக்க அமைச்சாக நீங்கள் மாற்றுவீர்கள் என நான் நம்புகின்றேன்.

Clean Sri Lanka வேலைத்திட்டமானது, social, environmental, ethical என்ற மூன்ற முக்கிய தூண்களின்மீது - pillars மூலம் முன்னெடுத்துச் செல்லப்படுகின்றது. இது நல்ல விடயம்! இதில் முதலாவதாக உள்ள social என்ற pillarஇன்கீழ் பல்வேறு விடயங்கள் முன்னெடுக்கப்படவுள்ளதாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. குறிப்பாக, சுத்தம் சம்பந்தமாகக் கூறப்பட்டிருக்கின்றது. இன்று இந்த நாட்டின் சுகாதாரத் துறையில் டெங்கு நோய் பாரிய பிரச்சினையாகக் காணப்படுகின்றது. இப்பிரச்சினை இலங்கை முழுவதும் உள்ளது. இந்த வேலைத்திட்டத்தை எங்களிலிருந்து முன்னெடுக்க வேண்டுமென்று நான் சொன்னதற்குக் காரணம், இன்று அரசாங்கத் திணைக்களங்களில்கூட டெங்கு நுளம்பு பெருகக்கூடிய இடங்கள் பெருமளவில் காணப்படுவதுதான். ஆகவேதான் இந்த வேலைத்திட்டத்தை எங்களிலிருந்து முன்னெடுக்கவேண்டிய தேவையிருக்கின்றது என்பதை நான் இங்கு மீண்டும் சொல்லிக்கொள்கின்றேன்.

அடுத்து, நீங்கள் Clean Sri Lanka வேலைத்திட்டத்தினூடாகப் பாதுகாப்பு, வீதிப் போக்குவரத்து சம்பந்தமான விடயங்களை அமுல்படுத்த முனைகின்றீர்கள்; நல்ல விடயம். இன்று 60-70 passengersஐ ஏற்றிச்செல்கின்ற பஸ் சாரதிகள் எந்த நேரமும் mobile phoneஇல்தான் இருக்கிறார்கள்; mobile phoneஇல் பேசியபடிதான் driving செய்கிறார்கள். அந்த பஸ்லில் driverக்கோ அல்லது அதில் பயணிக்கின்ற passengersக்கோ பேச முடியாத வகையில் பாரிய சத்தத்துடன் பாட்டு ஒலிக்கவிடப்பட்டிருக்கும். இதனால் பின்னால் வருகின்ற வாகனம் அடிக்கின்ற horn சத்தம்கூட அந்த driverக்குக் கேட்காதென நான் நினைக்கின்றேன். இவ்வாறான மோசமான செயற்பாடுகள் வீதிப் போக்குவரத்தில் இடையூறுகளை ஏற்படுத்துகின்றன. அதுமாத்திரமன்றி, எமது நாட்டில் பாதுகாப்பற்ற ரயில் கடவைகளும் பெருமளவில் இருக்கின்றன. இந்தக் கடவைகளில் இடம்பெறும் விபத்துகளினால் ஒவ்வொரு நாளும் பலர் இறப்பதை நாங்கள் பத்திரிகை வாயிலாக அறியக்கூடியதாக இருக்கின்றது. இவ்வாறான பிரச்சினைகளுக்கு Clean Sri Lanka வேலைத்திட்டத்தினூடாக நீங்கள் தீர்வைக் காண வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

அடுத்து, இன்று 'உணவுப் பாதுகாப்பின்மை' முக்கிய ஒரு பிரச்சினையாகக் காணப்படுகின்றது. இலங்கை முழுவதும் தொற்றா நோய்கள் எங்களுடைய மக்களை மிக மோசமாகப் பாதித்திருக்கின்றன. School canteen policy என policy ஒன்று இருக்கின்றது. School canteenஇல் எந்த உணவுப் பொருட்களை விற்கலாம் என்று ஒரு பட்டியல் இருக்கின்றது. ஆனால், இந்த school canteen policy இன்று பாடசாலைகளில் நடைமுறைப்படுத்தப்படுகின்றதா? என்றால், "இல்லை" என்றுதான் சொல்ல வேண்டும். பெரும்பாலான பாடசாலைகளில் இந்த விடயங்கள் பின்பற்றப்படுவதில்லை. எனவே, இவ்வாறான சின்னச் சின்ன விடயங்களிலிருந்து நாங்கள் 'Clean Sri Lanka' திட்டத்தை தொடங்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, மருந்துப் பாதுகாப்பு! இன்று இந்த நாட்டிலுள்ள சிறிய வைத்தியசாலைகள் மற்றும் மருந்தகங்களில், 10 சதவீதமானவற்றில்தான் pharmacists - மருந்தாளர்கள் இருக்கிறார்கள் என்று நான் நினைக்கின்றேன். இன்று அரச வைத்தியசாலைகளில்கூட மருந்தாளர்கள் இல்லாத ஒரு நிலைமை காணப்படுகின்றது. இந்த இடத்திலிருந்து Clean Sri Lanka வேலைத்திட்டம் தொடங்கப்பட வேண்டுமென நான் உங்களைத் தயவாகக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, எங்களுடைய பிரதேசங்களிலுள்ள பல திணைக்களங்களில் தமிழ் மொழி தெரியாத அரச உத்தியோகத்தர்கள் நியமிக்கப்பட்டிருக்கிறார்கள். குறிப்பாக, வனப் பாதுகாப்புத் திணைக்களத்தில் நியமிக்கப்பட்டிருக்கின்ற இவ்வாறானவர்கள் மொழி புரியாத காரணத்தால் எங்களுடைய மக்களோடு முரண்படுகிறார்கள். அவர்களுக்கு எங்களுடைய local language தெரியாது. அவர்கள் எங்களுடைய மக்களை அச்சமூட்டுகிறார்கள். அவர்கள் அங்கு தங்களுக்கு வசதிகளை ஏற்படுத்திக் கொடுக்கின்றவர்களோடு சேர்ந்து காடுகளை அழித்துக்கொண்டிருக்கிறார்கள். காடழிப்பானது இன்று எங்களுடைய நாட்டின் சுற்றுச்சூழலில் பாரிய பாதிப்பை ஏற்படுத்திக்கொண்டிருக்கின்றது. மேலும், எங்களுடைய இடம்பெயர்ந்த மக்களுடைய காணிகளில் வன இலாகாவினர் எல்லைக் கற்களை இட்டு, அவர்களை அங்கு செல்லவிடாது தடுக்கிறார்கள். இதனால் எங்களுடைய மக்கள் தங்களது சொந்தக் காணிகளுக்குள் போக முடியாமல் இருக்கிறார்கள். இந்த விடயத்திலும் Clean Sri Lanka வேலைத்திட்டம் செயற்படுத்தப்பட வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, முறையற்ற கழிவகற்றல் என்பது இன்று பாரிய ஒரு பிரச்சினையாக மாறியிருக்கின்றது. இன்று garbage management முறையாக நடக்கவில்லை. மாறாக, garbage dumpingதான் நடக்கின்றது. இதனால் எங்களுடைய சூழல் மிகவும் மோசமான முறையில் பாதிக்கப்படுகின்றது. அதேபோன்று கிரவல் அகழ்வும் இன்னுமொரு முக்கிய பிரச்சினையாகக் காணப்படுகின்றது. கிரவல் அகழ்வதற்குரிய permitஐ பெற்றுக்கொள்பவர்கள் அதற்குரிய கட்டுப்பாடுகளை உரிய முறையில் பின்பற்றுவதில்லை. கிரவல் அகழும்போது மிக ஆழமான குழிகள் ஏற்படுத்தப்படுகின்றன. அவற்றில் மக்களும் மிருகங்களும் விழுந்து சாகின்ற நிலை காணப்படுகின்றது. தயவுசெய்து, இந்த விடயத்தில் சுற்றுச்சூழலுக்குப் பொறுப்பாகவுள்ள அமைச்சர் அவர்கள் கூடிய கவனம் செலுத்தி, இந்த Clean Sri Lanka வேலைத்திட்டத்தினூடாக உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

இன்று எங்களுடைய பிரதேசங்களில் வீதி ஒழுங்கை மீறுவதால் அதிகமான விபத்துகள் - road traffic accidents இடம்பெறுகின்றது. இன்று வைத்தியசாலைகளில் emergency unitக்கு வருகின்ற patientsஇல் அதிகமானவர்கள் வீதி விபத்துகளுக்கு ஆளானவர்களாகவே இருக்கின்றார்கள். எங்களுடைய பிரதேசங்களில் roadஇல் கால்நடைகள் அலைவதும் படுத்திருப்பதும் இவ்வாறு நிறைய accidents நடப்பதற்கு முக்கியமான ஒரு காரணமாக இருக்கின்றது. ஏன் கால்நடைகள் roadக்கு வருகின்றன? அவற்றுக்குப் போதியளவு மேய்ச்சல்தரை இல்லாத காரணத்தால்தான் கால்நடைகளும் விலங்குகளும் roadக்கு வருகின்றன. வனப் பாதுகாப்புத் திணைக்களம் போன்ற அரச திணைக்களங்கள் அங்கு மேய்ச்சல் தரைகளை உருவாக்குவதில் தடையாக இருக்கின்றன. இதற்கு Clean Sri Lanka வேலைத்திட்டம்மூலம் நடவடிக்கை எடுக்க வேண்டும். முதலில் இவ்வாறான சின்னச் சின்ன விடயங்களை நாங்கள் நடைமுறைப்படுத்தினால், நிச்சயமாக இந்த Clean Sri Lanka வேலைத்திட்டம் வெற்றியளிக்கும்.

அடுத்து, சட்டவிரோத கட்டிடங்கள் அமைக்கப்படுவது பாரிய பிரச்சினைகளை ஏற்படுத்துகின்றது. இன்று பல இடங்களில் drainage வசதிகள் இல்லை. வயல் நிலங்களில் மண்ணை நிரப்பி வீடுகள் கட்டப்படுகிறது. இதையும் இந்த அரசாங்கம் கவனமெடுத்து, Clean Sri Lanka வேலைத்திட்டம்மூலம் உரிய நடவடிக்கை எடுக்க வேண்டும்.

அடுத்து, தேவையற்ற பொருட்களை அகற்றுதல்! இன்று எங்களுடைய அரச திணைக்களங்களிலும் அமைச்சுக்களிலும் அலுவலகங்களிலும் பாவிக்கப்படாத எத்தனை வாகனங்கள் நிறுத்தி வைக்கப்பட்டு இருக்கின்றன என்று பாருங்கள்! ஒன்றில், அவற்றைத் திருத்திப் பாவனைக்கு எடுக்க வேண்டும் அல்லது auctionமூலம் அவற்றை விற்று அரசாங்கத்துக்கு வருமானத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும். அவ்வாறு வாகனங்கள் தரித்துவைக்கப்பட்டுள்ள இடங்கள் எல்லாம் இன்று நுளம்பு பெருகின்ற இடங்களாகக் காணப்படுகின்றன. இதனையும் Clean Sri Lanka வேலைத்திட்டம்மூலம் சீர்செய்ய வேண்டும்.

அடுத்து, நெறிமுறைசார் - ethical பிரச்சினை! இன்று 'ஊழல்' என்பது fashionable word ஆக இருக்கின்றது. ஊழல் ஒழிப்பானது அடிமட்டத்திலிருந்து தொடங்கப்பட வேண்டும். அரச நிதியைப் பயன்படுத்தி உருவாக்கப்பட்டுள்ள பௌதிக வளங்களில் எவ்வளவு சதவீதம் பாவிக்கப்படுகின்றது என்பதை எடுத்துப் பாருங்கள்! இது சம்பந்தமாக என்னுடைய மாவட்டத்திலுள்ள விடயங்கள் அடங்கிய பட்டியல் ஒன்றையே நான் உங்களுக்குத் தர முடியும். பல மில்லியன் ரூபாய் செலவில் கட்டப்பட்ட புதிய கட்டிடங்கள் பல இன்றும் பாவிக்கப்படாத நிலையிலே காணப்படுகின்றது. கடந்த அரசாங்கக் காலத்தில் எங்களுடைய வவுனியா மாவட்டத்தில் பல மில்லியன் ரூபாய் செலவில் உருவாக்கப்பட்ட community water supplyஆனது ஒரு மாத கால பாவனைக்குப் பிறகு மூடிவைக்கப்பட்டிருப்பதை நான் அண்மையில் பார்த்தேன். இது மக்களுடைய வரிப் பணம்மூலம் உருவாக்கப்பட்டது. ஆகவே, இவ்வாறான பௌதிக வளங்கள் முறையாகப் பயன்படுத்தப்பட வேண்டும். இவற்றுக்கு Clean Sri Lanka வேலைத்திட்டம்மூலம் நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

அதுமாத்திரமன்றி, ஒரு நோக்கத்துக்காகப் பயன்படுத்தப்பட்ட அல்லது கட்டப்பட்ட கட்டிடம் வேறு நோக்கங்களுக்காகப் பயன்படுத்தப்படுகின்றது. உதாரணத்துக்கு, வட மாகாணத்தில் இருக்கின்ற ஒரேயொரு cooperative school வவுனியாவில் இருக்கின்றது. அது 2009ஆம் ஆண்டிலிருந்து வேறொரு நோக்கத்துக்காகப் பயன்படுத்தப்படுகின்றது. அங்கு இப்போது cooperative studies நடைபெறுவதில்லை. வட மாகாணத்துக்கென இருக்கின்ற அந்த ஒரேயொரு cooperative schoolஐ இந்த Clean Sri Lanka வேலைத்திட்டத்தினூடாக உரியவர்களிடம் கையளிக்கவேண்டிய தேவை இருக்கின்றது. தயவுசெய்து, அரசாங்கம் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டும்.

அடுத்து, இன்று எங்களுடைய நாட்டில் நாட்பட்ட சிறுநீரக நோய் - CKD - ஒரு முக்கிய பிரச்சினையாக இருக்கின்றது. இதற்கு அதிகூடிய உரப் பாவனையே காரணமெனச் சொல்லப்படுகின்றது. உரத்தை அளவாகப் பாவிக்க விவசாயிகளுக்கு ஆலோசனை வழங்குபவர்கள், உரிய இடங்களுக்கு வந்து கண்காணிப்பதில்லை என்ற குற்றச்சாட்டை விவசாயிகள் முன்வைக்கிறார்கள். இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு Clean Sri Lanka வேலைத்திட்டம் தேவையாக இருக்கின்றது. மேலும், இந்த Clean Sri Lanka வேலைத்திட்டத்தினூடாகப் பல்வேறு விடயங்களைச் செய்யவேண்டிய தேவை இருக்கின்றது. அந்த வகையில் இந்த வேலைத்திட்டத்தை நடைமுறைப்படுத்தும் ஒழுங்கில் மாற்றம் தேவையென நான் நம்புகின்றேன். சனாதிபதி செயலகத்திலிருந்து ஆரம்பிக்கின்ற Clean Sri Lanka வேலைத்திட்டம் நேரடியாக மாவட்ட மட்டத்துக்கு போகின்றது; அங்கிருந்து அது கிராமிய மட்டத்துக்குப் போகின்றது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து, இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

மாவட்ட மட்ட நிர்வாகத்துக்கும் மத்திய அரசு மட்ட நிர்வாகத்துக்கும் இடையில் மாகாண சபை என்ற ஓர் அமைப்பு இருக்கின்றது. இந்த Clean Sri Lanka வேலைத்திட்டத்தில் முக்கிய பங்கு வகிக்கின்ற உள்ளூராட்சி மன்றங்கள் மாகாண சபைக்குக் கீழே வருகின்றன. எனவே, இந்த வேலைத்திட்டத்தை மத்திய அரசு மட்டம் - மாகாண மட்டம் - மாவட்ட மட்டம் என, நடைமுறைப்படுத்தும் ஒழுங்கில் சில மாற்றங்களை ஏற்படுத்தவேண்டிய தேவை இருக்கின்றது.

அடுத்து, க.பொ.த. உயர் தரப் பரீட்சை வினாத்தாள்கள் - குறிப்பாக biology வினாத்தாள் - மிகவும் பிழையான முறையில் மொழிமாற்றம் - translation செய்யப்பட்டிருக்கின்றது. கேள்வி என்னவென்பதைப் புரியாமல் மாணவர்களால் விடை எழுத முடியாது. இவ்விடயம் தொடர்பாக நான் கௌரவ கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருடனும் பேசி இருக்கிறேன். எனவே, இந்த விடயத்தில் கட்டாயம் Clean Sri Lanka வேலைத்திட்டம் பயன்படுத்தப்பட வேண்டும். மொழிமாற்றப் பணிக்காக அதிகளவான தகுதிவாய்ந்தவர்களை நியமிக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

இந்தச் சபையில் இருக்கின்ற நாம் எல்லோரும் அரசியல் யாப்பைப் பேணிப் பாதுகாப்போமென்று சத்தியப்பிரமாணம் செய்திருக்கின்றோம். அந்த வகையில் அரசியல் யாப்பில் இருக்கின்ற பதின்மூன்றாவது திருத்தத்தை முழுமையாக நடைமுறைப்படுத்துவதற்குரிய ஆயத்தம் இந்த Clean Sri Lanka வேலைத்திட்டத்தினூடாக மேற்கொள்ளப்படும் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. இந்த Clean Sri Lanka வேலைத்திட்டம் வெற்றியளிக்க வேண்டும். இந்த நாட்டில் மாறி மாறி ஆட்சிக்கு வந்தவர்கள் ஜனநாயகமின்றிச் செயற்பட்டார்கள் என்பதற்காக, இன்று மூன்றில் இரண்டு பெரும்பான்மை பலத்தோடு இந்தப் புதிய அரசாங்கம் உருவாக்கப்பட்டிருக்கின்றது. இந்த Clean Sri Lanka வேலைத்திட்டம் உட்பட ஏனைய வேலைத்திட்டங்களில் நீங்கள் தோல்வி அடைவீர்களாக இருந்தால், இந்த நாட்டு மக்கள் ஜனநாயகத்தின்மீது வைத்துள்ள நம்பிக்கையை இழந்துவிடுவார்கள். எனவே, இந்த நாடு வேறொரு நிலைக்கு மாறக்கூடிய சூழ்நிலையை நீங்களும் ஏற்படுத்தாதீர்கள் என்று கேட்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chathuranga Abeysinghe. You have seven minutes.

[අ.භා. 1.00]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Clean Sri Lanka වැඩසටහන පිළිබඳව පැවැත්වෙන විවාදයේදී කරුණු කිහිපයක්

[ගරු චතුරංග අබේසිංහ මහතා]

ඉදිරිපත් කිරීමට මා මේ අවස්ථාව යොදා ගන්නවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් විවිධාකාරයේ චෝදනා කරමින් තමන්ගේ කථා පැවැත්වූවාට ජනතාව මේ Clean Sri Lanka programme එක පටන් ගත්තේ මීට ටික කාලෙකට ඉස්සෙල්ලායි. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට ඒක පොඩ්ඩක් අමතක වෙලා තිබෙනවා. රට බංකොලොත් වන තරමට වංචා, දූෂණ සිද්ධ කරලා, තමන්ගේ දේශපාලන බලය අවභාවිත කරපු දේශපාලනය මේ රටෙන් සහමුලින් තුරන් කර දමලා, පාර්ලිමේන්තුවත්, දේශපාලන සංස්කෘතියත් සම්පූර්ණයෙන් clean කරලා තමයි අපේ රටේ ජනතාව ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පත් කරගෙන අලුත් මාර්ගයක ගමන් කරන්න, නව ආර්ථික වැඩ පිළිවෙළකට සහ නව දේශපාලන සංස්කෘතියකට ඉඩ හදලා දීලා තිබෙන්නේ.

විශේෂයෙන්ම clean කියන කථාව ගත්තොත්, එහි යටින් කියැවෙන්නේ ඵලදායීතාව පැත්ත ගැනයි. මොකද, රටේ ඵලදායීතාව නැති නිසා තමයි අප අද මේ ආර්ථික අර්බුදයට මුහුණ දීලා තිබෙන්නේ. රජයේ අය වැය ගත්තත් ඵලදායීතාව නැහැ. අපේ කර්මාන්ත ක්ෂේත්‍රය ගත්තත් වෙනත් රටවලට සාපේක්ෂව ඵලදායීතාව වැඩි වෙලා නැති නිසා තමයි අද අපේ රට මේ තත්ත්වයේ තිබෙන්නේ. ඒ වාගේම අනෙක් හැම රටක්ම ඵලදායීතාව වැඩි කරගෙන තමයි තමන්ගේ ආර්ථිකයන් ලෝකයත් එක්ක තරගකාරී ආර්ථිකයන් බවට පත් කර ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප හැමෝම තේරුම් ගත යුතු දෙයක් තමයි local market කියලා එකක් දැන් නැහැ කියන එක. තිබෙන්නේ ජාත්‍යන්තර වෙළෙඳ පොළක්. ලංකාවත් එහි කුඩා වෙළෙඳ පොළක්. ඒ නිසා අපේ කර්මාන්තකරුවෝ, අපේ රාජ්‍ය ආයතන, අපේ පාසල් පද්ධතිය ඵලදායීතාවෙන් ඉහළට ගත්තොත් විතරයි අපට ගමනක් තිබෙන්නේ. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ තමයි ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය දැන් තිබෙන්නේ. ලංකාවේ නැවතත් ජාතික ඵලදායීතා සම්මාන තරගාවලිය පවත්වන්න අපි මේ වන කොට සූදානම් වෙලා ඉන්නවා. රාජ්‍ය අංශය, විශේෂයෙන් රාජ්‍ය ව්‍යවසායකත්ව අංශය - SOEs, පාසල් අංශය සහ කර්මාන්ත අංශය කියන සෑම අංශයෙන්ම ඵලදායීතාව වැඩි කර ගන්නේ කොහොමද කියන සංකල්පය ගෙනැල්ලා ඒ සඳහා මුළු රටම දැවැන්ත යොමු කිරීමක් කරන්න අපේ අමාත්‍යාංශය වන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය මේ වන කොට කටයුතු කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම ආයතනයක, ඕනෑම කර්මාන්තයක waste කියලා එකක් තිබෙනවා; විවිධාකාරයේ කුණු අපේ ආයතන ඇතුළේ තිබෙනවා. ඵලදායීතාව පැත්තෙන් බලලා අපි ඒවාට අගය එකතු කරන්නේ නැතුව පිරිවැය එකතු කර ගන්නවා. Defects පැත්තෙන් ගත්තත්, overproduction පැත්තෙන් ගත්තත්, waiting පැත්තෙන් ගත්තත්, භාවිත නොකරන ශ්‍රමය හෙවත් ඌන භාවිත ශ්‍රමය පැත්තෙන් ගත්තත්, inventory පැත්තෙන් ගත්තත් එහෙමයි. මේ වාගේ විවිධාකාර waste වර්ග අපේ ආයතනවල තිබෙනවා. මෙන්න මේවා ඉවත් කරමින් ඵලදායීතාව වැඩි කිරීමේ ක්‍රියාවලියකට රටම යොමු කිරීමට අපි මේ වන කොට සූදානමින් සිටිනවා, Clean Sri Lanka programme එක යටතේ. ඒ වාගේම තමයි අපේ industrial zones ගත්තත්. මේ වන කොට පිහිටුවා තිබෙන කාර්මික ජනපද, එහෙම නැත්නම් කාර්මික ප්‍රදේශ ඵලදායීතාවෙන් තොරව තමයි මේ දක්වා නිර්මාණය කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ භූමි ප්‍රමාණවලින් වැඩිපුර ඵලදායීතාවක් ගන්න, එහෙම නැත්නම් වැඩිපුර නිෂ්පාදනයක් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් මේ අවුරුද්ද ඇතුළත දියත් කරන්න සූදානම් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවට අවශ්‍ය කඩදාසි - කොළ, පොත් ආදිය - ලංකාවේ නිෂ්පාදනය කිරීමේ හැකියාවක් තිබෙන බව අපි දන්නවා. වාලච්චේන කඩදාසි කම්හල මේ වන කොට ඒකට යම්කිසි රුකුලක් දීලා තිබෙනවා. එයට තාක්ෂණය අවශ්‍ය වෙලා තිබෙනවා. නමුත් ඒ කම්හල පවත්වාගෙන යන්න, එහෙම නැත්නම් ඒකේ නිෂ්පාදනය වැඩි කරන්න දැනට තිබෙන ප්‍රධානම අර්බුදය වෙලා තිබෙන්නේ භාවිත කළ කඩදාසි නොමැති වීමයි. ඇත්තටම මේ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට අවශ්‍ය කරන භාවිත කළ කඩදාසි ලබා ගැනීමත් දැන් රටේ මාෆියාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි දැන් කැබිනට් තීරණයක් ලබා ගැනීම සඳහා වන යොමු කිරීමක් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ආයතනවල, පාසල්වල සහ ගෙවල්වල, විශේෂයෙන්ම රාජ්‍ය ආයතනවල, අහක දමන කොළ - අහක දමන කඩදාසි - සමස්තය සැපයුමක් ලෙස ඒ කර්මාන්තශාලාවට ලබා දුන්නොත් ඒ කර්මාන්තශාලාවට පුළුවන් අවශ්‍ය කරන නිෂ්පාදනය උපරිම තලයට ගේන්න. ඒ වාගේම, විශේෂයෙන් පාසල් පද්ධතිය ආශ්‍රයෙනුත් මේ Clean Sri Lanka වැඩ පිළිවෙළට සමගාමීව අහක දමන කොළ එකතු කිරීම සඳහා එකතු කිරීමේ මධ්‍යස්ථාන ඉදි කර ගනිමින් එම කර්මාන්තශාලාවලට අවශ්‍ය කරන යෙදවුම් අමු ද්‍රව්‍යයක් විධියට කඩදාසි එකතු කිරීමේ ක්‍රියාවලියක් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරමින් සිටිනවා. එය කරන්නේ, Clean Sri Lanka programme එකට සමගාමීවයි.

මේ වන කොට සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉන්න පුටු නම් ගොඩක් හිස්. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අප කිව යුතු දෙයක් තමයි, Clean Sri Lanka කියන්නේ එක තැනක එක ක්‍රියාවලියකට සීමා වූවක් නොවෙයි කියන එක. අදටත් අපට පෙනෙනවා, ත්‍රී වීලර් එකක, බස් එකක අමතර කෑල්ලක් ගලවපු එකක් අල්ලා ගෙන මේ ව්‍යාපෘතිය ගැන කථා කරන බවක්. ඉතාම පැහැදිලිව, පුළුල්ව දවස් දෙකක් තිස්සේ අපි මේ වැඩසටහන ගැන කියමින් සිටිනවා. අපි මේ වන කොට වංචාවෙන්, දූෂණයෙන් මේ රට clean කරගෙන තිබෙනවා; දේශපාලන සංස්කෘතියෙන් මේ රට clean කරගෙන තිබෙනවා. එතැනින් එහාට රටේ ඵලදායිතාව වැඩි කර ගැනීම සඳහාත් අපි කටයුතු කරමින් සිටිනවා. රාජ්‍ය අංශය ඵලදායිතා ක්‍රියාවලියට යොමු කර ගන්නේ කොහොමද, විශේෂයෙන්ම අපේ රාජ්‍ය ව්‍යවසායකත්වය යොදවන ආයෝජනයට ඵලදායී අගයක් එකතු කර ගන්නේ කොහොමද, සේවක ඵලදායිතාව, තාක්ෂණික ඵලදායිතාව, නිෂ්පාදන ඵලදායිතාව වැඩි කරගෙන විශේෂයෙන් රටක් විධියට ඉදිරියට යන්නේ කොහොමද කියන කාරණා අපේ අවධානයට යොමුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශීය කර්මාන්තකරුවා ගැන අප කථා කළාට දේශීය කර්මාන්තකරුවාත් ලෝක වෙළෙඳ පොළේ පංගුවක් වෙලායි තිබෙන්නේ. මොකද, අපේ රටත් මේ වන කොට ලෝක වෙළෙඳ පොළේ පංගුවක් වෙලායි තිබෙන්නේ. ඒ නිසා ඵලදායිතාව වැඩි කිරීමෙන් තොරව කිසිම කර්මාන්තයකට යා හැකි ගමනක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා අවශ්‍ය කරන ශක්තිය, තාක්ෂණික දැනුම සහ යොමු කිරීම කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිද්ධ කරනවා. මොකද, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ලංකාවේ කාර්මික විප්ලවයේ ප්‍රධානම පුරුකක් බවට මේ අවුරුද්දේ ඉඳලා පත් වෙනවා. ඒ වැඩ පිළිවෙළත් එක්ක විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට සහ මේ රටේ ජනතාවට ඒකාබද්ධ වෙන්න පුළුවන්. යම්කිසි පදනමකින් පටන් ගෙන අපේ බලශක්ති භාවිතය, අපේ යෙදවුම් භාවිතය, අපේ ශ්‍රම ඵලදායිතාව, අපේ භූමියේ ඵලදායිතාව වැඩි කර ගැනීමට හැකියාවක් අපට තිබෙනවා. ඵලදායිතාව වැඩි කර නොගත් නිසා තමයි අපට සහල් ප්‍රශ්නයත් ඇති වුණේ; පොල් ප්‍රශ්නයත් ඇති වුණේ. ඒ ගැන මේ දවස්වල සාකච්ඡා වෙමින් පවතිනවා.

විපක්ෂය පැත්තේ සිටින දේශපාලනඥයන් එකතු වෙලා අවුරුදු ගණනක් තිස්සේ ඉඳන් මේ රටේ නිෂ්පාදනය බිඳ වට්ටපු හින්දා පොල් ගෙඩි මිලියන 800ක් අපනයනය කරන අපනයනකරුවන්ට එම අවස්ථාව නැති වෙලා තිබෙනවා. ඒ නිසා ඔවුන්ගේ අපනයන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය කරන පොල් කිරි, මද සහ පොල් තෙල් නිෂ්පාදනයට අවශ්‍ය කරන අර්ධ නිමි අමු ද්‍රව්‍ය තාවකාලිකව ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කර තිබෙනවා. එය සලකා බැලීමට ලක් වෙනවා. එහෙම නැතුව, පොල් ගෙන්වන්න මේ අවස්ථාවේදී කිසිම තීරණයක් අරගෙන නැහැ. ඒ කාරණයත් පැහැදිලි කරමින් මගේ වචන ස්වල්පය නිමා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Faiszer Musthapha. You have 10 minutes.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

Hon. Deputy Speaker, I thought I had been given 12 minutes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

No, Hon. Member, you have ten minutes.

[අ.භා. 1.09]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා, Clean Sri Lanka වැඩසටහන පිළිබඳ විවාදයට සම්බන්ධ වීමට මට අවස්ථාව ලබා දීම ගැන. Clean Sri Lanka වැඩසටහන සම්බන්ධයෙන් නොයෙක් උදවිය නොයෙක් අදහස් ප්‍රකාශ කර තිබෙන බව මම දන්නවා. මම විශ්වාස කරනවා, මේ පණිවුඩය හරියාකාරව සමාජගත වෙලා නැහැ කියලා. එම නිසා මම මේ අවස්ථාවේ මේ ගරු සභාවේදී කියවනවා, ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයෙකු වන මා මිත්‍ර ක්‍රිශාන්ත කුරේ මහතාගේ සටහනක්. ඔහු සඳහන් කරනවා, "ඉතිහාසයේ පළමු වරට ශ්‍රී ලාංකිකයන් ජනප්‍රියවාදය, ජාතිකවාදය සහ ආගම්වාදය පසෙකට දමා, තම උදාර දිවයින නැවත ගොඩනැගීමේ අධිෂ්ඨානශීලී ගමනේදී එක්සත් වීමට උනන්දු වන බවට වූ පළමු සලකුණ තමයි Clean Sri Lanka කියන්නේ...

Clean Sri Lanka යනු රට පරිවර්තනයකට ලක් කරන පුරවැසි වගකීමක පිළිබිඹුවකි. ආචාරධර්මීය ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීමට වඩාත් පිරිසිදු භෞතික පරිසරයක් සහ දීපව්‍යාප්ත සදාචාරාත්මක කැපවීමක් සඳහා පිළිතුරු සැපයීම Clean Sri Lanka ව්‍යාපෘතියෙහි අරමුණ වේ." ඒ නිසා සංකල්පීය වශයෙන් අපි සියලුදෙනාම Clean Sri Lanka වැඩසටහනට සහයෝගය දිය යුතුයි කියන එක තමයි මගේ විශ්වාසය. අපි දන්නවා ඔබතුමන්ලා රට භාර ගත්තේ අරගළයකින් පස්සේ. ඒ අවස්ථාවේදී රටේ දේශපාලන අස්ථාවරභාවයක් තිබුණා, ආර්ථික අස්ථාවරභාවයක් තිබුණා. දරිද්‍රතාව 2019, 2020 වර්ෂවලට වඩා සියයට 20කින් වැඩිවෙලා තිබුණා වාගේම, මධ්‍යම පන්තිය දියාරු වෙලා ගිය වෙලාවක්. ඔබතුමන්ලා මේ රටට පොරොන්දුවක්ද, සිහිනයක්ද දුන්නේ කියලා තමුන්නාන්සේලාගේ ක්‍රියාවලින් තමයි ජනතාව තක්සේරු කරන්නේ. තමුන්නාන්සේලා පොරොන්දු වුණා දූෂණයෙන් තොර රටක්, ශක්තිමත් ආර්ථිකයක්, තිරසාර සංවර්ධනයක්, system change එකක්. මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, a journey of a thousand miles begin with a single step. Therefore, I say that any achievement starts with a simple step.

මේ සංකල්පය ඉදිරිපත් කිරීම ගැන ගරු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට මම මේ අවස්ථාවේදී ස්තුතිය ප්‍රකාශ කරනවා. ජනාධිපතිතුමා ජනතාවට Clean Sri Lanka වැඩසටහන ප්‍රකාශ කළාට පස්සේ, ත්‍රීවිල් රථ සහෝදරයන්ගේ සහ බස් රථ හිමියන්ගේ සහයෝගය ලබා ගන්න පුළුවන් වුණේ නැත්තේ එය සමාජගත වුණු ආකාරය නිසා. එදිනම පොලීසිය පටන් ගත්තා ත්‍රීවිල්වල සහ බස්වල අනවශ්‍ය කොටස් ගලවන්න. Clean Sri Lanka වැඩසටහන සමාජගත වුණු ආකාරය ප්‍රශ්නයක් කියන එක මම මේ අවස්ථාවේ ඔබතුමන්ලාට මතක් කරන්න කැමැතියි.

Clean Sri Lanka වැඩසටහනින් සමාජයේ සියලුදෙනාම එක හා සමාන ලෙස සැලකීමේ වැදගත්කම තහවුරු කළත්, ආර්ථිකමය පැත්තෙන් ගත්තොත් මධ්‍යම පන්තිය විනාශ වෙලා ගිහින් තිබෙනවා.

If you take the economic side, the poor man cannot have access to microfinance and he is not entitled to relief, but when it comes to large entities, they get millions out of their loans wiped out. Loan sharks are profiting through poor masses. Therefore, steps must be taken to eradicate loan sharks and to provide the common man with loans at concessionary rates so that he could carry on with his life.

Clean Sri Lanka වැඩසටහන ජනතාවට පීඩා වන ආකාරයට ක්‍රියාත්මක නොකළ යුතු බව මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. නීතිය ක්‍රියාත්මක කරනවාට වඩා ජනතාවගේ මනස වෙනස් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. අධිකරණ ඇමතිතුමා සභාවේ ඉන්නවා. සිංගප්පූරුව දිහා බලන්න. ඒ ජනතාව කුණු කසළ එහේ මෙහේ දමන්නේ නැහැ. රටට තිබෙන ආදරය නිසායි ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. නීති හරහා භය කරලා අපට හැම දාම මේ සමාජය වෙනස් කරන්න බැහැ කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ශ්‍රී ලාංකික චින්තනය, රටට ආදරය කරන චින්තනය Clean Sri Lanka තුළින් අපි ඇති කළ යුතුයි. එය ඇති කරන්න රටේ සමානාත්මතාවක් තිබෙන්න ඕනෑ.

අපේ අධිකරණ පද්ධතිය දිහා බලනකොට නඩුවක් අවුරුදු 10ක්, 20ක් යනවා. මහෙස්ත්‍රාත් උසාවියේ ඉඳලා ඇපැල් උසාවියට නඩුවක් යන්න අවුරුදු 20ක් විතර යනවා. සිවිල් නඩු සම්බන්ධවත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. පුරවැසියෙක් ඒ උසාවියකට යන්න කැමැති නැහැ. එය අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. උසාවි රාමුව දිහා බලනකොට, එහි පහසුකම් දිහා බලනකොට විශාල ප්‍රශ්න තිබෙනවා. අපේ පොලීසිය දිහා බලනකොට පහසුකම් අඩුවක් තිබෙනවා. අපි නොයෙක් අවස්ථාවල නොයෙක් ප්‍රකාශ කරනවා. අපේ නීතිය ගැන කථා කරනකොට, එක්නැලිගොඩ, රිවඩ් ද සොයිසා ගැන කථා කරනවා. ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනයේ වැරදිකරුවන්ට අද වෙනකම් නඩු පවරන්න බැරි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් system change එකක් අවශ්‍යයි ගරු අධිකරණ ඇමතිතුමනි. අමු අමුවේ එවැනි ඝාතන කරපු උදවිය නිදැල්ලේ. ලසන්ත වික්‍රමතුංගගේ සහෝදරයා මට හැම දාම කථා කළා. ඔහු හැම ආණ්ඩුවකින්ම ඉල්ලනවා,"මගේ සහෝදරයා ඝාතනය කළ පුද්ගලයන් අධිකරණය ඉදිරිපිටට ගේන්න කටයුතු කරන්න" කියලා. ඒ අනුව බලනකොට කොහේ හරි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

නිසා අපට වගකීමක් තිබෙනවා නීතිය සාධාරණ ලෙස ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් දිහා බලන්නත් ඕනෑ. අපි නීතිය ගැන කථා කරනවා. නමුත් පොලීසියට නිසි සම්පත් තිබෙනවාද? සම්පත් ඌනතාවක් තිබෙනවා. අපි නීතිපති දෙපාර්තමේන්තුව දිහා බලමු. අපි ඒගොල්ලන්ට චෝදනා කරනවා වුණත්, නීතිපති දෙපාර්තමේන්තුවේ බොහෝ නිලධාරින් පිරිසක් අද පෞද්ගලික අංශයට ඇවිල්ලා තිබෙනවා. ඒ බව අධිකරණ ඇමතිතුමා දන්නවා. ඒ නිසා නීතිපති දෙපාර්තමේන්තුව හරියාකාරව ක්‍රියා කිරීමට අවශ්‍ය සම්පත් සහ අවශ්‍ය නිලධාරින් ලබා දීම අවශ්‍යයි. ඒ නිසා අපේ නීති රාමුව, නීති පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් ලබා දීමත් Clean Sri Lanka වැඩසටහනේ වගකීමක් හැටියට මම දකිනවා.

ඒ වාගේම ආර්ථික පැත්ත දිහා බලනකොට, අපි ආයෝජකයන් දිහා -දේශීය සහ විදේශීය ආයෝජකයන්- වපර ඇහෙන් බලන්න හොඳ නැහැ. මේ රටේ ප්‍රාග්ධන දියුණුවක් ඇති කරන්න බැහැ, ආයෝජනයක් නැත්නම්. ඒ නිසා මම මේ අවස්ථාවේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා ආයෝජකයන්ට හිතකාමී ලෙස කටයුතු කරන්න කියලා. අපි Clean Sri Lanka කියන්නේ, සියලුදෙනාට හොඳ අනාගතයක් ලබා දෙන්න වැඩ කරනවා කියන එක. අපි ආර්ථිකමය වශයෙන්, සමාජයීය වශයෙන් වෙනසක් ඇති කළේ නැත්නම් අපට ඒ අවශ්‍ය වෙනස ලබා ගන්න බැහැ.

අපි දූෂණය ගැන කථා කරනවා. මේ රටට ආයෝජකයන් එන්නේ නැත්තේ දූෂණය නිසා. ඒක ලොකු ප්‍රශ්නයක්. ඒවා අවම කිරීමට ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගවලට මම ප්‍රශංසා කරනවා. ලෝකයේ අනෙකුත් රටවල් ආයෝජනය දිරි ගන්වන්න කටයුතු කරනවා. ඒ නිසා අපිත් ඒ සම්බන්ධයෙන් අලුත් ලෙස හිතන්න ඕනෑ; අලුතින් ක්‍රියා කරන්න ඕනෑ. මම මේ රජයෙන් ඉල්ලා සිටිනවා ඒ සඳහා තමුන්නාන්සේලා Clean Sri Lanka වැඩසටහන හරහා වැඩසටහනක් ඇති කරන්න කියලා.

තමුන්නාන්සේලා ඉන්නේ ආණ්ඩුවේ නම්, විපක්ෂයේ වැරදි ගැන හැම දාම කථා කරන්න එපා. තමුන්නාන්සේලා පත් කරලා තිබෙන්නේ රට ඉදිරියට ගෙන යන්නයි. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන්නේ. තමුන්නාන්සේලා ඉන්නේ ආණ්ඩුවේ නම්, තමුන්නාන්සේලා මේකට නිසි වැඩසටහනක් හදන්න. ඒ වාගේම විපක්ෂය දිහා වපර ඇහෙන් බලන්න එපා. විපක්ෂයටත් අදහස් තිබෙනවා. Clean Sri Lanka කියන්නේ මේ රටට ලොකු සම්පතක්. විපක්ෂයත් ඒ වැඩසටහනේ පංගුකාරයන් කරන්න. තමුන්නාන්සේලාට මේ ගමන තනියම යන්න බැහැ. මෙය සමාජගත කිරීමේ දී සියලුදෙනාම අවශ්‍යයි.

තමුන්නාන්සේලා විශිෂ්ට ජයග්‍රහණයක් ලැබුවා. තමුන්නාන්සේලාට උතුරේත්, නැගෙනහිරත් මන්ත්‍රීවරු ඉන්නවා. කිසිම ජාතික පක්ෂයකට ඒ අවස්ථාව ලබා ගන්න බැරි වුණා. ඒ නිසා තමුන්නාන්සේලාට මේ රටේ සැබෑ වෙනසක් කරන්න හැකියාවක් තිබෙනවා. නමුත් අද ප්‍රශ්නය තිබෙන්නේ, තමුන්නාන්සේලා ජනතාවට පොරොන්දුවක් දෙනවා ද, සිහිනයක් දෙනවාද කියන එක ගැන. ඒ සිහිනය පොරොන්දුවක් හැටියට ඉෂ්ට කිරීමේ පූර්ණ වගකීම තිබෙන්නේ තමුන්නාන්සේලාටයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි.

අපි මේ රටේ bureaucracy එක දිහා බලමු. මම පළාත් සභා පළාත් පාලන ඇමති හැටියට කටයුතු කළා. මේ රටේ ඇමති කෙනෙක් බලය ක්‍රියාත්මක කරන්නේ නිලධාරින් හරහා. පළාත් සභාවේ මහ ඇමති සහ ඇමතිවරු බලය ක්‍රියාත්මක කරන්නේ නිලධාරින් හරහා. හැබැයි, අපේ නගර සභා පනත දිහා බලන්න, ප්‍රාදේශීය සභා පනත දිහා බලන්න. ප්‍රාදේශීය සභාවේ සභාපතිට හෝ නගරාධිපතිට බලයක් තිබෙනවා plans approve කරන්න. ඒ ගැන තමුන්නාන්සේලා හිතන්න. ඒ තුළින් නොයෙක් ප්‍රශ්න ඇති වෙනවා. ඒ දූෂණයට ඉඩ දෙනවාද? මම පළාත් සභා හා පළාත් පාලන හිටපු ඇමතිවරයා හැටියට ඒ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. පළාත් පාලන ආයතන ඡන්දයත් ළඟ එනවා. පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමභාවය වැඩි කර දූෂණයෙන් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති සම්පාදනය කරන ලෙස තමුන්නාන්සේගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Aruna Panagoda. You have 12 minutes.

[අ.භා. 1.20]

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දින දෙකක් - ඊයේත්, අදත් - වෙන් කරලා Clean Sri Lanka නම් වූ රජයේ අලුත් වැඩසටහන පිළිබඳව මේ පාර්ලිමේන්තුවට විවාදයක් ලබා දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Clean Sri Lanka වැඩසටහන සම්බන්ධයෙන් වූ විවාදය යන අතරතුර විපක්ෂය ඒගොල්ලන්ගේ කාලය වෙන් කර ගන්න කල්පනා කරනවා ආණ්ඩුවට මඩ ගහන්න, අසත්‍ය කියන්න, වැරදි මත පළ කරන්න. ඒක තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. විපක්ෂයත් එකතු කරගන්න, දායක කරගන්න, එතුමන්ලාගේ යෝජනාත් ගන්න කියලා කියනවා හිටි ගමන් අපට ඇහෙනවා. ඒ ගමන් ස්තුතිත් කරනවා. ඒ කරන ගමන් අනෙක් පැත්තට මඩගහමින්, අසත්‍ය කියමින්, බොරු සමාජ මතයක් වපුරවන්න දරන වෑයම තමයි විපක්ෂයේ කටයුතුවලින් අපට පෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයක් හැටියට අපි ඉතා සැලසුම් සහගතව මේ Clean Sri Lanka වැඩසටහන සංවිධානය කරලා තිබෙන්නේ මේ රට අලුත් දිශාවකට අරගෙන යන්නයි. "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන දැක්ම අනුව මේ රට අලුත් දිශාවකට, නව්‍යකරණයකට අරගෙන ගිහිල්ලා, මේ රටේ ජනතාවට අහිමි වුණු ඇත්ත ජීවිතය නැවත ලබා දෙන්න තමයි Clean Sri Lanka වැඩසටහනෙන් අපි ආරම්භයක් ගත්තේ. ඒකේ Vision එක අනුව අපි පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ගොඩනඟද්දී පාරිසරික, සමාජමය හා ආචාර ධාර්මික මූලාරම්භයක් හා ජාතික තලයේ කැපවීම තුළින් සංවර්ධිත ජාතියක් ලෙස ශ්‍රී ලංකාව ඉහළ තලයකට ඔසවා තැබීම තමයි එහි මෙහෙවර - Mission එක - වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මෙහෙවර හා දැක්ම තුළ බොහොම ඉවසිලිවන්තව හා සැලසුම් සහගතව තමයි අපි මේ වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කරගන්න කටයුතු කරන්නේ. නමුත් ඒ සඳහා ඉවසිල්ලක් නැති විපක්ෂය අසත්‍ය කියන, මඩගහන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පොහොසත්, රටක් ලස්සන ජීවිතයක් ගොඩනැඟීම පටන් ගන්න තිබෙන්නේ කොතැනින්ද? ආරම්භය ගන්න තිබෙන්නේ කොතැනින්ද? ජනතාවට කාලකණ්ණි ජීවිතයක් උරුම කරලා දුන් රටක, බංකොලොත් රටක ජනතාවගේ ජීවිත පොහොසත් කරන්න තමයි අපට සිද්ධ වෙලා තිබෙන්නේ. ආදර්ශය, පෙලඹවීම, යොමු කිරීම හා වෙනස්වීමේ අවශ්‍යතාව ශක්තිමත්ව තහවුරු කිරීම මඟින් ධනාත්මක හැසිරවීම් ඇතිකිරීම තමයි මේ කටයුත්තේ අරමුණ බවට පත් කරගෙන තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජීවන පරිසරය ප්‍රමිතිගත මට්ටමකට නංවාලීම මඟින් ජනතාවගේ ජීවන තත්ත්වය වඩාත් ඉහළට නැංවීමත් මෙහි එක අරමුණක් බවට පත්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ශ්‍රී ලංකාව සංවර්ධිත ජාතියක් ලෙස නැවත ස්ථාපිත කිරීම සහ සමාජ සදාචාරය සහ පාරිසරික ප්‍රවේශයන් තුළින් රට තුළට ගනු ලබන සියලු උත්සාහයන් ඒකාබද්ධ කිරීම සහ පහසුකම් සැලසීමත් මෙහි තවත් අරමුණක් බවට පත්වෙලා තිබෙනවා. ඊළඟට, සතුටෙන් සහ සිනහවෙන් පිරුණු මිනිසුන් සිටින සුන්දර රටක් නිර්මාණය කිරීම සඳහා මානව සබඳතා සඳහා හඳුනාගත් වටිනාකම් සහ ආචාර ධර්ම ස්ථාපිත කිරීමත් මේ Clean Sri Lanka වැඩසටහනේ මූලික අරමුණක් බවට පත්වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අරමුණු පෙරදැරි කරගෙන අපි ආණ්ඩුව විධියට රට පුරාම සැලසුම් දියත් කරමින් ආරම්භයක් ගන්නකොට විපක්ෂය දකින්නේ, කුණු එකතු කරන එක. ඔන්න, දකින විධිය. කුණු ටිකක් එකතු කරනවා, එහෙම නැත්නම් වෙරළ සුද්ද කරනවා වාගේ කථා කියනවා. ගරු ජනාධිපතිතුමා ජනවාරි මාසයේ පළමුවැනි දා මේ Clean Sri Lanka වැඩසටහන හඳුන්වා දුන් තැන ඉඳලා විපක්ෂය අසත්‍ය කියමින්, මඩගසමින්, අවලාද නඟමින්, අසත්‍ය ප්‍රචාර පතුරවා හරිමින් පටු විධියට තමයි කටයුතු කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ මේ වැඩසටහන ආරම්භ කරන්න සැලසුම් සකස් කරද්දී අපි පළමුවැනි නිරීක්ෂණ චාරිකාව යොදා ගත්තා, හෝමාගම නගරයට. හෝමාගම නගරයෙන් මේක පටන් ගන්න අපි කල්පනා කළා. ඒ සඳහා අදහසක් ලබා ගන්න මම හෝමාගම නගරයේ ප්‍රධාන ස්ථාන කිහිපයකට, රජයේ ආයතන කිහිපයකට ගියා. හෝමාගම පෞද්ගලික බස් නැවතුම් පොළට මම ගියා. මොකක්ද එහි තිබුණු තත්ත්වය? ඒ බස් නැවතුම්පොළ ඉතා අවලස්සන තැනක් බවට පත්වෙලා තිබුණා. බස් හිමියන්ට, රියදුරන්ට, අනෙකුත් සේවකයන්ට නිවැරදි ආකාරයෙන් තමන්ගේ සේවාව ලබා දෙන්න, මඟීන්ට නිසි ආකාරයෙන් අවශ්‍ය සේවාව ලබා ගන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබුණා; පසුගිය කාලය පුරාම අත්හැරලා දමලා, ගන්න දෙයක් නැති තත්ත්වයට පත්වෙලා තිබුණා. එහි සේවකයන්ට තමන්ගේ මුහුණ කට සෝදා ගන්න හරියට තැනක් නැහැ. හරි වැසිකිළි කැසිකිළි පහසුකම් නැහැ. උදේ පාන්දර 3.00ට සේවයට එන රියදුරු මහත්වරුන්ට, කොන්දොස්තර මහත්වරුන්ට තේ එකක් බොන්න තැනක් හදලා නැහැ. ඔන්න, එක තැනක්. එම නිසා එතැනත් Clean Sri Lanka වැඩසටහන පටන් ගන්න ඕනෑ එක තැනක් කියලා අපි හිතනවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම Homagama Railway Station එකටත් ගියා. ඒ railway station එකේ තත්ත්වය මීට නොදෙවෙනියි. එතැන නිලධාරින් ඉන්නවා, ඔවුන් වැඩ කරන්න එකඟයි, වැඩ කරන්න කැමැතියි. එම ස්ථානයේ වෙනස් විය යුතු තත්ත්වයන් පිළිබඳව නිලධාරින් විසින් පසුගිය කාලයේම ආණ්ඩු දැනුවත් කරලා තිබෙනවා; ඇමතිවරු දැනුවත් කරලා තිබෙනවා; අදාළ නිලධාරින්ව දැනුවත් කරලා තිබෙනවා. හැබැයි, එතැනට අවශ්‍ය විධියට වැඩේ කෙරුණේ නැහැ. මේක තමයි පසුගිය කාලයේ පැවති තත්ත්වය. එම නිසා මේ රට භෞතික වශයෙන් විතරක් නොවෙයි, ආකල්පමය වශයෙනුත් වෙනස් කරද්දී Clean Sri Lanka වැඩසටහන ඉතාම වැදගත් වැඩසටහනක් බවට පත් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඔබතුමා දන්නවා, පසුගිය කාලයේ තිබුණු සියලුම ආණ්ඩු රාජ්‍ය සේවයට අත් පත් කර දී තිබෙන ඉරණම මොකක්ද කියලා. අතෘප්තිමත් රාජ්‍ය සේවකයෙක් බිහි කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රාජ්‍ය සේවයෙන් ප්‍රතිලාභ ලබන ජනතාව රාජ්‍ය සේවයට වෛර කරන කණ්ඩායමක් බවට පත් කරලා තිබෙනවා. රාජ්‍ය සේවය අකර්මණ්‍ය වන විධියට තමයි පසුගිය කාලයේ තිබුණු ආණ්ඩු කටයුතු කරලා තිබෙන්නේ. ඒ හේතුවෙන් අද කළ යුතුව තිබෙන්නේ මොකක්ද? අකර්මණ්‍ය කර තිබෙන, අතෘප්තිමත් කර තිබෙන රාජ්‍ය සේවය Clean Sri Lanka වැඩසටහන හරහා අපි තෘප්තිමත් සහ මහජන හිතවාදී රාජ්‍ය සේවයක් බවට පත් කළ යුතුයි. ඒ සඳහා අපි වැඩසටහන් හදනවා. ඒ නිසා තමයි මේ Clean Sri Lanka වැඩසටහන ඒ වෙනුවෙන් වූ එක් වැඩසටහනක් බවට පත් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා පසුගිය කාලයේ පළාත් පාලන මැතිවරණය කල් දමලා, විශේෂයෙන් මේ රටේ ග්‍රාමීය මට්ටමේ ජනතාවට තමන්ගේ ජීවන කටයුතු පහසු කර ගන්න තිබුණු අවස්ථා නැති කළ බව. ඒ සඳහා අවස්ථාවක් දුන්නේ නැහැ. පැවැත්විය යුතු මැතිවරණ කල් දැම්මා; පළාත් සභා මැතිවරණය කල් දැම්මා. ඒ විධියට වැඩ කරලා අපේ රටේ ජනතාවට මහජන නියෝජිතායතන තුළින් විසඳාගත යුතු කුඩා කුඩා ප්‍රශ්න වැඩි කරපු තත්ත්වයක් තමයි පසුගිය ආණ්ඩු තුළින් අපි දැක්කේ. ඒ තත්ත්වය අපි නිවැරදි කරන්න ඕනෑ. Clean Sri Lanka වැඩසටහන ඇතුළේ මේ තත්ත්වයන් නිවැරදි කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය සැලසුම් හදන්නත් අපි කල්පනා කරනවා; සැලසුම් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. විපක්ෂයේ මන්ත්‍රීවරු මෙතැනදී ඉදිරිපත් කළ කරුණු අනුවයි මම මේ කථා කරන්නේ. මම එය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අපි Clean Sri Lanka වැඩසටහන හදනකොට, "කොරහේ කිඹුල්ලු දකිනවා" වාගේ තත්ත්වයකට තමයි විපක්ෂය අද ඇවිල්ලා තිබෙන්නේ. මම ඒ අයට තවත් කාරණයක් පෙන්වා දෙන්න කැමැතියි. මීට අවුරුදු 10කට විතර කලින් මගේ හෝමාගම ආසනයේ කෝටි ගණනක් මහජන මුදල් වියදම් කරලා මාර්ගයක් හැදුවා. හෝමාගම නගරයේ තිබෙන වාහන තදබදය අඩු කරන්න තමයි ඒ මාර්ගය නිර්මාණය කළේ. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? එම මාර්ගය ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කරන්න බැරිව නිකම් කැළේට ගිය මාර්ගයක් බවට පත්වෙලා තිබෙනවා. එම මාර්ගයේ වාහන ගමනාගමනය කරන්න බැහැ. එම මාර්ගය හයිලෙවල් මාර්ගයට සම්බන්ධ වන ස්ථානයේ තවමත් පෞද්ගලික කඩයක් තිබෙන්නේ. ඔන්න, දැන් විපක්ෂයේ ඉන්න අය පසුගිය කාලයේ මේ වගේ දේවල්වලට කෝටි ගණන් මුදල් වියදම් කරලා කටයුතු කරපු විධිය. අපේ ආණ්ඩුව පත්වෙලා තවම මාස දෙකයි. දිව්‍ය ලෝකයක් බවට පත් කර තිබුණු රටක් පහුව දා අපි අපායක් බවට පත් කර දැම්මා වගේ තමයි දැන් මේ අය කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක් විධියට අපි මේ තත්ත්වයන් හඳුනාගෙන ගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම තුළ ඉතාම ඉක්මනින් ඒ නිවැරදි කිරීම් කරන්න අවශ්‍ය මූලික කටයුතු සකස් කරලා මේ රටේ ජනතාවට ඇත්ත සුව පහසු ජීවිතයක්, සතුටින් ඉන්න පුළුවන් ජීවිතයක්, පොහොසත් රටක් ගොඩනඟන්න මැදිහත් වෙනවා.

මට නියමිත කාලය අවසන් වෙමින් තිබෙන නිසා, විශේෂයෙන්ම මම තව එක කාරණයක් කියන්න කැමැතියි. අපි ගොඩනඟන්නේ ජනතාවට කරදරකාරි "ක්ලීන් ශ්‍රී ලංකාවක්" නොවෙයි. ජනතාව සම්බන්ධ කර ගත් - ජන සහභාගි - සංවර්ධනයක් ඇතුළේ, මේ රටේ ආර්ථිකය ක්‍රමිකව ගොඩනඟලා, මේ රට වඩාත් යහපත් සහ සුව පහසු රටක් බවට පත් කිරීම සඳහා මැදිහත් වීමක් කිරීම තමයි අපට තිබෙන්නේ. එම නිසා, ශ්‍රම මෙහෙයුමක් තුළින් නැවත මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරලා, ඉතා දියුණු රටක් ගොඩනඟලා, නැති වී ගොස් තිබෙන ජන ජීවිතයේ වටිනාකම් නැවත ලබා දෙන්න අපි හැම වෙලාවේම කල්පනා කරනවා.

[ගරු අරුණ පනාගොඩ මහතා]

අපි මේ තත්ත්වය ගොඩනඟද්දී විපක්ෂය මොකක්ද කරන්නේ? අපි දන්නවා, විපක්ෂය හැම දාම උදේ වරුවේ මේ සභාවට එනවා, මොකක් හෝ බොරුවක් කියනවා කියලා. බොරුවයි, වරුවයි. බොරුවයි, වරුවයි විපක්ෂයක් අද මේ තිබෙන්නේ. උදේට එනවා, බොරුවක් කියනවා, පැනලා යනවා. ඔන්න ඔහොම තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ නිසා බොරුවයි, වරුවයි විපක්ෂයකින් අපි ගන්නේ මොනවාද? මොකක්ද ඔවුන්ගෙන් මේ Clean Sri Lanka වැඩසටහනට යොදාගන්න තිබෙන දේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මම මතක් කරලා දෙනවා, විපක්ෂයේ කාර්යභාරය මොකක්ද කියන එක පිළිබඳව. ඒගොල්ලන් කල්පනා කරන්න ඕනෑ අපේ ආණ්ඩුවට ලැබිලා තිබෙන ජන වරම මොකක්ද කියලා. මේ විධියට අසත්‍ය සමාජගත කරලා, ජනතාව අපහසුතාවට පත් කරලා, රජයේ කටයුතු ගැන බොරු වපුරලා, මේ රටේ ජනතාවට අලුතින් තමන්ගේ ජීවිතය දිනා දෙන්න වැඩ කරන වෙලාවේ ඒක විනාශ කරන්න කල්පනා කරන විපක්ෂයට අපි කියනවා, "ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු - බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු, කඩුල්ලේ තරම දැනගෙන කඳ බඳිනු - තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු" කියලා. ඒ නිසා ඔබතුමන්ලා තමුන්ගේ තරම දැනගෙන කල් ගෙවන්න.

අද ජන වරම කොහේද තිබෙන්නේ? 159ක දැවැන්ත ජන වරමක් තිබෙන ආණ්ඩුවක් අද අපට තිබෙන්නේ. මේ රටේ ජනතාව ඒ ජන වරම අපට දීලා තිබෙන්නේ අද විපක්ෂයේ ඉන්න අය අවුරුදු ගණනාවක් ආණ්ඩු කරලා කරපු කෙරුවාව වෙනස් කරලා මේ රට හදන්නයි. ජාතික ජන බලවේග ආණ්ඩුව විධියට අපි ඒ වගකීම භාරගෙන ශක්තිමත්ව, ඉවසිලිවන්තව, සැලසුම් සහගතව මේ Clean Sri Lanka වැඩසටහන ඇතුළේ මේ රටේ ජනතාවට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් උරුම කර දෙද්දී, විපක්ෂයේ සමහරුන්ට තමන්ගේ වැඩ ගැනම ලජ්ජා හිතිලා හිනාවෙනවා. ඒ, ඒගොල්ලන්ගේ වැඩ ගැන හිතිලාමයි හිනාවෙන්නේ. පසුගිය කාලයේ හොරා කාලා, මේ රට විනාශ කරලා, මේ රටේ මහජන මුදල් නාස්ති කරලා, නැති භංග කරපු අය අද තමන්ටම හිනා වෙනවා. ඒ නිසා ඒගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වය වෙනස් කරලා ඉතාම කෙටි කාලයක් තුළ මේ දූෂිත දේශපාලනයෙන් මේ රට මුදාගෙන අලුත් දිශාවකට, පොහොසත් රටක් ගොඩනඟන දිශාවකට අපි මේ රට ගෙන යනවා. ඒ වෙනුවෙන් ජනතාව අපට ලබා දුන් ජන වරමට ගරු කරලා, ජාතික ජන බලවේගයේ අපි ජනතාවත් එකතු කරගෙන සාමූහිකව මේ රට ගොඩනඟනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙලාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Hesha Withanage Ankumbura Arachchi. You have 12 minutes.

[අ.භා. 1.33]

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

Clean Sri Lanka ව්‍යාපෘතිය ගැන විවාද කරන මේ මොහොතේ අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා අපි මතක් කරන්න ඕනෑ කාරණාවක් මතක් කළා. ඒක හොඳ පණිවුඩයක්. තමුන්ගේ තරම දැනගන්න ඕනෑ කියලා එතුමා කිව්වා. ඔව්, ඒක දැන් ජනතාවට පෙනෙනවා; දැන් තරම පෙනෙනවා. ඒ නිසා ඒක එතුමාම කියපු එක ගැන සතුටුයි. මම දැක්කා, කොළඹ දිස්ත්‍රික්කයේ තවත් මන්ත්‍රීවරයෙකුත් පෞද්ගලික නාළිකාවකට ගිහින් හරි ලස්සනට කිව්වා - ඒක එතුමාට කියැවුණා - bat එක දීලා ground එකට ආවාට පස්සේ out වෙන්න වුණා, දැන් ඔවුන්ට bat කරගන්න තේරෙන්නේ නැහැ කියලා. දැන් ඔවුන්ගෙන්ම මේ දේවල් කියැවෙනවා. නමුත්, අපි මේ ව්‍යාපෘතිය ගැන වැරදි විධියට බලන්නේ නැහැ. මේ ව්‍යාපෘතියේ අරමුණ වශයෙන් කියලා තිබෙන දේ ඇත්ත එකක් නම් විපක්ෂයක් විධියට අපි සතුටු වෙනවා, මේ ගොඩනැඟෙන්නේ අපේ රට කියන තැන ඉඳගෙන. නමුත්, ඒක නොවෙයි වෙන්නේ කියන එක පැහැදිලියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපට මතකයි, සමාජ, පාරිසරික සහ සදාචාරාත්මක පුනර්ජීවනය තුළින් සමාජය ඉහළ තලයකට ඔසවා තැබීම කියන පරමාර්ථයෙන් ජනවාරි 01වැනි දා Clean Sri Lanka වැඩසටහන ආරම්භ කළ බව ජනාධිපතිතුමා කිව්වා. හැබැයි, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, නැහැ, මේක පටන් ගන්නේ පෙබරවාරි 01වැනි දා සිට කියලා. මොකද, වැඩේ ඇනගත්තා. ත්‍රී වීලර්වල, බස් රථවල අමතර කෑලි ගලවලා Clean Sri Lanka කියන්නේ මේක කියලා සමාජගත වුණා. ඒක මේ විපක්ෂය කරපු වැඩක් නොවෙයි. ඒක අපි කරපු වැඩක් නොවෙයි. ඒක ඔබතුමන්ලාම ඇනගත්ත තැනක්. දැන් මහින්ද සහෝදරයාට මේක ආපසු හරවාගන්න ඕනෑ නිසා එතුමා කිව්වා, නැහැ, මේක පටන් ගත්තේ පෙබරවාරි මාසයේ කියලා. අපි දන්නේ නැහැ, ඇත්ත කථාව අනුර කුමාර මහත්මයා කියන එක ද, මහින්ද ජයසිංහ මහත්මයා කියන එක ද කියලා.

දැන් කෙසේ හෝ මේ වැඩසටහන ආරම්භ වෙලා තිබෙනවා නේ. අපි මේ Clean Sri Lanka කියන සන්නාමය ආපු තැන ඉඳලා හොයමු. මට පෙර කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, Clean Sri Lanka කියන්නේ මොකක්ද කියලාවත් විපක්ෂය දන්නේ නැහැ කියලා. නැහැ, අපට මේක හොඳට තේරෙනවා. මේ වාගේ වැඩසටහන් ගොඩක් අපි පසුගිය කාලයේත් දැක්කා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා clean කරපු හැටි අපට මතකයි නේ. මට පෙර කථා කළ මන්ත්‍රීතුමා එතුමන්ලාගේ ජන වරම ගැන කථා කළා. එතුමාට මම කියන්න ඕනෑ, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මීට වැඩිය ලොකු, දරාගන්න බැරි ජන වරමක් අරගෙනයි ආවේ කියලා. නමුත් එතුමාගේ පක්ෂයෙන් අද පාර්ලිමේන්තුවේ ඉන්නේ තුන්දෙනායි. එම නිසා ජන වරම ගැන මහ ලොකුවට පාරම්බාන්න එපා. ජන වරමට හරියට ගෞරවයක් දෙන විධියට වැඩ කරන එකයි වැදගත් වන්නේ. නමුත් දැන් අපට ඒක පෙනෙන්නේ නැහැ. ඔය මට්ටමේ ජන වරමක් නොවෙයි, මන්ත්‍රී ධුර 113ක් අරගෙනවත් මේ රටේ මෑත ඉතිහාසයේ කවදාවත් මිනිස්සුන්ට හාල් ටික නැති වුණේ නැහැ. හොරකම් කර කර හරි හාල් ටික දුන්නා. සුදු ලූනු ටිකෙන් හොරකම් කර කර හරි කන්න ටික දුන්නා. බී ලූනු ගෙඩියෙන් හොරකම් කර කර හරි කන්න ටික දුන්නා. අද සල්ලි දීලා ගන්නවත් හාල් ටික නැහැ. එම නිසා අමතක කරන්න එපා, රටේ තිබෙන තත්ත්වය ඔය ජන වරමෙන් වහන්න බැහැ කියන එක. ජන වරමට ගෞරවයක් දෙන්න නම්, වැඩේ හරියට කරන්න ඕනෑ.

අපි හිතනවා, මෙය සිංගප්පූරුවේ නිර්මාණය වුණු "Keep Singapore Clean" සහ ඉන්දියාවේ නිර්මාණය වුණු "Swachh Bharat" වැනි වැඩසටහන්වලින් සැදුම්ලත් සන්නාමයක්ද කියලා. කෙසේ හෝ මෙම වැඩසටහන යහපත් අරමුණින් ක්‍රියාත්මක කරනවා නම්, ඒ පිළිබඳව රට දැනුවත් කරන්න ඕනෑ. දැන්

කියනවා, විපක්ෂය දන්නේ නැහැ කියලා. ඇත්තටම අපට මේ සම්බන්ධව නිවැරදිව දැනගන්න විධියක් නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දැන් රූපවාහිනී වැඩසටහන්වලට ගියාම එක එක කථා කියනවා. සමහරු ඇඹරෙනවා. මෙය ලොකු පරාසයක් තුළ ක්‍රියාත්මක වන වැඩසටහනක්. මොකක්ද මේකේ වෙන්නේ කියන එක ගැන දන්නේ නැහැ. මේකේ ඉන්න සාමාජිකයෝ රූපවාහිනී වැඩසටහන්වලට ඇවිල්ලා කියන කථාත් පරස්පරයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මා යෝජනා කරනවා, මේ project එක මොකක්ද කියලා මෙම විවාදය අවසන් වන අද දිනයේ හෝ හරියට රටේ ජනතාව දැනුවත් කරන්න කියලා. එක එක කෑලි කියන්නේ නැතුව සමස්ත ව්‍යාපෘතිය පිළිබඳවම දැනුවත් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Clean Sri Lanka වැඩසටහන පරිසරය පිරිසිදුව තබා ගැනීම, සමාජයීය වෙනස කියන පුළුල් පරාසයක් තුළ ක්‍රියාත්මක වනවා නේ. මම යෝජනා දෙකක් ගෙනෙනවා. වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා එදා වේදිකාවල කරපු කථා අද සමාජ මාධ්‍ය තුළ ගළපා, bud කරලා දානවා. ඒ කියන්නේ, එතුමා ජනාධිපතිවරණ වේදිකාවේ කියපුවා සහ දැන් කරන කථා. අපි දැක්කා, ඊයේ පෙරේදා එතුමා කළුතරට ගිහින් කරපු කථාවක්. ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? ඉන්ධන මත පනවා ඇති රුපියල් 50 tax එක මොනම හේතුවකටවත් අඩු කරන්න බැහැ කියනවා. හැබැයි එතුමාම එදා වේදිකාවේ කිව්වා, "මේකේ රුපියල් 50ක් අඩු කරන්න පුළුවන්, වර්තමාන ආණ්ඩුව මේ රටේ ජනතාව ගැන හිතන්නේ නැහැ, අපි ආපු විගස අඩු කරනවා" කියලා. අනුර කුමාර දිසානායක මැතිතුමා අසත්‍ය කියලා බලය ගත්තා කියලාම කියන්න මම උත්සාහ කරන්නේ නැහැ. හැබැයි, අනුර කුමාර දිසානායක මහත්මයා එදා වේදිකාවේ කියපු කාරණා යථාර්ථයක් බවට පත් කර ගන්න බැරිව අද හිර වෙලා තිබෙනවා. මට පෙනෙනවා, ජනාධිපතිවරයාට මේ සඳහා හයියක් දෙන්න අමාත්‍ය මණ්ඩලයේ සමහරු සූදානම් නැහැ කියලාත්.

බලශක්ති ඇමතිතුමා එදා ඇත්ත කිව්වාද දන්නේත් නැහැ, ඒක එතුමාගේ හිතලුවක්ද දන්නේත් නැහැ. එක්කෝ එතුමා අවංකව කිව්වාද දන්නේත් නැහැ. එතුමා කිසිම ප්‍රශ්නයක් නැතුව කිව්වා, සියයට 37කින් විදුලි බිල වැඩි කරන්න වනවා, අඩු කරන්න බැහැ කියලා. ජනාධිපතිතුමා කිව්වේ, "අපි ආපු ගමන් විදුලි බිල අනිවාර්යයෙන්ම තුනෙන් එකකින් අඩු කරනවා" කියලායි. දැන් විදුලි බිල සියයට 20කින් අඩු වුණා නේ. දැන් ආණ්ඩුව ඉතාම අමාරු උත්සාහයක නිරත වනවා, "සියයට 20 අඩු කළේ අපි" කියලා ඒකේ credit එක දා ගන්න. ඒ credit එක දා ගන්න. මොකද, මේක ඔබතුමන්ලාගේ ආණ්ඩුව නේ. හැබැයි මේ රටේ ජනතාව දන්නවා, මහජන උපයෝගිතා කොමිසම විදුලි බිල අඩු කරන ලෙස නිර්දේශ කළ නිසා එය අඩු කරන්න වුණු බව. පසුව ඇමතිතුමාත් එය පිළිගත්තා. ගරු ඇමතිතුමනි, විදුලි බිල අඩු කරන්න පුළුවන්. විදුලි බිල අඩු කරන්න අවශ්‍ය සැලසුම් අපි විපක්ෂයේ ඉඳගෙන මීට පෙරත් කියලා තිබෙනවා. අපි විපක්ෂයේ ඉඳගෙන කළ යෝජනා එදා ආණ්ඩුව ඇහුවේත් නැහැ. අද ආණ්ඩුව ඊටත් වැඩිය නරක තැනකට තල්ලු වනවා කියන ආරංචි අපට එනවා. මේක තවම කැබිනට් මණ්ඩලය තුළ සාකච්ඡා වනවා. මා නිවැරදි නම් ඇමතිතුමා සද්ද නැතිව ඉඳීවි. එහෙම නැත්නම් ඇමතිතුමාගෙන් මා ඉල්ලනවා, "එහෙම දෙයක් වෙන්නේ නැහැ" කියලා කියන්න කියලා.

ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ වනකොට අපේ රටේ පුනර්ජනනීය බලශක්තිය පාවිච්චි කිරීම ඉතාම මන්දගාමී තැනක තිබෙන්නේ. ඒකට හේතුව, මාෆියාවකින් ඒක වහලා තිබීම. මම ඇඹිල්ල දිගු කරලා කියනවා, මේ රටේ මාෆියා ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනය තමයි ලංකා විදුලිබල මණ්ඩලය කියන එක. විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු සංගමය කාටවත් මෙල්ල කරන්න බැහැ. ඉංජිනේරු සංගමයේ බොහෝදෙනා එම මාෆියාවට යට වෙලා, ඛනිජ තෙල්වලින් නිෂ්පාදනය කරන විදුලිය unit එකක් රුපියල් 150ට, 160ට ගන්න ඔවුන් අනියමින් සහයෝගය දෙනවා. මොකද, ඔවුන් විශ්‍රාම ගිය පසු ජාවාරම්කාර එම සමාගම්වල රැකියා කරන්න යනවා. එම නිසා කවදාවත් පුනර්ජනනීය බලශක්තිය වැඩි කරන්න, ජල විදුලිය නිපදවීම වැඩි කරන්න, සූර්ය බලශක්තියෙන් කරන විදුලිය නිපදවීම වැඩි කරන්න, සුළං බලාගාර නිර්මාණය කරන්න අවශ්‍ය හයිය ඔවුන් දෙන්නේ නැහැ. පසුගිය කාලයේ යම් ප්‍රගතියක් තිබුණා. ගරු ඇමතිතුමනි, අපට ආරංචි වෙනවා, මේ වෙනකොට මේ රටේ ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය පසුබිම නිර්මාණය වෙලා තිබෙන මෙගාවොට් 10ට වැඩි යෝජිත විශාල ව්‍යාපෘති ගණනාවක් ආපසු හරවන්න උත්සාහ කරනවාය කියලා. ඒ කාගේ අවශ්‍යතාවද? මේ ගරු ඇමතිතුමාටත් හිටපු ඇමතිවරුන්ට වෙච්ච වැඩේම වෙලා තිබෙනවා කියලා අපට පෙනෙනවා. මේ ජාවාරම්කාරයෝ ටික ඒ අවශ්‍ය තැනට මේක තල්ලු කරනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී චෝදනාවක් කරනවා, ගරු ඇමතිතුමනි. කලින් මන්ත්‍රීතුමෙක් කිව්වා වාගේ විනිවිදව, නිවැරදිව වැඩ කරමින්, පිරිසිදු පාලනයක් කරන්න ආවා නම්, මේ රටට coal ආනයනය කරනකොට ඒ ප්‍රමිති සහතිකය ලබා දෙන සමාගම මොකක්ද කියා බලන්න ඕනෑ. Google කළාම බලා ගන්න පුළුවන්, RMA Energy Consultants කියලා එනවා. මේ සමාගමේ අයිතිකාරයා කවුද? ඇමතිතුමාට හිනා යනවා. ඇමතිතුමා ඒ ගැන දන්නවා. මේ සමාගමේ අයිතිකාරයා කවුද? එහෙම නම් සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා සමහර විට දන්නේ නැති වුණත්, මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවයි, මේ ආණ්ඩුවයි දෙකම එකයි. මේක තමයි මේ රටට වුණේ. මේ අයිතිකාරයාට මේකේ ඉහළ පුටුවක් දීලා, අපට මෙහි සාධාරණයක් බලාපොරොත්තු වෙන්න පුළුවන් නම්, මම හිතන විධියට ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවයි, ඔබතුමන්ලා අතරයි වෙනසක් නැහැ. ඒ නිසා මම මේ කාරණය දැඩි අවධානයට ලක් කරනවා.

ලංකා විදුලිබල මණ්ඩලය මේ ජාවාරම්වලට ඉඩ දෙනවා කියන්නේ මොකක්ද? අහිංසක මිනිස්සුන්ගේ විදුලි බිල සියයට සියයක් අඩු කරන්න පුළුවන්, පුනර්ජනනීය බලශක්තිය හරහා විදුලිය ලබාගෙන. මම ඔබතුමාට උදාහරණ විධියට පසුගිය අවුරුදු තුන පිළිබඳව කියන්නම්. සෝලාවලින් විතරක් විදුලිය නිපදවීම ගත්තොත්, අවුරුද්දේ 365 දවසේම සූර්ය බලය තිබෙන අපේ රටේ 2021දී සියයට 3.2යි; 2022දී සියයට 4.5යි; 2023දී සියයට 5.51යි grid එකට ගන්නේ. ඒ කියන්නේ සියයට 5 තවම ගන්නේ. ඒක ප්‍රවර්ධනය කරන්න තිබෙන අවස්ථාව නවත්වලා මේකේ ඉන්න නිලධාරින්ට ඒ අවශ්‍ය ජාවාරමේ යෙදෙන්න ඉඩ දෙන එක නොවෙයි, මම හිතන විධියට ජාතික ජන බලවේගයෙන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ. මේ රටේ විදුලි බිල අඩු කරන්න පුළුවන්කම තිබේද්දී, ඒ ව්‍යාපෘති ටික නතර කරලා, මෙහෙම කරන්න ගියොත් මොකද වෙන්නේ? කවුරු හරි ව්‍යාපෘති කරනකොට, ඒ හිටපු ඇමතිවරු හොඳ, පිරිසිදු කට්ටිය කියලා කියන්න බැහැ නේ. අපි දන්නවා නේ කට්ටියගේ හැටි. ඔවුන් මොනවා හරි කරලා තිබෙනවා නම්, ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. හැබැයි, මේ රටට නැවත වතාවක් රුපියල් 150ට, රුපියල් 160ට විදුලිය ඒකකයක් අරගෙන වැඩකටයුතු කරන්න ගියොත් අනාගතයේදී පසුගිය කාලයේ වුණා වාගේ කළුවරේ පැය ගණන් ඉන්න වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම කැට තියලා කියනවා, මාස හතර, පහකට වැඩිය යන්න බැහැ කියලා. ඒ නිසා මේ විධියට ක්‍රියාමාර්ග ගන්න යෝජනා වෙලා තිබෙනවා නම්, ඒ ගැනත් කල්පනා කරලා වැඩ කරන්න කියලා මම කියනවා.

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් තිබෙන නිසා මේ Clean Sri Lanka ගැන කථා කරන වෙලාවේ තවත් කාරණාවක් සඳහන් කරනවා. මමත් පසුගිය කාලයේ COPE එකේ සාමාජිකයෙක් විධියට හිටියා. අපේ වත්මන් ජනාධිපතිතුමාත් හිටියා. අපි COPE එක තුළ දිගින් දිගටම කථා කළා, මේ රටේ clean කරන්න තිබෙන ආයතනයක් ගැන. ඒ ආයතනය තමයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය. මම හිතන විධියට, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කියන්නේ අපේ රටේ තිබෙන ආයතන අතරින් වෙනත් ග්‍රහලෝකයක් විධියට හිතාගෙන ඉන්න ආයතනයක්. ඇමතිතුමාත් හිතන්නේ එහෙමයි. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කරලා තිබෙන හොරකම්, වංචා ගැන එකින් එක අපි මේ පාර්ලිමේන්තුවේදී කථා කළා. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ දින දෙකක විවාදයක් කළා. ඒ දින දෙකක විවාදයෙන් පසුව අපි තීන්දුවකට ආවා, මේ ආයතනයේ ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් වෙනස් කරමු කියලා. සියලු මන්ත්‍රීවරු ඒ ව්‍යවස්ථාව වෙනස් කරමු කියලා එකඟතාවකට ආවා. මම එදා පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරයෙක් විධියට COPE එකේදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හොරකම්, වංචා, දූෂණ ටික ගැන කියනකොට අනුර කුමාර දිසානායක මහත්තයා වචනයක්වත් කථා කළේ නැහැ. හිටපු ක්‍රීඩා ඇමතිවරුන්ගේ සහයෝගය හම්බ වුණේත් නැහැ. හැබැයි, අද වෙනකොට වත්මන් ක්‍රීඩා ඇමතිතුමාත් ගිහිල්ලා දණ ගහලා කියනවා, ඔබතුමන්ලා ළඟ සල්ලි ගොඩක් තිබෙනවා, අපේ අනික් ක්‍රීඩාවලට උදවු කරන්න කියලා. මොකක්ද මේ වැඩේ? නැවතත් ඒ ජාවාරම්කාරයන් ටිකට අවශ්‍ය හයිය නේ මේ දෙන්නේ. ඒක හොඳට පැහැදිලිව පෙනෙනවා. අපි හිතුවේ, මේ ඇමතිතුමා ආවාම, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ විනිවිදව වැඩ කරනවා කියන ප්‍රතිපත්තිය ඇත්ත නම්, ඒ හයියත් අරගෙන ඉස්සෙල්ලාම මේ රටේ මේ ජාවාරමට නායකත්වය දෙන ෂම්මි සිල්වාගෙන් පටන් ගනීවි කියලා. අද ෂම්මි සිල්වා ගැන වචනයක් කථා කරන්නේ නැහැ. අද ෂම්මි සිල්වා ළඟ දණ ගහලා ක්‍රීඩා ඇමතිතුමා කියනවා, අපිට අනික් ක්‍රීඩාවලට උදවු කරන්න කියලා. ඒකට තමයි අමාත්‍යාංශයක් දීලා තිබෙන්නේ; ඒකට තමයි ඇමතිතුමාට බලය තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කියන්නේ ක්‍රීඩා පනත යටතේ පිහිටුවා තිබෙන ආයතනයක්. ඒක අමාත්‍යවරයාගේ අධීක්ෂණය යටතේ, විගණකාධිපතිවරයාගේ මූල්‍ය විගණනයට යටත් වන ආයතනයක්. මට ඒ ගැන කියන්න වෙලාව නැහැ. මේ ආයතනයේ වංචා, දූෂණ ගැන අපි ඇති තරම් පසුගිය කාලයේදී කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කියපු කරුණු කාරණා එක්ක, චිත්‍රසිරි වාර්තාව අනුව අවශ්‍ය කටයුතු කරලා අලුත් ව්‍යවස්ථාවක් හදා ගන්නවා කියලා එකඟ වෙලා පාර්ලිමේන්තුවෙන් ගියා. නමුත්, පසුගිය කාලයේ හිටපු ක්‍රීඩා ඇමතිවරු කළේ වෙන දේවල්. අපි දැක්කා, show එකක් යනවා; ක්‍රිකට් ආයතනයේ සල්ලි ටික යොදවලා "Smart Youth" නමින් දේශපාලනික සැණකෙළියක් කළා. ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු කථා කරන්න ඕනෑ ඕවා ගැන නේ. "Smart Youth" කියන සැණකෙළියකට මෙච්චර මුදල් වෙන් කළා, මේවාට අපි දෙනවා වැඩියි කියලා කියන්නකෝ. නැහැ, එහෙම කියන්න කට අරින්නේ නැහැ. ක්‍රිකට් ආයතනය ඉස්සරහා වත්මන් ආණ්ඩුව නිශ්ශබ්දව ඉන්නේ ඇයි කියන ප්‍රශ්නය අපි අහනවා. මේ ආණ්ඩුවට එහෙම නිශ්ශබ්දව ඉන්න බැහැ. මේක හොර ගුහාවක් කියන එක ඇති තරම් අපි ඔප්පු කර තිබෙනවා.

ඒ වාගේම තමයි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මැතකදී,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මට කථාව අවසන් කරන්න තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ කරුණු ටික සභාගත කරන්නම්, මට කථා කරන්න වෙලාව ප්‍රමාණවත් නොවන නිසා. සමාවෙන්න, විපක්ෂයේ වෙලාවෙන් තවත් විනාඩි 3ක් මට එකතු කරනවා කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මැතකදී සිදු කළ ව්‍යවස්ථා සංශෝධනයෙන් සාමාජික ඡන්ද ප්‍රමාණය අඩු කර තිබෙනවා. නිලවරණය දැන් ළං වෙලා තිබෙනවා. 2024.12.20 වන දින සම්මත කර ගත් යෝජනා අතර ජනමාධ්‍යයට හෙළි නොවුණු අමුතු යෝජනාවක් තිබෙනවා. ඉස්සෙල්ලා හිටපු අධිකරණ ඇමති අලි සබ්රි මැතිතුමාත් එක්ක තමයි අපි ක්‍රිකට් ආයතනය කරපු හොරකම් පොඩ්ඩක් හරි control කළේ. මොකද, ඒ ආණ්ඩුවේ හිටපු අනෙක් ඔක්කොම විකිණිලා හිටියේ. මේ ආණ්ඩුවේ අධිකරණ ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ඉන්න කට්ටියට විතරක් ආයෙත් වතාවක් එන්න සංශෝධනයක් කර තිබෙනවා. එම සංශෝධනයට අනුව, පසුගිය අවුරුදු 15ක කාලය තුළ විධායක කමිටුවේ හෝ විශේෂ කමිටුවක අවුරුදු දෙකක නියෝජනයක් නොමැති කිසිවකුට ක්‍රිකට් ආයතනයේ නිලවරණයට ඉදිරිපත් වෙන්න බැහැ. හොරු කියලා චෝදනා ලබලා, හොරු කියලා විගණකාධිපති වාර්තාවෙන් හෙළි වෙලා තිබෙන පිරිස හැර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පාලන බලය නැවත වතාවක් ගන්න බැහැ කියන තැනට නීති හැදෙනවා නම් ගරු අධිකරණ ඇමතිතුමනි, කොතැනටද අපි යන්නේ? ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, ජනාධිපතිතුමාගේ බලය පාවිච්චි කරලා හෝ කරුණාකරලා මේ නිලවරණය නතර කර දමන්න කියා. මේ නිලවරණයට ඉස්සෙල්ලා මේ රටේ ක්‍රිකට් ආයතනය භාර ගන්න පුළුවන්, ආයතනයක් විධියට ගෙනියන්න පුළුවන්, සුදුසු කණ්ඩායමක් පත් කරන්න.

අපි දන්නවා, මේ දවස්වල ඇමතිතුමන්ලාට, නියෝජ්‍ය ඇමතිතුමන්ලාට පුදුමාකාර විධියේ යෝජනා එන බව. ඒ යෝජනා එක්ක ඉස්සරහට ගිහිල්ලා මේ රටේ ක්‍රිකට් විනාශ කරනවා නම්, පසුගිය කාලයේ රාජපක්ෂලා කරපු දේම ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙනුත් සිද්ධ වෙනවා නම්, තවදුරටත් අපි බලා ඉන්න සූදානම් නැහැ කියන කාරණාවත් මම මතක් කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණාවත් කියනවා. ක්‍රිකට් ආයතනය සම්බන්ධව 2023 නොවැම්බර් මස 07වන දින නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ මිලින්ද ගුණතිලක මැතිතුමා විසින් හිටපු ක්‍රීඩා ඇමති රොෂාන් රණසිංහ මැතිතුමාට එවපු ලිපියක් තිබෙනවා. එම ලිපියේ කාරණා ටික ඉතාම වැදගත්. මේවා කිසිදු මායිමකට ලක් කරන්නේ නැහැ. වත්මන් ක්‍රීඩා ඇමතිතුමා මේවා ගැන දන්නේත් නැතිව ඇති. මම දැක්කා එතුමා ගිහිල්ලා කොහේද ground එකක ජෙනරේටරයක් ගැන හොයලා බලනවා. ඒවා හොඳයි. ඒවා ගැන හොයන්න ඕනෑ. නමුත්, ඇමතිතුමනි, මේවා ඊට වඩා ලොකු හොරකම්. උදේ හවස මුහුණට පෙනෙන හොරකම් මේවා. වත්මන් ක්‍රීඩා ඇමතිතුමාටයි, නියෝජ්‍ය ඇමතිතුමාටයි අපි කියනවා ෂම්මි සිල්වාගේ සාක්කුවට වැටෙන්න එපා කියලා. එහෙම වැටිලා තමයි ඉස්සෙල්ලා හිටපු දෙදෙනාම විනාශ වුණේ. ඔබතුමන්ලා විනාශ වුණත් කමක් නැහැ, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව

විනාශ වෙන්න ඉඩ දෙන්න එපා. හරියට clean කරනවා නම් clean කරන්න හොඳ තැනක් තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලයෙන්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ඒ කටයුත්ත පටන් ගන්න කියන ඉල්ලීමත් කරමින්, මේ තොරතුරු ටික **සභාගත*** කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණාවලට අදාළවයි මම මේ කියන්නේ. අපි සියලු ක්‍රීඩා ගැන නියමිත පරිදි හදාරමින් ඒ සියලු වංචා හෙළිදරව් කර ගනිමින් යන්නේ. කලින් හිටපු ඇමතිලා වාගේ අපි කිසිම කෙනෙකුගේ සාක්කුවලට නම් වැටෙන්නේ නැහැ. මට ඒක තමයි විශේෂයෙන්ම මේ ගරු සභාවට කියන්න ඕනෑකම තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා ඒ ගැන කිසිදු චකිතයක් තියා ගන්න එපා. අපි සියලු ක්‍රීඩාවලට ඒ සාධාරණය ඉෂ්ට කරනවා. අපි ground එක බලන්න ගියෙත් ඒකයි. ඒකට ගොඩක් අයට හිත් රිදිලා තිබුණා. හදපු නැති ground එකක් ගැන කිය කියා ඉන්න නිසා තමයි අපිත් බලන්න ගියේ. ඒ කැලේ තිබිලා තමයි අපි කන්ටේනර් එකත් හොයා ගත්තේ. ඒවා මහජන සල්ලි. අපි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ගැන හදාරමින්, අවශ්‍ය නීති කටයුතු සම්පාදනය කරමින් අපට ඒකට මැදිහත් වෙන්න පුළුවන් නම් අපි මැදිහත් වෙනවා. මම නැවත කියන්නේ අපි කිසිම කෙනෙකුගේ සාක්කුවලට වැටෙන්නෙත් නැහැ කියලායි. අපි පගා ගන්න, කොමිස් ගන්න දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි කියන එක මම නැවත කියනවා.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ඔබතුමාගේ ඒ ක්‍රියාදාමය -ඔබතුමා හෝමාගම ගිය එක- මම අගය කළා. ඒකේ වරදක් නැහැ. හැබැයි, මේ යන විධියට ක්‍රිකට් ආයතනයේ නිලවරණය තිබ්බොත්, ඔබතුමාගේ ඇමති කාලය ඉවරයි නේ. ආයේ ඒ කට්ටිය ගහන්න ඕනෑ ගේම් ටික ගහනවා. ඒකයි වේලාසනින් මේ ගැන හෙළිදරව් කළේ. ඔබතුමාට තිබෙන බලය පාවිච්චි කරලා, එහෙම නැත්නම් ගරු ජනාධිපතිතුමා හරහා හෝ මේ කටයුත්ත නතර කරවන්න. මොකද, ඔබතුමාත් දන්නවා,- නියෝජ්‍ය ඇමතිතුමා නම් දන්නවාද දන්නේ නැහැ. මේ ආයතනයේ හොරකම් කරනවා. මේක හොරකම් සිදු කරපු ආයතනයක්. විගණකාධිපතිතුමා හොරකම් ගැන හෙළි කරපු ආයතනයක් මේ. ඒ නිසා නැවත ඒ කණ්ඩායම එන විධියට නීති හදාගන්නවා නම් ඇත්තටම ඇමතිතුමා විධියට ඔබතුමා සාක්කුවට වැටෙන්න ඕනෑ නැහැ, ඉබේටම වැටිලා ඉවරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sellaththamby Thilaganathan. You have 12 minutes.

[பி.ப. 1.51]

**ගරු සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. Sellaththamby Thilaganathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எமது இலங்கை நாடானது ஆரம்ப காலத்தில் மிகவும் வளமானதாகக் காணப்பட்டது. பின்னர் இலங்கையை ஆண்ட அரசியல்வாதிகள் இங்கிருந்த வளங்களைச் சூறையாடியதன் காரணமாக நாடு வங்குரோத்து நிலைக்குச் சென்றது. இந்த நாட்டை மீளவும் வளமானதாக மாற்றுவதற்காகவும் இங்குள்ள மக்களுக்கு அழகான, சிறந்த வாழ்க்கையைப் பெற்றுக் கொடுப்பதற்காகவும் தேசிய மக்கள் சக்தி அரசாங்கமானது தற்போது தனது பாதையில் வீறுநடை போட்டுக்கொண்டு இருக்கின்றது.

நான் வன்னித் தேர்தல் மாவட்டத்தைச் சேர்ந்தவன். அங்கு 2009ஆம் ஆண்டுவரை வாழ்ந்த மக்கள், மிகவும் வளமான தேசத்தில் அழகான வாழ்க்கையை வாழ்ந்துகொண்டிருந் தார்கள். 2009ஆம் ஆண்டுக்குப் பிறகு, அங்கு வந்த அரசியல்வாதிகள் அபிவிருத்தி என்ற போர்வையில் அங்கிருந்த வளங்களை இரவோடு இரவாகச் சூறையாடிச் சென்றனர். உதாரணத்துக்கு வன வளத்தை எடுத்துக் கொள்வோம். அங்கு காடுகள் இருக்கின்றன; அவற்றில் மரங்கள் இல்லை. அதுபோலத்தான், மணல் வளமும். மன்னாரில் காணப்படுகின்ற ஆற்று மணலானது இரவு பகலாகச் சூறையாடப்பட்டது. இவ்வாறு எமது நாட்டின் வளங்கள் சூறையாடப்பட்டுக்கொண்டிருந்தன. ஆனால், தற்போதைய ஆட்சியில் இவ்வாறான எந்தவொரு செயற்பாடும் நடைபெறவில்லை என்பதை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த காலத்தில் வன்னித் தேர்தல் மாவட்டத்தில் வாழ்ந்த மக்கள் விவசாயம், கால்நடை வளர்ப்பு, மீன்பிடி ஆகிய மூன்று துறைகளிலும் ஈடுபட்டு வந்தார்கள். அங்கு கால்நடை வளர்ப்பில் ஈடுபடுகின்ற பெரும்பாலான மக்களுக்குக் கடந்த ஆட்சிக் காலத்தில் எந்தவிதமான வசதிகளும் வழங்கப்படவில்லை. இலங்கையின் மொத்த நிலப்பரப்பில் 40 சதவீதம் விவசாயத்துக்காகவும் 30 சதவீதம் கைத்தொழிலுக்காகவும் இன்னுமொரு 30 சதவீதம் வன இலாகா மற்றும் வனசீவராசிகளுக்காகவும் ஒதுக்கப்பட்டுள்ளது. ஆனாலும், எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற கால்நடைப் பண்ணையாளர்களுக்கு எந்தவிதமான நில ஒதுக்கீடும் செய்யப்படவில்லை என்பதை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இங்கே என்னுடைய மேசையில் இருக்கின்ற 500 மில்லிலீற்றர் தண்ணீர்ப் போத்தல் இலங்கையில் 90 ரூபாய்க்கு

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

விற்கப்படுகின்றது. ஆனால், 500 மில்லிலீற்றர் பசும்பால் 80 ரூபாய்க்குக் கொள்வனவு செய்யப்படுகின்றது. அவ்வாறு கொள்வனவு செய்யப்படும் ஒரு லீற்றர் பால் 480 ரூபாய்க்கு விற்கப்படுகின்றது. சாதாரணமாகப் பொருட்களின் விலையை அவற்றை உற்பத்தி செய்கின்றவர்கள்தான் தீர்மானிக்க வேண்டும். ஆனால், இலங்கையில் அவ்வாறான ஒரு நிலை காணப்படவில்லை. இந்நிலை நீடிக்குமானால், எதிர்வரும் காலங்களில் இலங்கையில் கால்நடை வளர்ப்புத் துறை இல்லாமல் போய்விடும் என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். இத்துறையில் ஈடுபட்டிருப்பவர்கள் பெரும்பாலும் பெண் தலைமைத்துவக் குடும்பங்களைச் சேர்ந்தவர்கள் என்பதையும் நான் இந்தச் சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

1980ஆம் ஆண்டில் இலங்கையின் மொத்தத் தேசிய உற்பத்தியில் - GDPஇல் 9 சதவீதமாகக் காணப்பட்ட கால்நடை வளர்ப்புத் துறையானது, தற்போது 1 சதவீதமாகவே காணப்படுகின்றது. இதற்கு என்ன காரணம்? கடந்த ஆட்சியாளர்கள் இந்தத் துறையைச் சிறிதளவேனும் கணக்கிலெடுக்காமல் விட்டதுதான் இதற்குக் காரணம் என்பதை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். அதேபோல், விவசாயத் துறையானது GDPஇல் 7 சதவீதமாகக் காணப்படுகின்றது. எமது அண்டைய நாடான இந்தியாவின் GDPஇல் கால்நடைத் துறை 22 சதவீதமாகக் காணப்படுகின்றது; விவசாயத்துறை 16 சதவீதமாகக் காணப்படுகின்றது. ஒரே காலநிலை, ஒரே சூழல் நிலவுகின்ற இந்த இரண்டு நாடுகளில் இவ்வாறு வேறுபாடு காணப்படுவதற்கு என்ன காரணம்? கடந்த கால ஆட்சியாளர்கள் உள்நாட்டு உற்பத்தியில் அக்கறை கொள்ளாமல், commissionக்காகப் பொருட்களை வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்தமைதான் இதற்குக் காரணமாகும். எமது வன்னிப் பிரதேசத்தில் முன்பு milk bar காணப்பட்ட இடங்களில் தற்போது liquor barதான் காணப்படுகின்றது என்பதை நான் இங்கு மனவருத்தத்தோடு தெரிவித்துக்கொள்கின்றேன். வன்னிப் பிரதேசத்தின் குளங்களுக்குக்கீழ் காணப்படுகின்ற மேய்ச்சல் தரைகள் யாவும் தற்போது அதிகாரிகளின் சம்மதத்துடனேயே அடாத்தாகப் பயிர்ச்செய்கைக்குப் பயன்படுத்தப்பட்டு வருகின்றன என்பதை நான் இச்சபையில் தெரிவித்துக்கொள்கின்றேன்.

இலங்கை வாழ் மக்கள் வருடமொன்றுக்குச் சராசரியாக 104 கிலோகிராம் அரிசியை உட்கொள்கின்றனர். இங்குள்ள மக்களுக்குப் புரதத் தேவை மிக அதிகமாகக் காணப்படுகின்ற போதிலும், அவர்கள் காபோஹைதரேட் அடங்கிய உணவுகளையே அதிகமாக உட்கொள்கின்றனர். கால்நடை சார் உற்பத்திப் பொருட்களை நுகர்வதன்மூலம் அவர்கள் தமது புரதத் தேவையை நிறைவுசெய்துகொள்ள முடியுமென நான் நம்புகின்றேன். எமது பிரதேசங்களில் கால்நடைகளுக்குப் போதியளவு மேய்ச்சல் தரை இல்லாத காரணத்தால், அவை வீதிகளிலும் பொது இடங்களிலுமே இரவுவேளையில் தங்குகின்றன. இதனால் அவற்றின் சாணி, சலம் என்பவற்றினால் அவ்விடங்கள் தூய்மையற்றுக் காணப்படுகின்றன. எனவே, அங்குள்ள கால்நடைகளுக்குப் போதியளவு மேய்ச்சல் தரைகளை வழங்குவதன்மூலம் பொது இடங்களைச் சுத்தமாக வைத்திருக்க முடியும் என்பதை நான் இச்சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, அங்கு அலைந்து திரியும் கட்டாக்காலி நாய்கள் வீதியில் மலம் கழிப்பதோடு, நிறுத்தி வைக்கப்பட்டிருக்கும் வாகனங்கள்மீதும் சிறுநீர் கழிக்கின்றன. இதன்மூலம் நோய்த் தொற்றுகள் ஏற்படுவதற்கான வாய்ப்புகள் அதிகமாகக் காணப்படுகின்றது என்பதை நான் இங்கு தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்து, கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களமானது மிகவும் நலிவுற்ற நிலையிலேயே காணப்படுகின்றது. முல்லைத்தீவு மாவட்டத்தில் இருக்கின்ற கால்நடைகளின் எண்ணிக்கை ஏறக்குறைய 89,000. ஆனால், அங்கிருக்கின்ற கால்நடை வைத்தியர்களின் எண்ணிக்கை 05. இந்த 05 கால்நடை வைத்தியர்கள்மூலம் அங்குள்ள 89,000 கால்நடைகளுக்கும் சிறந்த முறையில் சிகிச்சையளிக்க முடியாது என்பதை நான் இங்கு தெரிவித்துக்கொள்கின்றேன். எதிர்காலத்தில் எமது ஆட்சியில் இவ்வாறான நிலைமைகள் நீக்கப்பட்டு, கால்நடைத் துறை சிறப்பாக மிளிரும் என்பதை இங்கு நான் குறிப்பிடுகின்றேன்.

இன்று இங்கு உரையாற்றிய எதிர்க்கட்சி உறுப்பினர் ஒருவர், நடைபெற்று முடிந்த க.பொ.த. உயர் தரப் பரீட்சையின் Biology Paperஇல் பிழைகள் இருப்பதாகச் சுட்டிக்காட்டினார். அதேபோல், 2022ஆம் ஆண்டு நடைபெற்ற பட்டதாரிகளுக்கான போட்டிப் பரீட்சையொன்றின் சிங்கள மொழிமூல வினாத்தாளிலும் 20 வீதமான தவறுகள் இருந்தன என்பதை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

வவுனியாவில் காணப்படுகின்ற Co-operative Training Centreஆனது, கடந்த பல வருட காலமாக இராணுவத்தினரின் பயன்பாட்டிலேயே இருந்து வருகின்றது. கடந்த மாதம் நாங்கள் இது தொடர்பாக அவர்களுடன் பேச்சுவார்த்தை நடாத்தியபோது, அதனை விடுவிப்பதாக அவர்கள் உறுதியளித்தனர் என்பதை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதுபோல், கடந்த காலத்தில் வடக்கு மாகாண சபை ஆட்சியின்போது, வவுனியாவில் அமைக்கப்பட்ட பொருளாதார மத்திய நிலையமானது இதுவரை காலமும் திறக்கப்படாமல் பூட்டிய நிலையிலேயே காணப்படுகின்றது. எமது தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, எதிர்வரும் சில மாதங்களில் அதனை மக்களுடைய பயன்பாட்டுக்குத் திறந்து வைக்கும் என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மகாவலி கங்கை நீரானது, இதுவரை காலமும் வன்னிப் பிரதேசத்துக்கு வழங்கப்படவில்லை. எமது ஆட்சிக் காலத்தில் அந்த நீரை வட பகுதிக்கும் வழங்குவதற்கு நாங்கள் திட்டமிட்டுள்ளோம். அவ்வாறு வழங்குவதன்மூலம் வட மாகாணத்தில் இருக்கின்ற மக்களுக்கு வளமானதோர் எதிர்காலத்தையும், ஓர் அழகிய வாழ்க்கையையும் நாங்கள் ஏற்படுத்திக் கொடுப்போம் என்று கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Chanaka Madugoda. You have seven minutes.

[අ.භා. 2.01]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. මේ රටට බලපාන, මේ රටේ අනාගතය සුබවාදී දිසාවට ගෙන යන්න පුළුවන් ඉතා වැදගත් මාතෘකාවක් ගැන තමයි අපි දෙපැත්තට බෙදිලා ඊයේ දිනයත්, අද දිනයත් පුරාවට වාද විවාද කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දවස් දෙක පුරාවට අප කථා කළේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳවයි. එතකොට සමහරෙකුට හිතෙන්න පුළුවන්, පසුගිය කාලය තුළ පැවතුණේ "dirty Sri Lanka" වක් ද කියලා. මම විශ්වාස කරනවා, පැවැති හැම ආණ්ඩුවක්ම Clean Sri Lanka වැඩ පිළිවෙළට විවිධ දේවල් එකතු කර තිබෙනවා කියලා. ඒ එකතු කරපු දේවල් තුළින් අපි මේ රටට විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබෙනවා.

අප මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විධියට කටයුතු කළ අවධිය. එවකට කොළඹ නගරය තිබුණේ කොහොමද කියන කාරණය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සිටින ඔබ අප සියලු දෙනා දන්නවා. එදා කොළඹ නගරය අපවිත්‍ර නගරයක්. කිසි කෙනෙකුට කොළඹ නගරයට ඇවිල්ලා නිදහසේ හුස්ම ගන්න පුළුවන් පරිසරයක් තිබුණේ නැහැ. නමුත් ගෝඨාභය හිටපු ජනාධිපතිවරයා ආරක්ෂක ලේකම්වරයා විධියට කටයුතු කළ අවධියේ කොළඹ නගරය ඉතාම දැකුම්කලු, ඉතාම වර්ණවත් නගරයක් බවට පත් කළා; ලෝකයේ තිබෙන හොඳම නගර අතරින් එකක් බවට පත් කළා.

ඒ නිසා මම විශ්වාස කරනවා, ගෝඨාභය හිටපු ජනාධිපතිවරයා වාගේම විවිධ ආණ්ඩු මේ රටේ Clean Sri Lanka වැඩ පිළිවෙළට ඒ ආකාරයට විවිධ දේවල් එකතු කර තිබෙන බව. ඒ සංකල්පය අද යථාර්ථයක් කර ගන්න අවස්ථාව ලැබෙන්නේ කොහොමද? අපි විවිධ ආණ්ඩුවලින් ලැබුණු ඒ යහපත් දේවල් ඉදිරියට ගෙන යනවා නම්, ඒවා ඉදිරි වැඩසටහන්වලට එකතු කර ගන්නවා නම්, මේ කාරණය යථාර්ථයක් කර ගන්න අපට පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කාලයක අපට මතකයි බස් රථයක, එහෙම නැත්නම් පොදු ස්ථානයක ගමන් කරන්න අපහසු වූ බව. මොකද, ඒ කාලයේ ඕනෑම කෙනෙකුට ප්‍රසිද්ධියේ දුම් පානය කරන්න විවෘත ඉඩක් තිබුණා. නමුත් පසුගිය ආණ්ඩු ගත්තු පියවර නිසා අද අපට බස් රථයක ඉතාම හොඳින් යන්න, ඒ වාගේම පොදු ස්ථානවල කටයුතු කරන්න හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම ඉටි කොළ සම්බන්ධයෙන් තිබුණු ගැටලු නිරාකරණය කර ගන්නත්, පෝස්ටර් පිළිබඳව තිබුණු ගැටලු නිරාකරණය කර ගන්නත් අපට අවස්ථාව ලැබුණා. ඒ ඒ ආණ්ඩු කාලවල කරපු විවිධ දේවල්, ගත්තු යම් යම් ක්‍රියා මාර්ග ද මේ Clean Sri Lanka වැඩ පිළිවෙළට පාදක වුණා කියන කාරණය මා විශේෂයෙන් සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කියන්න ඕනෑ වුණේ මේකයි. අපි Clean Sri Lanka කියන වැඩ පිළිවෙළ මේ මොහොතේ භෞතිකව දකිමින් ඉන්නවා. නමුත් ඊට වඩා එහාට ගිය, ඊට වඩා එහාට යන්න පුළුවන් අදහසක් මේ පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් නම් වටිනවා කියන කාරණය මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ. අප පළමුවෙන්ම පාර්ලිමේන්තුව තුළින් Clean Sri Lanka වැඩ පිළිවෙළ යථාර්ථයක් බවට පත් කර ගන්න අප අතර යම් එකඟතාවකට එනවා නම් එය වටිනවා කියා මම විශ්වාස කරනවා. පාර්ලිමේන්තුව තුළදී අපේ අදහස්වලින් clean වෙන්න අපට පුළුවන් නම්, පාර්ලිමේන්තුව තුළදී එකිනෙකාට චෝදනා කර ගනිමින්, එකිනෙකා විවේචනය කර ගනිමින් ඉන්නවාට වඩා මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න, මේ සංකල්පය ඉදිරියට ගෙන යන්න පුළුවන් යෝජනා එකතු කරගෙන මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මම මේ මොහොතේ සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව තුළ ඕනෑම බොරුවක් කියන්න පුළුවන් ඉඩ කඩ, පාර්ලිමේන්තුව තුළ ඕනෑම බොරුවක් කියමින් එකිනෙකාට චෝදනා කරන්න පුළුවන් ඉඩ කඩ, පාර්ලිමේන්තුවේ කියන දෙයක් අධිකරණය හමුවට ගෙන යන්න බැහැ කියන කාරණය මේ Clean Sri Lanka වැඩ පිළිවෙළ හරහා ඉවත් කරන්න පුළුවන් නම් මම විශ්වාස කරනවා, මීට වඩා හොඳ කතිකාවක්, මීට වඩා විශ්වසනීය කතිකාවක් මේ පාර්ලිමේන්තුව තුළ ගොඩ නැඟේවි කියලා; තමන් කියන දේ පිළිබඳව මීට වඩා විශ්වාසයක්, තමන් කියන දේ පිළිබඳව තමන්ටම වගකීමක් ඇති පිරිසක් සහිත පාර්ලිමේන්තුවක් බවට මේ පාර්ලිමේන්තුව පත් කර ගන්න අපට හැකියාව ලැබේවි කියලා.

නමුත්, අප හැම දාම වාගේ කථා කරන්නේ හිතලු - හිතාගෙන ඉන්න දේවල්. අපි එකිනෙකාට චෝදනා කර ගනිමින් ඉන්නවා. විවිධ ආණ්ඩු බලයට එනකොට - තාජුඩීන් ගැන වෙන්න පුළුවන්, එක්නැලිගොඩ ගැන වෙන්න පුළුවන් - අවුරුද්දෙන් අවුරුද්ද විවිධ කාරණා ගෙන හැර පාමින් බලයට ඒමට ඒ කාරණා පාවිච්චි කරමින් කටයුතු කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ පාර්ලිමේන්තුව තුළ ඕනෑම බොරුවක් ඕනෑම වෙලාවක කියන්න තිබෙන අයිතිය, ඒ බලය ඉවත් කරන්න අපට පුළුවන් නම් මේ පාර්ලිමේන්තුව clean කර ගන්න හැකියාව අපට ලැබෙනවා කියා මම විශ්වාස කරනවා. එමඟින් අප අතර තිබෙන වැරැදි මති මතාන්තර, වෛරය, දුරස්ථභාවය නැති කර ගන්න අපට හැකියාව ලැබෙනවා කියන කාරණය මම විශේෂයෙන් සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දවසේත්, අද දවසේත් අපි මේ පාර්ලිමේන්තුව තුළ Clean Sri Lanka වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න විවිධ යෝජනා ඉදිරිපත් කළා. අපි ඒ යෝජනා ඉදිරිපත් කරන අතරේ ආණ්ඩු පක්ෂය 76 වසරක සාපය පිළිබඳව, 76 වසරේ කෙරුණු දේවල් පිළිබඳව හැම විටම කථා කරමින්, චෝදනා කරමින් කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද එතුමන්ලා ඉන්නේ විපක්ෂයේ නොවෙයි; ආණ්ඩු පක්ෂයේයි. වී පිළිබඳ ප්‍රශ්නය අප ගෙන ආවාම එතුමන්ලා පසුගිය ආණ්ඩුවලට චෝදනා කරනවා. එවිට පෙරළා චෝදනා කරමින් අපටත් අහන්න පුළුවන්, 1988-89 කාලයේ හාල් මෝල් ගිනි තියපු එක මීට පාදක වුණා නේද කියලා. එහෙම චෝදනා කරමින් මේ පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන යන්න අපටත් පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් මම විශ්වාස කරනවා අප එවැනි තැනකට මේ පාර්ලිමේන්තුව රැගෙන නොයා යුතුයි කියලා. අප එකිනෙකාට කියන්න පුළුවන් දේවල්; එකිනෙකාට චෝදනා කර ගන්න පුළුවන් දේවල් ගොඩක් තිබෙනවා වෙන්න පුළුවන්. ඒ සියල්ල පැත්තක තියලා, ඒ චෝදනා කිරීම්වලින් බැහැර වෙලා නියමිත මාතෘකාවට, යෝජනාවට අදාළව මේ පාර්ලිමේන්තුවේ කථා කරලා, එකිනෙකාගේ අදහස් එකතු කරගෙන එම යෝජනාව ක්‍රියාත්මක කරන්න, ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න

[ගරු වානක මාදුගොඩ මහතා]

පුළුවන් තැනක් බවට මේ පාර්ලිමේන්තුව නිර්මාණය කර ගන්න හැකි නම් මේ රටේ මිනිසුන්ට වඩාත් වැඩි සේවාවක් කරන්න අපට පුළුවන් කියා මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක එක දේවල් පිළිබඳව හිතමින්, වරප්‍රසාදවලට මුවා වෙමින් කරන චෝදනාවලට මේ පාර්ලිමේන්තුවේ ඉඩ කඩ අහුරන්න ඕනෑ. එසේ කරමින් මේ පාර්ලිමේන්තුව යහපත් දිසාවකට ගෙන යන්න අපට පුළුවන්.

මම මේ මොහොතේ තවත් කාරණයක් සිහිපත් කරන්න ඕනෑ. පසුගිය කාලයේ Clean Sri Lanka වැඩ පිළිවෙළ තුළින් අප නැවත වරක් දැක්කේ පළාත් පාලන ආයතනවලින්, විවිධ ආයතනවලින් කරන්න පුළුවන් සේවා පිළිබඳව මේ සමාජය තුළ විවිධ මාධ්‍ය සංදර්ශන පවත්වමින් ඉන්න තත්ත්වයකුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැනින් බැහැරව සංකල්පමය වශයෙන් මේ කාරණය සාර්ථක කර ගන්න අපි සියලු දෙනා එකතු වෙලා කටයුතු කරමු. විපක්ෂය විධියට අප ඒ කටයුතුවලට එකතු වෙන්න සූදානම් කියන කාරණයත් මම විශේෂයෙන් සිහිපත් කරනවා.

ඒ වාගේම මේ මොහොතේ තවත් කාරණයක් කියන්න ඕනෑ. එක පැන් පහරින් වැඩ කරනවා කියලා ආපු ජනාධිපතිවරයෙක් අපට ඉන්නේ. අපි විශ්වාස කරනවා එතුමා ඒ සඳහා ක්‍රියාමාර්ග ගනියි කියලා. හැබැයි එක පැන් පහරින් කොහොමද වැඩ කරන්නේ කියන කාරණයට ආදර්ශයක් ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගෙන් ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාට ලබා ගන්න පුළුවන් කියාත් මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ මොහොතේ විශේෂ කාරණයක් සිහිපත් කරන්න ඕනෑ. ආණ්ඩු පක්ෂය අද අපේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට විවිධ චෝදනා නඟමින් ද්වේශ සහගතව කටයුතු කරමින් ඉන්නවා. මම විශ්වාස කරනවා මේ රටේ මිනිස්සු ඒක අනුමත කරන්නේ නැහැ කියලා. සමහර අය තමන් තුළ තිබෙන අධිමාන්නය නිසා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට කරන ඒ චෝදනා නිසා කෙනෙකුට එක විට හිතෙන්න පුළුවන්, දෙමළ ඩයස්පෝරාවේ, එහෙම නැත්නම් කොටි ත්‍රස්තවාදය ක්‍රියාත්මක කරපු අයගේ හිත් දිනා ගැනීම සඳහා පසුගිය මැතිවරණ කාලයේ ඔවුන්ට ලබා දුන් පොරොන්දුවක් වෙනුවෙන් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාව මේ විධියට මානසිකව වට්ටනවා ද, එහෙම නැත්නම් එතුමාට මානසික පීඩනයක් දෙනවා ද කියලා. ඒ කාරණය පිළිබඳව අපට හිතන්න වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ පිළිබඳව මේ රටේ තිබෙන ප්‍රතිවිරෝධය නැවත වරක් මිනිස්සු අතර වෛරයක්, පහළ සමාජය අතර ක්‍රෝධයක් ඇති නොවෙන තත්ත්වයට පත් කරන්න ඕනෑ. ඔබතුමන්ලා ආණ්ඩු බලය ගත්තේ ආණ්ඩුව කරන්න. ආණ්ඩුව ගත්තේ වැඩ පිළිවෙළත් එක්ක. ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යමින් කටයුතු කරයි කියලා විශ්වාසයෙන් අපි බලාගෙන ඉන්නවා කියන කාරණාව සිහිපත් කරමින් මට මේ අවස්ථාව දීම ගැන ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Arun Hemachandra. You have 12 minutes.

[අ.භා. 2.10]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා වැදගත් විවාදයකට සම්බන්ධ වීමට ලැබීම ගැන සතුටු වෙනවා.

Clean Sri Lanka කියන එකේ සිංහල තේරුම තමයි, "පිරිසිදු ශ්‍රී ලංකාවක්" කියන එක. අපිරිසිදු දේශපාලනය, අපිරිසිදු යාන්ත්‍රණය, අපිරිසිදු පරිසරය ශුද්ධ කිරීම සඳහා -පිරිසිදු කිරීම සඳහා- සකස් කළ වැඩ පිළිවෙළක් විධියටයි අපි මෙය දකින්නේ. මේ රට දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දීපු රටක්. ක්‍රමානුකූලව අපි දැන් ගොඩයමින් ඉන්නේ. අපි දැවැන්ත සමාජ අර්බුදයකට මුහුණ දීපු රටක්; ඒ වාගේම දැවැන්ත දේශපාලන අර්බුදයකට මුහුණ දීපු රටක්. නමුත් අපි සතුටු වෙන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. ඒ තමයි, දේශපාලන අර්බුදයෙන් අපි දැන් එළියට ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන් පසුගිය මැතිවරණ දෙකෙන්ම ජනතාව දැවැන්ත ජනවරමක් මේ ප්‍රගතිශීලි දේශපාලනය වෙනුවෙන් ලබා දීලා තිබෙනවා. ඒ ජනවරමත් එක්ක මේ රටේ දේශපාලන අර්බුදය නිමාවට පත් වෙලා තිබෙනවා. දැන් අපට තිබෙන ලොකුම වගකීම තමයි ආර්ථික වශයෙනුත් ඒ වාගේම, සමාජයීය වශයෙනුත් මේ රට අපි ඉස්සරහට අරගෙන යන එක.

විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය ඇමතිවරයා විධියට මම කටයුතු කරනවා. අපේ අමාත්‍යාංශයේ දූෂණ, වංචා, අක්‍රමිකතා බොහෝ දේවල් මට දකින්න සිද්ධ වුණා. අපි විදේශ කටයුතු අමාත්‍යාංශය පැත්තෙන් ගත්තොත්, මීට කලින් කළ පත්වීම් ඉතා දේශපාලනිකයි. පිට රටවලට ගිහිල්ලා අපේ නියෝජිතයන් විධියට කටයුතු කරන ඒ පිරිස අපේ රට වෙනුවෙන් යම්කිසි කාර්යභාරයක් කරන්න පුළුවන් අය වෙන්න ඕනෑ. ඇත්තටම ගත්තොත්, මීට කලින් පත් කරපු බොහෝ පත්වීම් දේශපාලනිකව තමයි පත් කරලා තිබෙන්නේ. මේ මොහොත වෙනකොට අපට පුළුවන්කමක් ලැබුණා ඒ බොහෝ අය යළි කැඳවන්න. කාර්යාලවල වැඩ කරන සේවකයෝ වෙන්න පුළුවන්, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ නොවන සේවකයන් වෙන්න පුළුවන්, අධිකාරින් වෙන්න පුළුවන්, එවැනි අය පවා, non-diplomatic appointments පවා පසුගිය කාල වකවානුව තුළ දේශපාලනිකව පත් කරලා තිබෙන්නේ. ඒක ඉතා කනගාටුදායක තත්ත්වයක්.

ලෝකයේ බොහෝ රටවල දූත පිරිස් එක්ක අපි සාකච්ඡා කරද්දී ඒ ක්ෂේත්‍ර පිළිබඳව යම්කිසි දැනුමක් තිබෙන පිරිස තමයි ඒ රටවලින් ඇවිල්ලා අපිත් එක්ක සාකච්ඡා කරන්නේ. ඒ වාගේ මොහොතක අපට දැඩි කනගාටුවක් දැනුණා, අපේ රට වෙනුවෙන් ambassadorsලා විධියට, high commissionersලා විධියට යන ඒ දූත පිරිස ඒ ක්ෂේත්‍ර සම්බන්ධ දැනුමක් නැති දේශපාලනිකව පත් කරපු නිසා ඒ අය මොන වාගේ සාකච්ඡා කරලා ඇතිද කියලා. ඒ ගැන අපට ප්‍රශ්නයක් පැන නැඟෙන එක ඉතා සාධාරණයි. අපි Clean Sri Lanka වැඩසටහන හඳුන්වලා දෙන්නත් කලින් අපි ඒ ක්ෂේත්‍ර සුද්ද කරන්න පටන් ගත්තා.

ඒ වාගේම අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ විවිධ අංශ තිබෙනවා. එහි එක අංශයක් තමයි, Economic Affairs Division එක. මෙය අපේ රටට විවිධ ආයෝජන ගෙනෙන්න පුළුවන්, විවිධ දේවල් සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න පුළුවන් අංශයක්. නමුත් මේ අංශය මීට පෙර හරියාකාරයෙන් පාවිච්චි

කළේ නැහැ. නමුත් අපි සතුටු වෙනවා, අපි මේ අංශය හරියාකාරව පාවිච්චි කරන්න පටන් ගත්තා. විවිධ රටවල් නියෝජනය කරන තානාපතිවරුන් ඒ අංශය හරහා ඇවිල්ලා අපිත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. විවිධ යෝජනා, අදහස් අපි හුවමාරු කරගෙන තිබෙනවා.

ඒක වැදගත් දෙයක්. ඒ වාගේම, තවත් අඩු පාඩුවක් විධියට අපි දකින දෙයක් තිබෙනවා. අපේ ඉන්න නිලධාරින්ගෙන්, විශේෂයෙන්ම Foreign Service officersලාගෙන් පසුගිය ආණ්ඩු හරියාකාරයෙන් ප්‍රයෝජන ගත්තේ නැහැ කියන ඒ විවේචනය තිබෙනවා. ඒ නිසා අපි ඒකත් ක්‍රමානුකූලව වෙනස් කරන්න කටයුතු කරනවා. මෑතකදී අපේ අතිගරු ජනාධිපතිතුමා දීපු ඒ පත්වීම් දෙස බලන්න. ඔබතුමන්ලාට දැකගන්න පුළුවන් වෙයි, සුදුසු අයට සුදුසු පත්වීම් අපි ලබා දීලා තිබෙන බව. මේ සියලු දේම අපි පටන් ගත්තේ Clean Sri Lanka වැඩසටහන ආරම්භ කිරීමට කලින්. නමුත්, දැන් මේ Clean Sri Lanka වැඩසටහනත් එක්ක තවත් දේවල් කරන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ වාගේම, තව වැදගත් දෙයක් මෙතැනදී කථා කරන්නට ඕනෑ. විශේෂයෙන්ම අපේ විදේශ රැකියා අමාත්‍යාංශය කියන්නේ බොහෝ අක්‍රමිකතා, දූෂණ, වංචාවලට මුහුණ දීපු අමාත්‍යාංශයක්. පසුගිය කාලය තුළ ම මේ අමාත්‍යාංශයට අදාළව දැවැන්ත මාතෘකා සාකච්ඡාවට ලක්වෙලා තිබුණා. විශේෂයෙන්ම E8 කියලා එකක් කිව්වා. ඒ වාගේම, Ministry of Foreign Affairs, Foreign Employment and Tourism සම්බන්ධ වාහන පර්මිට් ගැන කථා කළා. විදේශ රැකියා අමාත්‍යාංශය කියන්නේ මේ වාගේ බොහෝ දේවල් ගැන සාකච්ඡාවට ලක් වෙච්ච, විවේචනයට ලක් වෙච්ච, චෝදනාවට ලක් වෙච්ච අමාත්‍යාංශයක්. නමුත්, ඇත්තටම අපි ක්‍රමානුකූලව ඒ තත්ත්වය දැන් වෙනස් කරන්න පටන් ගත්තා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පසුගිය කාලය තුළ සිද්ධ වෙච්ච අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් යම්කිසි පැමිණිල්ලක් ඇවිල්ලා තිබුණා. විශේෂයෙන්ම ඒ සම්බන්ධව පරීක්ෂණ කරන්න මම ගියා. මම මේක කියන්නේ ඉතාම කනගාටුවෙන්. අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඒ software පද්ධතිය ඉතාම ප්‍රාථමිකයි. ඒක මටත් ඇත්තටම විශ්වාස කරන්න බැරි වුණා. ඉතාම වැදගත්, ඉතාම සංවේදී - sensitive - තොරතුරු හුවමාරු වෙලා තිබෙන්නේ MS Excel format එක යටතේ. මේ ගරු සභාවේ පරිගණක සම්බන්ධයෙන් දැනුමක් තිබෙන පිරිසක් ඉන්නවා කියලා අපි දන්නවා. MS Excel කියන්නේ ඉතාම ප්‍රාථමික දෙයක්. ඒක edit කරන්න පුළුවන්; බොහෝ දේවල් මකන්න පුළුවන්; ඇතුළු කරන්න පුළුවන්. මමත් මුලින්ම ඒ චෝදනාව විශ්වාස කළේ නැහැ. නමුත්, ඊට පස්සේ මමත් එහි තිබෙන නම් කිහිපයක් මකලා බැලුවාම ඒ නම් මැකුනා. ඇත්තටම එතැන ඉතාම අවංක නිලධාරින් ඉන්නවා. හැබැයි, සමහර දේශපාලන අධිකාරි, සමහර ඇමතිවරු, සමහර නියෝජ්‍ය ඇමතිවරු කරපු වැරදි නිසා ඒ නිලධාරින්ට තමයි චෝදනා එල්ල වුණේ. එම නිසා ඒ වෙලාවේම අපි තීරණය කළා, ඒ සම්බන්ධව අපි විද්වත් අදහසක් ගත යුතුයි කියලා. ඒ නිසා විශේෂයෙන්ම අපි මොරටුව විශ්වවිද්‍යාලයේ IT ක්ෂේත්‍රය බාරව ඉන්න මහාචාර්යවරයාත් එක්ක මේ ගැන කථා කළා. සතියක් ඇතුළත අපි එතුමාගේ presentation එකක් ගෙන්වාගෙන, විදේශ රැකියා අමාත්‍යාංශයේ ඒ කාර්යාලයේදී ඒක සමාලෝචනය කරලා දැන් තීරණයක් අරගෙන තිබෙනවා, අනිවාර්යයෙන්ම Sri Lanka Bureau of Foreign Employmentහි - SLBFEහි - පරිගණක මෘදුකාංග - software - පද්ධතිය සමස්තයක් විධියට ප්‍රතිසංස්කරණය කරනවා කියලා.

අන්න ඒ විධියට තමයි අපි වැඩ කරන්නේ. නමුත්, කියන්න ඉතාම කනගාටුයි, මේ වාගේ දේවල් අපි කරගෙන යනකොට කිසිම පදනමකින් තොරව සමහර විවේචන, සමහර චෝදනා විපක්ෂයෙන් අපට එල්ල වෙනවා. එසේ කටයුතු කරන්නේ නැතිව අපි එකමුතුව කටයුතු කළොත් ලොකු ගමනක් අපට යා හැකිව තිබෙනවා. අපට රටක් විධියට නැඟිටින්න පුළුවන් හොඳ අවස්ථාවක් මේක. ඒ වෙනුවෙන් අපි විපක්ෂයෙනුත් සහයෝගය ඉල්ලනවා. ඒ වාගේම, අපි තව දේකුත් කියන්න කැමැතියි. කිසිම පදනමක් නැතිව හැමදේම විවේචනය කරන්න එපා. මේක අවුරුදු 76ක් තිස්සේ වනසපු රටක්. හැම අර්ථයෙන්ම කඩා වැටිච්ච රටක්. මේ රට ගොඩ නඟනවා කියන්නේ ඇත්තටම ලොකු වැඩක්. ඒ කාර්යභාරය ඉතාම සාර්ථකව කරගෙන යන්න අවශ්‍ය දේවල් ටික දැන් අපි පටන් ගෙන තිබෙන්නේ. අපේ භාවිතාව තුළ අපි ඒක ඔප්පු කර තිබෙනවා. ඒ නිසා අපට කෙටි කාලයක් ඕනෑ. ඉතාම වේගයෙන් ඒ පරිවර්තනය ඔබතුමන්ලාට දකින්න පුළුවන් වේවි. විශේෂයෙන්ම අපි ලොකු ගොඩනැගිල්ලක් හදනවා නම්, අපි ලොකු සිහින මාළිගාවක් හදනවා නම් ඒකේ අත්තිවාරම ඉතාම හොඳට සකස් කළ යුතුයි. ඒ අත්තිවාරම සමහර විට එළියට පේන්නේ නැහැ. නමුත්, ඒ අත්තිවාරම තමයි මේ දවස් ටිකේ අපි සකස් කරගෙන එන්නේ. ඉතා ශක්තිමත් අත්තිවාරමක් ගොඩනඟන එක තමයි අපේ ප්‍රධාන අරමුණ.

විශේෂයෙන්ම මෙතැනදී මම මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය දවසක විදේශ රැකියා සම්බන්ධ දූත පිරිසක් අපේ රටට පැමිණියා. ඔවුන් පැමිණි රට මොකක්ද කියන්න මම කැමති නැහැ. අපි ඔවුන් සමඟ යම්කිසි සාකච්ඡාවක නිරතවී සිටින විට ඒ දූත පිරිසට නායකත්වය දීපු නිලධාරිනිය කියපු කාරණාවක් මම කියන්නම්. එතුමිය කිව්වා, "මීට කලින් තිබුණු රජයන් එක්ක ගනුදෙනු කිරීමේදී අපට විවිධ ප්‍රශ්න ගැටලු තිබුණා. අපේ රටේ vacancies දහස් ගණන් තිබෙනවා කියලා අපි කිව්වාට, නුසුදුසු අය තමයි අපේ රටට එවලා තිබුණේ." කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

හොඳයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට තවත් විනාඩි දෙකක පමණ කාලයක් අමතරව ලබා දෙන්න.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමිය තවදුරටත් කියා සිටියා, "අපි බලාපොරොත්තු වෙනවා, ඔබතුමන්ලා එවැනි අය අපේ රටට එවන එකක් නැහැ. පුළුවන් නම් අපේ රටට එවපු ඒ නුසුදුසු පුද්ගලයන්ගේ ලැයිස්තුව අවලංගු කරන්න." කියලා. ඒ නිසා සමස්තයක් විධියට කඩා වැටිච්ච ක්ෂේත්‍රයක් ලෙස තමයි අපි මේ ක්ෂේත්‍රය දකින්නේ. ඒ නිසා සමස්ත පරිවර්තනයක් මෙතැනට අවශ්‍යයි. ඒකට අදාළ ජනවරමක් අපට ජනතාව දීලා තිබෙනවා. ඒ ජනවරමත් එක්ක ඉතාම ශක්තිමත් ලෙස ඉස්සරහට යන්න අපි සූදානම් වෙලා ඉන්නවා. විශේෂයෙන්ම මේ Clean Sri Lanka වැඩසටහනත්, ඒ වාගේම මේකත් එක්ක එන digitalization වැඩසටහනත් එක්ක අපට දැවැන්ත පරිවර්තනයක් කරන්න පුළුවන් කියන ඒ විශ්වාසය අපට තිබෙනවා.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இப்பொழுது மிகவும் தீர்மானமிக்க ஒரு காலப்பகுதியில் இருக்கின்ற நாங்கள், தற்பொழுது இச்சபையில் இடம்பெற்றுக்கொண்டு இருக்கின்ற 'Clean Sri Lanka' வேலைத்திட்டம் தொடர்பான விவாதத்தை மிக முக்கியமானதொன்றாகவே கருதுகின்றோம். ஆனால், இங்கு முன்வைக்கப்படுகின்ற சில விடயங்களைப் பார்க்கும்பொழுது கவலையாக இருக்கின்றது. அதாவது, இந்த வேலைத்திட்டம் தொடர்பான எந்தவித அறிவும் இல்லாமல் சிலர் விமர்சனத்தை மாத்திரம் மையப்படுத்தி தமது வாதத்தை முன்வைக்கிறார்கள். இதனை எங்களால் ஒருபோதும் ஏற்றுக்கொள்ள முடியாது.

நாடு என்ற ரீதியில் நாங்கள் பல்வேறுபட்ட துன்பங்களுக்கும் துயரங்களுக்கும் முகங்கொடுத்துக் கொண்டிருந்தோம். குறிப்பாக, இந்த நாட்டில் பாரியதொரு பொருளாதார நெருக்கடி ஏற்பட்டது. தற்பொழுது நாங்கள் அதிலிருந்து கட்டங்கட்டமாக மீண்டு வருகின்றோம். அதுமாத்திரமல்ல, தற்போது நாங்கள் சமூக நெருக்கடியிலிருந்தும் கட்டங்கட்டமாக மீண்டு வருகின்றோம். நடைபெற்று முடிந்த கடந்த இரண்டு தேர்தல்களின் மூலமாக இங்கு நிலவிய அரசியல் நெருக்கடியானது முற்றுமுழுதாக முடிவுக்குக் கொண்டுவரப்பட்டிருக்கின்றது. தற்பொழுது இந்த நாட்டில் மக்கள் ஆணை பெற்ற, மக்களின் அபிலாஷைகளுடன் ஒத்துப்போகக்கூடிய ஓர் அரசாங்கம் பதவியில் இருக்கின்றது. இந்த வேளையில், நாங்கள் இந்த 'Clean Sri Lanka' வேலைத்திட்டம் மூலமாக இந்த நாட்டை மிக வேகமாக முன்னோக்கிக் கொண்டுசெல்ல விரும்புகின்றோம். ஏன் நாங்கள் 'Clean Sri Lanka' என்று கூறுகின்றோம் என்றால், இந்த நாட்டில் காணப்படுகின்ற unclean - அசுத்தமான பல விடயங்களைச் சுத்தம் செய்யவேண்டிய தேவை எமக்கு இருப்பதனால்தான். இது வெறுமனே வீதிகளையும் வடிகான்களையும் மாத்திரம் சுத்தம் செய்கின்ற ஒரு வேலைத்திட்டமல்ல. மாறாக, இந்த நாட்டின் ஒட்டுமொத்த அரசியலையும், சுற்றுச்சூழலையும், மக்களின் சிந்தனையையும் இன்னும் பல்வேறுபட்ட விடயங்களையும் சுத்தப்படுத்துகின்ற ஒரு வேலைத்திட்டமாகும். எமது சிந்தனையிலிருந்து, எமது சூழலிலிருந்து, எமது அரசியலிலிருந்து என ஒட்டுமொத்தப் பரிணாமத்தின் மூலமாகத்தான் இந்த 'Clean Sri Lanka' வேலைத்திட்டத்தின் வெற்றி நிச்சயமாக எட்டப்படும் என்பதில் எந்தவிதமான ஐயமுமில்லை.

கடந்த 76 வருடங்களாகச் சீரழிக்கப்பட்ட ஒரு நாட்டைத்தான் நாங்கள் தற்போது பொறுப்பேற்றிருக் கின்றோம் என்பதை நீங்கள் ஏற்றுக்கொள்ளுங்கள்! இவ்வாறானதொரு நாட்டைக் கட்டியெழுப்புவது என்பது இலகுவானதொரு விடயமல்ல. அதாவது, இது switch ஒன்றை 'off" பண்ணிவிட்டு, 'on' செய்யும்போது ஏற்படும் இருட்டு - வெளிச்சம் போன்றதொரு விடயமல்ல. மாறாக, இது ஒரு நீண்ட பயணம். அந்தப் பயணத்தை நாங்கள் ஆரம்பித்திருக்கின்றோம். அந்த மாற்றத்தை நாங்கள் எங்களிலிருந்து உணர்த்தி வருகின்றோம். இதுவரை காலமும் செய்யப்பட்டுவந்த அமைச்சுகளின் செலவுகளாக இருக்கலாம் அல்லது ஏனைய விடயங்களாக இருக்கலாம். தற்போது அவை மாற்றமடைந்திருக்கின்றன; செலவுகள் பல மடங்கால் குறைந்திருக்கின்றன. தற்போது இந்த நாட்டில் புதியதோர் அரசியல் கலாசாரம் அறிமுகப்படுத்தப்பட்டு இருக்கின்றது.

எனக்கு வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சுப் பதவி வழங்கப்பட்டு இருக்கின்றது. வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வே லைவாய்ப்பு என்பன இரண்டு முக்கிய விடய விதானங்கள்! கடந்த காலங்களில் இவை சார்ந்த அமைச்சுக்களில் இடம்பெற்ற பல்வேறுபட்ட குறைபாடுகளை எங்களால் தற்பொழுது கண்டறியக்கூடியதாக உள்ளது.

கடந்த காலங்களில் மேற்கொள்ளப்பட்ட பல்வேறு தரப்பட்ட அரசியல் ரீதியான பதவி வழங்கல்மூலம் நாட்டின் முன்னேற்றப் பயணம் தடைப்பட்டது. சில சந்தர்ப்பங்களில், குறிப்பாக ஏனைய நாடுகளிலிருந்து எம்மைச் சந்திக்கவரும் தூதுவர்களுடன் பேசும்பொழுது எமக்குத் துக்கமாக இருக்கும். விசேடமாக, எமது நாட்டைப் பிரதிநிதித்துவப்படுத்தும் தூதுவர்கள் தொடர்பில் நாங்கள் கோடிட்டுக் காட்டவேண்டிய விடயம் என்னவென்றால், அரசியல் ரீதியாக நியமிக்கப்பட்டவர்கள் எந்த விதமான பேச்சுவார்த்தைகளில் ஈடுபட்டிருப்பார்கள் என்பதுதான். இதை எங்களால் நினைத்துக்கூடப் பார்க்க முடியாதுள்ளது. இவ்வாறு வெளிநாட்டலுவல்கள் துறை சீரழிக்கப்பட்ட ஒரு துறையாக இருந்தது.

வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சானது, ஊழல், மோசடி போன்ற பல்வேறுபட்ட குற்றச்சாட்டுகளுக்கு உள்ளான ஓர் அமைச்சாகத்தான் காணப்பட்டது. தற்பொழுது நாங்கள் இந்த நிலைமையைப் படிப்படியாக மீட்டு வருகின்றோம்; பல்வேறுபட்ட மாற்றங்களை ஏற்படுத்தி வருகின்றோம். குறிப்பாக, வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்துக்கான ஒட்டுமொத்த மென்பொருள் கட்டமைப்பையும் இன்னும் வெளிப்படைத் தன்மை கொண்டதாக அறிமுகம் செய்து, இந்தத் துறையை மிக வேகமாக முன்னோக்கிக் கொண்டுசெல்ல இருக்கின்றோம். இதற்காக மீண்டும் ஒருமுறை உங்கள் அனைவரிடமும் ஆதரவை வேண்டி நிற்கின்றோம். உங்களால் ஆதரவளிக்க முடியாத பட்சத்தில், தயவுசெய்து எங்களுக்கு இடைஞ்சலாக இருக்கவேண்டாமெனக் கேட்டுக்கொள்கின்றோம்.

වසර ගණනක් අප දුටු සිහිනය සැබෑ කරගන්නට අපට දැන් යම්කිසි අවස්ථාවක් ලැබිලා තිබෙනවා. එම නිසා ඒ අවස්ථාවත් එක්ක අත්වැල් බැඳගන්න කියලා යළිත් වතාවක් අපි සියලුදෙනාටම ආරාධනා කරනවා. ඒ සඳහා සියලුදෙනාටම ශක්තිය, ධෛර්යය, යෝධ බලය ලැබේවා! කියලා ප්‍රාර්ථනා කරමින් මම සමුගන්නවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.25]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජනවාරි මාසයේ පළමුවැනි දා ගරු ජනාධිපතිතුමා Clean Sri Lanka වැඩසටහන පිළිබඳව ජාතිය අමතා කථා කළා. අපට ලොකු සතුටක් දැනුණා, රටට අවශ්‍යම අරමුණක් කරා එතුමා යනවා කියලා. ඉන් පස්සේ Clean Sri Lanka වැඩසටහනේ අරමුණු පිළිබඳ ලොකු විවාදයක් ඇති වුණා. ඇත්තටම Clean Sri Lanka වැඩසටහන කියන්නේ මොකක්ද, Clean Sri Lanka වැඩසටහන මඟින් ඉටු කරගන්න බලාපොරොත්තු වන අරමුණ කුමක්ද කියලා ගැටලුවක් මතු වුණා. ඊයේ දින මේ විවාදය ආරම්භ කරපු අවස්ථාවේදී මේ සභාවේ සිටින ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයකු වන මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ගරු අගමැතිතුමියට කිව්වා, "මේ වැඩසටහන මොකක්ද කියලා කරුණාකරලා පැහැදිලි කරන්න" කියලා. එතුමිය කිව්වා, "මට විවාද කරන්න උගන්වන්න එපා, මට උත්තර දෙන්න ඕනෑ, ඊට පස්සේ මම කියන්නම්" කියලා. අපිත් බලාගෙන හිටියා. විශ්වවිද්‍යාලවල සමහර වෙලාවට දේශනය පැයයි. විනාඩි 45ක්ම කථිකාචාර්යතුමා අවවාද කරනවා. විනාඩි 15ක් උගන්වනවා. එහෙම කථිකාචාර්යවරු ඉන්නවා. ඒ නිසා අවසන් විනාඩි 15 හරි එම අරමුණු පැහැදිලි කරයිද කියලා අපිත් බලාගෙන සිටියා. නමුත් එහෙම කළේ නැහැ. මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඔබතුමා අවස්ථානුකූලව වැදගත්ම ප්‍රශ්නයක් ඇහුවා. ඒක මේ විවාදය ගොඩක් කෙටි කරගන්න තිබුණු කාරණයක්. එහෙම වෙච්ච නැති නිසා ප්‍රශ්නය තවත් සංකීර්ණ වුණා.

මේ විවාදය තුළ මතු වුණු තවත් කරුණක් තිබෙනවා. කරුණාකරලා කියවන්න, Clean Sri Lanka වැඩසටහනේ කාර්යසාධන බලකාය ස්ථාපනය කරන්න ගරු ජනාධිපතිතුමා 2024 දෙසැම්බර් මාසයේ 19වැනි දා නිකුත් කරපු ගැසට් නිවේදනය. එහි තිබෙනවා මේ අරමුණු. ඒ අරමුණු මොනවාද කියලා දැනගන්න තිබෙන වටිනාම නෛතික ලේඛනය, ඒක. මේ වන විට මේ වැඩසටහනට අදාළව ඉදිරිපත් වෙලා තිබෙන නෛතික බලයක් ඇති එකම ලේඛනය මේ ගැසට් නිවේදනය. මේ විවාදය තුළ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ බොහෝදෙනෙක් - දෙගොල්ලන්ම- කිව්වා, පරිසරය පිරිසිදු කිරීමෙන් ඔබ්බට ගිහිල්ලා අල්ලස, දූෂණය නැති කරලා, රාජ්‍ය සේවය කාර්යක්ෂම කරලා, රට ඉදිරියට ගෙනයන සමස්ත වැඩ පිළිවෙළ මේ Clean Sri Lanka වැඩසටහන තුළ තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නමුත් මේ ගැසට් නිවේදනයේ කිසිම තැනක අල්ලස, දූෂණය පිටුදැකීම ගැන නැහැ. මේ ගැසට් නිවේදනයේ කිසිම තැනක නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත කිරීම ගැන නැහැ. මේ කාර්යසාධන බලකායට ගරු නීතිපතිතුමාව සාමාජිකයකු කරලා නැහැ. මේ කාර්යසාධන බලකායට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් හෝ වෙනත් නියෝජිතයකු පාර්ශ්වකාරයෙක් කරලා නැහැ. මෙම කාර්යසාධන බලකායේ අරමුණු විස්තර කරද්දි ඒ විස්තර කරන තැන්වල තිබෙන්නේ පරිසරය කෙරෙහි යොමු වෙච්ච දෙයක්.

ඒ නිසා අපි ඕනෑවට වඩා පුළුල් වෙන්න අවශ්‍ය නැහැ. ඒ පරිසරය ප්‍රශ්නයම වැදගත්; ඉතා වැදගත්, රජයකට ඉදිරියට යන්න ප්‍රමාණවත්. හැබැයි මේ සභාවේ සිටින අපි කවුරුවත් වරදවා තේරුම් ගන්න නරකයි, මේ කාර්යසාධන බලකාය පිහිටුවා තිබෙන්නේ රාජ්‍ය තන්ත්‍රයේ තිබෙන දූෂණ නැති කරන්න, මේ රටේ පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය එකතු වෙලා සිද්ධ කරන අපරාධ වළක්වන්න, රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාව ඇති කරන්න කියලා. නැහැ, එහෙම දෙයක් මේ ගැසට් නිවේදනයේ නැහැ. එහෙම තිබෙනවා නම් ඊළඟ කථිකයෙකුට පුළුවන්, අල්ලස් හා දූෂණය පිටු දැකීම ගැන මෙන්න මෙතැන තිබෙනවා; නීතියේ ආධිපත්‍ය සුරක්ෂා කිරීම ගැන මෙතැන තිබෙනවා කියලා පෙන්වා දෙන්න.

මේ ගැසට් නිවේදනය මඟින් කාර්යන් පවරා තිබෙනවා. එහි පළමුවැනි කාර්ය තමයි, මේ Clean Sri Lanka වැඩසටහන නියමිත කාල රාමුවක් තුළ අවසන් කිරීම. නමුත් අද වෙනකම් මේ කාර්යසාධන බලකාය විසින් ඒ කාර්යය අවසන් කරන කාල රාමුවක් නියම කරලා නැහැ, පියවර 1, 2, 3, 4 අහවල් දිනවලට අවසන් වෙනවා කියලා. මම අහගෙන රජය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමෙක් මේ සභාවේදී කිව්වා, මෙහි කාල සීමාව අවුරුදු 5ක් කියලා. මොකද, මේ රජය පවතින සම්පූර්ණ කාලයේදී මේ වැඩසටහන අවසන් වෙනවා කිව්වා. ඉතින් අපි දැනගන්න කැමැතියි, ඒක ඇත්තද බොරුද, එහෙම දෙයක් තිබෙනවාද කියලා. නමුත් එහෙම කාල රාමුවක් නැහැ.

දෙවැනි අරමුණෙන් කියනවා, සංවිධාන ව්‍යුහයක් ඇති කරනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එවැනි සංවිධාන ව්‍යුහයක් මේ රටේ මේ දක්වා ඇති කරලා නැහැ. එවැනි සංවිධාන ව්‍යුහයක් ඇති කරනවා නම් ඒක නෛතික බලයක් සහිතව ඇති කළ යුතුයි. මොකද, මෙවැනි බරපතළ කාර්යයක් ඉටු කරගන්න, ඒ නියෝග ලබා දෙන්න, නියෝග ක්‍රියාත්මක කරන්න, අධීක්ෂණය කරන්න ඒ ව්‍යුහයන්වලට බලයක් තිබෙන්න ඕනෑ. එහෙම සංවිධාන ව්‍යුහයක් මේ පාර්ලිමේන්තුවට මේ දක්වා ඉදිරිපත් වෙලා නැහැ; ඒ සම්බන්ධයෙන් කිසිම ගැසට් නිවේදනයක් ඉදිරිපත් වෙලා නැහැ.

තුන්වැනි අරමුණෙන් කියනවා, මේ වැඩසටහනට ප්‍රාමාණික විද්වතුන්, වෘත්තියවේදීන් සහ ආයතන නියෝජිතයන් සම්බන්ධ කර ගන්නවා කියලා. එවැනි කණ්ඩායම් ඒකරාශි කරගෙන මෙන්න මේ කණ්ඩායම්, මෙන්න මේ පුද්ගලයන් මෙන්න මේ විෂයයන් පිළිබඳව පත් කළා කියලා අද වෙනකල් කිසිම තැනක සඳහන් වෙලා නැහැ. මම අන්තිම මොහොතේත් වෙබ් අඩවිය පරීක්ෂා කර බැලුවා, අද උදේවත් එහෙම දෙයක් දාලා තිබෙනවාද කියලා. හැබැයි, තවමත් නැහැ. ඒ විතරක් නොවෙයි.

මේ වැඩසටහනට අරමුදල් සම්පාදනය කර ගැනීමත් වැදගත් වෙනවා. එය පස්වැනි අරමුණ වශයෙන් සඳහන් කර තිබෙනවා. මූලික වශයෙන් රුපියල් මිලියන 90ක් ලැබුණු බව කිව්වා. පෞද්ගලික අංශයෙන් තවත් මුදල් ලබා ගන්න අපේක්ෂා කරන බවත් කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රාජ්‍ය මුදල් පරිහරණය පිළිබඳ රෙගුලාසි - මුදල් රෙගුලාසි - තිබෙනවා. රටේ නීති තිබෙනවා. ඒ නිසා ඒ සඳහා විශේෂිත ව්‍යවස්ථාපිත ක්‍රමවේදයක් සකස් කරලා, ආයතනයක් ගොඩනඟලා, අරමුදලක් ගොඩනඟලා මිසක් මෙහෙම මුදල් එකතු කරන්න පුළුවන්කමක් නැහැ. එවැනි අරමුදලක් සඳහා මෙතෙක් සල්ලි අරගෙන තිබෙනවා නම්, මුදල් එකතු කර තිබෙනවා නම් ඒක නීති විරෝධීයි. ඒ වාගේම කාර්ය පටිපාටිකව විරෝධීයි. එය, මේ අරමුණ ඉටු කර ගැනීමට විශාල බාධාවක් වෙනවා.

ඒ විතරක් නොවෙයි. වැඩසටහන් හඳුනා ගැනීම සහ සමපාත කර ගැනීම ගැනත් සඳහන් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කනගාටුවට කාරණය තමයි, මේ රජයේ ප්‍රමුඛතම වැඩසටහනක් හැටියට 2025 ජනවාරි 01වැනි දා ඉඳලා ක්‍රියාත්මක කරනවා කියපු මේ වැඩසටහනේ, වැඩසටහන් හඳුනා ගැනීම සහ ඒවා මේ Clean Sri Lanka වැඩසටහන සමඟ සමපාත කර ගැනීම පිළිබඳව කිසිම ප්‍රගතියක් අත්වෙලා නැහැ. ඒ නිසා තමයි Clean Sri Lanka කියන්නේ, බස්වල කොටස් ගැලවීම, ත්‍රීවීලර්වල කොටස් ගැලවීමයි කියන පටු අරමුණට ආවේ. ඒක සිදු

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

නොවිය යුතු දෙයක්. අපි දන්නවා, රජයේ අරමුණ ඒක නොවෙයි කියලා. මේ පිළිබඳව වැඩසටහනක් සකස් කරලා නැහැ; ඒ වැඩ පිළිවෙළ මුද්‍රණය කරලා රාජ්‍ය නිලධාරින්ට බෙදා දී නැහැ; රාජ්‍ය නිලධාරින්ව දැනුවත් කරලා නැහැ; පොලීසිය දැනුවත් කරලා නැහැ. එවැනි තත්ත්වයක් නිසා තමයි පටන් ගත්ත ගමන් ම විශාල අවුලක් නිර්මාණය වුණේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට අවස්ථාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඔබතුමිය මීට කලින් කථා කළ මන්ත්‍රීතුමාට විනාඩි 2 වෙනුවට විනාඩි 5ක් ලබා දුන් ආකාරය මම බලාගෙන හිටියා. මටත් විනාඩියක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක ආණ්ඩු පක්ෂයෙන් දුන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය කිරීම පිළිබඳව ඩිජිටල්කරණය යොදා ගැනීම ගැනත් සඳහන් වෙනවා. ඒක ඇත්ත. ඩිජිටල්කරණය හරහා මෙවැනි විශාල වැඩසටහනක් සමාලෝචනය කරන්න පුළුවන්කම තිබෙනවා. ඒක ලෙහෙසි දෙයක් නොවෙයි. හැබැයි, මේ දක්වා මේ වැඩසටහන සමාලෝචනය කිරීමට අවශ්‍ය platform එකක් හදලා නැහැ. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. අපි මේ වැඩසටහනට විරුද්ධ නැහැ. මේ වැඩසටහන හොඳයි. කරුණාකර මේ ගැසට් නිවේදනයේ තිබෙන අරමුණු ටිකවත් ඉෂ්ට කරගන්න. නැති දේවල් ගැන මවාපාන්න එපා. තිබෙන දේ ගැන පමණක් කථා කරමු. තිබෙන දේ ක්‍රියාත්මක කරමු. කියන දේ කරන්න. විපක්ෂය වශයෙන් අපි සූදානම්, අපි කැමැතියි, අපේ සහයෝගය ලබා දෙන්න. කරුණාකර කියන දේ කරන්න, කරන දේ කියන්න. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.33]

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගය ආණ්ඩුව නව වසර ආරම්භයේදීම පටන් ගත් මුඛ්‍යතම වැඩ පිළිවෙළ, ප්‍රතිපත්තිය, ක්‍රියාමාර්ගය පිළිබඳ වූ විවාදය පුරා දින 2ක් මුළුල්ලේ පැවැත්වෙනවා. මේ Clean Sri Lanka වැඩ පිළිවෙළ, මෙහි සැබෑ ස්වරූපය විපක්ෂය තවමත් හඳුනාගෙන නැහැ කියන එක මේ පුරා දින දෙක ගතවන අවසාන මොහොතේත් අපට දැනෙමින් තිබෙනවා. ඒ වෙන කිසිවක් නිසා නොවෙයි. Clean Sri Lanka වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් පුරා දින 2ක් මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කළා, වාද විවාද කළා. හැබැයි, ඒ වැඩ පිළිවෙළ, එහි මුඛ්‍ය අරමුණ මොකක්ද කියන එක විපක්ෂයට තවමත් තේරුම් ගන්න බැරිවෙලා තිබෙනවා. ඒකට හේතුව, විපක්ෂය කරන්නේ අන්ධයා අලියාගේ එක කොටසක් අතගාලා මෙහෙම තමයි අලියා කිව්වා වාගේ වැඩක්. අන්ධයා අලියාගේ කකුල අතගාලා, "අලියා වංගෙඩියක් වගේ" කිව්වා වාගේ විපක්ෂයත් Clean Sri Lanka වැඩ පිළිවෙළේ, ප්‍රතිපත්තියේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ඔවුන්ට දැනෙන, අතගාලා අහුවෙන ප්‍රමාණයට විග්‍රහ කරන්න පටන් අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, Clean Sri Lanka වැඩ පිළිවෙළේ අරමුණ සහ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව, ප්‍රතිපත්තිය පිළිබඳව පැහැදිලි කරන්න මගේ කාලයෙන් වැඩි ප්‍රමාණයක් යොදවන්න මම බලාපොරොත්තු වෙනවා, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම සඳහා. පසුගිය නොවැම්බර් මාසයේ 14වෙනි දා මේ රටේ ජනතාව ජන වරමක් දීලා රට අලුත් මාර්ගයකට ප්‍රවේශ කරන්න අවශ්‍ය තීන්දුව ගත්තා, තීරණය ගත්තා. නොවැම්බර් මාසයේ 14වෙනි දා ඒ ජන වරම ප්‍රකාශයට පත් කරනකොට මුළු රටම එක මිටට පෙළ ගැහිලා මොකක්ද කිව්වේ? ඒ කිව්ව එක දෙයක් තමයි, මේ දියවන්නාව පිරිසිදු කරන්න ඕනෑ, සුද්ද කරන්න ඕනෑ කියන එක. එදා රටේ ජනතාව, මුළුමහත් රටම එකට එකතු වෙලා ජන වරමෙන් කිව්වේ දියවන්නාව සුද්ද කරන්න ඕනෑ, පාර්ලිමේන්තුව පිරිසිදු කරන්න ඕනෑ කියලා. ඒ අනුව සාතිශය බහුතරක් මේ රටේ ජනතාව ඒ පාර්ලිමේන්තු මැතිවරණය තුළ මෙතෙක් සමානුපාතික නියෝජන ක්‍රමයක් තුළ ලබා දෙන්න පුළුවන් ඉහළම ජන වරමක් සහිතව පාලන බලයේ සුක්කානම ජාතික ජන බලවේගයට භාර දුන්නා, පසුගිය නොවැම්බර් මාසයේ 14වෙනි දා. නොවැම්බර් මාසයේ 14වෙනි දා ඉඳලා මේ වෙනකොට මාස දෙකයි. දැන් රටේ ජනතාව තමන්ගේ වගකීම, යුතුකම ඉටු කරලා තිබෙනවා. ඒ නිසා අද තමුන්නාන්සේලා බොහෝදෙනෙකුට විපක්ෂයේ අසුන්ගන්න වෙලා තිබෙනවා.

ජාතික ජන බලවේගයට සාතිශය බහුතරයක් රටේ ජනතාව බලය දුන්නේ මොකටද? ඒ වෙන කිසිවකට නොවෙයි, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් මේ රටේ ජනතාවට උරුම කර දීම වෙනුවෙන්. පොහොසත් රටක් ලස්සන ජීවිතයක් මේ රටේ ජනතාවට උරුම කරලා දෙන්න නම්, ඒ ලස්සන ජීවිතය පොහොසත් රට නිර්මාණය කිරීමට අවශ්‍ය ආර්ථික ක්‍රියාමාර්ග, ඊට අවශ්‍ය මැදිහත් වීම, රටේ ආර්ථිකයට අදාළ මැදිහත් වීම කළ යුතු වෙනවා. එහෙම කරද්දී ලස්සන ජීවිතයක් මේ රටේ ජනතාවට උරුම විය යුතු වෙනවා. හැබැයි, මේ රටේ ජනතාවට සැබෑ ලෙසම අද උරුම වෙලා තිබෙන්නේ, මේ වෙනකොට උරුම කර දීලා තිබෙන්නේ ලස්සන ජීවිතයක්ද? කොහෙත්ම නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. සංඛ්‍යා ලේඛනත් එක්ක අපි ඊට උදාහරණයක් ගනිමු.

රටක් හැටියට අපේ රටේ ළමුන් සම්බන්ධයෙන්, අපේ රටේ කාන්තාවන් සම්බන්ධයෙන්, අතිශය අවදානම් සහගත පිරිස් සම්බන්ධයෙන් මෙතෙක් කාලයක් අනුගමනය කළ ක්‍රියාමාර්ග අපි කාටවත් සතුටු වෙන්න පුළුවන් ඒවා නොවෙයි. උදාහරණයක් හැටියට 2023 අවුරුද්දේ වාර්තා වෙලා තිබෙන සංඛ්‍යා ලේඛන අනුව ස්ත්‍රීන්ට එරෙහිව බරපතළ අපරාධ 759ක් වාර්තා වෙනවා. ළමයින් සම්බන්ධ බරපතළ ගණයේ අපරාධ 9,436ක් 2023 අවුරුද්දේ විතරක් සටහන් වෙනවා. ළමා හා කාන්තා

කාර්යාංශයේ සංඛ්‍යා ලේඛන වාර්තා අනුව ළමුන් සම්බන්ධ වෙනත් අපරාධ 1,714ක් වාර්තා වෙනවා. මේ රටේ කාන්තාවන් සහ ළමයින් සම්බන්ධයෙන් උරුම වෙලා තිබෙන ඛේදනීය තත්ත්වය ඒක තමයි. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය 2017 අවුරුද්දේ නිකුත් කළ වාර්තාවකට අනුව කියනවා, අපේ රටේ පොදු ප්‍රවාහනය භාවිත කරන කාන්තාවන්ගෙන් සියයට 90කට ආසන්න පිරිසක් අඩුම තරමේ ගමනාන්තයට පෙර එක් වතාවක් හෝ ලිංගික හිංසනයකට භාජන වෙනවා, ලිංගික අතවරයකට ලක් වෙනවා කියලා. එහෙම කියන්නේ 2017දී එක්සත් ජාතීන්ගේ සංවිධානය අපේ රටේ කාන්තාවන් සම්බන්ධයෙන් නිකුත් කර තිබෙන වාර්තාවකයි.

ඒ වාගේම මිලියන 1.6ක් වෙච්ච අපේ රටේ ආබාධිත ජනතාව සම්බන්ධයෙන්, ආබාධිත පුරවැසියා සම්බන්ධයෙන් සමාජයේ තිබෙන ආකල්පය මොකක්ද? ඒ සම්බන්ධයෙන් අපිට උරුම වෙලා තිබෙන අත්දැකීම් මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගාමිණී සහෝදරයා,- *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම කියවුණේ නැහැ නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක අහන්න ඕනෑ,-*[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ නම කියවුණේ නැහැ නේ. ඔබතුමා නිහඬ වෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ කාලය කා දමන්න දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඉඩ දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න. මගේ කාලය ඔබතුමාට දෙන්නේ නැහැ; මගේ කාලයෙන් ඔබතුමාට අවස්ථාව දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා නිහඬ වෙන්න. ඔබතුමාගේ නම කියවුණේ නැහැ නේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමාට කථාව කරගෙන යන්න ඉඩ දෙන්න.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ඔබතුමා විපක්ෂයේ කාලය අරගෙන ඒකට අවශ්‍ය කරන යමක් පැහැදිලි කර ගන්න. මගේ කාලය නාස්ති කරන්න මම ඉඩ දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
විපක්ෂය රට කාලා විනාශ කළා. තමුන්නාන්සේලා කාලාන්තරයක් තිස්සේ රට කාලා විනාශ කළා වාගේම තවදුරටත් කාලය කා දමන්නත් අපි තමුන්නාන්සේලාට ඉඩ දෙන්නේ නැහැ; ඒකට අවස්ථාව දෙන්නේ නැහැ. ඒ නිසා විපක්ෂයේ කාලය අරගෙන ඔබතුමාගේ පැහැදිලි කිරීම් කර ගන්න කියන කාරණය මම මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. අපට උරුම වෙලා තිබෙන රට ඉතාම අවලස්සන, ඛේදනීය රටක් නම්, මේ උදාහරණවලින් රටේ ජනතාවට උරුම වෙලා තිබෙන්නේ යහපතක් නොවෙයි නම් ඒක වෙනස් කළ යුතු නැද්ද? ඒක වෙනස් කළ යුතුයි. ඒක වෙනස් කරලා, රටේ ජනතාවට වඩා හොඳ, නිවැරදි රටක් නිර්මාණය කර දීම, වඩා දියුණු සමාජ සංස්කෘතික හර පද්ධතීන් සහිතව රටේ මානව, දයාව පිරුණු මිනිසෙකුට තවත් මිනිහෙක් ගරු කරන මානව සහකම්පනය සහිත සමාජයක් මේ රටට නිර්මාණය කළ යුතු වෙනවා. ඒකට අවශ්‍ය කරන මහ පෙන්වීම, ඒකට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ, ඊට අවශ්‍ය කරන සමාජීය මානව දැක්ම සහිත වැඩ පිළිවෙළ තමයි Clean Sri Lanka වැඩ පිළිවෙළ ඇතුළේ මූලාරම්භය හැටියට කැටි වෙලා තිබෙන්නේ; මූලික ප්‍රතිපත්තියේ අඩංගුව බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා Clean Sri Lanka වැඩ පිළිවෙළේ ප්‍රතිපත්තිය මොකක්ද, වැඩ පිළිවෙළ මොකක්ද කියලා ප්‍රශ්න කරන විපක්ෂයට අපි කියනවා, Clean Sri Lanka වැඩ පිළිවෙළේ ප්‍රතිපත්තිය මූලික ස්තම්භයන් තුනක් මත ගොඩනැඟෙනවා කියන එක. පළමු කාරණය තමයි, සමාජීය වශයෙන් මේ සමාජය වඩා දියුණු මානවීය සමාජයක් බවට පත් කරන එක, ඊට අවශ්‍ය කරන මහ පෙන්වීම හා නායකත්වය සපයන එක.

දෙවැනි කාරණය තමයි, පාරිසරික විනාශයන් වළක්වා ගනිමින් දියුණු පාරිසරික තත්ත්වයන් සහිතව ගහට-කොළට, සතා -සිව්පාවාට ගරු කරන, සතා-සිව්පාවාට අදාළ කරන බැඳීමක් සහිත පාරිසරික අගයන් ආරක්ෂා කරන මිනිසෙකු -මානවයෙකු- නිර්මාණය කළ යුතු වෙනවාය කියන එක.

තුන්වෙනි කාරණය තමයි, අපි තුළ ගොඩනඟා ගත යුතු, අපි ආරක්ෂා කර ගත යුතු සදාචාරාත්මක සංවර්ධනය. ඒක තමයි නැත්තේ. ඒ සදාචාරාත්මක සංවර්ධනය සහිත සදාචාරාත්මක මිනිසෙකු නිර්මාණය කිරීමට අවශ්‍ය කරන මහ පෙන්වීම, නායකත්වය, දායකත්වය Clean Sri Lanka වැඩ පිළිවෙළ ඇතුළේ කැටි කරලා තිබෙනවා; ගැබ් කරලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක වෙනවා. උදාහරණයක් හැටියට අපේ රටේ දේශපාලන සංස්කෘතිය, සදාචාරය ගනිමු. අපේ රටේ තරම් කුණු වෙච්ච දේශපාලන සංස්කෘතියක්, අපේ රටේ තරම් ගඳ ගහන දේශපාලන සදාචාරයක් තිබුණු රටක් මම හිතන්නේ ලෝක ඉතිහාසයේවත් දකින්න නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තවත් විනාඩි දෙකකින් කථාව අවසන් කරන්න.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඒ සියල්ල වෙනස් කරලා ජරා ජීර්ණත්වයට පත් වෙච්ච, බංකොලොත් වෙච්ච, බෙලහීනත්වයට පත් වෙච්ච රට වෙනුවට අලුත් දේශපාලන සංස්කෘතියක් මෙරටට හඳුන්වා දීලා තිබෙනවා. මෙම ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වෙලා ගෙවුණු මාස හතරක් වැනි ඉතා කෙටි කාලය ඇතුළත කුණු වෙලා ගඳ ගහපු අපේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා, අලුත් ආදර්ශයක් රටට ලබා දුන්නා. උදාහරණයක් හැටියට මම එක කාරණයක් ගැන කියන්නම්. මේ ගෙවුණු මාස හතර ඇතුළත ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට ඇවිල්ලා, මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ඥාති සංග්‍රහය අවසන් කළා.

ඇමති මණ්ඩලයට ඥාතීන් පත් කිරීම නැවැත්වූවා. ජනාධිපතිගේ, අගමැතිගේ, නියෝජ්‍ය ඇමතිවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවලට තමන්ගේ පවුල්වල ඥාතීන් පත් කර ගැනීම නැවැත්වූවා; පත් නොකිරීමට කටයුතු කළා. රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ පත් කිරීම්වලදී, තානාපතිවරු පත් කරද්දී ඥාතීන් පත් කිරීම අත්හිටෙව්වා; නැවැත්වූවා; එසේ නොකිරීමට කටයුතු කළා. හැකියාව, සුදුසුකම, දක්ෂතාව මත වඩා නිවැරදි, සුදුසුම පුද්ගලයා පත් කරන්න කටයුතු කළා. අද මේ විපක්ෂයේ ඉන්න බොහෝදෙනෙක් එදා ඥාති සංග්‍රහය නැවැත්වූවා නම්, එතුමන්ලා අද මේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ ඉදිරි පෙළ ආසනවල දකින්න නොලැබෙන්න තිබුණාය කියලා මම විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ ආදර්ශය සපයන්න, ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න අපට පුළුවන්කම ලැබුණා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පසුගිය කාලය තුළ කිව්වා, අපට සියයට 3යි තිබෙන්නේ, බලයට පත් වෙන්න බැහැ, සියයට 3ක ඉන්න අපට බලයට පත් වෙන්න බැහැ කියලා. එසේ විවේචනය කරපු බොහෝ අයට "අපට බලයට පත් වෙන්න පුළුවන්. සියයට 3, සියයට 42 කරන්න පුළුවන්. සියයට 42, සියයට 62 බවට පත් කරන්න පුළුවන්" කියලා අපි පෙන්වූවා. ඒ වාගේම අපි මේ රටේ ජනතාවට වෙච්ච පොරොන්දු, මේ රටේ ජනතාවගේ අභිලාෂයන්, ජනතාවගේ අරමුණු ඉටු කිරීමත් නියත ලෙසම, අනිවාර්යයෙන්ම, සිදු කරනවාය කියන සහතිකයත් මේ පාර්ලිමේන්තුව තුළදී ලබා දෙමින්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඒ වගකීම නොපිරිහෙළා ඉටු කරනවාය කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.46]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ විවාදයේදී කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. ඒ ගැන කථා කිරීමට පෙර මම මේ කාරණය කියන්න ඕනෑ. ඊයේ ගරු හරිනි අමරසූරිය අගමැතිතුමිය එතුමියගේ කථාවේදී, ඊට පෙර කථා කළ ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාගේ කථාවට උත්තර දෙමින් සිටි අවස්ථාවේදී මම මූලාසනයෙන් අවසර ලබාගෙන කාරුණිකව, සදාචාරාත්මකව ඉල්ලීමක් කළා, Clean Sri Lanka වැඩසටහන පිළිබඳව මම එතුමියගෙන් පැහැදිලි කිරීමක් බලාගෙන ඉන්නවා, ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නය කියලා. නමුත් මොකද දන්නේ නැහැ, වෙන කාරණාවක් මතද දන්නේ නැහැ, එතුමිය මට ලබා දුන් ප්‍රතිචාරය එච්චර සුදුසු නැති බව මම කියන්න ඕනෑ. ඒ ගැන ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් මීට පෙර සඳහන් කළා. විපක්ෂයේ අපට තිබෙන කාර්ය භාරය මොකක්ද? Within the radius of the parliamentary democracy, විපක්ෂයේ අපි කථා කරන්නේ, ආණ්ඩු පක්ෂයෙන් වැඩි පැහැදිලි කිරීමක් ලබා ගන්න. නමුත් එතුමිය ක්ෂණිකව කිව්වා, "පාර්ලිමේන්තු විවාද කටයුතු සම්බන්ධව මට උගන්වන්න එන්න එපා" කියලා. මට කිසිසේත්ම එහෙම වුවමනාවක් නැහැ. එතුමියට උගන්වන්න මට වුවමනාවක් නැහැ; මට ඒ සඳහා වෙලාවකුත් නැහැ. මට ඊට වඩා වැදගත් රාජකාරි ඕනෑ තරම් තිබෙනවා.

නමුත් පසුගිය පාර්ලිමේන්තුවේදී අපි විපක්ෂයේ ඉන්නකොට වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා එහා කෙළවරේ ආසනයක තමයි වාඩි වෙලා හිටියේ. එතුමාගේ ආසනය ළඟ තමයි මමත් හිටියේ. දෙවැනි පේළියේ එතුමිය වාඩි වෙලා හිටියා. පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ කාර්ය භාරය ඉටු කරද්දී අපි එක සටනක හිටියා. ඒ නිසා මම හිතුවා, එතුමිය මගේ දේශපාලන මිතුරියක් කියලා; තවමත් මම එහෙම හිතනවා. නමුත් එතුමියට ඒක අමතක වෙලා වාගේයි. කෙසේ වෙතත් ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම එතුමිය උත්තර දෙනකොට විපක්ෂයේ ඉන්න අයට දරා ගන්න බැහැ, කනගාටුයි කියලාත් කිව්වා. එතුමියගේ උත්තරය නිසා මට කනගාටුවක් නැහැ. මට හැමදාම කනගාටුයි තමයි. ඒ, මොකද? මම නියෝජනය කරන්නේ මේ රටේ ඉතාම දුෂ්කර ජීවිතයක් ගත කරන, අඩු දියුණු ජන කණ්ඩායමක්. ඒ නිසා කොළ පාට වෙච්චා, නිල් පාට වෙච්චා, රතු පාට වෙච්චා, අපට හැමදාම දුකයි තමයි.

අපේ පුරවැසිභාවය සම්පූර්ණ වෙලා නැහැ. නීත්‍යනුකූල ප්‍රශ්නයක් තිබෙනවා. හරි, ප්‍රශ්නයක් නැහැ. එම නිසා මම මේ කථාව මෙතැනින් නවත්වන්නම්. එතුමියට මේ පණිවුඩය දෙන්න කැමැතියි. එතුමිය කරුණාකරලා මේක තේරුම් ගන්න ඕනෑ. එතුමියගේ තරහාව - කේන්තිය, නැත්නම් කෝපය - මට තේරුම් ගන්න පුළුවන්. නමුත්, මම ඒකට උත්තර දෙන්න යන්නේ නැහැ. මට නම් තරහක් නැහැ. මට ඒ සම්බන්ධයෙන් maturity එකක් තිබෙනවා කියලා මම හිතනවා. මොකද, මම 2001 ඉඳලා පාර්ලිමේන්තුවේ ඉන්නවා. එතුමිය පසුගිය පාර්ලිමේන්තුවට ආවා.

ප්‍රශ්නයක් නැහැ. මම එතුමියට සුබ පතනවා. නමුත්, එතුමිය මට ඒ විධියට උත්තර දීම ගැන මම කනගාටු වෙනවා. මොකද, ඊයේ එතුමියගේ social media trolls තුළින් මුළු රටටම ගියා, "අපේ අගමැතිතුමිය මනෝ ගනේසන්ට මාර උත්තරයක් දුන්නා, එතුමා ඉල්ලන් කෑවා" කියලා. මම ඉල්ලන් කෑවේ නැහැ. මට කවුරුවත් කවන්න ඕනෑ නැහැ. එතුමිය ඒ විධියට කථා කළා කියලා එතුමියගේ සමාජ මාධ්‍ය trolls කථා කළා. එම නිසා ඒ විධියට හැසිරෙන්න එපා කියලා මම කාරුණිකව සහ මිත්‍රශීලීව එතුමියගෙන් ඉල්ලීමක් කරනවා. එච්චරයි කියන්න තිබෙන්නේ.

Clean Sri Lanka කියන එක සංකල්පයක් හැටියට අපි පිළිගන්නවා. ඒක හොඳයි. අපි ඒ ගැන සතුටු වෙනවා වාගේම අපි සම්පූර්ණ සහයෝගයත් ලබා දෙනවා. ඒ සංකල්පය හොඳයි. ඒ සංකල්පය අපි සිංගප්පූරුවේදී දැක්කා, ඉන්දියාවේ මෝදි අගමැතිතුමාගෙන් දැක්කා, පසුගිය වකවානුවේ ලංකාවේත් අපි ඒක දැක්කා, දැනුත් දකිනවා. ඒක හොඳයි. ප්‍රශ්නයක් නැහැ, හොඳට කරන්න. හොඳ දේ හොඳයි. අපි කනගාටු වෙන්නේ නැහැ, ඒ ගැන අපි සතුටු වෙනවා. හැබැයි, මම එක කාරණයක් කියන්නම්. ඒ සංකල්පයට අනුව පරිසරය පමණක් නොවෙයිනේ සුද්ද කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මිනිසුන්ගේ චින්තනයත් වෙනස් කරනවානේ.

මම තව එක කාරණයක් කියලා කථාව ඉවර කරන්නම්. මොකද, unclean දේ ගැන කියනකොට, මේ සංකල්පය ගැන කියනකොට මම එක කාරණයක් කියන්න ඕනෑ. ගිය සුමානේ කථා කරනකොටත් මම මේක කිව්වා. දෙමළ ප්‍රගතිශීලී සන්ධානය නියෝජනය කරමින් සමගි ජන සන්ධානය තුළ කටයුතු කරන අය හැටියට අපි බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. වතුකරයේ ජනතාවට ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, වැටුප් ප්‍රශ්නය. මම ගිය සැරේ යෝජනා කළා, අවම දෛනික වැටුප රුපියල් 2,000ක් කරන්න කියලා. ඒක කියනකොට සමහර වෙලාවට ආණ්ඩුව පැත්තේ සමහර අය පාර්ලිමේන්තුවෙන් පිට කථා කරනවා මට ඇහුණා, "ඉවසගෙන ඉන්න ඕනෑ" කියලා. මෙවර අය වැය අවස්ථාවේ රාජ්‍ය සේවකයින්ට වැටුප් වැඩි කරනවා නම්, වතු සේවකයින්ගේ දෛනික වැටුපත් වැඩි කරන්න. අපට ඉවසාගෙන ඉන්න කියලා රාජ්‍ය සේවකයින්ට විතරක් පඩි වැඩි කරනවා නම් ඒක හොඳ නැහැ, ඒක unclean වැඩක්; ඒ ක්‍රමයට කරන්න එපා.

ඒ වාගේම ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා, මගේ මිත්‍රයා දැන් මේ සභාවේ ඉන්නවා. එතුමාගේ තාත්තා මගේ තාත්තාගේ මිත්‍රයෙක්. මෙතුමා දැන් මගේ මිත්‍රයා. මෙතුමා ළඟදී කිව්වා, මේ රටේ දේශපාලන සිරකරුවන් නැහැ කියලා. අපි කනගාටු වෙනවා. අපේ යහපාලන ආණ්ඩුව කාලයේත් මේ කථාව කියලා තිබෙනවා. යහපාලන ආණ්ඩුව කාලයේ මාත් සමඟ කැබිනට් මණ්ඩලයේ හිටපු ඇමතිවරුත් මේ කථාව කිව්වා. ඒ සම්බන්ධයෙන් අපි ඇමති මණ්ඩලය තුළ සටන් කළා. ඉතිහාසයේ යුද්ධයෙන් පසුව වැඩිම දමිළ දේශපාලන සිරකරුවන් සංඛ්‍යාවක් නිදහස් කළේ වෙන කවුරුවත් නොවෙයි අපි. වැඩේ කරලා තමයි ආවේ. නමුත්, ඔක්කෝම කට්ටිය නිදහස් කරන්න බැරි වුණා. දේශපාලන සිරකරුවන් නැහැයි කියන කථාව ඔබතුමන්ලාගේ කටින් කියන එක තමයි අපට දුක. මොකද, ඔබතුමන්ලා NPP. ජේවීපී කියන්නේ, මේ රටේ සන්නද්ධ අරගළ කරපු පක්ෂයක්; දේශපාලන ව්‍යාපාරයක්. ඔබතුමන්ලා මේක දන්නවා. "දේශපාලන සිරකරුවෝ" කියන කාරණය ඔබතුමන්ලා දන්නවා. නිල වශයෙන් කිව්වේ නැතත්, එවැනි පිරිසක් ඉන්නවා. ඒ අර්ථය තිබෙනවා. දේශපාලන සිරකරුවන් නැහැ කියලා කාටවත් කියන්න බැහැ. මේ තත්ත්වය පිළිගත්තත් නැතත්, කරුණාකරලා ඒ සිරකරුවන් නිදහස් කරන්න. එක කාරණයක් තමයි, Detention Orders නිසා ඒ අය සිරවෙලා ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මට තව තත්පර කිහිපයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

තව කට්ටියක් ඉන්නවා, ඒගොල්ලන් නඩු පවරනවා. Charge sheets දීලා ඉන්නවා. සමහර අයට තීන්දු දීලා තිබෙනවා. තීන්දු දීලා තිබෙන අයට සමාව දෙන්න ජනාධිපතිතුමාට පුළුවන්. Detention Orders දීලා තිබෙන අයට DOs ඉල්ලා අස්කර ගන්න පුළුවන්. අනෙක් අයට Attorney-General's Department එකට ගිහිල්ලා ඉල්ලා අස්කර ගන්න පුළුවන්. ඒගොල්ලන්ව නිදහස් කරන්න. ඒගොල්ලන් නිදහස් වෙන්න ඕනෑ. එහෙම කරන එක තමයි සැබෑ clean වීම; නැත්නම් unclean.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මගේ කථාව ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

කඳුකරයේ ඉතාම අඩු දියුණු ජන කණ්ඩායමක් වන වතු කම්කරු ජනතාවගේ වැටුප් ප්‍රශ්නය අවසන් කරන්න. නැත්නම් ඒක unclean. ඒ වාගේම දෙමළ දේශපාලන සිරකරුවන් නිදහස් කරලා ඒකත් clean කරන්න. මට තව කථා කරන්න දේවල් තිබුණත්, වේලාව නැහැ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරනවා කියලා තමයි ඔබතුමන්ලා අපිත් එක්ක එකට එක කථා කරලා බලයට ආවේ. නමුත්, ඒ පනත අහෝසි කරලා නැහැ. ඔබතුමන්ලා ඒ පනත අහෝසි කරන්න ඕනෑ. ඒ පනත අහෝසි කරලා අපට සම්පූර්ණ clean උත්තරයක් ලබා දෙන්න. ඒක තමයි සැබෑ clean කිරීම කියන්නේ. එසේ කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, යම් කිසි දේශපාලනික ව්‍යාපාරයක් ජයග්‍රහණය කළාට පස්සේ ඔවුන් ස්වකීය වැඩ පිළිවෙළ විවිධ ආකාරයෙන් සමාජගත කරනවා. ජාතික ජන බලවේග රජය බලයට පත් වෙන්න පූර්වයෙන් ජාතික ජන බලවේගයේ ප්‍රධානම සටන් පාඨය වුණේ අපවිත්‍රත්වය පිළිබඳ කාරණයයි. ජාතික ජන බලවේගය ඒක සමාජයීය ක්ෂේත්‍රයේ දැක්කා, ආර්ථික ක්ෂේත්‍රයේ දැක්කා, සංස්කෘතියේ දැක්කා. අනික්

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

පැත්තෙන් දේශපාලනික ක්ෂේත්‍රය ඉතාම බරපතළ විධියට අපවිත්‍රකරණයට ලක් වෙච්ච බව ඉතා ඉහළින් දැක්කා. ඒක විවේචනය කළා. ඒ පිළිබඳ මතවාදයක් සමාජයට ගෙනාවා. අන්න, එහෙම ගෙනාපු දේශපාලන ව්‍යාපාරයක් ස්වකීය බලය ලබා ගැනීමෙන් පසුව ක්‍රියාත්මක කළ යුතු ප්‍රධානම කාරණාව තමයි පවිත්‍රකරණය. මේක එක ක්ෂේත්‍රයකට විතරක් සීමා වුණු කාරණයක් නොවෙයි. මේක සියලුම ක්ෂේත්‍රවලට අදාළයි. අපවිත්‍ර වෙලා තිබෙන තැනක් පවිත්‍රකරණය කළොත් තමයි අභිමානවත් ජීවිතයක් මිනිස්සුන්ට ලබා දෙන්න පුළුවන් වෙන්නේ; ලස්සන ජීවිතයක් ලබා දෙන්න පුළුවන් වෙන්නේ. අන්න, ඒක නිසා තමයි ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා Clean Sri Lanka වැඩසටහන දියත් කළේ; ඒ සංකල්පය සමාජගත කළේ.

මේකේ ප්‍රධාන කුලුනු 3ක් - ප්‍රධාන ශානරයන් 3ක් - අපට හඳුනාගන්න පුළුවන්. පළමු එක, සමාජීය කාරණය. දෙවැනි එක, පාරිසරික කාරණය. තුන්වැනි එක, ආචාර ධර්ම පිළිබඳ කාරණය, නැත්නම් ආකල්පමය කාරණය. මේකට තව ක්ෂේත්‍ර ගණනාවක් එකතු කරන්න පුළුවන්. විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා වාගේ තව ක්ෂේත්‍ර ගණනාවක් එකතු කරගන්න පුළුවන්. හැබැයි, ඒ එකතු කර ගැනීමේදී ශුද්ධ වෙන්නේ කවුද කියන එක, සාමාන්‍ය වචනයෙන් කිව්වොත් ශුද්ධත්වයට පත් වෙන්නේ කවුද කියන එක අපට තේරුම් ගන්න පුළුවන්, දේශපාලන ව්‍යාපාරයක් විධියට. ශ්‍රී ලාංකීය සමාජයම වැළඳගත් සංකල්පයක් විධියට තමයි මේ Clean Sri Lanka සංකල්පය එන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දවස් කිහිපයකට කලින් අපට පත්තරයක තොරතුරක් ලැබෙනවා, දඹුල්ලේ ආබාධ සහිත සහෝදරයෙක් බස් ගණනාවකට ගොඩ කරගන්නේ නැතුව පාරේ දුක් විඳිනවා, බස් එකට ගොඩවෙන්න විධියක් නැහැ, කොළඹට එන්න විධියක් නැහැ කියලා. සල්ලි ගෙවලා නැතුවද? නැහැ. ආබාධිත තැනැත්තන්ට ටිකට් අරගෙනවත් එන්න බැරි බස් සේවයක් තමයි තිබෙන්නේ. මේ බලපත්‍ර ගනිද්දී ආබාධිතයන් පාරේ අතහැර යන බස් සේවයකටද බලපත්‍ර ගන්නේ? නැහැ. ඒ කොන්දොස්තරවරු, රියැදුරු මහත්වරු දැනගන්න ඕනෑ ආබාධ සහිත තැනැත්තෙක් වුණත් ටිකට් එකක් ගන්නවා නම්, බස් එකට ගොඩ කරගන්න, බස් එකේ එක්කගෙන යන්න. මොකක්ද, මෙතැන වෙලා තිබෙන්නේ?

1977න් පසුව කාලකණ්ණි විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් එක්ක,- මම ඉතාම බරපතළ විධියට කියනවා "කාලකණ්ණි" කියන වචනය එකතු කරන්න ඕනෑ. විවෘත ආර්ථිකයේ ධනාත්මක පැති තිබෙනවා. හැබැයි, ලංකාව තුළ නිෂේධනාත්මක පැති ඉස්සරහට අරගෙන මංකොල්ලකාරී ධනවාදී ක්‍රමයක් හඳුන්වා දීමෙන් පස්සේ ලංකාවේ ආචාර ධර්ම පද්ධතිය විනාශ වෙලා ගියා. ඊට ඉහතදී අපි සංකල්පයක් විධියට ආබාධ සහිත තැනැත්තන්ට, වැඩිහිටියන්ට, ස්ත්‍රීන්ට, ළමයින්ට ඉතා ඉහළ වටිනාකමක් දෙමින් තමයි සැලකුවේ. නමුත්, අපි අත්දැකීමෙන් දන්නවා, අපි අත්දැකීම් විඳලා තිබෙනවා, ආබාධ සහිත මිනිස්සුන්ට -විශේෂයෙන්ම ආන්තිකරණයට ලක් වෙච්ච මිනිස්සුන්ට- වෙලා තිබෙන අගතීන්, වෙනස්කම්. මේ සියල්ල ආචාර ධර්ම පද්ධතියේ බිඳ වැටීම්. මේ ආචාර ධර්ම පද්ධතිය යළි නඟා සිටුවිය යුතු නැද්ද? අන්න ඒකයි Clean Sri Lanka වැඩසටහන තුළින් ආකල්පමය පැත්ත ධනාත්මක දිශාවකට ගෙන ඒමේ අවශ්‍යතාව එන්නේ.

අන්න එහෙම ආවොත් තමයි සමාජයක් සුශික්ෂිත, ශිෂ්ටසම්පන්න සමාජයක් බවට පත් වෙන්නේ. අපේ රටේ ආබාධ සහිත ප්‍රජාව සියයට 8.7ක් ඉන්නවා. ඒක ලොකු ඉලක්කමක්. ලක්ෂවලින් ගත්තොත් ලක්ෂ 17කට අධිකයි. මේ කොටසට පසුගිය අවුරුදු ගණනාවක් තිස්සේ සිද්ධ වුණේ මොකක්ද? අපව අයිතිවාසිකම් තුනකට සීමා කරලා. අපි උදාහරණයක් ලෙස ගනිමු, 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත. ඒ අනුව අධ්‍යාපනයට ප්‍රවේශය තිබෙනවා; වෘත්තියකට ප්‍රවේශය තිබෙනවා; රැකියාවකට ප්‍රවේශය තිබෙනවා. හැබැයි, අධ්‍යාපනයට ප්‍රවේශය තිබුණු පලියට ඊට අවශ්‍ය වටපිටාව නැත්නම්, ඒ ළමයා අතර මං වෙනවා. ඊට හොඳම උදාහරණය තමයි, 1960 ගණන්වලදී විශ්වවිද්‍යාලවල දෘශ්‍යාබාධිත උපාධිධාරීන් බිහි වෙන්න පටන් ගත්තාට පස්සේ, ඒ ගත වෙච්ච මුළු කාලය තුළම ලංකාවට නිෂ්පාදනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ, දෘශ්‍යාබාධිත උපාධිධාරීන් 500කට අඩු ගණනක් වීම. අවුරුදු 57ක් තිස්සේ 500කට අඩු උපාධිධාරීන් ගණනක්. මොකක්ද මේකෙන් කියැවෙන්නේ? අපේ රට ආබාධ සහිත ප්‍රජාවට සුදුසු ආකාරයෙන් එම ප්‍රජාව සුදුසු ස්ථානයේ තබමින් කටයුතු කර නැහැ කියන එකයි.

ඊළඟට, ඔවුන්ගේ සමාජ ජීවිතය ගන්න. ගර්භිණී ආබාධ සහිත කාන්තාවක් රෝහලකට ගියාම ඇත්තෙන්ම මවකට ලැබෙන සැලකිලි ලැබෙනවාද? නැහැ. ආබාධිත වෙලත් දරුවෙක් හදා ගත්තේ ඇයි කියන ප්‍රශ්නය තමයි අහන්නේ. ඒ ප්‍රශ්නය කොච්චර වේදනාත්මක ද? ආබාධ සහිත තැනැත්තෙකු රෝහල්ගත වුණොත්, අපි ඔහුගේ සාත්තුවට, ඔහුගේ ආරක්ෂාවට කුලියට අරගෙන තව කෙනෙකු තබා ගන්න ඕනෑ. හැබැයි, ආණ්ඩුවෙන් වැටුප් ලබන සාත්තු සේවයක් තිබියදීයි එසේ කරන්නේ. මේකෙන් මොකක්ද කියන්නේ? තවදුරටත් ඔබව සුරක්ෂිත කිරීමට අපට නොහැකිය යන්නයි. රෝහල්වලදී මේ අත් දැකීම අපි විඳලා තිබෙනවා. හැබැයි, මේක වෙනස් කළ යුතු නැද්ද? ආචාරධාර්මික පද්ධතියේ වෙනස්කම් ඇති කළ යුතු නැද්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ආගම් විධියට ගත්තොත්, බෞද්ධයෝ මෛත්‍රී කරනවා; කිතුනුවෝ ප්‍රේම කරනවා; ඉස්ලාම් ලබ්ධිකයෝ සහෝදරත්වය බෙදා හරිනවා. මට කියන්න, මේ ආගම් තුනම ප්‍රබලව ක්‍රියාත්මක වන මේ රටේ අර දඹුල්ලේ දෙපා අහිමි සහෝදරයා බස් ගණනාවකට ගොඩ වෙන්න බැරිව සිටියදී ඔහු තුළ ඇති වෙච්ච හැඟීම, ඔහුගේ හිතේ ඇති වෙච්ච පැරීම කොහොම වෙන්න ඇති ද කියලා. හැබැයි, අපේ සමාජයේ තවත් කිහිපදෙනෙකු එකතු වෙලා බලහත්කාරයෙන් ඊළඟ බස් එකට නංවලා ඔහුව කොළඹට එවලා තිබෙනවා. මේක හරිම වේදනාකාරී අත්දැකීමක්.

මේ සමාජය ආචාරධාර්මික විධියට ගරා වැටෙන්න ඇරලා, අත් හැරලා දැම්මොත් අප වාගේ කණ්ඩායම් ප්‍රපාතයෙන් ප්‍රපාතයට වැටිලා, විනාශයෙන් විනාශයට පත් වෙලා මුලින්ම අපේ මනුෂ්‍යත්වය අහිමි වෙනවා, අභිමානය අහිමි වෙනවා; අපි හුදු සමාජයේ වෙන්ව, කොන්ව ජීවත් වන තත්ත්වයකට පත් වෙනවා. ඒ වාගේ ඉරණමකට ද අප පත් විය යුත්තේ? නැහැ. ශ්‍රී ලාංකීය සමාජය ශිෂ්ටසම්පන්න වෙනවා නම්, අනිවාර්යයෙන් එය ආබාධ සහිත ප්‍රජාවට, වැඩිහිටියන්ට, දෙමාපියන්ට, ළමයින්ට, ස්ත්‍රීන්ට ගරු කරන, ඔවුන්ට අවකාශය සාදා දෙන, අභිමානවත් බවක් එකතු කරන, සාධාරණ අවස්ථා නිර්මාණය කරන, සමානාත්මතාව නිර්මාණය කරන සමාජයක් විය යුතුයි. මෙන්න මේක තමයි Clean Sri Lanka වැඩසටහනේ හරයාත්මක අපේක්ෂාව, බලාපොරොත්තුව. සමාජයේ බිඳ වැටීම අහෝසි කිරීමට, සමාජ සම්බන්ධතා ඉතා ඉහළට ඔසවා තැබීමට තමයි උත්සාහ කරන්නේ.

සමාජ සම්බන්ධතා තහවුරු කරන්න, ඒ වාගේම තමන්ගේ සහෝදරියට වාගේ තමන්ගේ අසල්වැසි කාන්තාවට සලකන, ගරු කරන සමාජයක් ගොඩනඟන්න, තමන්ගේ අම්මාට වාගේ සියලු අම්මාවරුන්ට, සියලු පියවරුන්ට සලකන සමාජයක්

ගොඩනඟන්න, ආබාධිත සහිත අපටත් මේ සමාජයේ නිසි ගෞරවයෙන්, අභිමානයෙන් යුතුව ජීවිතයක් උරුම කර දෙන්න තමයි උත්සාහ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම යෝජනා කරන්න කැමැතියි, Clean Sri Lanka වැඩසටහනේ කාර්ය සාධක බලකායට ආබාධ සහිත තැනැත්තෙකුත් නියෝජනය කරන්න අවස්ථාව සලසා දෙන්න කියලා. එතකොට අපට පුළුවන්, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තියේ තිබෙන, "අපි නැතිව අපි පිළිබඳව තීරණ නොගත යුතුයි" කියන සංකල්පය තවදුරටත් තහවුරු කරන්න. එහෙම වුණොත් තමයි ආබාධ සහිත අපටත් ඇත්තෙන්ම පවිත්‍ර රටක, ලස්සන රටක පොහොසත් ජීවිතයක්, ලස්සන ජීවිතයක් උරුම කර ගන්න පුළුවන් වන්නේ. පරිසරය පිරිසිදු කිරීම පමණක් නොවෙයි, ආබාධ සහිත ප්‍රජාවට ප්‍රවේශ විය හැකි, භුක්ති විඳිය හැකි පරිසරයක් නිර්මාණය විය යුතුයි. මිනිසා භෞතික පරිසරය නිර්මාණය කරන කොට අනිවාර්යයෙන් universal ක්‍රමවේද භාවිත කළ යුතුයි. එතකොට ආබාධ සහිත තැනැත්තන්ටත් ප්‍රවේශය ලැබෙනවා. භෞතික පරිසරය විසින් ඔවුන්ව ආබාධිත තත්ත්වයට පත් කරලා තිබෙන බාධක ඉවත් වනවා. ඒ බාධක ඉවත් වූ සමාජයක, ඒ බාධක අහිමි වූ භෞතික සමාජයක, අභිමානවත් පුරවැසියන් විධියට, ජාතික ජන බලවේගය රජය ක්‍රියාත්මක කරන මෙන්න මේ Clean Sri Lanka වැඩසටහන තුළින් හුස්ම ගැනීමේ, පවිත්‍රත්වය භුක්ති විඳීමේ උරුමය අපටත් ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, අපටත් Clean Sri Lanka වැඩසටහනට ඒකාබද්ධ වන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 07ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.07]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ආණ්ඩුව විසින් ගෙනෙන ලද, දෙවන දවසේත් විවාදයට ගන්නා මේ කල් තැබීමේ විවාදය Clean Sri Lanka සංකල්පය ගැනයි. ආණ්ඩුවේ බොහෝදෙනා කියන්න උත්සාහ කරනවා, විපක්ෂය විවේචනය කරනවා, කකුලෙන් අදිනවා කියන කාරණය. අපට එහෙම වෙන්න ඕනෑ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. පසු ගිය කාලයේ මේ රටේ කොරෝනා ව්‍යසනය වෙලාවේ සෞඛ්‍ය අංශයට බෙහෙත් නැති වෙලාවේ බෙහෙත් ගෙනැවිත් දෙන්න එදා මුලින්ම උදවු කළේ සමගි ජන බලවේගයේ අපේ විපක්ෂ නායකතුමා. IMF එකේ යෝජනා තුළ තිබුණු බරපතළ කාරණා ලිහිල් කරලා, එයාලා එකඟ නොවුණු සහ අද එකඟ වෙලා තිබෙන සියලු කාරණා නිවැරදි කරලා මේ රටේ යහපත වෙනුවෙන්, යහපත් කාරණා වෙනුවෙන් විපක්ෂයේ ඉඳගෙන අප සහයෝගය දීලා තිබෙන බව ආණ්ඩු පක්ෂයේ ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා මතක තබා ගන්න. මේ කරන වැඩේ නිවැරදිව කරන්න කියන ඉල්ලීම ඔබතුමන්ලා දකින්නේ ඔබතුමන්ලාට බාධා කිරීමක් ලෙස නම්, ඔබතුමන්ලාගේ කකුලෙන් ඇදීමක් ලෙස නම්, ඒක තමයි ඔබතුමන්ලාගේ නොතේරීම. ඔබතුමන්ලා දැන් clean වෙලා ඉවරයි සමාජයෙන්. සමුපකාර ඡන්දය පැවැත්වුණා; Clean වුණේ නැද්ද, ජාතික ජන බලවේගයේ අපේක්ෂක කණ්ඩායම? ඔබතුමන්ලා ඊළඟ මැතිවරණය හෙට තියන්න. ඔබතුමන්ලාව clean කරන්න බලාගෙනයි ඉන්නේ.

ඔබතුමන්ලාට මොකද වුණේ? ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වෙන්න ඉස්සෙල්ලා රට clean කළේ මේ රටේ ජනතාව. "ජාතියේ වීරයා" හැටියට හඳුන්වමින් දරුවන් මහ පාරේ චිත්‍ර ඇඳලා, නගර ලස්සන කරලා - අලංකාර කරලා - තමයි එතුමාව ජනාධිපති ධුරයට ගෙන ආවේ. නමුත් ජනාධිපතිවරණයේදී දුන්නු බලාපොරොත්තු සුනු විසුනු කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඔබතුමියන්ලාගේ අත් දැකීම්, දැනුම ආදි සියල්ල අද අසරණ වෙලා තිබෙනවා, මානව සමාජය තුළ. ඒකේ ඵල විපාක අපිත් විඳිනවා.

ඔබතුමන්ලා මේ සමාජයේ දේශපාලන චරිත සියල්ල මෙතැනදී සැහැල්ලු ලෙස කොතෙක් නම් විවේචනය කළා ද? අද ඔබට ඒ පොල්ලෙන් පහර වදින්නේ නැද්ද? අපි මේවා ගුණමකුකමට කියන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඔබතුමන්ලා උදේ පාන්දර ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කැන්ටීම නම් clean කරනවා. දෙවියන්ගේ පිහිටයි. දවල් කෑමත් එහෙමයි. ටිකක් පරක්කු වුණොත් දංකුඩ තමයි කන්න වෙන්නේ. කනවාට බණින්නේ නැහැ. හැබැයි, මැති ඇමතිවරු පාර්ලිමේන්තුවෙන් කනවාට ඔබතුමන්ලා බැන්නා. අපි දන්නවා ඔබතුමන්ලාට උදේට කන්න තිබෙන්නේ, දවල්ට කන්න තිබෙන්නේ -තුන්වේල කන්න තිබෙන්නේ- මේ පාර්ලිමේන්තුවෙන් කියලා. ඔබතුමන්ලා ඇවිල්ලා ඒක උදේ, දවල් clean කරන එක සමාජයට කියලා ඔබතුමන්ලාව මේ සමාජය තුළ පිළිකුල් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි හදන්නේ නැහැ.

ඔය ගොල්ලන්ට මොකක්ද වුණේ? හොරු අල්ලලා හොරුන්ට දඬුවම් දෙන්න, උගන්ඩාවේ තිබෙන සල්ලි ගේන්න රටේ ජනතාව තියපු ඒ බලාපොරොත්තු සුනුවිසුණු කළා. එහෙම නේද අපේ උගන්ඩා කුමාරි? ඒ සල්ලි නැහැ නේ, දැන්. ගේන්න විධියක් නැහැ නේ. දැනගෙන බොරු කියලා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බලාගෙන ඉන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බලාගෙන ඉන්නවා හැමෝම. දැන් ඔබතුමන්ලාට බලන්න වෙන්නේ ඊළඟ ඡන්දයේදී. තියන්න කෝ ප්‍රාදේශීය සභා ඡන්දය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මේ වැඩ ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ ඉඳිද්දී කරලා ආවේ. 2011දී මම බණ්ඩාරවෙල මහ නගර සභාවේ UNP නගරාධිපති. මම 2011දී පටන් ගත්තා මහ නගර සභාව clean කරන්න. ඔබතුමන්ලා වාගේ ත්‍රිවිල් ටික clean කරලා, පාරවල් ටික clean කරලා, ඒ ඔක්කෝම කරලා අපි හිතුවා අපට ජනතාව කැමැතිවෙයි කියලා. අපි හිතුවා, රටේ ජනතාව ඒකට කැමැති වෙයි කියලා. නැහැ, කැමැති වුණේ නැහැ. ඇයි? ප්‍රායෝගික නැහැ. මාසයයි, දෙකයි ගියේ ආපහු කුණු දාපු තැනට කුණු දැම්මා. කෙළ ගහපු තැනට කෙළ ගැහුවා. ත්‍රිරෝද රථ ටික තිබ්බ‍ෙව විධියටම ගාල් කළා. හැබැයි, දෙවැනි අවුරුද්දේ නගරාධිපති හැටියට චමින්ද තේරුම් ගත්තා, මේවාට විකල්ප විසඳුම් දෙන්න ඕනෑ කියලා. කුණු දමන්න අපට තිබුණේ පුංචි ඉඩකඩ ප්‍රමාණයක්. එතැන මහා විශාල කුණු කන්දක් තිබුණා. අපි මේ කුණු කන්දෙන් පොහොර හදලා රුපියල් ලක්ෂ 34ක ලාභයක් ගත්තා. අපි කුණු දාන විධිය කියලා දුන්නා; කුණු දාන්න බෑග් වර්ග දෙක තුනක් දුන්නා; ඒ කුණු දාන්නේ කොහොමද කියලා ඉගැන්නුවා. කුණු දාන්න පුළුවන් ඒ භාජන සියල්ල අපි අපේ මහ නගර සභාවේ වැසියන්ට ලබා දුන්නා. දැන් ඔවුන්ට කුණු දැමීමේ ප්‍රශ්නයක් නැහැ. භාජනයක් තිබෙනවා; දිනයක් තිබෙනවා; වේලාවක් තිබෙනවා. ඒ වෙලාවට අදාළ

[ගරු චමින්ද විජේසිරි මහතා]

පළාත් පාලන ආයතනයෙන් කුණු ගෙනියන්න එනවා. ඒ පළාත් පාලන ආයතනයටත් ගැටලුවක් නැහැ, ඒ කුණු ටික ගෙනිහින් දමන්න පුළුවන් නිශ්චිත බිම් ප්‍රමාණය තිබෙනවා. ඉතින් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නගරය අලංකාර වුණා. දැන් නගරය අලංකාරයි. මල් හදලා, එළවලු හදලා, පලතුරු හදලා අලංකාර වෙනකොට ඒ නගරය කැත කරන්න ඒ ජනතාවට හිතක් තිබුණේ නැහැ. අන්න ඒ වාගේ ආකල්පමය වෙනසක් ඇති කරන්න පුළුවන් වැඩපිළිවෙළක් ඔබතුමන්ලා ගොඩනගන්න. ඒකට අපි අපේ සහයෝගය දෙන්නම්.

මේ ආණ්ඩුවේ බෝඩ් එක විතරක් තිබෙනවා, "Clean Sri Lanka" කියලා. ඔබතුමන්ලා කියනවා, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ කථාව පිටුපස්සේ තිබෙන්නේ මොකක්ද? ඒ පිටුපස්සේ තිබෙන්නේ හාල්වලින් හොරා කෑව එක පසුගිය කාලයේ කරපු විධියටම. හාල් ගෙනැල්ලා මහා පරිමාණයේ වංචාවක් සිද්ධ කරලා, එය ඔප්පු වෙලා කියලා ෆයිල් එකක් ඇරිලා තිබෙනවා. කප්පම්කාරයෝත් එක්ක මන්ත්‍රීවරු ගිහිල්ලා කප්පම් ගන්නවා, කුරුණෑගල පැත්තේ. එයාලාගේ බෝඩ් එකේ ඉස්සර තිබෙනවා, ඔව්, පිරිසිදු රටක්, පොහොසත් රටක් කියලා. හැබැයි, පිටුපස්සේ තිබෙන්නේ මොකක්ද? අර "හක්කේ බුදු රැස්-බොක්කේ දඩමස්" වාගේ තමයි මේ ආණ්ඩුව. ඒ වාගේ වැඩපිළිවෙළක් තමයි ඔබතුමන්ලා මේ කරන්නේ. ඔබතුමන්ලාට නිසි වැඩපිළිවෙළක් නැහැ.

දැන් ජනාධිපතිතුමා ගම සමඟ පිළිසඳර පටන් අරගෙන. බොහොම හොඳයි. ඒ පිළිසඳරට ගිහිල්ලා මොනවාද කියන්නේ? පසුගිය කාලයේ සිද්ධ වෙච්ච ඒ හොරකම් ටික නැවත වතාවක් කියනවා. ඒ හොරකම් අල්ලන වැඩපිළිවෙළක් හදන්න. ගරු ජනාධිපතිතුමාගේ කැබ් එකේ පිටුපස්සේ තිබුණු ඒ ෆයිල් එක එක අරගෙන පිරිසිදු කරනවා නම්, ඒකට අවශ්‍ය වැඩපිළිවෙළ ගේන්න. ඒවා clean කරන්න අවශ්‍ය වැඩපිළිවෙළ ගේනවා නම්, අපි පක්ෂව අත් දෙකම උස්සන්නම්. දැන් මොකක්ද කරන්නේ? මන්ත්‍රීවරයෙක් කථා කළාට පස්සේ ඒ මන්ත්‍රීවරයාගේ නමට හදපු ඒ බොරුව, ගොතපු චෝදනාව පෙන්වලා, අර චීත්ත සංස්කෘතිය, ගවුම අඳින සංස්කෘතිය තවම ඉතා නින්දිතව මේ JVP එකේ ආණ්ඩුව කටයුතු කරනවා. ඒකට ජාතික ජනබලවේගය කියන්න මම උත්සාහ කරන්නේ නැහැ. ඇයි? ජාතික ජන බලවේගයේ බොහෝදෙනා තුළ අද උත්සාහයක් තිබෙනවා, මේ රට නිවැරදි තැනට ගන්න. හැබැයි, ගෝඨාභය රාජපක්ෂගේ ඒ කඳවුර ඇතුළේ සිටි දේශපාලනඥයන්ට වාගේම මේ ජාතික ජන බලවේගය ඇතුළේ ඉන්න උගතුන්ට අද තැනක් නැහැ. ඔවුන්ට අවස්ථාවක් නැති බවට අපට පෙනෙනවා. අද දෙකට බෙදිලා. එහෙම කටයුතු කිරීම පිළිබඳව මම කනගාටු වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම අවසාන කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේ වැඩපිළිවෙළ සාර්ථකව ගෙනියන්න, මේ වැඩපිළිවෙළේ සාර්ථකභාවය තුළ අපට දෙන්න පුළුවන් ඒ හයිය, ශක්තිය විපක්ෂයක් හැටියට ඔබතුමන්ලාට අපි ලබා දෙනවා කියන කාරණය මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.13]

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම වත්මන් රජයේ ප්‍රධානතම ව්‍යාපෘතියක් වශයෙන්, මෙන්න මේ බිඳ වැටිච්ච රට යළි ගොඩනගා ගැනීමේ ඒ ජනතා අභිලාෂ මස්තකප්‍රාප්ත කරන්න, ඒ ජනවරමට අනුව කටයුතු කරන්න, ඒ ජනවරමින් මේ රටේ ජනතාවට වඩා හොඳ හෙට දිනක් නිර්මාණය කරන්න තමයි විශේෂයෙන්ම මේ Clean Sri Lanka වැඩසටහන අපේ රජය ගෙනැත් තිබෙන්නේ.

මම මේ කාරණයේදී විශේෂයෙන්ම ප්‍රධානම කොටස් දෙකක් යටතේ කරුණු දක්වන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම භෞතික - physical - පරිසරය සඳහා සහ ආධ්‍යාත්මික ගුණ වගාව සඳහා - spiritually - අපි කොහොමද මේ ව්‍යාපෘතියෙන් ප්‍රතිඵල අත්පත් කර ගන්නේ කියන කාරණය මෙතැනදී වැදගත්.

අපි දර්ශනය පිළිගන්නවා නම්, සමාජ සංවර්ධනය පිළිගන්නවා නම්, සමාජය පවතින්නේ ප්‍රතිවිරෝධතාව එක්ක බව අපි දන්නවා. ප්‍රතිවිරෝධතාවේ අවසානය තමයි විශේෂයෙන්ම පරිසරයත් එක්ක තිබෙන ප්‍රතිවිරෝධතාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මේ සියලු දේවල් ගන්නේ පරිසරයෙන්. කන බොන දේ, අඳින පලඳින දේ, අපි කථා කරන දේ ඇතුළු මේ සියල්ල ගන්නේ භෞතික පරිසරයෙන්. ඒ නිසා පරිසරයෙන් තොරව අපට පැවැත්මක් නැහැ.

ඉන්දියාවේ හිටපු මහත්මා ගාන්ධි වරක් කිව්වා, "ලෝකයේ තිබෙන සම්පත් ලෝකයේ ප්‍රශ්න විසඳාගන්න සමත්. හැබැයි, ලෝකයේ තිබෙන සියලු සම්පත් එක කෑදර මනුස්සයෙකුට දුන්නොත් ඒක ප්‍රමාණවත් නැහැ" කියලා. මේ ලෝකයේ තිබෙන සම්පත් මේ ලෝකයේ තිබෙන ප්‍රශ්න විසඳාගන්න සමත්. හැබැයි, අපි මොකක්ද මේ සම්පත්වලින් අද කරලා තිබෙන්නේ? කෑදරකම නිසා, හෙට ගැන නොහිතන නිසා, බඩජාරි සමාජ ක්‍රමය නිසා අද පරිසර පද්ධතිය විනාශයකට ලක් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සොබාදහම කියන්නේ පුදුම දෙයක්. ඉතාම ලස්සනට ඉර පායනවා, ලස්සනට හඳ බැහැලා යනවා, ගංගා තිබෙනවා, ඇළ දොළ තිබෙනවා, තුරුලතා තිබෙනවා, ගහ කොළ තිබෙනවා, සතා සිවුපාවා ඉන්නවා. හරි ලස්සන පරිසර පද්ධතියක් තිබෙන්නේ.

ඉතිහාසයේ, වැඩි ඈතක නොවෙයි අපට මතකයි, අපේ සීයලා කුඹුරු කොටනකොට කවදාවත් ගෙදරින් වතුර අරගෙන ගිහිල්ලා බිව්වේ නැහැ. වක්කඩෙන් වතුර ටික බොන්න පුළුවන් තරමට පිරිසිදු ජලවහන පද්ධතියක් කුඹුරේ තිබුණා. එදා දණ්ඩි පැටව් හිටියා, තිත්ත පැටව් හිටියා. ඉතා අලංකාරවත් පරිසර පද්ධතියක් තිබුණා. සමාජ ක්‍රමයේ තිබෙන වැරැද්ද නිසා, කෲරතර මිනිසුන් සමාජය සූරාකෑම නිසා පරිසර පද්ධතිය දැවැන්ත විනාශයට ලක් වෙලා තිබෙනවා. අද ඒ සියල්ල විනාශ කරලා තිබෙන්නේ. ඒ

නිසා අපට මේ පරිසරයට beautification එකක් අවශ්‍යයි, protection එකක් අවශ්‍යයි. ඒ නිසා තමයි අපි මේ වැඩ පිළිවෙළ විශේෂයෙන්ම ගෙනාවේ. ඉතිහාසයේ අපි සමාජය ගැන හිතුවා. විශේෂයෙන්ම අපි ගහක පලතුරු ටික කඩා ගන්නකොට එක අත්තක පලතුරු කැඩුවේ නැහැ. අපි සත්තු ගැන හිතලා ඒ පලතුරු ටික සත්තුන්ට ඉතිරි කළා. මුළු කුඹුරේම ගොයම් ටික, ඒ අස්වැන්න අපි කපා ගත්තේ නැහැ. එක ලියැද්දක් අපි සත්තුන්ට වෙන් කළා. එහෙමයි අපි හිතුවේ.

එහෙම හිතපු මිනිස්සු මේ සොබාදහමත් එක්ක නරුම ගනුදෙනුවකට ආවා; හෙට ගැන නොහිතන ගනුදෙනුවකට ආවා. ඒකේ ප්‍රතිඵල අපට ලැබී තිබෙනවා. සොබාදහමට attack එකක් දුන්නොත් සොබාදහමත් reattack එකක් දෙනවා. ඒ නිසා තමයි මහ කඳු නාය යන්නේ. ඒ නිසා තමයි අපි ගොඩ ගහන කුණු කඳුවලට අපිම වැළලිලා යන්නේ. ඒ නිසා තමයි ලොස්ඇන්ජලීස් ප්‍රාන්තය විනාඩි දෙකක් තුනක් ඇතුළත lost වෙලා යන්නේ. ඒ නිසා මේ සොබාදහමත් එක්ක කරන ගනුදෙනුව ඉතාම සියුම්, මනරම්, සුන්දර, ළෙන්ගතු, දයාර්ද්‍ර ගනුදෙනුවක් වෙන්න ඕනෑ. ඒ සඳහා මිනිසාගේ චිත්ත ධෛර්යය අවදි කරන එක මේ වැඩසටහනේ එක අංගයක් කියලා අපි විශ්වාස කරනවා. මේ සොබාදහම අපි යළි හදා ගන්න ඕනෑ. කෙසේ වෙතත්, ගොඩක්දෙනෙක් කථා කරන නිසා මම ඒ කොටසට වැඩියෙන් බර තියන්නේ නැහැ. අපට අවශ්‍යයි, spiritual purification එකක්. Physical beautification එකකට වාගේම, ඊට වඩා වැඩියෙන් බර තියන්න ඕනෑ spiritual purification එකක් අපට අවශ්‍යයි.

ඒ එක්කම, ආධ්‍යාත්මික පැත්තෙන් අද අපි කොතැනද ඉන්නේ? ඉතා බරපතළ විධියට බිඳ වැටුණු තැනක අපි ඉන්නේ.

රඹුකන සිද්ධාර්ථ හාමුදුරුවන්ගේ සින්දුවක මෙහෙම තිබෙනවා.

"බුදු බණ කිව්වා නිරන්තරේ
බුදු බණ ඇසුවා නිරන්තරේ
ගතිගුණ අතින් අපි තවමත්
වනාන්තරේ, වනාන්තරේ..."

හැබැයි, වනාන්තරේ සත්තු මෙහෙම නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට යම් කාරණයක් මතක් වෙනවා. විද්‍යාඥ කණ්ඩායමකට වුවමනා වුණා, සත්තුන්ගෙන් පරීක්ෂණයක් කරන්න. එයාලා කැලෑවකට ගිහිල්ලා වඳුරෝ රංචුවක් ඉන්න ගහක් යටට කෑම ටිකක් දැම්මා. අතු උඩ හිටපු වඳුරෝ ඔක්කොම පැටවු එක්කම බිමට ආවා. එයාලා ඒ වෙලාවේ blast එකක් කළා. ඒ blast එක කරපු වෙලාවේ වඳුරන්ගේ හැසිරීම වුණේ මොකක්ද? අතට අසු වුණු වඳුරු පැටියා අරගෙන ගහ උඩට නැංගා. එහෙමයි සත්තුන්ගේ හැසිරීම. නමුත් අපේ ඉස්කෝලයක් ඇරෙන වෙලාවට ඉස්කෝලයක් ඉස්සරහ රතිඤ්ඤාවක් දාලා බලන්න. පීරලා, පීරලා තමන්ගේ ළමයා හොයා ගන්නයි බලන්නේ. එතකොට ඔක්කොම විනාශ වෙයි. ඒකයි මම කිව්වේ, ගති ගුණ අතින් අද අපි ඉන්නේ වනාන්තරයක කියලා. ඒ නිසා මෙන්න මේවා වෙනස් කරන්න ඕනෑ.

මට එක්සත් ජාතික පක්ෂයට, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට, රනිල් මහත්තයාට, මහින්ද මහත්මයලාට ආර්ථිකය විනාශ කිරීම සම්බන්ධයෙන් දැවැන්ත විවේචන තිබෙනවා. හැබැයි, ඒවාට සමාව දෙන්න පුළුවන්. ඒ විනාශය අපට calculate කරන්න පුළුවන්. කවදා හරි ඒවා recover කර ගන්න පුළුවන්. ආර්ථික ඝාතකයෝ ඒ සියල්ල විනාශ කළා. හැබැයි, අපට කවදා හරි ඒගොල්ලන්ට සමාව දෙන්න පුළුවන්. කවදා හරි ඒවා calculate කරන්න පුළුවන්, මනින්න පුළුවන්, recover කරගන්න පුළුවන්. හැබැයි, මේගොල්ලන් සමාජයට කරපු දැවැන්ත අපරාධයක් තිබෙනවා. ඒක මනින්න බැහැ. ඒක කෙටි කාලයක් ඇතුළත හදන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වංචාව, දූෂණය, හොරකම, නාස්තිය, ස්ත්‍රී දූෂණය, මත්ද්‍රව්‍ය ඉතිහාසයේ ඉඳලා තිබුණා. බුදුහාමුදුරුවන්ගේ කාලයේ ඉඳලා තිබුණා. හැබැයි, එක හොඳකමකුත් තිබුණා.

ඒ තමයි වංචා කරනවා නම්, දූෂණ කරනවා නම්, ස්ත්‍රී දූෂණ කරනවා නම්, ඒවා කරපු මිනිසුන්ව සමාජයෙන් පිටුදැක්කා. ඒවා එදාත් සමාජයේ තිබුණා. නමුත් ඒවා කරන මිනිසුන්ව එදා සමාජයෙන් පිටුදැක්කා. හැබැයි, පසුගිය කාලයේ ඔබතුමන්ලා මොකක්ද කළේ? මට මතකයි, එක්තරා මන්ත්‍රීවරයෙක් ගුරුවරියක් දණගැස්සුවා. ඒක වෙන්න පුළුවන් කියමු. හදිසියේ ඇති වෙච්ච ආවේගයකට එහෙම වෙන්න පුළුවන් කියමු. ඒ මන්ත්‍රීවරයා හිර ගෙදර ඉඳලා එන දවසේ මොකද වුණේ? ආගමික නායකයන් ඔහුට පිරිත් නූල් බඳිනවා; කරට මල් මාලා දමනවා; නගරය මැද්දේ කර තියාගෙන යනවා මම දැක්කා. නමුත් ඉතිහාසයේ එවැනි අයව ප්‍රතික්ෂේප කළා. මහින්ද මහත්තයලා, රනිල් මහත්තයලා එවැනි අයට ඉණිමං තියලා උඩට යන්න පාරවල් හැදුවා. ඒක තමයි සිදු වූ දැවැන්ත විනාශය.

ඒකේ අවසානය මොකක්ද වුණේ? මේ පාර්ලිමේන්තුව පිරුණේ කාගෙන්ද? මේ පාර්ලිමේන්තුව පිරෙන්න ඕනෑ උගතුන්ගෙන්. මේ පාර්ලිමේන්තුව පිරෙන්න ඕනෑ බුද්ධිමතුන්ගෙන්. නැණවතුන්ගෙන් පිරෙන්න ඕනෑ මේ පාර්ලිමේන්තුවට ගම්පහ දිස්ත්‍රික්කයෙන් එක්කෙනෙක් ආවා, ඔහුගේ නම ප්‍රසන්න රණතුංග. නමේ මුලට වැටෙනවා, "කප්පම් ප්‍රසන්න" කියලා. මීගමුවෙන් එක්කෙනෙක් ආවා. ඔහුගේ නමට, - මම නම කියන්නේ නැහැ - සුදු සීනි වාගේ ද්‍රව්‍යයක් මට මතක් වෙනවා. කැලණියෙන් ආවා, දේශීය පානයක් පෙරපු කෙනෙක්. කුඩුකාරයන්ගෙන්, ගංජාකාරයන්ගෙන්, කප්පම්කාරයන්ගෙන් පිරුණු තැනක් බවට මේ පාර්ලිමේන්තුව පත් වුණා.

මිනිසුන්ගේ අධ්‍යාත්මයේ දැවැන්ත වෙනසක් කරන්න නම් spiritual purification එකක් ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ මානවයා බිහි වෙන්නේ හෝමෝසේපියන්-සේපියන් කියන වානරයාගෙන්. ඒ නිසාද දන්නේ නැහැ, අපේ හදවතේ වානරයායි, මනුස්සයායි දෙදෙනාම ජීවත් වෙනවා. ආණ්ඩුවක් ඕනෑ මොකටද? පාලකයන් ඕනෑ මොකටද? අපේ හදවතේ ජීවත් වෙන සතා යටපත් කරලා මනුස්සයාව අවදි කරන්න. ඒකට තමයි පාලකයන් ඕනෑ; පාර්ලිමේන්තුවක් ඕනෑ; අණපනත් හැදෙන්න ඕනෑ. අපේ හදවතේ ජීවත් වෙන සතා යටපත් කරලා මනුස්සයා අවදි කරන්න ඕනෑ.

ඔය කියන මහා බෞද්ධයා මහින්ද රාජපක්ෂ දින පහකට බාර් එක බැගින් දැම්මා. රනිල් වික්‍රමසිංහ ගිය අවුරුද්දට බාර් 700ක් දැම්මා. දිනකට දෙක බැගින් බාර් දැම්මා. එතකොට අවදි වෙන්නේ කවුද? අපි දන්නවා, මේ පාර්ලිමේන්තුවේ හිටපු රේස් බුකිකාරයෝ දින හයකට එක රේස් බුකිය බැගින් දැම්මා කියලා. අම්මා බෞද්ධ මහා සම්මේලනයේ සභාපතිනිය, පුතා ලංකාවේ බූරුපිටියේ අධිපති. ඒ වාගේම පාර්ලිමේන්තුවේ හිටපු ඇමති. එහෙමයි කටයුතු කළේ. මත්ද්‍රව්‍ය ගෙනැල්ලා; කුඩු ගෙනැල්ලා, ගණිකා මඩම් දාලා මේ රට විනාශ කළා. ඒ නිසා අපට ඕනෑ හදවතේ සිටින මනුස්සයා අවදි කරන්නයි. ආධ්‍යාත්මිකව මනුස්සයෙක් ගොඩ නඟන්නයි. අන්න ඒකට තමයි අපට spiritual purification ඕනෑ.

ඒක දැවැන්ත ආකාරයෙන් කරන්න පුළුවන්, කලාවට. මේක කලාවත් එක්ක බද්ධ වෙලා යන්න ඕනෑ කියලා අපි හිතනවා.

[ගරු නලින් හේවගේ මහතා]

මනුස්සයෙක් හදන්න ඕනෑ. අපි කොච්චර බුද්ධිමතුන් හැදුවත් වැඩක් නැහැ, අම්මා මහලු මඩමේ නම්; දරුවා අනාථ නිවාසෙක නම්. ඒ නිසා අපි වෙනස්ව හිතන ආකාරයේ මනුස්සයෙක් නිර්මාණය කරන්න ඕනෑ. මේ වැඩසටහන ඇතුළේ අන්න ඒ උත්තුංග අරමුණ තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. අපට ඒක හදන්න පුළුවන්. අපි ඒ වෙනුවෙන් තමයි මැදිහත් වෙන්නේ. මෙන්න මේ දැවැන්ත වැඩසටහන ඇතුළේ අපට විශාල කාර්ය භාරයක් කරන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්යවරයෙක් වරක් කිව්වා, අපට සංවර්ධන ඉලක්ක සපුරාගන්න, සියයට හතක, අටක, නවයක ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්න අඩුම ගණනේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 30කවත් ආයෝජන ඕනෑ කියලා. අපට savings අඩුයි; අපට එච්චර ආයෝජන කරන්න බැහැ. එහෙම නම් මේ රට හදන්න අපට මොනවාද තිබෙන්නේ? සමාජ ප්‍රාග්ධනය - social capital. අපි ඉතිහාසයේ මහා විශ්වකර්ම නිර්මාණ කළේ ණය අරගෙන නොවෙයි; තාක්ෂණය අරගෙන නොවෙයි. සීගිරිය ගල මුදුනට වතුර ගෙනිච්චා. නමුත් ජිනසේන සෙන්ට්‍රික් වතුර පොම්ප තිබුණේ නැහැ. පළමු සැතපුම් 17දී සැතපුමකට අඟල් හයක දිය බෑස්මක් සහිතව යෝධ ඇළ හැදුවා. මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා කියන බුදුගුණ කැටි කරලා මහා කළුගල්වලින් බුදුපිළිම නිර්මාණය කළා. වැව් 32,000ක් හැදුවා. ඒ මහා දැවැන්ත විශ්වකර්ම නිර්මාණ කළේ කොහොමද? ඒ තමයි සමාජ ප්‍රාග්ධනය - social capital. මෙන්න මේක අවදි කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇමෙරිකාවට කැත්‍රිනා සුළි කුණාටුව ආවා. අවුරුදු දෙකක් ගියා, යළි සුවපත් වෙන්න. ලංකාවට සුනාමි ඇවිල්ලා 35,000ක් වැළඳුණා. හැබැයි, මාස හය යනකොට යළි රට ගොඩ ආවා. එලෙස ආවේ සමාජ ප්‍රාග්ධනය - social capital - නිසායි. මම එක උදාහරණයක් ඔබතුමියට කියන්නම්. ගිය අවුරුද්දේ ලංකාවේ දන්සැල් 17,760ක් ලියාපදිංචි වෙලා තිබුණා. අපි මේ රටේ තරුණයන්ට බණිනවා ඉබාගාතේ යනවා, phone එකේ ඉන්නවා කියලා. හැබැයි, ඒ තරුණයා දන්සැල් දෙන්න කටයුතු කළේ කොහොමද? ගමේ හැම තැනම ගිහින් බඩු එකතු කරලා, මඩුවක් ගහගෙන, හට්ටි මුට්ටි ගෙනැල්ලා දන්සැල් 17,000ක් දුන්නා. අපි ඒ තරුණයාට කිව්වොත් "පුතේ, ඒ දන්සැල් 17,000 වෙනුවට අපි මේ වතාවේ ගමේ අහිංසක දුප්පත් මනුස්සයෙකුට ගෙයක් හදලා දෙමු" කියලා, මොකක්ද කරන්නේ? ගඩොල් කැට 1,000යි, සෙවිළි තහඩු 20යි එකතු කරනවා, ගමේ මේසන් මහත්තයා ඉන්නවා; වඩු මහත්තයා ඉන්නවා. මේ වෙසක් පෝයට ගෙවල් 17,000ක් හදන්න පුළුවන්. සමාජයේ හොඳ දේවල් තිබුණා.

අපි දැන් මෙය සමාජ ප්‍රගමනයට turn කරන්න ඕනෑ. මේක කළ හැකියි; ඒ වාගේම මේක කළ යුතුයි. දැවැන්ත වැඩ කොටසක් මේ වෙනුවෙන් කරන්න තිබෙනවා. අපි හිතනවා එහෙම තමයි අපට මේ ගමන යන්න වෙන්නේ කියලා. මේ දැවැන්ත සමාජ පරිවර්තනයේදී මෙන්න මේ වැඩ කටයුත්ත කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, තව එක කාරණයක් සඳහන් කරලා මම කථාව අවසන් කරන්නම්. මේ වැඩසටහන අපි ගාල්ලෙන් පටන් ගත්තා. ගිය වසරේ අපේ රටට සංචාරකයන් මිලියන 2ක් ආවා. සංචාරකයන් මිලියන 3ක් අපේ රටට ගෙන්වන්න අපි අපේක්ෂා කරනවා. එහෙම තමයි අපේ රටට ඩොලර් ටිකක් හොයා ගන්න අපි බලන්නේ. සංචාරකයෝ ලංකාවට එනකොට අපේ රට පොඩ්ඩක් ලස්සන වෙලා තිබෙන්නත් ඕනෑ. ඒ සඳහාත් අපි වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ අනුව අපි අලුත්ගම ඉඳලා ගොයියාපාන දක්වා මුහුදු තීරයේ කිලෝමීටර් 75ක් ශුද්ධ කළා. එම කටයුත්තට උදේ 7.00ට ලැහැස්ති වුණේ. සියලු රාජ්‍ය නිලධාරීන් ආවා. පැය 5ක් යනකොට 5,000කට ආසන්න පිරිසක් ඒ වෙරළ තීරය- ගාලු පාරට පෙනෙන තීරය ලස්සනට පවිත්‍ර කරලා රුක් රෝපණය කළා. අපි ලබන මාසයේ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ එම කටයුත්ත පටන් ගන්නවා. එම අමාත්‍යාංශයට සම්බන්ධ ආයතන 500ක් තිබෙනවා. ඒ 500 තුළත් ඒ කටයුත්ත පටන් ගන්නවා. අපි පරිසරය ලස්සන කරනවා; හැඩ කරනවා. අපිට තිබෙන්නේ beautification විතරක් නොවෙයි, purification පවා තිබෙනවා. මෙන්න මේ පැති 2 ඒකාබද්ධව සිදු කළොත් වඩා හොඳ රටක් හදන්න පුළුවන්, වඩා හොඳ හෙටක් හදන්න පුළුවන් කියා අපි හිතනවා. ඒ වෙනුවෙන් හැම දෙනාම එකතු වෙන්න කියන ආයාචනය කරමින් මා සමු ගන්නවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.25]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**

(மாண்புமிகு றிஸாட் பதியுதீன்)

(The Hon. Rishad Bathiudeen)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இச்சபையில் முதலில் Clean Sri Lanka வேலைத்திட்டம் சம்பந்தமான மாண்புமிகு சனாதிபதி அவர்களுடைய உரையையும், அதன்பிறகு நேற்றும் இன்றும் பாராளுமன்ற உறுப்பினர்கள் அது தொடர்பாகத் தெரிவித்த கருத்துரைகளையும் நாங்கள் கேட்டோம். அவற்றில் ஒரு சிலருடைய பேச்சுகள் வஞ்சகத்தோடும் பழிதீர்க்கின்ற உணர்வோடும் அமைந்திருந்ததை நாங்கள் அவதானித்தோம். உண்மையிலேயே இலங்கையானது எல்லாத்துறை சார்ந்தும் சுத்தமாக்கப்பட வேண்டும். ஒவ்வொரு மனிதனும் மனதளவில் சுத்தமாகிக்கொள்ள வேண்டும். இச்சபையில் இருக்கும் 225 பேரும் தங்களுடைய நிலைப்பாட்டை நேர்மையானதாக, சீரானதாக ஆக்கிக்கொள்கின்றபோதுதான் இந்த நாடு cleanஆகவும், நாட்டின் எதிர்காலம் சிறப்பாகவும் அமையும். இந்த வேலைத்திட்டம் சம்பந்தமாக மக்களுக்கு இன்னும் சரியான புரிதல் இல்லை. எனவே, இது தொடர்பில் தெளிவுபடுத்தவேண்டிய தார்மீகப் பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. பாராளுமன்ற உறுப்பினர்களாகிய எங்களுக்குக்கூட, இது சம்பந்தமாகச் சரியானதொரு தெளிவூட்டல் வழங்கப்படவில்லை. இச்சபையில்கூட, Clean Sri Lanka வேலைத்திட்டம் தொடர்பில் உரையாற்றுவதைவிட, உறுப்பினர்கள் ஒருவரையொருவர் திட்டிக்கொள்கின்ற, கடந்தகால சம்பவங்களைச் சொல்லிப் பழிதீர்த்துக்கொள்கின்ற விடயங்களுக்குத்தான் அதிக நேரத்தைச் செலவிடுவதை நாங்கள் பார்க்கின்றோம்.

கடந்த காலங்களில் இருந்த பாராளுமன்ற உறுப்பினர்களும் அரசாங்கமும் சரியில்லை என்பதனால்தான் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க தலைமையிலான இந்த அரசாங்கத்தை அதிகபட்ச ஆதரவோடு மக்கள் தெரிவுசெய்து இருக்கின்றார்கள். ஆகவே, நீங்களும் கடந்த கால ஆட்சியாளர்கள் போன்று செயற்படாமல், மனச்சாட்சியோடு

உங்களுக்கு மக்கள் தந்திருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தைச் சரியாகப் பயன்படுத்திக்கொள்ளுங்கள்! இல்லையென்றால், எதிர்காலத்தில் இந்த நாடு குட்டிச்சுவராகி, பொருளாதாரத்தில் வீழ்ச்சியடைந்த நாடாக மாறுவதையும், நாட்டில் இவ்வளவு வளங்களை வைத்துக்கொண்டும் பின்னோக்கிய பாதையில் எமது பொருளாதாரம் செல்வதையும் எம்மால் தடுக்க முடியாமல் போய்விடும். உங்களிடம் மூன்றில் இரண்டுக்கும் மேற்பட்ட பெரும்பான்மைப் பலம் இருக்கும்பொழுது, இந்த நாட்டு மக்கள் எதிர்பார்க்கின்ற விடயங்களைச் செய்யுங்கள்! கடந்த காலங்களில் ஆட்சியாளர்கள் தங்களுக்குத் தேவையான நேரங்களில், தங்களுக்கு ஏற்றவாறு சட்டங்களை மாற்றிக் கொண்டார்கள்; புதிய சட்டங்களை இயற்றிக்கொண்டார்கள். நீங்கள் அவ்வாறு செய்யாமல், உண்மையில் தேவையான மாற்றங்களைச் செய்ய வேண்டும். அதற்கான சந்தர்ப்பத்தை இந்த நாட்டு மக்கள் உங்களுக்குத் தந்திருக்கிறார்கள்.

எம்மைப் பொறுத்தவரையில் இந்தியா மிக முக்கியத்துவம் வாய்ந்த ஒரு நாடு. ஆனாலும், சனாதிபதியின் இந்திய விஜயம் தொடர்பான statementஇல் நாங்கள் road connectivity சம்பந்தமான விடயத்தைக் காணவில்லை. இதற்கு முன்னர் இருந்த அரசாங்கம் இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையில் பாலம் அமைப்பது தொடர்பில் பேச்சுவார்த்தை நடத்தி, அதில் உடன்பாடும் கண்டிருந்தது. ஆனால், தற்போது அந்தத் திட்டம் கைவிடப்பட்டுள்ளதா, இல்லையா? அல்லது இந்த அரசாங்கத்துக்கு அதில் உடன்பாடு இல்லையா? என்பது எங்களுக்குத் தெரியாது. எமது நாடு பொருளாதார நெருக்கடியில் வீழ்ந்தபோது, கைகொடுத்த நாடுதான் இந்தியா! அந்த நேரத்தில் எமது நாட்டுக்கு இந்தியா 4 பில்லியன் டொலரை வழங்கவில்லை என்றால், இந்த நாடு குட்டிச்சுவராகி இருக்கும்; இன்னும் அதலபாதாளத்துக்குள் சென்றிருக்கும். எனவே, நாங்கள் அந்த நாட்டோடு - அங்குள்ள ஒரு பில்லியன் மக்களோடு - இலங்கையை connect பண்ணுகின்றபோது, நமது நாட்டின் பொருளாதாரம் மேம்படக்கூடிய வாய்ப்பு இருக்கின்றது. குறிப்பாக, சுற்றுலாத்துறை வளர்ச்சியடைவதற்கு வாய்ப்பு இருக்கின்றது. இந்திய சுற்றுலாப் பயணிகளும், உலக நாடுகளில் இருந்து இந்தியாவுக்கு வருகின்ற சுற்றுலாப் பயணிகளும் இலங்கைக்கு வரக்கூடிய வாய்ப்பு இருக்கின்றது.

நீங்கள் பஹ்ரைனுக்குச் சென்று பார்த்தால், அந்த நாட்டுக்கும் சவூதி அரேபியாவுக்கும் இடையில் பாலம் இருப்பது தெரியும்! ஒரு பாலம் போதாதென்று இன்னொரு பாலம் - அதுவும் கடல் சார்ந்த பாலம் - அமைப்பதற்கான திட்டம் தீட்டப்பட்டு இருக்கின்றது. அதேபோல், பிரான்ஸுக்கும் இங்கிலாந்துக்கும் இடையில் பாலம் இருக்கின்றது. இவ்வாறு பல நாடுகளுக்கிடையில் பாலம் இருக்கின்றது. இவ்வாறான திட்டங்களைச் செயற்படுத்துகின்ற போது, யுத்ததால் பாதிக்கப்பட்டு பல்வேறு கஷ்டங்களோடும் துன்பங்களோடும் வாழுகின்ற வடக்கு, கிழக்கு மக்கள், குறிப்பாக நான் சார்ந்த மன்னார் மாவட்ட மக்களும் அப்பிரதேசமும் சுற்றுலாத்துறையால் மேம்படக்கூடிய வாய்ப்பு இருக்கின்றது. எனவே, இந்த விடயத்தில் கவனம் செலுத்துமாறு கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் வீடமைப்பு அமைச்சராக இருந்தபோது, ஆரம்பிக்கப்பட்ட வீட்டுத் திட்டங்கள் பல இன்னும் பூர்த்திசெய்யப்படாமல் அரைகுறையாக இருக்கின்றது. இன்று நாங்கள் Clean Sri Lanka வேலைத்திட்டம் பற்றிப் பேசுகின்றோம். அங்குள்ள வீடுகளைச் சென்று பார்த்தால் தெரியும், அவை எவ்வாறான நிலையில் இருக்கின்றன என்று. நாங்கள் வவுனியாவிலே, மன்னாரிலே, முல்லைத்தீவிலே DCB Meetingsக்குப் போனால், மக்கள் அதைத்தான் கேட்கிறார்கள். கோட்டாபய செய்த பாவத்தை தயவுசெய்து நீங்கள் செய்யாதீர்கள்! அவற்றை estimate பண்ணி, மிகுதிப் பணத்தை வழங்கி, அந்த வீடுகளை முடித்துக்கொடுங்கள்! அதேபோல, 1990ஆம் ஆண்டு யாழ்ப்பாணத்திலிருந்து வெளியேற்றப்பட்ட முஸ்லிம்கள் குடியேறியிருக்கின்ற பகுதி மிக மோசமான நிலையில் இருக்கின்றது. அங்கு போய் பார்த்தால் நிலைமை தெரியும்! இங்கிருக்கின்ற MPsஉம் அன்று அங்கு வந்தார்கள். அந்தப் பகுதி Cleanஉம் இல்லை; அங்கு மக்கள் வாழக்கூடிய சூழலும் இல்லை. நாங்கள் சொந்தப் பணத்தில் அவர்களுக்கு ஒரு காணியை எடுத்துக் கொடுத்தோம். நாங்கள் இது பற்றி அங்குள்ள TNA உறுப்பினர்களுடனும் இன்னும் பலருடனும் கதைத்தோம். ஆனால், யாரும் செய்யவில்லை. அந்தக் காணிக்காக கடந்த அரசாங்கம் 8 கோடி ரூபாயை ஒதுக்கியிருந்தது. புதிய சனாதிபதியின் circularஇன்படி அதை நிறுத்திவிட்டார்கள். தயவுசெய்து, அந்தப் பணத்தைக் கொடுத்து அந்த மக்களுடைய குடியேற்றத்துக்கு உதவி செய்யுங்கள்!

இன்று புத்தளம் வைத்தியசாலையானது, clean இல்லாமல் மிக மோசமான நிலையில் காணப்படுகின்றது. அதனை Line Ministryக்குக்கீழ் எடுக்கவேண்டிய தேவை இருக்கின்றது. இடம்பெயர்ந்த மக்கள் புத்தளத்துக்கு வந்தபிறகு, அந்த வைத்தியசாலைக்கு நிறையத் தேவைகள் ஏற்பட்டன. நாங்கள் நல்லாட்சி அரசாங்கத்தில் இருந்தபொழுது, CECB ஊடாக proposal ஒன்றைச் செய்தோம். வெளிநாட்டு நிதியைப் பெற முயற்சி செய்யும்பொழுது அரசாங்கம் மாறிவிட்டது. எனவே, தயவுசெய்து அதை develop பண்ணுவதற்கான வேலைத்திட்டத்தைச் செய்ய வேண்டும். நீங்கள் Line Ministryக்குக்கீழ் 35 வைத்தியசாலைகளை எடுக்க இருப்பதாகக் கேள்விப்படுகின்றோம். அதற்குள் புத்தளம் வைத்தியசாலையையும் உள்வாங்குமாறு நான் உங்களிடத்தில் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

வவுனியாவில் சேகரிக்கப்படுகின்ற குப்பைகளை universityக்கு முன்னால் கொண்டுபோய் போடுகின்றார்கள். இதனால் 5,000 பல்கலைக்கழக மாணவர்கள் ஆபத்தை எதிர்நோக்குகின்ற அதேவேளை, அதனைச் சூழவுள்ள கிராமங்களும் ஆபத்தை எதிர்நோக்குகின்றன. எனவே, தயவுசெய்து உங்களுடைய அரசாங்கம் வவுனியாவில் Clean Sri Lanka வேலைத்திட்டத்தை முன்னெடுக்கும்போது, முதலாவது வேலையாக அதற்கான பாதுகாப்பு அரணை அமைத்து அல்லது அதை வேறோர் இடத்துக்கு மாற்றி, அங்குள்ள மக்களுக்கும் university மாணவர்களுக்கும் ஆபத்தில்லாத ஒரு நிலைமையை ஏற்படுத்த வேண்டுமென நான் இந்த இடத்தில் வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்து, புத்தளத்திலுள்ள முந்தல் - கற்பிட்டி AGA Officeஇல் நிசாந்த என்பவர் ADPஆக கடமையாற்றுகின்றார். அவர், கடந்த அரசாங்கத்தில் ஏனைய எல்லா MPsஉம் பெற்றுக்கொடுத்த பணத்தைச் செலவு செய்திருக்கிறார். ஆனால், நான் பெற்றுக்கொடுத்த பணத்தில் ஒரு ரூபாயைக்கூட செலவு செய்யவில்லை. ஏனென்று கேட்டபொழுது, "இந்த MP முஸ்லிம் கிராமங்களுக்கும் தமிழ்க் கிராமங்களுக்கும்தான் பணத்தை ஒதுக்கியிருக்கிறார். அதனால் செய்ய முடியாது" என்று அவர் சொன்னாராம். அந்த மாவட்டத்திலுள்ள ஏனைய எல்லாப் பிரதேச செயலகங்களினாலும் அந்தப் பணம் செலவழிக்கப் பட்டுள்ளன. ஆனால், முந்தல்-கற்பிட்டி பிரதேச செயலகத்திலுள்ள இந்த அதிகாரி துவேச உணர்வோடு

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

செயற்பட்டு, ஒரு ரூபாயைக்கூட அங்குள்ள மக்களுக்காகச் செலவழிக்கவில்லை. இன்று அங்குள்ள பாதைகளால் பயணிக்க முடியாத துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. எனவே, இவ்வாறான அதிகாரிகளையும் Clean செய்ய வேண்டும். பாராளுமன்ற உறுப்பினர்கள் தவறுசெய்தால் தண்டிப்பதுபோல், அரச அதிகாரிகளையும் தண்டிக்க வேண்டும். மக்களுடைய வரிப் பணம்மூலம் சம்பளம் பெறுகின்ற அரச அதிகாரிகள் இவ்வாறு துவேச உணர்வோடு செயற்படக்கூடாது. எனவே, இதையும் அரசாங்கம் கவனத்திலெடுக்க வேண்டும். நேற்று கல்முனையிலும் மன்னாரிலும் மதுபானசாலை திறப்பதற்கு எதிர்ப்புத் தெரிவித்து ஆர்ப்பாட்டம் நடந்ததை நாங்கள் பார்த்தோம். தயவுசெய்து அந்த விஷயத்திலும் கவனம் செலுத்துமாறு கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.33]

**ගරු අතුල වෙළඳගොඩ මහතා**
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඊයේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳව සභාව කල්තබන අවස්ථාවේ ගෙනා යෝජනාව විවාද කරන මේ මොහොත වෙනකොටත් මේ පිළිබඳව පක්ෂ, විපක්ෂ වශයෙන් ඉදිරිපත් කළ සාධනීය කාරණා කිරා මැන බැලුවාම අපට තේරුම් යන්නේ මොකක්ද? මේ වැඩසටහන ඉදිරිපත් කිරීමේ අරමුණ වුණේ රටක් විධියට අපි මුහුණ දී තිබෙන ආර්ථික, සමාජයීය හා සංස්කෘතික ගැටලුවලින් මිදී අපි කාටත් ජීවත් වෙන්න පුළුවන් විධියේ දියුණු, ලස්සන, ඒ වාගේම පොහොසත් රටක් නිර්මාණය කර ගැනීමයි. පසුගිය මැතිවරණ සමයේ අපගේ තේමා පාඨය වුණේත් එයයි. ඒ අනුව අපි හිතනවා, මෙවන් වැඩසටහනක් ඉදිරිපත් කිරීම ප්‍රශස්ත කාරණයක් කියලා.

කාලීන අවශ්‍යතාවක් විධියට මේ මොහොතේ රටට ඉදිරිපත් කර තිබෙන මේ වැඩසටහන තේරුම් ගැනීම පිළිබඳව අපට තිබෙනවා, බරපතළ සංවාද කිහිපයක්. ඊයේත්, ඒ වාගේම මේ මොහොත දක්වාත් විපක්ෂයෙන් අපට චෝදනා සහ විවේචන එල්ල කරමින් ඉදිරිපත් කළ කරුණු දිහා බැලුවාම ඉතා පැහැදිලියි, මේ වැඩසටහන පිළිබඳව අපි මොන තරම් මේ සමාජයට කරුණු කියන්න ගියත්, මේ පණිවුඩය මෙතැන ඉන්න අයටවත් හරියට තේරුම් ගන්න බැරි බව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ අනුව මෙය ක්‍රියාත්මක කිරීම කොතරම් අභියෝගයක් ද කියන එකත් එක පැත්තකින් අපට සලකා බලන්න වෙනවා.

විපක්ෂය නියෝජනය කරන රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා ඊයේ දිගින් දිගටම කිව්වේ මොකක්ද? බස් රථවල සහ ත්‍රී වීලර්වල සවි කර තිබෙන නොයෙක් අමතර උපාංග ගලවන එක සම්බන්ධයෙන් එතුමා කථා කළා. එතුමා ඇහුවා, පාකිස්තානයේ වාගේ, බස් රථවලට පොලුවලින් ගහලා එළවා දමන තැනටද මේ Clean Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක කරන්න යන්නේ කියලා. ඒ වාගේම එතුමා කොට්ඨාස සභා ගැනත් කිව්වා. මේ ව්‍යාපෘතිය හරහා ලැබෙන මුදල් කොට්ඨාස සභාවලට අරමුදල් ලෙස ගැනීමට ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළකටද මේ යන්නේ කියලා එතුමා ඇහුවා. ඒ වාගේම එතුමා කියනවා, මන්ත්‍රීවරුන් කානුවලට බැහැලා, වැවට බැහැලා ඒවා පිරිසිදු කරන්න, වැසිකිළි හෝදන්න යෑම් වාගේ තත්ත්වයට පත් වුණා, ඒවා කරන්නට ආයතන තිබෙනවා, හැබැයි මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය නැති වෙන තැනකටද මේ යන්නේ කියලා. ඒකෙන් අපට තේරෙන දේ මෙයයි. මේ කරුණු සලකා බැලුවත් අපට තේරෙනවා, සාරගර්භ විධියට, සාධනීය විධියට විපක්ෂයෙන් බලාපොරොත්තු වුණු සහයෝගය මේ වැඩසටහන සඳහා ලැබෙන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂයට වගකීමක් තිබෙනවා, එහි තිබෙන අඩුපාඩු පෙන්වා දෙන්න; ඒ පිළිබඳව සාධනීය විවේචනයක් කරන්න. නමුත් එවැනි විවේචනයක් නොවෙයි අපි දැන් දකින්නේ.

පසුගිය මැතිවරණ සමයේ අපි ඉලක්ක කරගෙන මැතිවරණ වේදිකාවේ කරපු කථාවම තමයි මේ පාර්ලිමේන්තුවටත් මෙතුමන්ලා ඉදිරිපත් කරන්නේ. ඊට වඩා යමක් අපට පෙනෙන්නේ නැහැ. මේ වැඩසටහන පිළිබඳව ඉදිරිපත් කරන්නේත් එළියේ වේදිකාවල ජාතික ජන බලවේගය ඉලක්ක කර ගත් ඒ කථාමයි. එහෙම නැතුව මේ යෝජනාවට සාධනීය වශයෙන් කරුණු ඉදිරිපත් කරන බවක් අපි දැක්කේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සමාජයකට ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. අපි හිතනවා, පුද්ගලයෙකුට, ආයතනයකට, දේශපාලන ව්‍යාපාරයකට, ගමකට, රටකට ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ බව. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රමිතිය සලකා බලා තමයි රටේ උතුරු, නැඟෙනහිර, බටහිර, මධ්‍යම කියන මේ සෑම පළාතකින්ම ජාතිය, ආගම පදනම් කරගන්නේ නැතුව සමස්ත රට ගොඩනැඟීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ජාතික ජන බලවේගය ඉදිරිපත් කරපු ඒ ජනතාවාදී වැඩ පිළිවෙළට සහාය දැක්වූයේ. අපේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව අපි කිව්වා, සෑම ක්ෂේත්‍රයකටම ප්‍රතිපත්තිමය වෙනසක් අවශ්‍ය වෙනවා, මේ හැම දේ තුළම අපට නව පුනරුදයක් අවශ්‍ය වෙනවා කියලා. සෑම ක්ෂේත්‍රයක් තුළම බලාපොරොත්තු වන ඒ පුනරුද යුගය වෙනුවෙන්, අපට අවශ්‍ය system change එක වෙනුවෙන් අපට ප්‍රතිපත්තිමය තීන්දු ගන්න වෙනවා. හාල්, පොල් ඇතුළු වෙනත් සිල්ලර කාරණාවලින් මේ මාස දෙක පුරාම මාධ්‍ය ඇතුළේ තමන්ගේ විවේචන ඉදිරිපත් කරලා, ඒකට මතයක් හදන්න හැදුවාට මේ ජන වරම අවුරුදු පහකට අපට දීලා තිබෙන්නේ, මේ රට වෙනස් කරන්නයි. ඒ වෙනස් කිරීම සඳහා වුණු ප්‍රතිපත්ති තීන්දු ගන්න, ඒ තීරණ හරහා මේ රට වෙනස් කිරීමේ වගකීම තමයි ජාතික ජන බලවේගය විධියට අපට ජනතාව පවරා තිබෙන්නේ. ඒක තමයි මේ ජන වරමේ තිබෙන්නේ.

ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් ඒ වෙනුවෙන් කාර්යසාධක බලකායක් සහිතව ඉදිරිපත් වූ වැඩ පිළිවෙළ සෑම ආයතනයකම, සෑම ක්ෂේත්‍රයකම ඉන්න හැම දෙනාම පිළිගන්නා මෙන් ජාතික ජන බලවේගය වෙනුවෙන් අපි ඉල්ලා සිටිනවා. බිම් මට්ටමේ ඉන්න සාමාන්‍ය ජනතාව දක්වා ම මේ හැම දෙයක්ම ප්‍රචාරාත්මක විධියට යන්න ඕනෑ. ඒ අනුව අපි මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ කොහොමද, ඒ සඳහා වැඩසටහන් හදන්නේ කොහොමද, මේ හැම දෙයක්ම පිළිවෙළකට, හරි විධියට ජනගත කරන්න අවශ්‍ය සහයෝගය ලබා ගන්නේ කොහොමද කියන එක ගැන අපි හිතන්න ඕනෑ. ඒ සඳහා අපට වැදගත්ම ආයතනය තමයි, මේ උත්තරීතර පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තුවට ඒ සඳහා වෙච්ච යෝජනාව අපි ඉදිරිපත් කරලා බලාපොරොත්තු වුණේ එවැනි සාධනීය විවේචනයක් මිසක සාමාන්‍ය කථාවලට, මාධ්‍යවලට කරන කථාවලට, මොනවා හරි කරන විනාඩි දෙකේ තුනේ පුංචි පුංචි කථාවලට සීමා වන විපක්ෂයේ කාර්යභාරයක් නොවෙයි. ඒක නිසා විපක්ෂයේ සහයෝගය ලැබුණත් නැතත් අපට තිබෙනවා, ප්‍රබල ජන වරමක්. ඒ ජන වරමට අනුව මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ජන අනුමැතියක් අපට

ලැබිලා තිබෙනවා. ඒක නිසා සැකයක් හෝ ඒ හා සම්බන්ධයෙන් කිසිම දෙගිඩියාවක් අපට නැහැ. මේ වැඩ පිළිවෙළ සාර්ථක කරන්න පුළුවන් තරමේ දැවැන්ත වුවමනාවක්, ඒ වෙනුවෙන් අපට සූදානමක් වාගේම ඒ සඳහා අපට පරිචයක් තිබෙනවා. බලය සහිතව අපට ලැබුණු මේ ජන වරම තුළ සෑම සියලු දෙයක්ම සාර්ථක කරගන්න අවශ්‍ය කටයුතු අපි කරනවා. අපි බලාපොරොත්තු වනවා, සමාජයේ සියලු ආයතන පද්ධතිවල ඉඳලා ග්‍රාමීය වශයෙන් පහළම සිටින ජනතාව දක්වා මේ ආකල්ප වෙනස වෙනුවෙන් තිබෙන අපේ වැඩ පිළිවෙළ එකින් එක ජනගත කරන්න. අපි ඒ සඳහා ප්‍රචාරාත්මක වැඩ පිළිවෙළක් මෙලෙස ක්‍රියාත්මක කරද්දී තමයි ඒකට පහර එල්ල වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ කෙළවරට වෙන්න තිබෙන තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ බලය අපි මීට අවුරුදු 20කට කලින් ලබා ගත්තා. ඒ ප්‍රාදේශීය සභාව තමයි, අපි බලය ලබා ගත් ලංකාවේ එකම එක පළාත් පාලන ආයතනය. හැබැයි, ඒ පළාත් පාලන ආයතනයේ බලය අපි ගත්තේ රාජ්‍ය බලය නැතිවයි. අපි ඒ සඳහා මේ විධියේම වැඩ පිළිවෙළක් හැදුවා. ඒ, දැනට අවුරුදු 20කට කලින්. එදා එකින් එක ව්‍යාපෘති සකස් කරලා ඒ ව්‍යාපෘති තුළින් අපි අත්පත් කරගත් ජයග්‍රහණය සමාජ ජයග්‍රහණයක් දක්වා පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපි අරගෙන යනකොට බිම් මට්ටමින් ඒක පිළිගත්තා. "දඬු වැට පනිමු" වැඩසටහන පොඩි දරුවන් වෙනුවෙනුත්, "බිංදුවයි, එකයි, දෙකයි, තුනයි" කියන පෙරපාසල් වැඩසටහනත්, "රන් පැහැයෙන් ගුරු පැහැයට", "වන පස මල්" වාගේ වැඩසටහන් එදා අපි ක්‍රියාත්මක කළා. ප්‍රාදේශීය සභාවක් ක්‍රියාත්මක කරපු ඉතාම සාර්ථක කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනක් එදා අපි ඉදිරිපත් කළා. ඒ කසළවලින් අපි ගොවි පොළක් සකස් කළා. ඒ ලැබෙන කාබනික පොහොරවලින් අපි එම ගොවි පොළේ වෙනම පිරිසකට රැකීරක්ෂා උත්පාදනය කරන අවස්ථා නිර්මාණය කළා. අද කථා කරන කාබනික වගාවෙන්, වස විසෙන් තොර කෑම වේලක් දෙන්නේ කොහොමද, පලතුරු දෙන්නේ කොහොමද කියන වැඩසටහන අපි එදා ආරම්භ කළා.

ඔබතුමන්ලා දන්නවා, තිස්සමහාරාමය, යාල, කතරගම, කිරින්ද වෙරළ තීරය නැරඹීමට දවස පුරා අතිවිශාල පිරිසක් පැමිණෙන බව. ඒ වාගේම එම ස්ථාන නරඹන්න විදේශීය සංචාරකයින් එනවා. එම නිසා ඒ ප්‍රදේශවල කුණු කසළ ප්‍රශ්නය විශාල ලෙස තිබෙනවා. ඒ වෙනුවෙන් එම ප්‍රදේශවල යටිතල පහසුකම් නිර්මාණය කිරීමේ ගැටලුවක් තිබෙනවා. නමුත්, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අපි බාර අරගෙන, පළමුවැනි වතාවට ඒ නගරය පිළිවෙළකට ලස්සන කරලා, ඒ සංකල්ප එකින් එක අරගෙන ගිහිල්ලා ඒක පිළිගන්වලා, තිස්සමහාරාම නගරය ලස්සන, පිරිසිදු නගරයක් බවට පත් කරලා, ලංකාවේ හොඳම පළාත් පාලන ආයතනය බවට එය කරන්න අපට පුළුවන් වුණා. ලංකාවේ සියලු පළාත් පාලන ආයතන අතරින් අවස්ථා තුන හතරකදීම අපට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව හොඳම පළාත් පාලන ආයතනය බවට පත් කරන්න පුළුවන් වුණා. හොඳම ප්‍රාදේශීය සභාව කියලා ලැබිච්ච ඒ ගරුත්වය සහ පිළිගැනීම මත දෙවැනි වතාවටත් අපි ජයග්‍රහණය කළා. ඒ නිසා තමයි අපි කිව්වේ මේ නියාමන වැඩසටහන, අපි කථා කරන මේ සියලු දේවල් අපට අලුත් දේවල් නොවෙයි කියලා. මේවා අපි අත්හදා බලපු දේවල්. ඒ නිසා මේ සියලු දේවල් වෙනුවෙන් අපට සැලසුමක් තිබෙනවා. ඒවා කරන්නේ කොහොමද කියලා අපට අවබෝධයක් තිබෙනවා. ඒ වාගේම, අපට ජන වරමක් තිබෙනවා. අන්න ඒ ජන වරම පාවිච්චි කරලා ජයග්‍රාහී ලෙස මේ රට වැටී තිබෙන තැනින් ඉහළට ඔසවා තැබීමට අපට කළ හැකි සෑම දෙයක්ම අපි කරනවා. ආකල්පමය වශයෙන් වාගේම සමාජයක් විධියට පිළිගන්න පුළුවන් වන විධියේ ගරුත්වය සහිත රටක් නැවත නිර්මාණය කරන්න අපට හොඳම අවස්ථාවක් උදා වෙලා තිබෙනවාය කියා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සංචාරකයෙක් අපේ රටට ආවාට පස්සේ ඒ සංචාරකයා සමඟ සන්සන්දනය කළාම අපට පේනවා, ඇත්තටම ඔවුන් සහ අපි අතර තිබෙන වෙනස. ඒ ආකල්පමය වෙනස පේනවා; හැම පැත්තකින්ම ඒ වෙනස පේනවා. ඒ නිසා රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා කියන විධියට මේ හදන්නේ පාකිස්තානයේ වාගේ බස්වලට පොලුවලින් ගහන්න ද කියලා අපි අහනවා. නැහැ, පිළිවෙළක් සහිතව, විනයක් සහිතව, වටිනාකමක් සහිතව, හර පද්ධතියක් සහිතව මේ රට මෙතැනින් අපි ඔසවා තබන්නම්. ආකල්පමය වශයෙන් නව පුනරුදයක් කරා මේ රට නැවත අරගෙන යන්න නම් මේ දේහයේ ඇති වී තිබෙන තුවාල සෑම එකකටම අවශ්‍ය ප්‍රතිකාර කළ යුතුයි කියා අපි හිතනවා. මේ දේහයේ තිබෙන සෑම තුවාලයක්ම, වේදනා දෙන සෑම තැනක්ම සුවපත් කරලා වඩා හොඳ දේශයක් බවට මෙය පරිවර්තනය කිරීමට අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය තීන්දු අපි ගන්න ඕනෑ. ජනාධිපතිතුමා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ජාතික ජන බලවේගයේ අපි සියලුදෙනාම ඒ ප්‍රතිපත්ති තීන්දු තීරණ නොබියව ගන්නවා. ජනතාවගේ ජන අනුමැතිය අපට තිබෙනවා. ඒ නිසා නැවත පිටුපසට යන්න, පැකිළෙන්න අපට කිසිම කාරණාවක් නැහැ. ඒ සඳහා අවශ්‍ය කරන බලය, ජනතා සහභාගිත්වය සහිතව නැවත ජනතාවට ප්‍රතිලාභ ලැබෙන ආකාරයට මේ සියල්ලක්ම ලබා දීම සඳහා වෙච්ච එකඟතාවක් තිබෙනවා. අපි සහ මහ ජනතාව අතර තිබෙන බැඳීම, ඒ ගිවිසුම කිසි ලෙසකින්වත් උල්ලංඝනය කරලා අපි පිටුපසට යන්න කටයුතු කරන්නේ නැහැ. ඉදිරි කාලය තුළ අපි රටේ ජනතාවට ලස්සන, සුන්දර රටක් නිර්මාණය කරදීමේ කාර්යයට දායක වෙනවා. මේ රට වැටී තිබෙන තැනින් ඔසවා තබන්න අවශ්‍ය කරන සෑම ප්‍රතිපත්ති තීන්දු තීරණයක්ම ගැනීම සඳහා අපි ජනතාව එක්ක වැඩ කරනවා. මේ රටේ ජනතාවට ඒ විශ්වාසය සහ බලාපොරොත්තුව ලබා දෙමින්, කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[3.45 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Deputy Chairperson of Committees, when we are discussing this Clean Sri Lanka programme of the Government, I must say that I went on to the website and tried to familiarize myself with the programme and I found that it was divided into three main sections: social, environmental and ethical. When I read the social and environmental sections, I found out that those sections predominantly looked at apolitical issues, that they are primarily to do with environment and also cleanliness in a very physical sense and I think it was only the section under "ethical" which had a slightly more wider perspective.

The section "ethical" particularly stated, "....aims to build trust in the systems by ensuring integrity..." It was a brief section which described it. I wish the Government had a far more comprehensive programme put up on the website. At least that sentence seemed a little bit wider, reflecting the mandate that the Government got at the last

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

Parliamentary and Presidential Elections because the mandate was a complete overhaul, not only with regard to corruption, cleanliness in that sense, but also with regard to the entire political culture that had plagued this country for the last 75 years. So, in that sense, Madam, I wish to bring to the notice of the Government - I am glad that the Hon. Minister of Public Security and Parliamentary Affairs and my good Friend, the Hon. Minister of Justice and National Integration are here because I wish to bring to the notice of this Government about their own comments over the last few days - that the expectations are very high and I say this in a good sense. I do not much agree with the main party, the JVP element, of the National People's Power because of their past positions with regard to the Tamil national question. I think the JVP has still not made their position clear with regard to the ethnic problem or, at the very least, if they have, it falls far short of what the Tamil people expect. But, the view of the National People's Power is slightly wider, not slightly wider, but considerably wider and I know personally of Members within the Government who have very progressive views on many issues. So, therefore, when we talk in terms of being ethical, I think it is important that there must be a clear picture. Why do you use the term "ethical"? Obviously, it means that the last 75 years was not ethical. That is why the people wanted a complete overhaul and why you had been voted in. So, when you use the term "ethical", an important part of it is that you must be consistent in what you say today, what you say tomorrow and with regard to the meaning and connotations of your own actions. I think that is very important.

If you take, for example, one of the biggest issues that the Tamil people face, it is this godforsaken Prevention of Terrorism Act. It is a law that the JVP itself, whom I might not agree with on several policy issues, condemns because they were a victim of it and what was said at the time of elections and before was that the PTA would be repealed. I quite understand that to repeal a law or to come up with a new law, you need some time, if, in case, you need one. I do not believe that you do, but if, in case, the Government thinks that they need one, you might take some time. The nature of the PTA was so draconian, Madam, that in 2015, when the then Government made commitments to the United Nations Human Rights Council that they would have a moratorium on the implementation and the functionality of the PTA, the current President Hon. Anura Kumara Dissanayake was seated in Opposition and did not object because he himself knows the draconian nature of the PTA. But, after the elections were over, this Government has backtracked very quickly within the first week and stated that they will have to monitor the implementation of the Act because as long as the implementation and the application of the Act is monitored and looked at carefully, then no faults would be done. But, faults have been done. During the memorialization of the Tamils, there were arrests under the PTA. Subsequently, maybe because of certain policy decisions taken, the police went before courts and then withdrew the PTA charges in the “B” reports. But, the point here, Madam, is that the law is so draconian and you say it is draconian because it is so wide in its possible applicability and that the police will misuse it; they will always misuse it. That has been the history of this terrible law. And, even if your Government wishes to be otherwise, the law is applied by the police and they continue to misuse it and that is my point. So, you cannot have a policy saying that you want to be ethical and then backtrack from your previous position. Actually, that empowers a police which wants to be in transition. That is the point I am trying to make. The PTA is now being applied to teachers in schools! Yesterday, the TID had gone and questioned the teachers in Konavil Maha Vidyalayam in Kilinochchi. The TID in Paranthan had gone and questioned them because at a function, at a sports meet, there were certain artistic interpretations that the teachers had done and they have been questioned by the TID under the PTA. So, surely, there must be something done for this.

I am told now that the Hon. Minister for Public Security and Parliamentary Affairs has said that memorialization in the North and the East will be observed and scrutinized very carefully. Why? His justification for it is because certain people in the South have said that that memorialization is terrorism or is amounting to terrorism. Surely, just because someone in the South says it is terrorism, you cannot have a different form of application for the North and the East! That in itself shows that it is unethical. Just because people shout, you cannot suddenly change your application of the PTA and the way in which you look at memorialization only in the North and East. There is something wrong and that is because you must be very clear. You only have one year. If you want to make those radical changes that you got a mandate for, you have that one year to make those radical changes because after that, if in case you falter, you would not be able to do anything. So, if you are going to change the culture, I expect you to change it immediately. The more you drag it out, the more you cave into pressure - that is what the Minister of Public Security means and if people in the South are complaining and that you are going to look at memorialization differently in the North and East, you are caving into pressure - that will mount more and more and you all will take the same path as the previous governments did.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Please give me more time, Madam.

I will conclude by just saying this. The Hon. Prime Minister is now the Hon. Minister of Education, Higher Education and Vocational Education. When she was seated in the Opposition - actually she sat just behind me - she raised an issue with regard to the Jaffna Central College. In the Jaffna Central College, there was a new lady principal who was appointed and she was fully qualified. She was from the Sri Lanka Principals' Service. But, because of political interference by Douglas

Devananda, her appointment had been suspended and the acting Principal there now is someone who is totally unqualified. The Prime Minister stood up in the House at that time and said that such political interference must stop. Well, she is now the Minister of Education and I urge the Prime Minister - it is over 100 days since she has come into power and she is now one of the most powerful people in this Government, in the country - that this is one thing she can do. Look at this sort of things. That is an uncontroversial issue and she must interfere.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
One last thing, Madam, with regard to solar power. For over three or four months, solar meters are not being issued by the CEB. There are people who have spent millions of rupees on solar power; because of the increasing rise in the prices of electricity, they have invested in millions. But, because the CEB is not issuing solar meters, they are at a complete loss. They have spent money, but they are not able to get the benefit of that investment. At least now, the Government must look into that. These are uncontroversial issues.

Also, look at the issues of the PTA, memorialization and the political prisoners. My good Friend, the Hon. Minister of Justice has said that there are no political prisoners. The JVP identifies their former prisoners as political prisoners. The President at speeches in Jaffna had said political prisoners will have to be released and since he is committed to that position, he must look into that. Thank you.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු කාරණාව සම්බන්ධයෙන් සොයා බලා මම මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කරන්නම්. ඔබතුමා කිව්වේ පරන්තන්වල සිද්ධියක් ගැන නේද?

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
ඔව්, පරන්තන්.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආචාර්ය හර්ෂණ නානායක්කාර ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ආයෙත් වැඩේ කැවා නේ!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මම ඔබතුමියට එරෙහිව පැමිණිලි කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ප්‍රශ්නයක් නැහැ. -*[බාධා කිරීමක්]* No, I will not.

Hon. Ponnambalam, you raised a very valid point about the PTA. I thank you for that. I think also on a last occasion when it was raised, I assured you that a Cabinet Paper will be put forward for the formulation of a committee to look into the abolition of the PTA. Now, that Cabinet Paper is being prepared. Hopefully, in the next Parliamentary Sitting, I will be able to confirm to you that Cabinet approval has been given for the abolition of the PTA and to bring in the ATA, which concerns international standards. That is what I wanted to clarify and we will hold onto that pledge.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ක්ලීන් ශ්‍රී ලංකාවක්; සුපිරිසිදු ශ්‍රී ලංකාවක් යන තේමාව යටතේ සභාව කල් තබන අවස්ථාවේ විවාදය පැවැත්වෙන මේ මොහොතේ ඒ ගැන අදහස් දක්වන්න මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකාව යනු ඉතා වටිනා භූගෝලීය පිහිටීමක් ඇති සුන්දර රටක්. ස්වාභාවික සම්පත්වලින් අනූන, දේශීය, විදේශීය ජනතාවට ආගන්තුක සත්කාර දැක්වීමෙන් පොහොසත් ජනතාවක් සිටින, ලෝකයේ සංචාරය කිරීමට සුදුසුම රටවල් 25 අතරින් එක් රටක් තමයි අපේ මේ මාතෘ භූමිය. ඒ වුණාට අපේ රටේ වර්තමාන තත්ත්වය කුමක්ද? අද අපේ රට ලෝකය ඉදිරියේ හැල්ලුවට ලක් කළ රටක්. විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, අවුරුදු 76ක දේශපාලන ඉතිහාසය ගැන කථා කරන්න එපා කියලා. මේ රටේ

[ගරු දීප්ති වාසලගේ මහත්මිය]

ඇති වුණු ප්‍රශ්නවලට වග කියන්නේ කවුද? මේ වගකීම භාර ගන්නේ කවුද? නිදහසින් පසු වසර 76ක් අපේ රට පාලනය කරමින් අපේ රටේ සියලු ක්ෂේත්‍රවල දරුණු අර්බුද ඇති කළ දේශපාලන බල කඳවුරු නියෝජනය කරන විපක්ෂ මන්ත්‍රීවරු කියනවා, "කථා කරන්න එපා ඉතිහාසය ගැන, දේශපාලන ඉතිහාසය වැඩක් නැහැ, ඉදිරි වැඩ පිළිවෙළ කියන්න, අනාගතය කියන්න" කියලා. ඒ අය අවුරුදු 76ක් තිස්සේ ඇති කළ දරුණු අර්බුදවලට විසඳුම ඒ අය මාස දෙකකින් අපෙන් ඉල්ලනවා. ඒක සාධාරණද කියලා මම මේ ගරු සභාවෙන් අහනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටේ දේශපාලන ඉතිහාසය ගැන කථා නොකර බැහැ. මොකද, දේශපාලන ඉතිහාසය මේ සියල්ලට වගකිව යුතුයි කියලා මම හිතනවා. අපි අපේ රට ගැන කථා කළොත්, මහජන නියෝජිතයන් ගැන කථා කළොත්, මහජනයාගේ මුදල් කොල්ල කන, සමාජ විරෝධී ක්‍රියාවල නිරත වන, දූෂණවලට උරදෙන චරිත දේශපාලන ඉතිහාසය තුළ අපි දැක්කා. දේශපාලන ඉතිහාසය තුළ අපි දැක්කේ නැහැ, සැබෑ මහජන නියෝජිතයන්. ඒ වාගේම, අපේ රටේ අධ්‍යාපනය, සෞඛ්‍යය, නීතිය, ආර්ථිකය, සංස්කෘතිය ඇතුළු සියලු දේවල්වල අර්බුද ඇති කළ දේශපාලන ඉතිහාසයක් තමයි අපි දැක්කේ. මහජන නියෝජිතයාට තිබූ ස්ථානය ඔවුන් කෙලෙසා ගත්තා.

මම ජීවත් වෙන මාතලේ දිස්ත්‍රික්කයේ මැති ඇමතිවරු විශාල ප්‍රමාණයක් මේ සභාව නියෝජනය කළා. නමුත් කියන්න කනගාටුයි, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ආසනයේ ඒ ග්‍රාමීය ජනතාවට තමන්ගේ මූලික අවශ්‍යතාවක් වන පිරිසිදු වතුර ටිකක් ලබාදීමට පැවති දේශපාලන අධිකාරියට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා අපි මේ රට පිරිසිදු කළ යුතු නැද්ද? මේ රට පිරිසිදු කිරීම ආරම්භ කළේ අපි. අපේ රටේ ජනතාව තමයි මේ පිරිසිදු කිරීම ආරම්භ කළේ. පසුගිය අවුරුද්දේ පැවති ජනාධිපතිවරණයේදී සහ මහ මැතිවරණයේදී මේ පාර්ලිමේන්තුව දේශපාලනිකව පිරිසිදු කිරීමේ බලය මහජනතාව තමන් අතට ගත්තා. මහජනතාව අපිට විශාල වරමක් ලබා දුන්නා. ඒ වරම තුළ අපිට පුළුවන් වුණා, ඒ දේශපාලන සංස්කෘතිය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න. ඒ වාගේම අපේ ජනාධිපතිතුමා ඉතිහාසගත ජනාධිපති කෙනෙක්. මේ රටට නිදහස ලැබීමෙන් පසු කිසිම නායකයෙකුට හැකියාව ලැබුණේ නැහැ, සාමය දිනා ගැනීමට. ලංකාවේ උතුර, දකුණ, නැගෙනහිර සහ බටහිර ඇතුළු සියලු පෙදෙස්වල ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින් ජාතිය, ආගම, කුලය ඉවතලා ජාතිය එකතු කිරීමට අපේ ජනාධිපතිතුමාට හැකියාවක් ලැබුණා. එය අපි ලබපු විශේෂ වරප්‍රසාදයක් විධියට මම සලකනවා. ඒ වාගේම, ඉදිරියේදී අපේ රට මේ ප්‍රශ්නවලින් ගැලවීමට නම් මේ ප්‍රශ්න ගැන කථා කළ යුතුයි.

මහජන නියෝජිතයන් වන අපි සියලුදෙනාම පාසල් ගිය උදවිය, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියද්දී ප්‍රශ්න නැවත නැවත කියවා අවබෝධ කර ගත යුතුයි. ඔබතුමන්ලා විසින් - පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් නියෝජනය කරන දේශපාලන කඳවුරු විසින් ඇති කරන ලද ප්‍රශ්නවලට අපි ඉදිරි අවුරුදු පහේදී විසඳුම් සොයනවා; පිළිතුරු ලියනවා. එසේ විසඳුම් සොයන විට, ඔබතුමන්ලා නියෝජනය කරන කඳවුරුවලින් ඇති කළ ප්‍රශ්න පිළිබඳව මේ ගරු සභාව තුළ නැවත නැවත කථා කිරීමට අපට සිදු වෙයි. සමහර විට ඔබතුමන්ලාගේ හදවත් කම්පාවට පත් වෙයි. නමුත්, ඒ සියල්ල ඔබට අසා සිටීමට සිදු වෙනවා. ඒ, ඔබ මේ රටේ දේශපාලන ප්‍රශ්න ඇති කිරීමට මැදිහත් වූ දේශපාලන අධිකාරියක් වන නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රට සුපිරිසිදු කළ යුතුයි. මෙය, අප සියවස් ගණනක් දැකපු සිහිනයක්. අපේ රට පිරිසිදු ශ්‍රී ලංකාවක් කළ යුතුයි. ඒ පිරිසිදු ශ්‍රී ලංකාව තුළ පරිසරය පිරිසිදු කිරීම පමණක්ම නොවෙයි අපේක්ෂා කරන්නේ. එය සමාජයීය වශයෙන්, සදාචාරාත්මක වශයෙන්, පාරිසරික වශයෙන් ද පිරිසිදු විය යුතුයි. විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු මේ විශාල වපසරිය ඉතාම ලඝු කොට දක්වනවා. එතුමන්ලා මේ සභාව තුළ නැවත නැවතත් ඒ බව කිව්වා. එතුමන්ලා කියනවා, කුණු ඉවත් කිරීම, කානු සුද්ද කිරීම තමයි මේ වැඩසටහන කියලා. Clean Sri Lanka කියන තේමාව අවබෝධ කර ගැනීමට නොහැකි වීම කනගාටුවක්. එය, ඔවුන්ගේ ආකල්පවල තරම විදහාපාන එකක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම කැමැතියි පාරිසරික පැත්ත ගැන කථා කරන්න; මේ වායුගෝලය ගැන කථා කරන්න. වායුගෝලයේ සංයුතිය වෙනස් වීමට දේශපාලනය බලපානවා කියා මම මේ ගරු සභාවට කියනවා. වසර 76ක් පුරාවට කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවයක් ඇති කර ගැනීමට අපට නොහැකි වුණා. කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවයක් නැති නිසා අපි පෞද්ගලික වශයෙන් වාහන භාවිතයට පුරුදු වුණා. ඒ අනුව මාර්ග තදබදයක් ඇති වුණා; රිය අනතුරු ඇති වුණා. මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු මේ ගැන ඉතාම හොඳින් දන්නවා කියලා මම හිතනවා. වාහන භාවිතය සීමා කර ගැනීමට නොහැකි වූ නිසා පොසිල ඉන්ධන දහනය කිරීම වැඩි වුණා. වාහන සම්බන්ධයෙන් පුනර්ජනනීය ජෛව ඉන්ධන සංකල්පයකට යන්න අපට බැරි වුණා. මේ රට තුළ පොසිල ඉන්ධන දහනය කිරීම නිසා වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් සංයුතිය වැඩි වුණා.

මේ රට තුළ කැළි කසළ බැහැර කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර ගන්නට බැරි වුණු දේශපාලන අධිකාරියක් තමයි මේ සභාව තුළ අද පුරාජේරු කථා කරන්නේ. 2017 වසරේ මීතොටමුල්ල කුණු කන්ද පුපුරා ගොස් ජීවිත බිලි ගත්තා; නිවාස, දේපළ බිලි ගත්තා. එය ඇත්තටම අපේ රටේ ඛේදනීය තත්ත්වයක්. අක්‍රමවත්ව කැළි කසළ බැහැර කිරීම තුළ ජීව වායු වායුගෝලයට එකතු වීම නිසා වායුගෝලයේ සංයුතිය වෙනස් වෙනවා. කාබන්ඩයොක්සයිඩ්, මීතේන් වායු හරිතාගාර වායු විධියට අපි හඳුන්වනවා. හරිතාගාර වායු සංයුතිය වායුගෝලයේ වැඩි වීම නිසා අපට හරිතාගාර ආවරණයේ බලපෑම වැඩි වෙනවා. ඒ නිසා අපේ දේශගුණික තත්ත්වයන් වෙනස් වෙනවා; අපේ වර්ෂා කාලසටහන වෙනස් වෙනවා. අප මේ සියල්ල හොඳින් අධ්‍යයනය කළ යුතුයි. ඒ වාගේම ගංවතුර තත්ත්ව, නියං කාල අපේ රටේ ඇති වෙනවා. එහිදී අපට දේපළවලින්, ජීවිතවලින් වන්දි ගෙවීමට සිදු වෙනවා. ඒ නිසා අපි අපේ වායුගෝලය ආරක්ෂා කළ යුතුයි. වායුගෝලය ආරක්ෂා කිරීමට අද දේශපාලන මැදිහත්වීමක් තිබෙනවා. අපි කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවයක් ඇති කළ යුතුයි. ඒ වාගේම අපි මේ රට තුළ ක්‍රමවත්ව කැළි කසළ බැහැර කිරීමක් ස්ථාපිත කළ යුතුයි. අපි ඒ වෙනුවෙන් ජාතික ජන බලවේගය ලෙස මේ භූමිය තුළ දේශපාලන වැඩසටහන් ස්ථාපිත කරනවා.

මේ Clean Sri Lanka තේමාව යටතේ අපේ අධ්‍යාපනයට ලොකු වපසරියක් තිබෙනවා. අපේ අධ්‍යාපනය අද කොතැනට ද ගිහින් තිබෙන්නේ? විභාග කේන්ද්‍රීය කර ගත් තරගකාරී අධ්‍යාපනයකුයි අපේ රටේ තිබෙන්නේ. අපේ රටේ අධ්‍යාපනයෙන් බැහැර වන දරුවන් සමාජගත වන්නේ සමාජයට සංවේදී පුරවැසියන් ලෙස නොවෙයි. ආකල්ප නැති, දැනුමෙන් පමණක් පොහොසත් දරුවන් තමයි අප සමාජගත කරන්නේ. ඒ නිසා අපේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කළ යුතුයි. Clean Sri Lanka තේමාව යථාර්ථයක් බවට පත් කිරීමට අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීම

වෙනුවෙන් අපි අධ්‍යාපන සැලසුම් සකස් කරනවා. ඒ වාගේම, අපි අපේ දරුවන් දැනුමෙන් පොහොසත්, සමාජ මනෝභාවය වෙනස් කළ, ආකල්ප වෙනස් කළ, දැනුම කුසලතා පිරි දරුවන්, පුරවැසියන් ලෙස සමාජගත කළ යුතුයි. අපි පරිසරයට, සමාජයට සහකම්පනයක් ඇති දරුවන් සමාජගත කළ යුතුයි. ඒ වෙනුවෙන් අධ්‍යාපනයට පැවරුණු කාර්යය ඉතා විශාල බව මම කියා සිටිනවා. අධ්‍යාපනයට සම්බන්ධ සියලු ආචාර්ය මහාචාර්යවරුන්, අධ්‍යාපනඥයන්, අධ්‍යාපනවේදීන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන්, ආදරණීය සිසු දරුවන් ඇතුළු සියලු දෙනාගෙන් මා ඉල්ලා සිටිනවා Clean Sri Lanka තේමාව මේ සමාජය තුළ, අපේ මාතෘ භූමිය තුළ යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා - මේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා - ධෛර්යවත්ව අපත් සමඟ එකතු වෙන්න කියලා. ඒ වාගේම, මේ භූමිය ලෝකය ජයග්‍රහණය කළ දියුණු රාජ්‍යක් බවට පත් කර ගැනීමට හැකියාව ලැබෙන්න ඔබ අපට ධෛර්යයක් වෙන්න. අපි ඔබ වෙනුවෙන් සැලසුම් සකස් කරනවා.

Clean Sri Lanka තේමාව යටතේ දේශපාලනය පිරිසිදු විය යුතුයි; ඒ වාගේම, රාජ්‍ය සේවය පිරිසිදු විය යුතුයි; ජනතාව පිරිසිදු විය යුතුයි. අප සියල්ලන්ම එක්ව සියවස් ගණනක අප දැකපු සිහිනය වන සුපිරිසිදු ශ්‍රී ලංකාව යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා අපත් සමඟ එකතු වෙන්න, මේ වැඩ පිළිවෙළට දායක වෙන්න. මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා අපත් එක්ක එකතු වෙන්න කියලා. අපි හොඳ රටක් හදමු, පොහොසත් රටක් හදමු, සිනහවෙන් පිරුණු මිනිසුන් සිටින රටක් හදමු කියන ආරාධනය කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 4.08]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Clean Sri Lanka වැඩසටහන පිළිබඳව පැවැත්වෙන සභාව කල් තබන අවස්ථාවේ විවාදයේදී අදහස් කීපයක් ඉදිරිපත් කරන්න මටත් අවස්ථාව ලබා දීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මා විශේෂයෙන් මේ කාරණය කියන්න කැමැතියි. ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමිය මේ ගරු සභාවේදී Clean Sri Lanka ගැන ප්‍රකාශයක් කළා; දැනුවත් කළා. නමුත් එයින් කිසිම දැනුවත්වීමක් අපට සිද්ධ වුණේ නැහැ. කිසිම වැඩ පිළිවෙළක් නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාට නිසි ගෞරව ඇතිව අපේ වේලාව අරගෙනයි මම මෙය කියන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා බොහෝ දෙනෙක් ගරු අගමැතිතුමිය ගැන විවිධ ප්‍රකාශ කළා. මෙය දිගට build up වෙන කොට අපට වගකීමක් තිබෙනවා, එතුමිය මේ වෙලාවේ සභාවේ නැති නිසා එයට පිළිතුරක් දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව පාර්ලිමේන්තුවේදී වෙනම විශේෂ ප්‍රශ්නයක් ඇහුවා, මීට කලින් පාර්ලිමේන්තු සතියේ. එතුමිය එහිදී ඉතාම දීර්ඝ, සවිස්තරාත්මක, පැහැදිලි පිළිතුරක් ලබා දුන්නා.

Clean Sri Lanka ව්‍යාපෘතිය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරලා ඒ සම්බන්ධයෙන් වූ විවාදය ඊයේ ආරම්භ කළා. ඒ විවාදය තුළ එතුමියට තිබුණු සීමිත වෙලාව ඇතුළේ එතුමිය සැලසුම් කර ගත්ත කථාව කළා. ඒ නිසා මම ඔබතුමාට නිසි ගෞරවය ඇතිව කියන්නේ මේකයි. අපි තව අවස්ථාවක මේ ගැන විවාද කරමු. නමුත්, ගරු අගමැතිතුමිය මේ පිළිබඳව ඉතා පැහැදිලිව දීර්ඝ ප්‍රකාශයක් මීට කලින් පැවැති පාර්ලිමේන්තු රැස්වීම් සතියේ දී කරලා තිබුණා.

බොහොම ස්තුතියි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඊයේ කළ කථාව ගැන මම දැනුවත් වුණේ නැහැ. ඒ නිසායි මම ඒ ගැන කථා කළේ. අපේ අග්‍රාමාත්‍යතුමිය ප්‍රකාශ කළා, ගුරුවරු දණ ගැස්සූ යුගය Clean Sri Lanka වැඩසටහන යටතේ අවසන් කළා කියලා. ඒ එක්කම මම අහන්න කැමතියි, ගුරුවරු, විදුහල්පතිවරු පාසල්වල දේශපාලනය කිරීමේ යුගය අවසන් කරන්නේ කවදාද කියලා. මම විශේෂයෙන්ම මේ ගැන කථා කරන්නේ මෙන්න මේ නිසායි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ විදුහල්පතිවරු නව දෙනෙක් පසුගිය ජනාධිපතිවරණයේ දී

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

දේශපාලන කටයුතු කළා. ඒ අය දේශපාලන කටයුතු කිරීම හේතුවෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ අයගේ රාජකාරි වැඩ තහනම් කළා. ඒ විධියට තහනම් කරලා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතට ලිඛිතව දැනුම් දුන්නා, මේ ගැන පරීක්ෂණයක් කරලා අදාළ රාජකාරි කටයුතු කරන්න කියලා. ඉතින් ඒ ගැන තවම කිසිම රාජකාරියක් කරලා නැහැ. පසුගිය ජනාධිපතිවරණයේ දී ඒ විදුහල්පතිවරු නවදෙනා ඒ කරපු වැරැද්දට කිසිම රාජකාරියක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කරලා නැහැ. අම්බලන්ගොඩ ධර්මපුත්‍ර ජාතික පාසලේ විදුහල්පතිවරයා ප්‍රකාශ කළ ඒවා record කරලාත් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සිදුවීම මේකයි.

2024.06.24 දින පාසලේ උසස් පෙළ පන්තිභාර ගුරුවරු කැඳවා නිශාන්ත ලියනගේ නැමැති විදුහල්පතිවරයා විසින් මෙම උසස් පෙළ පන්ති සඳහා පැමිණෙන ළමයින්ගෙන් එක් අයෙකුගෙන් රුපියල් 10,000කට ආසන්න මුදලක් එකතු කිරීමට දරුවන් දැනුවත් කර තිබෙනවා. එහිදී විදුහල්පතිවරයා පවසා තිබෙනවා, "පාසල් සංවර්ධනය සඳහා රජයෙන් මුදල් ලබා දෙන්නේ නැහැ. ඒ නිසා ඒ බර දෙමව්පියන්ට දෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. ඒකට ජේවීපී එකට ඡන්දය දෙන්න. දෙමව්පියන්ට ඒ පීඩනය දුන්නේ නැත්නම් මේක තේරෙන්නේ නැහැ" යනුවෙන්. ගුරුවරු කැඳවා විදුහල්පතිවරයා එවැනි ප්‍රකාශයක් කරලා තිබෙනවා. ඉතින් මේ විදුහල්පති තවමත් ඒ විදුහලේ ඉන්නවා; දේශපාලනය කරනවා. ඉතින්, ඇයි මෙහෙම දේශපාලනය කරන්න ඉඩ දෙන්නේ? මම අධ්‍යාපන ඇමතිතුමියට ගිය පාර්ලිමේන්තු වාරයේදීත් කරුණු ඉදිරිපත් කළා. මේ සම්බන්ධව යම් රාජකාරියක් කෙරෙන්න ඕනෑ. එක්කෝ මේ විදුහල්පතිවරු ගෙන්වලා නීතිමය කටයුත්තක් කරලා ඒ කරන්න තිබෙන රාජකාරියක් කරන්න කියලායි මම මේ ගරු සභාවෙන් ඉල්ලන්නේ. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය නැවත වතාවක් මම අපේ ගරු කථානායකතුමාගෙන් අහනවා. මේ ගැන පරීක්ෂණයක් කරලා ඒ වාර්තාව අනුව අප දැනුවත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම කැමතියි මේ Clean Sri Lanka වැඩසටහන ගැන අපේ අදහස් ඉදිරිපත් කරන්න. Clean Sri Lanka වැඩසටහනට මගේ යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමතියි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 339ක් මේ රටේ තිබෙනවා. ඒ වාගේම ග්‍රාම නිලධාරි වසම් 14,022ක් තිබෙනවා. එක් ග්‍රාම නිලධාරි වසමකට රාජ්‍ය නිලධාරින් 5දෙනෙක් ඉන්නවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා මීට කලිනුත් ඔය විදුහල්පතිවරුන්ගේ සිද්ධිය ඉදිරිපත් කළා. මට මතක විධියට, මෙතුමා මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කළේ තුන්වෙනි වතාවට. මා දන්නා විධියට දැන් ඒ සම්බන්ධව විමර්ශන කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ විපක්ෂ නායකතුමා ඔබතුමාත් පිටුපස්සෙන් තියාගෙන පහේ පන්තියේ දරුවෝ ඉදිරියේ මිත්‍රවරුනි, කියලායි කථා කළේ; මිත්‍රවරුනි, මා මිත්‍රවරුනි කියලා කථා කළේ. අන්න ඒවා ගැනත් විමර්ශනය කරන්න ඕනෑ. පාසල්වල දේශපාලනය කළා. කෝ, දැන් බඩු බෙදනවා? කෝ, දැන් බස් බෙදනවාද? දැන් සුහුරු පන්තිත් නැහැ, බස් බෙදන්නෙත් නැහැ, මිත්‍රවරුනි කියන්නෙත් නැහැ. හැම දාම මේ පාර්ලිමේන්තුව,-

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

මොනවාටද අවස්ථාව දෙන්න කියන්නේ? දීපු අවස්ථාව අරගෙන හැම දාම මොනවාද කිව්වේ? හැම දාම දීපු අවස්ථාවේ වැඩක් නැති දේවල් නේ කියන්නේ. මේ පාර්ලිමේන්තුවේ එකම දේ හැම දාම කියනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

පාර්ලිමේන්තුවේ තමයි කථා කරන්නේ. සජිත් ප්‍රේමදාස මැතිතුමා බස් බෙදුවා. සජිත් ප්‍රේමදාස මැතිතුමා ලැප්ටොප් බෙදුවා. ඒ හැමදෙයක්ම රටේ ජනතාවටම බෙදුවා. ඒ බෙදලාත් තමයි බොරු කියපු කට්ටියට ජනතාව ආණ්ඩුව දුන්නේ. ඉතින් ආණ්ඩුව කරන්න ඔබතුමන්ලා. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්නේ සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ විදුහල්පතිවරු තමයි එහෙම කටයුතු කරලා තිබෙන්නේ. මේ Clean Sri Lanka වැඩසටහන යටතේ ඒ රාජකාරියත් කෙරෙන්න ඕනෑ. කානු සුද්ද කරන එකයි, බස්වල කැලි ගලවන එකයි, තවත් දේවල් ගලවන එකයි, පොලිස් නිලධාරින් ගිහිල්ලා තවත් ස්ථාන සුද්ද කරන එකයි විතරක් නොවෙයි. *[බාධා කිරීමක්]* මම මාළු කාලා තමයි ධීවරයා ගොඩ දැම්මේ. මම මාළු කාලා තමයි පාරිභෝගිකයාගේ බය ඇරෙව්වේ. මාළු කාපු එක ගැන මට කියන්න එන්න එපා සහෝදරයා. අපි දේශපාලනය කරන පිරිසිදු මිනිස්සු. මම මේ කථාව ගිය සතියේ පාර්ලිමේන්තුවේදී කිව්වාය කියලා නිහාල් ගලප්පත්ති මගේ ඥාතියා මේ පාර්ලිමේන්තුවේදී මට දෝෂාරෝපණයක් කළා, මම සභාවේ නැති අවස්ථාවකදී. එතුමා මගේ පැටිකිරිය දන්නවා කිව්වා, මගේ තාත්තා ගැන දන්නවා කිව්වා, මගේ සහෝදරයන් ගැන දන්නවා කිව්වා, මගේ මල්ලි ගැන දන්නවා කිව්වා, පාලු ගෙයි වළං බිඳලාය කිව්වා. නමුත් මගේ පැටිකිරිය ගැන, වෙදආරච්චිලා කවුද කියන්න මුළු රටේම මිනිස්සු දන්නවා. තිබෙන දේපළ රටේ මිනිසුන්ට දුන්නා. මෙතුමා දන්නවා. මෙතුමා අපේ ගමේ. අපේ නෝනාගේ ඥාතියෙක් මේ ඉන්නේ. අපේ බිමල් රත්නායක මහත්මයා; තංගල්ලේ; අපේ ඥාතියා. *[බාධා කිරීමක්]* නැතුව? අපේ නෝනාගේ ඥාතියෙක්. *[බාධා කිරීමක්]* වෙදආරච්චිලා කියන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට ගරු සේවයක් කරපු මිනිස්සු. මගේ තාත්තා 1971 දී නගරාධිපතිවරයා හැටියට පත්වෙලා අවුරුදු 30ක් නගර සභාවේ සේවය කරපු මනුස්සයෙක්. මම අවුරුදු 8ක් නගරාධිපති වශයෙන් හම්බන්තොට ජනතාවට ගරු සේවයක් කරපු මනුස්සයෙක්. ඒ වාගේම මගේ පුතා නගරාධිපති හැටියට තංගල්ලේ නගර සභාවේ ඉඳගෙන ගරු සේවයක් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
අපේ පරම්පරාවම ගරු සේවයක් කරපු මිනිස්සු. ඒ නිසා අපි ගැන, අපේ පැටිකිරිය ගැන කියන්න ඕනෑ නැහැ, නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. එතුමා මම සභාවේ නැති වෙලාවේදී කියපු ඒවාටයි මම එතුමාට මේවා කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා කථාව අවසන් කරන්න, කාලය අවසානයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
අපි, වෙදආරච්චිලා කියන්නේ සාධාරණව දේශපාලනය කරන, රටේ ජනතාවට සාධාරණය ඉෂ්ට කරන, හොරු නොවන අවංක, කෙළින් මිනිස්සු. අන්න ඒ බව මම කෙළින්ම ප්‍රකාශ කරන්න කැමැතියි, නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාට.

මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය පුද කරමින්, කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද ලලිත් කුමාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

Clean Sri Lanka වැඩසටහන පිළිබඳව දවස් දෙකක් තිස්සේ විවාද කරන වෙලාවේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියන දෙපැත්තෙන්ම ඉදිරිපත් වූ නොයෙක් ආකාරයේ නොයෙක් අදහස්වලින් මේ සභාව පෝෂණය වුණා. හැබැයි බොහෝ වෙලාවට චෝදනා මුඛයෙන් කථා කරන විපක්ෂය අද මේ Clean Sri Lanka වැඩසටහනට අතහිත දෙන්නම්, සහයෝගය දෙන්නම්, ඒක අවශ්‍ය වැඩසටහනක් කියලා කියන ගමන්, අනෙක් පැත්තෙන් මේ සමාජයට, මේ වටපිටාවට, මේ රටට වෙනත් පණිවුඩයක් යන විධියේ අවලාද ටිකක් තමයි නහමින් හිටියේ. කොහොම වුණත්, ඔබතුමන්ලාට මේ ගැන පැහැදිලි කරලා දෙන්න අපට බැරි වෙයි. හැබැයි ඔබතුමන්ලාටත් වගකීමක් තිබෙනවා, මේක හරියට තේරුම් ගන්න.

රටේ ජනතාවට අපි විශාල පොරොන්දුවක් දුන්නා. ඒ අනුව රටේ ජනතාවත් බලාපොරොත්තු රාශියක් සහිතව, එදා හිටපු ගොඩක් "සීයලා" ගෙවල්වලටත් යවලා, සියයට 3ක ප්‍රතිශතයක හිටපු අපට අද සියයට 60කටත් වැඩි ජන වරමක් ලබා දීලා තිබෙන්නේ ජනතාවගේ මතයත් එක්ක සෙල්ලම් කරන්න නොවෙයි, මේ රට නිවැරදි දිශාවට ගන්නයි. එදා එහෙම කුඩා තැනක ඉඳලා, විවිධ අවලාද හා විවිධ චෝදනා සියල්ල පරදලා, අපේ නායකත්වය විසින්, පක්ෂ නායකත්වය විසින් ජනතා විමුක්ති පෙරමුණ විධියටත්, ඉන් පසුව ජාතික ජන බලවේගය විධියටත් අපි කරගෙන ගිය නිර්මාණශීලී මැදිහත්වීම්, ඒ කැපකිරීම් සියල්ලේ ප්‍රතිඵලයක් හැටියට තමයි අපට මේ ජයග්‍රහණය ලබා ගන්න පුළුවන් වුණේ. ඒ නිසා තමයි ජනතාව මේ ව්‍යාපාරය ජාතික ව්‍යාපාරයක් හැටියට ඔසවා තැබුවේ. ඒ ජනතාවගේ බලය, ජනතා පරමාධිපත්‍යය හරියට රකින්න තමයි අපි ඉදිරිපත් කරපු රට ගොඩනඟන ජාතික ප්‍රතිපත්ති මාලාවත්, වැඩ පිළිවෙළත් මුල් කරගෙන එතැනින් එහා ගිය සැලසුම්වලට, එතැනින් එහා ගිය දැක්මකට මේ රටේ සියලු බලවේග එකතු කරගන්න කටයුතු කරන්නේ. විශේෂයෙන්ම වෘත්තීය වශයෙන් අත්දැකීම් විශාල ප්‍රමාණයක් තිබෙන, අපේ මේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන විවිධ ක්ෂේත්‍රවල නැණවතුන් හැමදෙනාමත්, ඒ වාගේම මන්ත්‍රී ධුරවල නොහිටියත් ගම් බිම් මට්ටමින් ස්වේච්ඡාවෙන් වැඩ කරන, ඔබතුමන්ලාට හිතා ගන්නවත් බැරි විධියේ මහා බලවේගයක් එකතු කර ගනිමින්, ඒ සියලුදෙනා එක්ක අත්වැල් බැඳ ගනිමින් තමයි අපි මේ රට ගොඩනඟන්න යන්නේ.

අපි ඒ පියවර තබනකොටම විපක්ෂය නිහඬව ඉන්නේ නැතුව විවිධ විවේචන ඉදිරිපත් කරමින් අදහස් දක්වන්න හැදුවත්, ජනතාව දන්නවා, ඒ වාගේම ගම් බිම්වල ජීවත් වන අපට දැනෙනවා, මොන තරම් විශ්වාසයක් තියලාද ජනතාව මෙම වැඩසටහනත් එක්ක අත්වැල් බැඳ ගනිමින් සිටින්නේ කියලා. ඔබතුමන්ලාට කථා කරන්න ලැබෙන විනාඩි කිහිපය තුළ ඔබතුමන්ලා යම් යම් අදහස් දැක්වුවත්, ඔබතුමන්ලා මෙය කවදා හෝ තේරුම් ගනීවි කියලා, රටට ආදරයක් තිබෙනවා නම් අපි මේ ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ හරි හැටි කියවා ගනීවි කියලා අපි විශ්වාස කරනවා. එම නිසා අපේ ආදරණීය ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඇතුළු අපි තැබූ පියවරට අනෙකුත් සියලු බලවේග එකතු කරගෙන නිර්මාණශීලීව අපි මේ රට ගොඩනඟන කටයුත්ත ඉදිරියට අරගෙන යනවා. ඒක සක් සුදක් සේ පැහැදිලියි. ඒ ගැන සැකයක් තියාගන්න එපා. ඒ පිළිබඳව අපි දින තියලා ඔබට කියනවා; කියලා තිබෙනවා.

Clean Sri Lanka වැඩසටහන විතරක් නොවෙයි, තවත් වැඩසටහන් මාලාවක් එක්කයි අපි රට දිහා බැලුවේ. ඒ වාගේම ඉතිහාසයේ එක් එක් රජයන් විවිධ වූ තේමාවන් එක්ක රටට, ජනතාවට බලාපොරොත්තු දීලා, රට පෙළ ගස්වා ගන්න හදපු අවස්ථා බොහොමයක් අපි දැක්කා. පසුගිය කාලයේ පැවැති රජයන් තමන්ගේ ප්‍රතිපත්ති මාලාවන් මොනවා වුණත්, නොයෙක් දේවල් කියමින්; ඇස් නිලංකාර වන විධියේ දේවල් කියමින් තමයි ජනතාවගේ ජන මනස ඩැහැගත්තේ. ඒ ඒ අවස්ථාවල ප්‍රතිපත්ති මාලාවක් ගැහුවේ නැතත් මේ රටේ විවිධ මතයන් හැදුවා අපට මතකයි. "යළි පුබුදමු ශ්‍රී ලංකා" කිව්වා; "මෛත්‍රී යුගයක්" කිව්වා; "යහ පාලනය" කිව්වා. ඒ වගේ විවිධ දේවල් කිව්වා. ඒ දේවල් දැන් මේ රටේ ගොඩක් අයට අමතක වෙලා තිබෙනවා. ඒවා අමතක කරලා ජනතාව අපිත් එක්ක ආවා තමයි. හැබැයි, ඉතිහාසයේ සිදු වූ ඒ දේවල් අපට තවමත් මතක් වෙනවා. ඒ වාගේම ජනතාව අතරත් තවම කියැවෙනවා. "ආසියාවේ ආශ්චර්යය" වැඩ පිළිවෙළ ගත්තොත්, ඒක සූකරයෙකුටවත් දිරවන්නේ නැති. වමනය යන විධියේ වැඩසටහනක් කියලා අපේ ගමේ වැඩිහිටියෙක් දවසක් මට කිව්වා. එවැනි දේවල් ඉදිරිපත් කරමින් තමයි ජනතාවගේ ජන මනස විකෘති කළේ. හැබැයි, රටට ආදරය කරන ජනතාව කොයි මොහොතේත් තමන් කැමැති දේශපාලන පක්ෂය තෝරාගෙන ඡන්දය දුන්නා. ඒ නායකයින්ට සැලකුවා. හැබැයි, පැවැති රජයයන්වල නායකයෝ ජනතාවගේ ජන විඥානය හරියට තේරුම් ගත්තේ නැහැ. එය තේරුම් ගත්තේ නැති නිසාම ජන බලය මේ ආකාරයෙන් අපේ පැත්තට ගොඩනැඟෙන්න පටන් ගත්තා. එසේ තිබියදී ඒකටත් විහිළු කරන්න අද විපක්ෂය කටයුතු කරනවා. ඒ වාගේම පුළුවන් ආකාරයට ගම්වලට ගිහිල්ලා ජනතාව එක්ක දේශපාලනය

[ගරු චමින්ද ලලිත් කුමාර මහතා]

ගොඩනගනවා වෙනුවට විවිධ බොරු බේගල් ඇදබාමින් ජනතාව මුළා කරන්න හදන උත්සාහයක් තමයි පසුගිය මැතිවරණයේදී අපි දැක්කේ. අපි දේශපාලනය කළා, ඔවුන් මඩ වැගිරුවා. එය තේරුම් ගත් ජනතාව ජාතික ජන බලවේගය ඔසවා තබලා, අපට මේ රට භාර දීලා අත්වැල් බැඳගෙන දැන් වැඩ කරන්න සූදානමින් ඉන්නවා. ඒ නිසා අපි කියනවා, තවත් විහිළු සපයන්නේ නැතුව මේ රට ගැන කුමක් හෝ හැඟීමක් තිබෙනවා නම් ඒ පිළිබඳව හිතලා අපට අවශ්‍ය සහයෝගය දෙන්න කියලා. ඒ සඳහා ඔබ අවංක හදවතින් ඉදිරිපත් වෙනවා නම්, අවංකව ඒ සහයෝගය භාර ගන්න අපිත් කැමැතියි.

මේ රටේ ජනතාව බලාපොරොත්තු වන දේවල් අකුරටම ක්‍රියාත්මක කරන විධිය ගැන කිව්වොත්, අපට ඒ සඳහා උදාර නායකත්වයක් තිබෙනවා. ඒ නායකත්වය අද ලෝකය ඉස්සරහා මේ රටට කීර්තියක් අත්කර දෙමින් අභිමානයෙන් යුතුව කටයුතු කරනවා. ඊයේ රෑ සිරස නාළිකාවේ "සටන" වැඩසටහන බැලුවා නම් ඔබට පෙනෙන්න ඇති, අපේ ජනාධිපතිතුමා කියපු විධියටම - පොරොන්දු වුණු විධියටම- මාධ්‍ය ආයතනයක් ඉදිරියට ගිහිල්ලා, මාධ්‍යවේදීන් හතර පස්දෙනෙක් අසන ප්‍රශ්නවලට උත්තර දුන් හැටි. රට තුළත්, මාධ්‍යවේදීන් තුළත් තිබුණු සැකය දුරු කරලා, එතුමා ඒ හැම ප්‍රශ්නයකටම පැහැදිලි ලෙස, නිවැරදිව පිළිතුරු දුන්නා. ඇත්ත වැඩ පිළිවෙළ මොකක්ද, අපේ අරමුණ මොකක්ද කියලා එතුමා පැහැදිලි කළ ආකාරය ඔබට මතක ඇති. ඒවා දකිනකොට පසුගිය කාලයේ අයියලා, මල්ලිලා මාධ්‍ය සාකච්ඡාවලට ඉදිරිපත් වුණු හැටි අපට මතක් වෙනවා. අමාත්‍යාංශ නිලධාරින්, ඇමතිවරු, ඒ සියලුදෙනා පිරිවරාගෙන තමයි ඒ "විරුවෝ" කියන නායකයෝ පසුගිය කාලයේ ඉඳලා හිටලා හෝ ගිහිල්ලා මාධ්‍ය සාකච්ඡාවලට සහභාගී වුණේ. මල්ලිට බැරි වෙනකොට මල්ලී අයියාගෙන් අහනවා, අයියට බැරිවෙන කොට අයියා තව කාගෙන් හෝ අහනවා. අන්තිමට කවුරු හරි නිලධාරියෙක් උත්තර දෙනවා. මාධ්‍යවේදීන් දෙදෙනෙක් විතර මැදිහත් වෙනවා, කථා කරගත්ත ප්‍රශ්නවලට උත්තර දෙනවා. අපි එහෙම නැහැ. විවෘතව, කරපු දේ කියන, කියන දේ කරන දේශපාලන ව්‍යාපාරයක් හැටියට තමන්ගේ වගකීම ඉෂ්ට කරමින් යද්දී, මේ රට වැටුණු තැනින් ගොඩට ගන්න අද ජාතික ජන බලවේග රජය සියලු කටයුතු සූදානම් කරන අතර තමයි මේ Clean Sri Lanka වැඩසටහන ගෙනාවේ. අපේ මන්ත්‍රීතුමන්ලා විවිධ ප්‍රශ්න ඇහුවා. අපේ මන්ත්‍රීතුමන්ලා මොනවාද ඇහුවේ? මට මතකයි, එක් මන්ත්‍රීවරයෙක් ඇහුවා, ජනතාව සහභාගි කරගෙනද මේක කරන්න යන්නේ, නිලධාරින් විතරක් තළා පෙළාද මේක කරන්න යන්නේ කියලා. ඔය විධියට මේක කරන්න බැහැ කියලා කිව්වා. තවත් මන්ත්‍රීවරයෙක්, අපේ පක්ෂ මූලස්ථානයේ අරමුදලට එකතු කරන්නද නිලධාරින්ගේ වැටුප් මේ විධියට යොදවාගන්න හදන්නේ කියලා මොකක්ද විකෘති අදහසකුත් ඉදිරිපත් කළා. එවැනි දෙකොන පැටලුනු විකෘති අදහස් එක්ක මේ සභාවට විවිධ අදහස් දුන්නත්, ස්වේච්ඡාවෙන් වැඩ කරන්න මේ රටේ ජනතාව කොච්චර සූදානම්ද කියලා අපි දන්නවා. එහෙම සංස්කෘතියක් තිබෙන රටක්, මේක. ස්වේච්ඡාවෙන් තමන්ගේ වැඩ කරන්න අපේ රටේ මිනිස්සු කැමැතියි.

ගමක ශ්‍රමදානයක් කරන්නේ නැතුව ගියා නම් මොකක්ද තත්ත්වය? තමුන්නාන්සේලාගේ ප්‍රාදේශීය සභාවේ සභාපති, නගර සභාවේ නගරාධිපති හොරකම් කරද්දී, ඡන්දයක් පවත්වන්නේ නැතුව විවිධාකාරයෙන් ආණ්ඩු කරගෙන ගියා. ඉතිහාසයේ තමුන්නාන්සේලා මේ රට පාලනය කරපු දවස්වල සියයට 8ක, 10ක කොමිස් එකක් අරගෙන -තමන්ගේ පංගුව අරගෙන- තමයි ගම්වල ඔය ගොඩක් ව්‍යාපෘති සිදු කළේ. ප්‍රාදේශීය සභා මැදිහත් වෙලා කොන්ත්‍රාත්කරුට හරියට ව්‍යාපෘතිය කරන්න දුන්නේ නැහැ, තමන්ගේ සාක්කු පුරවාගත්තා. එහෙම කරනකොට කැඩුණු පාරේ වැටී වැටී යනවා මිසක් ඒ පාරේ ශ්‍රමදානයක් කරන්න ගමේ කෙනෙක් කවදාවත් ආවේ නැහැ. හැබැයි, ස්වේච්ඡාවෙන් වැඩ කරන, හොරකම් කරන්නේ නැති පාලනයක්, මෙහෙයුමක් යටතේ ගමේ, රටේ ජනතාව අදත් වැඩ කරන්න කැමැතියි. ඒ නිසා සම්පත්දායකයින් හැටියට ස්වේච්ඡාවෙන් වැඩ කරන අයගේ; විවිධ ක්ෂේත්‍රවල හැකියා තිබෙන අයගේ උදවු ජාතික ජන බලවේගයේ මේ Clean Sri Lanka වැඩසටහනට දැනටමත් ලැබෙන්නට නියමිතව තිබෙනවා. අපි ඒක ගම් බිම් මට්ටමින් අත්දකිනවා. අපි නොකිව්වත් දැනටමත් ඔවුන් තමන්ගේ බෝඩ් ගහගෙන ගමේ බිමේ වැඩ පටන් අරගෙන තිබෙනවා. ප්‍රාදේශීය සභාවට ගිහින් කිව්වාම, ප්‍රාදේශීය සභාවේ නිලධාරින් යටතේ හෝ ඒ උදවු ටික ලැබුණු අවස්ථා අපි මීරිගමදී දැක්කා. මොකද, මේ රටේ ජනතාවට විළිරුදාවක් තිබුණා කොහෙන් හෝ මේ රටේ ප්‍රශ්න ටික කෙළවර වෙන්න ඕනෑ, මේ රට ලස්සන වෙන්න ඕනෑ කියලා. මම විළිරුදාව කියලා කිව්වේ මේ නිසායි. මවකට අලුත් දරුවෙක් බිහි කරන්න තිබෙන හැඟීම වාගේ හැඟීමක් ඇතිව, ඒ තරම් බරක් දරාගෙන හෝ මේක කරන්න තමයි රටේ ජනතාව අත්වැල් බැඳගෙන ලැහැස්ති වුණේ. ඒ නිසා පොලිසිය තමන්ගේ පැත්තෙන් තමන්ට හිතෙන දේ කළාට, තවත් එවැනි දේවල් සිද්ධ වුණාට, ඒ සියලු දේවල් Clean Sri Lanka වැඩසටහන පිට දමා විවේචනය කරලා විපක්ෂයේ ඔබ අත් පිහදාගන්න හැදුවාට අපි මේ වැඩේ කියපු විධියටත් වඩා හොඳට කරලා පෙන්වනවා.

අපේ මන්ත්‍රීතුමන්ලා මේ වැඩ පිළිවෙළේ දින, සීමා ඇහුවා. අවසන් වන දවසක් මේකේ නැහැ. හැබැයි, අලුත් දේවල් එකතු කරමින් මේ රට ඉදිරියටම අරගෙන යන එක තමයි මේ Clean Sri Lanka වැඩසටහනේ අරමුණ කියන එක පසුගිය 01 වැනිදා මේ වැඩසටහන ගැන පැහැදිලි කරද්දී ජනාධිපතිතුමාම කිව්වා. ඒක ගොඩක් අයට මතක නැතුව ඇති. විපක්ෂයේ අයට මේක දැනගන්න ලැබුණේ නැත්නම්, දකින්න ලැබුණේ නැත්නම්, ඒ දකින්න ඕනෑ නැතිකම මිසක්, මේ ගැන සොයා බලා සාධාරණ අදහසක් කියන්න ඕනෑ නැතිකම මිසක් වෙන මොකවත් නොවෙයි. මොකද, අද ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල මේ කථාව කියනවා. ඒ නිලධාරින් මේක දන්නවා. දිසාපතිතුමන්ලා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී මේ ගැන කරුණු ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේලා ඒ කමිටුවලට ඉදිරිපත් වෙලා නැහැ. ජනතාවගේ ඡන්දය අරගෙන එම කමිටුවලට ගියාද? කියන්නකෝ. ඒ වාගේ වැඩසටහන්වලට අවශ්‍ය මට්ටමින් සහභාගි වුණාද? නැහැ. අපි ආණ්ඩු පක්ෂය විධියට ඒවාට සහභාගී වෙනවා. සියලු සම්බන්ධීකරණ කමිටු කැඳවනවා. ඒ වැඩසටහන් පවත්වමින් තමයි දැනටත් මේ ආරම්භය අරගෙන තිබෙන්නේ. මේක විවිධ පැතිකඩවලින් පවතින වැඩසටහනක්. ඒ නිසා විවේචනවලින් විතරක් මේක නතර වෙන්නේ නැහැ. අපට නීතිය ගැන කියන්න, නීතිය ක්‍රියාත්මක කරන හැටි කියලා දෙන්න විවිධ අදහස් යෝජනා ඉදිරිපත් කරන ඔබතුමන්ලා ඉතිහාසය ගැන සොයා බලන්න. අර ෆොන්සේකා මහත්මයා කුදලාගෙන ගියා වාගේ, නැත්නම් අර කියපු මහත්වරුන්ගේ තාත්තලාගේ පාලන කාලයේ ඇස් බැඳලා ගෝනි බිල්ලෝ ගෙනැල්ලා නීතිය ක්‍රියාත්මක කළා වාගේ, ගෝල් ෆේස් එකට ගිහින් පොලු හමුදා ආලා පොලුවලින් ගහලා "මලයණ්ඩිය බිය නොවන්න, මම ඔබව බේරා ගන්නම් " කියලා රටේ ජනතාවට ගහලා, ජන විඥානය හඳුනන්නේ නැතිව රට පුරාම ගුටි කෑවා වාගේ කටයුතු කරන්න අපට බැහැ. අවශ්‍ය නීති අවශ්‍ය වෙලාවට සම්පාදනය කරගෙන; ජන බලය, ජන මතය, ජනතා පරමාධිපත්‍ය තුළින් ලැබුණු බලයෙන් කිසිම අකටයුත්තක් නොකර, සාධාරණ විධියට මේ රට පවත්වාගෙන යන්න පාර්ලිමේන්තුවේත්, රජයේත් අවශ්‍ය මැදිහත්වීම සිදු කරමින් Clean Sri Lanka වැඩසටහන ඉදිරියට ගෙනයන්න අපි සූදානම්.

ඒ සඳහා පුළුවන් කෙනෙක් අවංකව සහයෝගය දෙන්න. ඔබතුමන්ලා සහයෝගය දුන්නත්, නැතත් මෙම වැඩසටහන ඉදිරියට ගෙන යන බව අපි රට ඉස්සරහ කියනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. Clean Sri Lanka වැඩසටහන පිළිබඳව යමක් කථා කරනවා නම්, මෙතුමන්ලාගේ මේ වැඩසටහනේ ආරම්භය පිළිබඳවම ලොකු ගැටලුවක් තිබෙනවා. මෙහි ආරම්භය ගන්නකොටම ත්‍රී වීලර් රථ රියදුරන් එක්ක, පෞද්ගලික බස් රථ හිමියන් එක්ක ලොකු ගැටුමක් ඇති වුණා. ත්‍රී වීලර් රථය සාමාන්‍යයෙන් පොඩි වාහනයක් වුණාට ත්‍රී වීලර් රථ හිමියාට එය බෙන්ස් එකක්. ඒගොල්ලන් ඉතාම වුවමනාවෙන් සහ ආදරයෙන් ඒක බලා ගන්නවා. පොඩි ළමයෙකුට බයිසිකලයක් අරන් දුන්නාම බෙල් එකක් සවි කරනවා වාගේ, එහෙම නැත්නම් තවත් යමක් ඒකට එකතු කරනවා වාගේ ඉතාම ආදරයෙන්, ඉතාම වුවමනාවෙන් ඒ අය ඒ වාහනයට නොයෙක් උපාංග එකතු කර ගන්නවා. නමුත්, ඒ සම්බන්ධවත් අවධානය යොමු කරලා ලොකු හිංසනයක් ඇති කළා. එම නිසා Clean Sri Lanka වැඩසටහන ආරම්භයේම එහි අරමුණට ලොකු හානියක් වුණා කියා මා විශ්වාස කරනවා. එම නිසා එහි ආරම්භය පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා.

අපේ රටේ යම් වෙනසක් කරන්න තමුන්නාන්සේලාට දැන් උපරිම ශක්තිය ලැබිලා තිබෙනවා. වෙනස් කරන්න ඕනෑ දේවල් තිබෙනවා. යම් යම් දේවල් වෙනස් කළ යුතු බවට අපිත් එකඟ වෙනවා. ඊට අපේ සහයෝගයත් ලබා දෙනවා. තමුන්නාන්සේලා ආණ්ඩු බලය ගත්ත දවසේ ඉඳලා උත්සාහ කරනවා, හාල් මාෆියාව නැති කරන්න. තමුන්නාන්සේලා මුලින්ම හාල් මෝල් හිමියන්ගේ මාෆියාව නැති කරන්න පටන් ගත්තාට, ඒකට උත්සාහ කළාට ඒක සාකච්ඡාවලට පමණක් සීමා වෙලා එතැනින්ම ඒක නතර වෙලා තිබෙනවා. තවමත් එම ප්‍රශ්න ඒ ආකාරයෙන්ම තිබෙනවා. එම නිසා Clean Sri Lanka වැඩසටහනේදී ඉස්සෙල්ලාම හාල් මාෆියාව clean කිරීමේ වැඩකටයුත්ත කරන්න. මේ වාගේ තවත් මාෆියා තිබෙනවා. මේ වාගේ ගැටලු තවත් තිබෙනවා.

ලංකා විදුලිබල මණ්ඩලයේ මාෆියාව බලන්න. විදුලිබල මණ්ඩලයේ තිබෙන ගැටලුව තවම විසඳිලා නැහැ. එම නිසා කරුණාකරලා තමුන්නාන්සේලා මේ කළ යුතු දේවල් පිළිබඳව අවධානය යොමු කරන්න. විදුලිබල මණ්ඩලයේ මාෆියාව මේ රටේ දැවැන්තම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. Solar පද්ධතියක් ගත්තාම, ඒ සඳහා ගතවන කාලය අද දැවැන්ත ගැටලුවක් වෙලා තිබෙනවා. ඒක රජයටත්, රටටත් ලොකු ගැටලුවක්.

ඔබ කවුරුත් දන්නවා, මේ ආණ්ඩුව ආරම්භයේදීත් තිබුණු ප්‍රධානතම ප්‍රශ්නය පාස්පෝට් ප්‍රශ්නය බව. දැන් පාස්පෝට් පෝලිම් ටික නතර වෙලා තිබෙනවා. පාස්පෝට් පෝලිම නතර වුණාට ඒ ප්‍රශ්නය තවම තිබෙනවා. මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා එක්කත් මේ පිළිබඳව කථා කළා. මොකද, අද පාස්පෝට් එකක් ගන්න ගියාම ඒ සඳහා appointment එක හම්බ වෙන්නේ තව මාස පහකට, හයකට පසුව. ඕනෑම කෙනෙක් බලාපොරොත්තු වන්නේ ඉක්මනින් පාස්පෝට් එක ලබා ගන්න, appointment එක අරගෙන මාස පහක් හෝ හයක් බලාගෙන ඉන්න නොවෙයි. එය ප්‍රශ්නයට විසඳුමක් නොවෙයි. අද පාස්පෝට් පෝලිම නතර වෙලා තිබෙනවා. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. පාස්පෝට් පෝලිම නතර වුණාට පාස්පෝට් එක ගැනීමේ හැකියාව ලැබිලා නැහැ. එම නිසා පාස්පෝට් එකක් ගන්න යනකොට තවමත් අපට call එකක් දීලා අහනවා, උදව්වක් ගන්න පුළුවන්ද කියලා. එම නිසා මේ පිළිබඳව වහාම අවධානය යොමු කරන්න කියලා මම අග්‍රාමාත්‍යතුමිය ඇතුළු රජයෙන් ඉල්ලා සිටිනවා. යම් කෙනෙකු පාස්පෝට් එකක් ගන්න අද යන්නේ ඉක්මනින් එය අවශ්‍ය නිසායි. එය මාස හයකින් ගන්න වුවමනා නම් ඒ කෙනා ඒ සඳහා යන්නේ තවත් මාස පහකට පසුව. නමුත්, අද පාස්පෝට් එකක් ගන්න ගියාම මාස පහකින් නම්, මාස හයකින් නම් appointment එකක් හම්බ වෙන්නේ ඒ ප්‍රශ්නය තවම එතැනමයි. TV එකෙන් පෝලිම් පෙන්වන්නේ නැති වුණාට, එම ප්‍රශ්නය තවමත් තිබෙනවා. ඔබතුමන්ලා ඒ ගැන අවධානය යොමු කරන්න. ඒ විධියට තමයි මේ පෝලිම් සුද්ද කරලා තිබෙන්නේ.

ඒ විධියටම රේගුවේත් සුද්ද කළා. දැන් රේගුවේ පෝලිම් ටික සුද්ද වෙලා තිබෙනවා. තවදුරටත් සුද්ද කරන්නත් යම් උත්සාහයක යෙදෙනවා. නමුත් එතැනදී වෙලා තිබෙන්නේ මොකක්ද? රේගුවේ වෘත්තීය සමිති ප්‍රකාශ කරන භයානක තත්ත්වය, ඒ භයානක කාරණාව තමයි, කන්ටේනර් 300කට වැඩි ප්‍රමාණයක් කිසිම සෝදිසියක් නැතුව release කරලා තිබෙනවා කියන එක. කන්ටේනර් 300කට වැඩි ප්‍රමාණයක් මෙහෙම release කරනකොට ඒවා හරහා මේ රටට කුඩු ආවාද, මොනවා ආවාද කියලා දන්නවාද? දැන් දවස් දෙකකට කලින් ඇමතිතුමා මහ ලොකුවට කියනවා, හෙරොයින් මෙච්චර කිලෝ ගණනක් ආවා, අයිස් මෙච්චර කිලෝ ගණනක් ඇල්ලුවා, මෙන්න මෙච්චර මත් ද්‍රව්‍ය ප්‍රමාණයක් ඇල්ලුවා කියලා. නමුත් මේ කන්ටේනර් 300 ඇතුළේ මත් ද්‍රව්‍ය ඇවිල්ලාද, නැද්ද කියන එක ගැන තමුන්නාන්සේලාට වගකීමක් ගන්න පුළුවන්ද? වගකීමක් ගන්න බැහැ නේ. කොහොමද දන්නේ මොන අපරාධයන් ඒ තුළින් සිදු වෙලා තිබෙනවාද කියලා? අනික් එක, එතුමන්ලා ඒ අවස්ථාවේදී කියනවා, මේ red alert containers විශාල ප්‍රමාණයක් කිසිම සෝදිසියක් නැතුව release කරන්න කටයුතු කළා කියලා.

අවසාන වශයෙන්, මම මේ වෙලාවේදී එක ඉල්ලීමක් කරනවා. කරුණාකරලා තමුන්නාන්සේලා Clean Sri Lanka වැඩසටහන හැටියට කරන්න ඕනෑ ප්‍රධානම දේ තමයි, පාස්කු ප්‍රහාරය පිළිබඳ කාරණය clean කරන එක. පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් අදටත් දුක් විඳිනවා. පාස්කු ප්‍රහාරය පිටුපස හිටපු පිරිස කවුද කියලා මේ රටට හෙළි කළොත් ඔන්න තමුන්නාන්සේලාට ගෞරවයෙන් කියන්න පුළුවන්, ඔන්න Clean Sri Lanka සාර්ථක වුණා කියලා. එහෙම නැතුව ත්‍රිරෝද රථ රියදුරන්ට, එහෙම නැත්නම් පෞද්ගලික බස්රථ හිමිකරුවන්ට කරන මේ හිංසාව නතර කරන්න. ඇත්තටම clean ශ්‍රී ලංකාවක් බිහි කරන්න අවශ්‍ය නම් මේ කිව්ව දේවල් පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා ප්‍රධාන වශයෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.37]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாம் இப்பொழுது 'Clean Sri Lanka' வேலைத்திட்டம் சம்பந்தமாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம். உண்மையிலேயே இந்த 'Clean Sri Lanka' வேலைத்திட்டம் இன்றைய சூழ்நிலையில் முக்கியமானதொரு வேலைத்திட்டமாகும். இவ்வாறான வேலைத்திட்டம் உலக நாடுகள் பலவற்றில் வெற்றிபெற்றிருக்கின்றது. குறிப்பாக, சிங்கப்பூர், மலேசியா போன்ற நாடுகள் இவ்வாறான வேலைத்திட்டத்தினூடாகப் பொருளாதாரத்திலும், அபிவிருத்தியிலும், மக்களுடைய மனநிலையிலும், ஒவ்வொருவரின் தனிப்பட்ட வாழ்க்கையிலும், ஒவ்வொரு கிராமங்களிலும் பாரிய மாற்றத்தைக் கண்டிருக்கின்றன. அவ்வாறான நல்ல எண்ணத்துடன் இந்த 'Clean Sri Lanka' வேலைத்திட்டம் உருவாக்கப்பட்டிருந்தால், இது சிறப்பாக முன்னெடுக்கப்பட்டு, இந்த நாட்டுக்கு நன்மைபயக்க வேண்டுமென நாங்கள் பிரார்த்திக்கின்றோம்.

தற்பொழுது, இந்தச் சபையில் இருக்கின்ற கௌரவ பிரதம அமைச்சர் அவர்கள் நேற்றைய தினம் இந்தச் சபையில் 'Clean Sri Lanka' வேலைத்திட்டத்தின் முக்கியத்துவம் பற்றி விளக்கினார். இருந்தாலும், இன்னும் இது தொடர்பிலான தெளிவான விளக்கம் சாதாரண மக்கள் மத்தியிலும் அரச உத்தியோகத்தர்கள் மத்தியிலும் சென்றடையவில்லை. எனவே, முதலில் அதற்கான வேலைத்திட்டங்களைக் கௌரவ பிரதம அமைச்சர் அவர்களும் இதற்குப் பொறுப்பான அமைச்சர்களும் மேற்கொள்ள வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

சிங்கப்பூர் உட்பட பல நாடுகள் இதுபோன்ற வேலைத்திட்டங்கள் ஊடாக எவ்வாறு வளர்ச்சியடைந்தன என்று பார்த்தால், அவை கிராம மட்டத்திலிருந்து, அதாவது உள்ளூராட்சி மன்றங்களிலிருந்து ஆரம்பித்து அவற்றை முன்னெடுத்துச் சென்றிருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. ஆகையால், இந்த வேலைத்திட்டத்துக்காக உள்ளூராட்சி மன்றங்களை நீங்கள் அதிகளவு பயன்படுத்த முடியும். அவற்றிடம் அதற்கான ஆளணி இருக்கின்றது; machineris இருக்கின்றன. இந்த வேலைத்திட்டம் தொடர்பில் உள்ளூராட்சி மன்ற உத்தியோகத்தர்களைத் தெளிவுபடுத்தி, அவர்களுடைய ஒத்துழைப்போடு ஒவ்வொரு கிராமத்தையும் துப்புரவு செய்ய முடியும்.

இன்று இந்த நாட்டின் பல பகுதிகளிலும் அடிக்கடி வெள்ள அனர்த்தம் ஏற்படுவதற்கு முக்கிய காரணம் அந்தந்தப் பகுதிகளிலுள்ள drainage - வடிகான்கள் சுத்தப்படுத்தப்படாமல் இருப்பதுதான். குறிப்பாக, கிழக்கு மாகாணம் கடந்த இரண்டு மாதங்களாகத் தொடர்ச்சியாக வெள்ளத்தில் மூழ்கி வருகின்றது. ஒருவாறு கொஞ்சம் நிலைமையைச் சீர்செய்யும்போது, மீண்டும் வெள்ளப்பெருக்கு ஏற்படுகின்றது. குறுகிய காலப்பகுதிக்குள் மூன்றாவது தடவையாக அங்கு கடந்த 2-3 நாட்களாக வெள்ளப்பெருக்கு ஏற்பட்டுள்ளது. எதிர்வரும் வாரங்களிலும் மழையுடனான காலநிலை இருக்குமென எதிர்வுகூறப்பட்டுள்ளது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உள்ளூராட்சி மன்றங்களை - local authoritiesஐப் பலப்படுத்தி, அவற்றினூடாக drainageஐ clean பண்ணுவது, tree planting - மரங்களை நாட்டுவது, கிராமங்களை அழகுபடுத்துவது போன்ற ஆரம்பக்கட்ட வேலைகளைச் செய்ய முடியும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 6ක් නේද තිබුණේ?

கடந்த வாரம் இரண்டு - மூன்று நாட்களாகத் தொடர்ச்சியாகப் பெய்த கடும் மழை காரணமாக நேற்றும் இன்றும் அம்பாறையிலுள்ள சேனாநாயக்க சமுத்திரத்தின் வான் கதவுகள் திறக்கப்பட்டுள்ளன. அதனால் அநேகமான வயல் நிலங்கள் அழிவடைந்துள்ளன. ஆயிரக்கணக்கான ஏக்கரில் செய்கை பண்ணப்பட்ட வேளாண்மை, அறுவடைக்கு ஆயத்தமாக இருந்த நிலையில் முழுமையாக வெள்ளத்தில் மூழ்கியிருக்கின்றது. அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை, பொலன்னறுவை ஆகிய நான்கு மாவட்டங்களும் வெள்ளத்தால் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. அங்குள்ள மக்கள் கடும் கஷ்டங்களுக்கு மத்தியில் செய்த விவசாயத்தில் ஏற்பட்டுள்ள பாரிய பாதிப்புகளுக்கு உரிய இழப்பீடுகளை அரசாங்கம் கொடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

நான் முன்னர் குறிப்பிட்டதுபோன்று, Clean Sri Lanka என்பது நல்லதொரு வேலைத்திட்டம்; அதை நாங்கள் வரவேற்கின்றோம். அதற்காக எங்களுடைய முழு ஆதரவையும் ஒத்துழைப்பையும் எந்தவொரு வேறுபாடும் இல்லாமல் தருவதற்கு ஆயத்தமாக இருக்கின்றோம். இது வெறுமனே சுத்திகரிப்பு சார்ந்த ஒரு வேலைத்திட்டமல்ல. ஏனென்றால், ஒரு சிறிய நாடான சிங்கப்பூருக்கே இதுபோன்ற conceptஇன் இலக்கை அடைவதற்கு 25 வருடங்களுக்கு மேலானது. "இந்த நாட்டை மாற்றத்தை நோக்கிக் கொண்டுபோக வேண்டும், மக்கள் மத்தியில் மாற்றம் வரவேண்டும், எல்லாவற்றிலும் clean ஏற்பட வேண்டும், புதிய இலங்கையைக் கட்டியெழுப்ப வேண்டும்" என்ற உணர்வில்தான் மக்கள் உங்களுக்கு வாக்களித்தார்கள். இந்த நாட்டை 76 வருடங்கள் மாறி மாறி ஆட்சி செய்த கட்சிகளைத் தூக்கியெறிந்துவிட்டு, புதியதொரு கட்சியை ஆட்சிக்குக் கொண்டுவந்திருக்கிறார்கள். மக்களுடைய அந்த உணர்வுகளை நாங்கள் மதிக்கின்றோம். அந்த உணர்வுகளுக்கேற்ப, உண்மையிலேயே இந்த மாற்றத்தை அரசாங்கம் அடைய வேண்டுமாக இருந்தால், இந்த வேலைத்திட்டம் தொடர்பில் அரச உத்தியோகத்தர்கள் மத்தியில், குறிப்பாக, பாதுகாப்பு உத்தியோகத்தர்கள், பொலிஸ் உத்தியோகத்தர்கள், ஏனைய துறைகளில் வேலைசெய்கின்ற உத்தியோகத்தர்கள் மத்தியில் அதற்கான மனநிலை ஏற்படுத்தப்பட வேண்டும். உத்தியோகத்தர்களுக்கு அதற்குரிய பயிற்சி வகுப்புகளை நடாத்த வேண்டும்; தெளிவுபடுத்தல்களைச் செய்ய வேண்டும். அதற்காக உள்ளூராட்சி மன்றங்களை முழுமையாகப் பயன்படுத்த வேண்டும். அவ்வாறு செய்தால் மக்களுடைய மனநிலையில் மாற்றத்தைக் கொண்டுவந்து, இந்த வேலைத்திட்டத்தை மிகச்

சிறப்பாகச் செய்ய முடியும். இந்த 'Clean Sri Lanka' வேலைத்திட்டம் மூலம் ஆகக்குறைந்தது 10-15 ஆண்டுகளுக்குள்ளாவது எமது நாட்டைக் கட்டியெழுப்ப முடியுமெனச் சொல்லி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.44]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳව අපේ විපක්ෂයේ ඇතැම් ගරු මන්ත්‍රීවරුන්ගේ අර්ථ කථන දෙස බැලුවාම අපට පෙනෙනවා, ඒක පිළිබඳ ඉතාම පටු අර්ථ කථනවලට එතුමන්ලා යොමු වුණු බව. ඒක ඔවුන් කළේ නොදැන නොවෙයි. එය හිතාමතාම කරපු ආත්ම වංචාවක් බව පෙනෙනවා. විශේෂයෙන්ම Clean Sri Lanka වැඩසටහන තේරුම් ගන්න ඕනෑ නම්, මම කියන්නේ ඇත්ත ජන වරමේ අදහස එතුමන්ලා තේරුම් ගන්න ඕනෑ බවයි. අපට ආසන 159ක ජන වරමක් ලබා දීලා තිබෙනවා. ඒ ජන වරම ඇතුළේ අභිලාෂයක් තිබෙනවා. අන්න ඒ අභිලාෂය සාක්ෂාත් කර ගන්න තමයි අපි, අපේ වැඩසටහන දියත් කරලා තිබෙන්නේ. මේක හරි පැහැදිලි එකක්. ඒ නිසා මේක ත්‍රිරෝද රථයක හෝ බස් රථයක අමතර කෑලි ගලවන එකකට කොටු කරන්න යන්න එපා. එය ඊට එහා ගිය පුළුල් අරමුණක් සහිත චින්තනමය වෙනසක් සහිත වැඩසටහනක් බව කියන්න ඕනෑ.

අපේ අමාත්‍යාංශයට අදාළව ගරු විපක්ෂ නායකතුමාත්, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාත් ප්‍රශ්න දෙකක් නැඟුවා. මට මුලින්ම අහන්න වෙන්නේ, එතුමන්ලා මැරිලා ඉපදුණාද කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දින 60ක ආණ්ඩුවෙන් - අපෙන් - අහනවා, "බලන්නකෝ පාස්පෝට් නිකුත් කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා නේ" කියලා. අපි බලය ගන්නකොට සුහුරුපාය ඉස්සරහ කිලෝමීටර තුනහමාරක පෝලිමක් තිබුණා, පාස්පෝට් එක ගන්න. අද හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා පිළිගත්තා, ඒ පෝලිම නැහැයි කියලා. ඒ කියන්නේ අපි පියවරක් අරගෙන තිබෙනවා. Online පෝලිම ගැන කියනවා. ගරු මන්ත්‍රීතුමා, අපි ඒකට වැඩසටහනක් හදලා තිබෙනවා. එතැන කමිටුවක් තිබෙනවා. කිසියම් කෙනෙකුට හදිසි අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒ කමිටුවට අදාළ ලියවිලි ඉදිරිපත් කළාට පසුව ඔහුට ඒ සහනය ලැබෙනවා. අදටත් ඒක ක්‍රියාත්මක වෙනවා. ඒක හින්දා කිලෝමීටර තුනක පෝලිමක් නැති කරලා, අපි ඒ වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. මේක අපට දායාද වෙච්ච එකක්; ජන වරමක් නොමැති පසුගිය ආණ්ඩුවෙන් අපට දායාද වෙච්ච එකක්. අන්න ඒක මතක තබා ගන්න. දැන් අපි ඒක කරපින්නාගෙන යනවා. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබෙනවා. ඒ නඩුව හෙට කැඳවීමට නියමිතව තිබෙනවා. ඒ නඩුවේ stay order එකක් තිබුණා. ඒ stay order එක දැන් විසුරුවා හැර තිබෙනවා. අභියාචනාධිකරණයේ ඒ නඩුව තිබෙන්නේ. හෙට දවසේ ඒ නඩුව කෙළවරක් වුණොත් අපට තව පියවරකට යන්න පුළුවන්. ඒක තමයි මේ ප්‍රශ්නය පිළිබඳ ඇත්ත තත්ත්වය.

ඊට අමතරව විපක්ෂ නායකතුමා කිව්වා, දැන් කොහොමද, මාර වැඩේ නේ, නීති විරෝධී, ඒ කියන්නේ විෂ මත් ද්‍රව්‍යවලට අදාළ තත්ත්වයන් සහ කප්පම් ගැනීම්වලට අදාළ ගිනි අවි සැහෙන්න සැරිසරනවා නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පොලිස් දෙපාර්තමේන්තුව තිබුණේ කොහොමද? වැඩබලන පොලිස්පතිවරයා මාධ්‍ය සාකච්ඡාවක් කැඳවලා කියනවා මම දැක්කා, "ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි දේශපාලන බලපෑමකින් තොරව අපි සේවය කරන්නේ" කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරු සතුටු වෙන්න, මේ රටේ පොලිස්පතිවරයාගේ ඒ ප්‍රකාශයට. හිටපු පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න කිව්වා, දේශපාලන පත්වීම් විධියට විතරක් OIC පත්වීම් 250ක් ආවා කියලා. එහෙම රටක් මේ. එහෙම තිබුණු පොලිස් දෙපාර්තමේන්තුව අද යන්තම් දේශපාලනීකරණයෙන් තොරව පවත්වා ගෙන තිබෙනවා.

විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්නයට උත්තරයක් පොලිස්පතිවරයා එවලා තිබෙනවා. මේ වසරේ ජනවාරි 12වැනි දා ඉඳලා 20වැනි දා දක්වා වූ දින 9ට විතරක් අපේ මෙහෙයුම්වලදී විෂ මත් ද්‍රව්‍ය වැරදිවලට අදාළ අත්අඩංගුවට ගැනීම් මෙන්ම හෙරොයින්, ගංජා, වෙනත් කියන මත් ද්‍රව්‍යවලට අදාළව කිලෝග්‍රෑම් 5,760ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. නීති විරෝධී ගිනි අවි -මතක තබා ගන්න, හරි අවාසනාවන්ත තත්ත්වයක්- යුද හමුදා කඳවුරකින් විතරක් 78ක් එළියට ගිහිල්ලා තිබෙනවා. ඒවා අත්අඩංගුවට අරගෙන තිබෙනවා, භාගෙට භාගයක්. ටී56 ගිනි අවි 1ක්, පිස්තෝල අවි 3ක්, බෝර 12 ගිනි අවි 3ක්, බෙහෙත් කොටන තුවක්කු 20ක් එක්ක ඔක්කෝම ගිනි අවි 27ක් මේ දවස් 9 තුළ අත්අඩංගුවට ගෙන තිබෙනවා. අපි දන්නවා, දේශපාලනයේම කොටසක් විධියට ගිය පිස්තෝල, තුවක්කු පිළිබඳව. සමහර පිස්තෝල රෑට බුදියනවා, දවල්ට සැරිසරනවා; සමහර පිස්තෝල දවල්ට නිදියනවා, රෑට සැරිසරනවා. ඒවා කාගේද? ඇතැම් දේශපාලනඥයන්ගේ ගෙවල්වල තිබුණු පිස්තෝල, තුවක්කු ප්‍රමාණය ගත්තොත් armoury එකක් විධියට තිබුණේ. ඒක නිසා විපක්ෂ නායකතුමාට මතක් කරන්න ඕනෑ, අපි යම් ගමනක් යන්න ආරම්භ කර තිබෙන බව. පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂයෙන්ම STF එක පාවිච්චි කරලා නීති විරෝධී මත් ද්‍රව්‍යයත්, පාතාලයත් මැඬලන්න අදාළ කටයුතු සකස් කරමින් ඉන්නවා.

ඒ වාගේම මේ ගරු සභාවේදී කියැවුණා, විදුලි මාෆියාවක් ගැන. අපිට මතකයි, ඩලස් අලහප්පෙරුම හිටපු විදුලිබල අමාත්‍යවරයා වරක් කරපු ප්‍රකාශය පිළිබඳව. විදුලි මාෆියාව තිබෙන්නේ කොහේවත් නොවෙයි, දියවන්නාවේ කියලායි කිව්වේ. අද ඔබතුමන්ලා සතුටු වෙන්න. මේගොල්ලන් මොනවාද මේ කියන්නේ? එදා මහජන උපයෝගිතා කොමිසමේ සභාපති ජනක රත්නායක තීන්දුවක් ගත්තාට පස්සේ දෝෂාභියෝගයක් ගෙනාපු පාර්ලිමේන්තුවක් මේ. දෝෂාභියෝගයක් ගෙනාවේ. අද මහජන උපයෝගිතා කොමිසම තීන්දුවක් අරගෙන තිබෙනවා. අපි ඒ තීන්දුවට ගරු කරන ආණ්ඩුවක්. අද අපි එහෙම කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා විපක්ෂය සතුටු වෙන්න, මෙහෙම ආණ්ඩුවක් තිබෙන එකට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ෆයිසර් මුස්තාපා මැතිතුමා කිව්වා, මහජනයාට - පුරවැසියෙකුට - යන්න පුළුවන් උසාවියක් හදන්න කියලා. අද තමයි එහෙම කිව්වේ. කවුද මේ කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට ගල් ගහපු රටක්, මේ. ඊට පස්සේ අපි දැක්කා, රනිල් වික්‍රමසිංහලා මේ ගරු සභාවට ඇවිල්ලා උසාවියට කෝචොක් කරන හැටි. අධිකරණ බලය තිබෙන්නේ අධිකරණයේ නොවෙයි, පාර්ලිමේන්තුවේ කිය කියා කයිවාරු ගැහුවා, බලපෑමක් ඇති වෙන්න. මේ ඉස්සරහා පෙළේ හිටපු මහත්තයාගේ

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

තාත්තායි, බාප්පයි ඔවුන්ට පක්ෂව තීන්දුව දුන්නේ නැහැ කියලා ශිරානි බණ්ඩාරනායක මහත්මියට ලෝගුව ගන්න තමන්ගේ නිල මැදිරියට යන්න දුන්නේ නැහැ. එහෙම ඉඩ දුන්නේ නැති මහත්වරුන් මොහාන්ව ගෙනැල්ලා බෞතීස්ම කළා, ශ්‍රේෂ්ඨාධිකරණ පුටුවේ. එහෙම කට්ටිය අද ප්‍රජාතන්ත්‍රවාදයයි, නීතියේ බලයයි පිළිබඳව කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආන්දෝලනාත්මක තීන්දුවක් ඇවිල්ලා තිබෙනවා. ඒ තමයි SC FR No. 35/2024 දරන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව. එක්තරා විනිශ්චයකාරවරයෙකුගේ; අභියාචනාධිකරණ සභාපතිවරයාගේ ක්‍රියා කලාපය සම්බන්ධව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. අද අපි ඒ තීන්දුවට අනුගතව කටයුතු කර තිබෙනවා. මොකක්ද, ඒ තීන්දුවේ කියන්නේ? I quote:

> "….a judicial officer if unsuitable, should be expelled from service……"

Judicial officer කෙනෙක්, corrupt වෙනවා නම් ඒ කෙනාව ඒකෙන් අයින් කරන්න ඕනෑ කියනවා. ඊට පසුව මොකක්ද කියා තිබෙන්නේ?

> "Then in the first place, such person would not be a sitting judge. Secondly, for the Constitutional Council to refrain from approving a nomination of such a person on such basis,...."

අද අපි ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවටත් - රනිල් වික්‍රමසිංහලා මොනවාද කළේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීන්දුවට පටහැනිව Supreme Court එකට එක්තරා විනිශ්චයකාරවරයෙකු නම් කළා. එසේ නම් කළාට පසුව ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වුණා. ඒකෙන් මුළු රටම කැලඹුණා; මුළු අධිකරණ ක්ෂේත්‍රයම කැලඹුණා. නමුත් අද වනවිට වර්තමාන රජය, අධිකරණ අමාත්‍යවරයා හරි ලස්සනට තීන්දු තීරණ ගනිමින් යනවා, ඒ තීන්දුවට අනුගතව. අද ඒ විනිශ්චයකාරවරයා එහෙම සිටියදී සුදුසු විනිශ්චයකාරවරු 4 දෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. අභියාචනාධිකරණ විනිශ්චයකාරවරු සුදුසුකම් මත පත් වෙනවා. අද කවුරුත් සතුටුයි, මේ අධිකරණ system එක ගැන; අධිකරණ ක්‍රමය ගැන. එක මන්ත්‍රීවරයෙක් අධිකරණවල නඩු ප්‍රමාදය පිළිබඳව ඇහුවා. ඒ පිළිබඳව සලකා බලා ඒවාටත් සැලසුම් සකස් කරනවා. ඉස්සෙල්ලා හොඳ උසාවියක් හදා ගන්න ඕනෑ. එසේ හොඳ උසාවියක් හදා ගන්න එකට අදාළව ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ආදර්ශයක් දීලා තිබෙනවා. ඒ තමයි ඉතිහාසයේ ප්‍රථම වතාවට සුදුසුකම් සහිත විනිශ්චයකාරවරයාට ඒ තැන දීලා තිබීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී ගොඩක් දෙනා කථා වුණා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතින් පරිප්පු කාපු පක්ෂයක් ඉන්නවා නම් ඒ අපි තමයි වැඩියෙන්ම. අපි ඒකේ තිබෙන දිග, පළල ආදී සියල්ල හඳුනනවා. අපි දන්නවා, ඊයේ රාත්‍රියේ ජනාධිපතිවරයා හරි පැහැදිලිව ප්‍රකාශයක් කළා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත කඩිනමින් අහෝසි කරනවා, ඒකට කැබිනට් අනුකමිටුවක් පත් කර තිබෙනවා, ඒ කැබිනට් අනුකමිටුවේ නිර්දේශ පදනම් කරගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අපි අහෝසි කරනවා කියා. ඒක අපි පැහැදිලිවම කියා තිබෙනවා. මේගොල්ලන් ඒක දන්නවා. එහෙම දැන ගෙනත් තමයි මේවා කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Clean Sri Lanka වැඩ පිළිවෙළ හරහා අපි ආණ්ඩුවක් විධියට ඊට අදාළ මැදිහත්වීම කර තිබෙනවා. සමහරු කියනවා, මේකේ අර්ථකථනය හොඳ නැහැ; ගැසට් එකට අනුව මේකට නීතියේ බලය නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි භාවිතාවෙන් කටයුතු කරන්නේ. එහෙම නැතුව කයිවාරුවෙන් නොවෙයි. අපි භාවිතාවෙන් ඊට අදාළ මැදිහත්වීම් කරන පක්ෂයක්. ඒ අනුව මහජනයාගේ අරමුණට පක්ෂව අපි වැඩ කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී විශේෂයෙන්ම කොලොන්නාවේ ප්‍රශ්නයක් ගැන කථා කළා. ඒක මම වෙන ගැටලුවක් විධියටයි මෙතැනදී දැන් මතු කරන්නේ. කොලොන්නාව ආසනයේ තිබෙන මහජන ආයතන දෙකට අදාළව ඉතා විකෘතිසහගත ප්‍රශ්නයක් මරික්කාර් මහත්මයා ඇහුවා. අධිකරණ නියෝගයක් තිබෙනවා, එම ප්‍රදේශයේ යම් බිම් කඩක වෙසෙන ජනයා ඉවත් කරන්න කියලා. ඒක අපේ කාලයේ ලබා දුන් තීන්දුවක් නොවෙයි. ඒ අධිකරණ තීන්දුව අපේ ආණ්ඩුවට කලින් පැවැති ආණ්ඩුව කාලයේ දුන් තීරණයක්. ඒ තීරණය පදනම් කරගෙන මේ සභාව නොමඟ යවන අදහසක් ප්‍රකාශ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි වගකීමෙන් කියන්නම්. ඒක අධිකරණ තීන්දුවක් මත ඉවත් වෙච්ච එකක්. ඒක ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී එරංග ගුණසේකර නියෝජ්‍ය අමාත්‍යවරයා හිටපු වෙලාවේදී සාකච්ඡා වුණු දෙයක්. අපි මරික්කාර් මන්ත්‍රීතුමාට කියනවා, ඒ සාකච්ඡා වුණු දේ අපි ඒ විධියටම ඉෂ්ට කරන්නම් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අපට ආණ්ඩුවක් විධියට තේරුම් ගන්න පුළුවන්, එහෙම ඉවත් කිරීමක් වුණාම වෙන තැනක් නැත්නම් යන්න තැනක් නැහැ කියලා. ඒක එතුමා කියන්න ඕනෑ නැහැ. අපි දන්නවා, ඇතැම් මාර්ගවල වෙළහෙළදාමක් කරගෙන එදිනෙදා ජීවත් වෙන මිනිස්සු එතැනින් ඉවත් කළාට පස්සේ ජීවනෝපාය නැති වෙනවා කියලා. නමුත් අපි ඔවුන් වෙනුවෙන් සම්බන්ධීකරණ කමිටුවලදී කථා කරලා, මධ්‍යම පරිසර අධිකාරියත් එක්ක සාකච්ඡා කරලා, ජාතික නිවාස සංවර්ධන අධිකාරියත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. ඒ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් විධියට අපි සහතිකයක් දෙනවා, පදික වේදිකාවල වෙළඳාම් කරන ඒ වෙළඳ මහත්වරුනුත් ඒ වාගේම ඔය මීතොටමුල්ල කුණු කන්ද ආශ්‍රිතව ඉවත් කරන අයවත් අපි පාරට ඇදලා දාන්නේ නැහැ කියලා. ඊට අදාළව ජාතික නිවාස සංවර්ධන අධිකාරියත් එක්ක සාකච්ඡා කරලා ස්ථිර විසඳුමක් දීලා තමයි අපි නතර වෙන්නේ. ඒක නිසා මරික්කාර් මන්ත්‍රීතුමාට ඔය පදය හෙට මේ සභාවේ කියන්න වෙන්නේ නැහැ කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.58]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, මට කාලය ලබා දීම පිළිබඳව.

Clean Sri Lanka සංකල්පය, concept එක ඉතා හොඳයි. අපේ රට සුද්ද කරන්න ඕනෑ, clean කරන්න ඕනෑ. අපි දැක්කා ඉන්දියාවේ මෝදි අගමැතිතුමා "Clean India" පටන් ගත්තා. ඒකේ අදියර ගණනාවක් තිබුණා. Sanitation පැත්ත ගැන අවධානය යොමු කළා. සිංගප්පූරුවේත් මේ දේ කළා. ඒ වාගේම

මේ රටේ ජනතාවත්, අපිත් බලාපොරොත්තු වෙනවා, සුන්දර රටක්, පිරිසිදු රටක්, clean වෙච්ච රටක් ගොඩ නැඟෙන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහිදී අපි විශේෂයෙන් අවධානය යොමු කරන්නේ දූෂණය, වංචාව, අක්‍රමිකතා, නාස්තිය නැති රටක් ගොඩනඟන්න මේ ආණ්ඩුව කොහොමද කටයුතු කරන්නේ කියන එක ගැනයි. ඒක අපේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු දෙයක්. මේ ආණ්ඩුවට මෙච්චර ජන වරමක් ලැබුණෙත් දූෂිතයන් අල්ලලා නීතිය ක්‍රියාත්මක කරලා, ඒ වංචනිකයන් උපයා ගත් ධනය නැවත වතාවක් රටේ ජනතාවට ලබා දීලා, ඒ වාගේම නාස්තිය අවම කරලා, ඒකෙන් ලැබෙන ප්‍රයෝජනය රටේ ජනතාවට ලබා දීලා, තෙල් මිල අඩු වෙයි; විදුලි බිල අඩු වෙයි; VAT එක අඩු වෙයි; අධ්‍යාපනයට, සෞඛ්‍යයට ගහලා තිබෙන VAT එක අයින් කරයි; අපේ ධීවර ජනතාවට ඉන්ධන සහනාධාරය ලැබෙයි කියලා. ඒ බලාපොරොත්තුව රටේ ජනතාව තියාගෙන තමයි මේ රට clean කරන්න වර්තමාන රජයට බලය දුන්නේ.

අපි විශ්වාස කරනවා, මේ Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ අන්න ඒ දේවල්වලට ප්‍රමුඛස්ථානය ලබා දෙයි කියලා. අපි දකිනවා, බස්වල, ත්‍රිරෝද රථවල තිබෙන ස්ටිකර් ගලවනවා; බෝඩ් ගලවනවා. ඒක හොඳයි. එහෙම ගලවනවා ඇත්තේ මගීන්ගේ ආරක්ෂාවට වෙන්න ඇති. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගීන් ආරක්ෂිතව, සුරක්ෂිතව පොදු ප්‍රවාහන සේවයේ තමන්ගේ ගමනාන්තය දක්වා යා යුතුයි. ඒක හොඳයි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දවසක් හැර දවසක් අහිංසක මිනිහෙකුගේ ජීවිතයක් අහිමි වෙනවා, විශේෂයෙන් බස් රථ අනතුරු නිසා. ඒ වාගේම වසරක් තුළ අවම වශයෙන් මගීන් 13දෙනෙකුවත් බස් එකෙන් වැටිලා, footboard එකෙන් වැටිලා මරණයට පත් වෙනවා.

2024 වර්ෂය ගත්තොත්, බස් රථ අනතුරු 4,919ක් සිදු වෙලා තිබෙනවා. ඒවායේදී ජීවිත හානි 320ක් සිදු වෙලා තිබෙනවා. එය සියයට 15කට ආසන්න ප්‍රමාණයක්. 2020 ඉඳන් 2024 වෙනකල් ගත්තොත්, 12,140ක් මහා මාර්ග අනතුරු වෙලා තිබෙනවා. ඒ වාගේම අවුරුද්දකට මරණ 2,321 සිට 2,557ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම SLTB බස්වලින් මරණ 50ක්, ප්‍රයිවට් බස්වලින් මරණ 152ක් හා බස් රථ අනතුරු 198කට ආසන්න ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි අපේ මගීන්ගේ ආරක්ෂාව තකා නම් මේ කියන ස්ටිකර් ටික ගලවන්නේ, බෝඩ් ලෑලි ටික ගලවන්නේ, අනතුරුවලින් ජනතාව ජීවිතක්ෂයට පත්වීම වළක්වාලන්නට අවශ්‍ය කරන වැඩ පිළිවෙළත් රජය ක්‍රියාත්මක කරන්න ඕනෑ. උදාහරණයක් ලෙස ගත්තොත්, දැන් බස් රථවල පර්මිට් එකේ නම මාරු කරන්න බැහැ. එම නිසා කලින් අයිතිය තිබුණු මනුස්සයාගේ පර්මිට් එකෙන්ම තමයි ධාවනය කරන්නේ. දැන් SLTB එකේ බස් රථ සියයට 40ක් ධාවනය කරනවා නම්, සියයට 60ක් ප්‍රයිවට් බස් රථ ධාවනය කරන්න ඕනෑ. Expressway එකේ නම් සියයට 50:50යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගැබිනි මාතාවන්ට අපේ රටේ බස් රථ ද ඇතුළුව පොදු ප්‍රවාහන සේවයේ යන්න පුළුවන් ද? මේ බස් රථවල quality assurance එකක් තිබෙනවා ද? ඒ වාගේම, ආබාධිත පුද්ගලයන්ට මේ බස් රථ ද ඇතුළුව පොදු ප්‍රවාහන සේවයේ ගමන් කරන්න පුළුවන් ද? එය කොයි තරම් අනාරක්ෂිත ද? බස් රථ ඇතුළු පොදු ප්‍රවාහන සේවයේදී කාන්තාවන් මොන තරම් නම් අසීරුතාවට, අපයෝජනයට ලක් වෙනවා ද? මම ඒ වචනය කියන්නේ නැහැ. බස් රථවල යන අය එය දන්නවා. බස් රථවල යන අය දන්නවා, කාන්තාවන්ට පොදු ප්‍රවාහනයේදී වෙන දේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියන්නේ clean කරනවා නම් මේ සියල්ල clean විය යුතුය කියලායි. එහෙම නැතිව "Clean suit, empty pocket" වාගේ තත්ත්වයකට, මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන වාහනවල කෑලි ටිකක් එහෙන් මෙහෙන් ගලවලා, "Clean Sri Lanka" කියලා බෝඩ් ලෑල්ලක් ගහලා හරියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කුණු කසළ ගැන කථා කරන කොට කිව යුතු දෙයක් තිබෙනවා. මගේ ආසනය වන මීගමුවේ කොච්චිකඩේ අද දැවැන්ත කුණු කන්දක් තිබෙනවා. එතැන ශුද්ධ පවිත්‍ර කරන්න ඕනෑ. ඒ වාගේම, වත්තල දැවැන්ත කුණු කන්දක් තිබෙනවා, ගරු බිමල් රත්නායක ඇමතිතුමනි. ඒ ස්ථානයත් ශුද්ධ පවිත්‍ර කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, දවසකට, දෙකකට කානුවක් දෙකක් ශුද්ධ කරලා හරියන්නේ නැහැ. නිසි වැඩ පිළිවෙළක් හදන්න. ගරු බිමල් රත්නායක මැතිතුමනි, නිසි වැඩ පිළිවෙළක් හදලා ඒක ක්‍රියාත්මක කරන්න; system එකක් හදන්න. අපි පාරවල්, කානු, බෝක්කු, ශුද්ධ පවිත්‍ර කරන්නේ කොහොමද, ඩෙංගු මර්දනය කරන්නේ කොහොමද, එතැනින් එහාට ගිහින් දූෂණය, වංචාව, අක්‍රමිකතා පිටු දකින්නේ කොහොමද කියන කාරණා පිළිබඳව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

ඔබතුමන්ලා දැන් බලයට ඇවිල්ලා ඉන්නවා. විපක්ෂයේ අපි අද දූෂණය, වංචාව ගැන කථා කරනවා. රේගුවේ නිලධාරින් කියනවා, බහලු 323ක් පැය දෙකක් ඇතුළත Red Channel එකේත්, Amber Channel එකේත් යවන්නේ නැතිව Green Channel එකේ අත් හැර දාලා තිබෙනවා කියලා. මේක අපේ රටේ ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක්. මේකෙන් අපේ රටේ බදු ගෙවන ජනතාවගේ බදු මුදල් වංචා වෙලා තිබෙනවා. කෝටි ගණනක වංචාවක් වෙලා තිබෙනවා. මොනවාද ඒවායේ තිබුණේ; සල්ලි ද, කුඩු ද, එහෙම නැත්නම් ආයුධ ද කියන එක පිළිබඳව කවුරුවත් දන්නේ නැහැ. අද මේ රටේ රේගු නිලධාරින් ඒ පිළිබඳව හෙළිදරව්වක් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රට clean කරනවා නම් මේවායෙනුත් රට clean කරන්න කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න, මේ ගරු මන්ත්‍රීතුමා විශේෂයෙන් මතු කරපු කාරණයක් ගැන කියන්න.

මම කියන්නේ, බහලු 323ක් Green Channel එක හරහා නිදහස් කිරීම පිළිබඳවයි. අද උදේ සිටම මෙය විශාල ප්‍රවෘත්තියක් ලෙස මතු කරමින්, සමාජ මාධ්‍ය හරහා පවා සමාජයේ වැරදි මතයක් හදන්න උත්සාහ කළා. ඔව්, බහලු 323ක් නිදහස් කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් වෘත්තීය සමිති එම නිවේදන නිකුත් කළාට පසුව, අප ක්ෂණිකවම කරපු කාර්යය තමයි ඊයේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ වෘත්තීය සමිති නියෝජිතයන් ගෙන්වා සාකච්ඡාවක් පවත්වපු එක. ඒ සාකච්ඡාවට මමත් සම්බන්ධ වුණා. එවැනි දෙයක් සිදු වී තිබෙනවා නම්, ඒ කන්ටේනර් පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා නම් ඊට අදාළව පරීක්ෂණයක් කරන බව අපි කිව්වා. ඒ සහතිකය ලබා දෙමින් අප කිව්වේ ඒ වෘත්තීය සමිතිවලට රේගුවේ නිෂ්කාසන කටයුතු හරියාකාරව කරන්න මැදිහත් වන ලෙසයි. අපි ඒ ප්‍රශ්නය විසඳුවා.

ඒත් එක්කම මා සඳහන් කරන්න ඕනෑ, කලිනුත් බහලුම් නිදහස් කිරීමේදී රේගුව තුළ තදබදයන් නිර්මාණය වී තිබෙන බව. අපි කවුරුත් දන්නවා, මෙතැන හෙමින් හෙමින් විසඳා ගත යුතු

[ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා]

ප්‍රශ්නයක් තිබෙන බව. හැබැයි මීට කලිනුත් ඒ සඳහා අදාළ කමිටු පත් කරලා, කැබිනට් අනුමැතිය ලබා දීලා රේගුවේ ඉන්න නිලධාරීන් ඒ කමිටු හරහා මැදිහත් වෙලා ඔවුන්ට සුදුසු ක්‍රමවේද අනුගමනය කරමින් මේ විධියට බහලුම් නිදහස් කර තිබෙනවා. ඒ ක්‍රමවේද අනුගමනය කළ සමහර අවස්ථාවලදී එම red tag එක ගහන ඒවා scan කරලා යවපු අවස්ථා ද තිබිලා තියෙනවා. ඒ වාගේම, අතීතයේදී එහෙම red tags ගහන්නේ නැතුව Green Channel එකේම ගිය ඒවාත් තිබිලා තියෙනවා. හැබැයි අපි දන්නේ නැහැ, ඒ පිළිබඳව පරීක්ෂණ සිද්ධ වුණා ද කියලා. දත්ත විධියට ඉදිරිපත් කරනවා නම් මීට පෙර අවස්ථා 7කදී මෙසේ කර තිබෙනවා. විශේෂයෙන් 2024.07.25වැනි දා මෙවැනි කන්ටේනර් 584ක් නිදහස් වෙලා තිබෙනවා. ඊට අදාළව රේගුවෙන් ලබා දුන් වාර්තාව මේ පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා මම සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

අපේ පැත්තෙන් පරීක්ෂණය කරන බව කියන ගමන්ම මෙහිදී මා පෙන්නුම් කරන කාරණය මේකයි. ඒ නිදහස් වෙච්ච කන්ටේනර් 323 සම්බන්ධයෙන් සඳහන් කරන්නේ Green Channel එක හරහා ගිය ඒවා නොව, red tags ගහපු, නමුත් තදබදය වළක්වා ගැනීම සඳහා scan කරලා ගිය ඒවා කියන අදහසයි. ඒ තොරතුරු ඔක්කෝම තිබෙනවා. අපි ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදු කරනවා කියන කාරණයත් මා සඳහන් කරනවා. වැරදි ආකාරයට සමාජයේ කලබල ඇති කිරීමට තොරතුරු ඉදිරිපත් කරන එක නුසුදුසුයි කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, මගෙන් අහන්න, මම කියන්නම්. We will allow you.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Just a clarification. ගරු ඇමතිතුමනි, මේ trade union එක ඉදිරිපත් කරලා තිබෙන කරුණු අනුව ඒ බහලුම් 323 scan කරලා එළියට දාලා තිබෙනවා කියා ඔබතුමා කිව්වා. මට දැනගන්න ඕනෑ, ඒ බහලුම්වල තිබුණේ මොනවාද කියන එක රජයෙන් හඳුනාගෙන තිබෙනවා ද, ඒ ගැන අවධානයක් තිබෙනවා ද කියලා. ඒවා නැවත කැඳවීමක් කරලා, ඒවායේ බදු මුදල් ගෙවලා ආයෙත් ඒවා මුදා හරින්නේ නිසි පරීක්ෂණයකින් ද කියලාත්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලාත් මම දැනගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
රේගුවෙන් ලබා දුන්නු තොරතුරු අනුව, අදාළ බදු මුදල් අය කරගෙන තමයි එය කරලා තිබෙන්නේ. හැබැයි දැන් යම් පැමිණිල්ලක් ඉදිරිපත් වෙලා තිබෙන නිසා මා කලිනුත් සඳහන් කළ පරිදි මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරනවා කියන කාරණය සඳහන් කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු සභානායකතුමා.

[අ.භා. 5.09]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට අවස්ථාව ලබා දුන්නාට. මට තිබුණු වෙලාව අඩු වෙලාත් තිබෙනවා. කමක් නැහැ.

පළමුවැනිම කාරණය මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම විවාදය අවසන් කිරීම සඳහා පිළිතුරු කථාව මෙතැනින් පටන් ගන්න කැමතියි. සමගි ජන බලවේගය කියන පක්ෂය සහාය දෙන්නේ රාජපක්ෂ රෙජිමයට ද, රනිල් වික්‍රමසිංහ රෙජිමයට ද, නැත්නම් මේ පුන පුනා කියන Clean Sri Lanka වැඩ පිළිවෙළට ද? මොකද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජබය මේ දවස්වල රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමඟ එකතු වෙන්න සාකච්ඡා කරනවා. ඒ රනිල් වික්‍රමසිංහ කරපු දේශපාලන, ආර්ථික අපරාධ නිසා තමයි, මේ රටේ ජනතාව රනිල්වත් ගෙදර යවලා -හෝදලා යවලා- අප ඉල්ලන්නේත් නැතුවත් මන්ත්‍රීවරුන් 159දෙනෙකු එවලා තිබෙන්නේ. දිනන බව දැනගෙන හිටියාට අපි එච්චර ඉල්ලුවේ නැහැ. ඔබතුමන්ලා දැන් ඒ අපරාධකාර, මේ රට විනාශ කරපු ඒ රනිල්ගේ රෙජිමයත් එක්ක ඔබතුමන්ලා කරන සාකච්ඡාව මොකක්ද? එසේ සාකච්ඡා කරන ගමන් මෙතැනට ඇවිල්ලා Clean Sri Lanka වැඩසටහනට සහයෝගය දෙනවා කියන්නේ මොකක්ද? ඔබතුමන්ලාගේ කථා එකතු කරලා ඒ කථාවල text එක වෙන වෙනම columns දෙකකට දාලා බලන්න. මේ text එකට විරුද්ධයි ඊළඟ text එක. මා කියන්නේ භාෂාව පිළිබඳ විශේෂඥ ඥානය තිබෙන කෙනෙකු ලවා ඒක deconstruct කරලා බලන්න කියලායි. ඒවායේ කිසිම පදනමක් නැහැ. ඔබතුමන්ලා රාජපක්ෂලාත් එක්කත් ඉන්නවා.

ඔබතුමන්ලා දන්නවා, මේ රටේ මහ ජනතාව අපට ජනවරමක් දීලා තිබෙන බව. මෙහිදී ඔබතුමන්ලා පවා කැමැති දෙයක්

තිබෙනවා. ඔබතුමන්ලාත් ඒ කාලයේ විරුද්ධ පක්ෂයේ හිටියේ, රාජපක්ෂලාට විරුද්ධව. රනිල් වික්‍රමසිංහ රෙජිමයත් රාජපක්ෂ රෙජිමයෙන් ආපු by-product එකක්. රාජපක්ෂලා -ඒ රෙජිමය- මේ රටේ මහජන මුදල් අසීමාන්තිකව මංකොල්ල කෑවා කියන එක ඔබතුමන්ලා දන්නවා. ලංකාවේ ප්‍රධාන මන්දිර තුනම අදත් පාවිච්චි කරන්නේ කවුද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? රාජපක්ෂලා. අදත් ජනාධිපති ආරක්ෂකයන් වැඩි ප්‍රමාණයක් ඉන්නේ කාටද? අද අපි පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කළා. ශ්‍රාවස්තිය කියලා මොකක්දෝ තැනක් තිබෙනවා, පාර්ලිමේන්තුවට ද කොහේදෝ අයිති. අද කවුද ඒකේ ඉන්නේ? ජනාධිපති ආරක්ෂකයෝ. ඒ කවුරු දාපු අය ද? අපට ඒ නිලධාරින් එක්ක ප්‍රශ්නයක් නැහැ. කොළඹ තිබෙන ප්‍රධාන මන්දිර සියල්ලේම ඉන්නේ ජනාධිපති ආරක්ෂයන් සහ රාජපක්ෂලා. රුපියල් කෝටි 45ක කාපට් ආදි අනම් මනම් ගෙනාවා, යෝෂිත රාජපක්ෂගේ SMSවලින්. එහෙම විනාශයන් කරපු රාජපක්ෂගේ ගෙදරට එක්කෝ, රුපියල් ලක්ෂ 46ක කුලිය දෙන්න ඕනෑ. අපි ඉතා smart විධියට කටයුතු කරලා තිබෙන්නේ. එක්කෝ කුලිය දෙන්න. එහෙම නැත්නම් රුපියල් 30,000 අරගෙන යන්න. දැන් අපේ අම්මලා තාත්තලා බලාගන්නේ කවුද? මේ රටේ දුප්පත් මිනිසුන්ගේ අම්මලා තාත්තලා බලාගන්නේ කවුද? ඇයි, දුප්පත් මිනිස්සු, සාමාන්‍ය ජනතාව, සිවිල් සේවකයන්, හමුදාවේ අය, පොලීසියේ අය, සාමාන්‍ය ගුරුවරු රටට සේවයක් කරන්නේ නැද්ද? හිටපු ජනාධිපතිවරු විතරද රටට සේවය කරන්නේ? විපක්ෂයේ කිහිපදෙනෙක්ම අද කථා කළා රාජපක්ෂලා ගෙදරින් එළියට ඇදලා දානවා කියලා. මම මේ සජබෙට කියන්නේ. පොහොට්ටුවේ කවුරුවත් මෙතැන ඉන්නවාද? මම හිතනවා නැහැ කියලා. හැඳි ගෑවෙන්න යැව්ව නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් තුන්දෙනායි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඒකයි ප්‍රශ්න කරන්නේ. මේ ප්‍රධාන විපක්ෂය රාජපක්ෂත් එක්ක හිටගන්නවා; රනිල් එක්ක සාකච්ඡා කරනවා; Clean Sri Lanka වැඩසටහනට උදව් කරනවා ලු. ඔබතුමන්ලාට සඳහටම ඔහොම තමයි ඉන්න වෙන්නේ. සඳහටම ඒක මතක තියාගන්න. ඔබතුමන්ලා හිතන්නේ වංචාව, වංචනික බව කියන වචන ජනතාවට තේරෙන්නේ නැහැ කියලාද? මිනිස්සුන්ට වචන තේරෙනවා; body language එක තේරෙනවා; හැඟීම් තේරෙනවා. ඒ නිසා මේ දේශපාලනය තුළ ඔබතුමන්ලාට කවදාවත් මේ රටේ ජනතාව දිනාගන්න බැහැ. මිනිස්සු පෙන්වපු මාවතක් තිබෙනවා. අපි පිළිගන්නවා, අපේ කථානායකවරයෙකුගේ අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධ සහතිකයක් අවශ්‍ය මොහොතේ ඉදිරිපත් කිරීමට බැරි වීම නිසා මේ රටේ ජනතාව ඉල්ලීමක් කළා. මේ රටේ ජනතාව සදාචාර බලයක් - moral power එකක් - ගොඩ නඟලා තිබෙන්නේ, කාටවත් හෙළවෙන්න බැහැ. අපට පවා හෙළවන්න බැහැ. ඒක moral power එකක්. ඒක political, social විතරක් නොවෙයි, moral power එකක්. අපට පවා සිද්ධ වුණා අවනත වෙන්න. අපි මෙතරම් විනයගරුකව, මෙතරම් සදාචාරසම්පන්නව ඇත්ත ජීවිතයේදීත් කටයුතු කරනවා. අපි රඟපානවා නොවෙයි, pretend කරනවා නොවෙයි. එහෙම කටයුතු කරද්දීත් අපට සිද්ධ වුණා, අපේ හිටපු කථානායකතුමාගේ අධ්‍යාපන සහතිකයක් ඉදිරිපත් කරගන්න බැරිවෙච්ච නිසා එතුමා තනතුරෙන් අයින් කරගන්න. ඔබතුමන්ලා හිතනවාද, ඔබතුමන්ලා රාජපක්ෂලා එක්ක, රනිල් එක්ක එකට හිටගන්න ගමන්, රාජපක්ෂලා ගෙවල්වලින් එළියට ඇදලා දානවා කියලා මෙතැන කිව්වාට රටේ ජනතාව ඔබතුමන්ලා අනුමත කරනවා කියලා? Sorry. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජබය කියන්න ඕනෑ කාටද සහාය දෙන්නේ කියන එක. රනිල්ටද, මහින්ද රාජපක්ෂටද, නැත්නම් ජනතාවටද? ඒක නොකිව්වා කියලා අපට ප්‍රශ්නයක් නැහැ. ඒක එතුමන්ලාගේ දෙයක්.

දෙවැනි කරුණ මේකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මුළු විවාදය තුළම මොකක්ද තිබුණේ? මේක mock කරන්න තමයි හැදුවේ. Singaporeවල, USAවල, Chinaවල මේ වාගේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. ලෝකයේ හැම රටක්ම නිදහස් අරගළවලින් ඉස්සරහට එනකොට ඒ විධියට තමයි කටයුතු කරන්නේ. 1948 ඉඳලා බලන්න. දෙවැනි ලෝක යුද්ධයෙන් පස්සේ රටවල් නිදහස් වෙනකොට හැම රටකම මේ වාගේ ව්‍යාපෘති සිය ගණනක් කරලා තිබෙනවා. එකම එක මන්ත්‍රීවරයෙක්, මමට මතක විධියට හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා,- regional පක්ෂවල මන්ත්‍රීතුමන්ලා - කථා කරද්දී මට හොඳට තේරුණා, ඒගොල්ලන් මේ Clean Sri Lanka වැඩසටහනට basically කැමැතියි කියා. ඉලංගෛයි තමිල් අරසු කච්චි පක්ෂයේ (Dr.) Sathiyalingam මන්ත්‍රීතුමා කිව්වා, මේ වැඩසටහන දිගටම යන්න ඕනෑ කියලා. ඒ වාගේම තමයි හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. එතුමාගේ දේශපාලනය සම්බන්ධ වෙන ගැටලු තිබෙන්න පුළුවන්. නමුත් එතුමා කිව්වා, Singaporeවල 25 years මෙවැනි වැඩසටහන් ගියා කියලා. දැන් අපට මොකක්ද කියන්නේ? සමහරු හිතාගෙන ඉන්නේ මේක ශ්‍රමදාන project එකක් කියලා. එහෙම කියලා මේක mock කරනවා. මම දන්නේ නැහැ මේක හදපු අය සිංගප්පූරුවේ දේවල් අධ්‍යයනය කළාද, නැත්නම් ඇලස්කාවේ දේවල් අධ්‍යයනය කළාද කියලා. එහෙම කළාට ප්‍රශ්නයකුත් නැහැ. නමුත්, මගේ පක්ෂය වෙනුවෙන් මම දන්න දේ මේකයි. මේක අපි කණ්ඩායමක් වශයෙන් කරපු දෙයක්; ජනාධිපතිතුමා වැඩිපුර උනන්දුවෙන් කරපු දෙයක්. මේ රට පුනරුද ව්‍යාපාරයකින් ඉස්සරහට එනකොට, සිංගප්පූරුවල අත්දැකීම් ගත්තත් නැතත්, මේක automatically එන දෙයක්.

මේ රටේ මිනිස්සුන්ට මේ රට හදා ගන්න ඕනෑ නිසා නේ අපට ඡන්දය දුන්නේ. අපි කළේ ඒ අභිලාෂයට නමක් දැමීම පමණයි. මේක සිංගප්පූරුවෙන් ගත්තා නොවෙයි. මේක mock කරන්න නේ මෙහෙම කියන්නේ. මේක, සිංප්පූරුවල කොපියක් කියනවා. අපට ඒවා තේරෙන්නේ නැහැ, අපි බබාලා! මම අහන්න කැමැතියි, "Clean Singapore" Project එක කියවපු කෙනෙක් මෙතැන ඉන්නවාද කියලා. Singapore ගැන USA ගැන ගොඩක් දේවල් කිව්වා. ඒවා මෙතැන ඉන්න එක්කෙනෙක්වත් කියවලා තිබෙනවාද? අද එක්කෙනෙක් කිව්වා, "ට්‍රම්ප් ජනාධිපතිතුමාගෙන් ඉගෙන ගන්න, එතුමා එක පෑන් පහරින් කළා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා දන්නවා, American Law එක වෙනස්. ට්‍රම්ප් ජනාධිපතිතුමා ඡන්දෙ දිනුවේ, 2024 නොවැම්බර් 05වැනි දා. එතුමා වැඩ භාර ගත්තේ දිනලා දින 75කට පස්සේ මේ ජනවාරි 21වැනි දා. USA Constitution එක අනුව transition period එකක් තිබෙනවා. ඒ transition period එක තුළ තමන්ගේ team එක නම් කරනවා. ඊළඟ විදේශ ඇමති, ඊළඟ රාජ්‍ය ලේකම්, ඊළඟ Health Director වාගේ ඔක්කෝම පත් කරනවා. ඒ team එක දවස් 75ක් වැඩ කරනවා, කොහොමද බලය මාරු කර ගන්නේ කියලා. ඒ ඔක්කෝම homework කරලා දවස් 75කට පස්සේ තමයි ට්‍රම්ප් ඇවිල්ලා, 75වෙනි දවසේ දිවුරුම් දුන්නේ. දැන් මේ සභාවට ඇවිල්ලා කියනවා, අනුර දිසානායකට ඉගෙන ගන්න ලු, ට්‍රම්ප්ගෙන්! ඔයගොල්ලන් ට්‍රම්ප් කරේ තියා ගත්තාට අපට ප්‍රශ්නයක් නැහැ. ට්‍රම්ප් දවස් 75ට කරපු වැඩවලට වඩා අනුර දිසානායක දවස් 63ට කරලා තිබෙනවා.

අනෙක් එක, ට්‍රම්ප් මැතිතුමා මොකක්ද කළේ පළමුවෙනි පෑන් පහරින්? World Health Organization එකෙන් අයින් වුණු

[ගරු බිමල් රත්නායක මහතා]

එක; Climate Change පිළිබඳ Paris Agreement එකෙන් අයින් වුණු එක. සමගි ජන බලවේගයේ මන්ත්‍රීතුමන්ලා මේ සභාවේ කිව්වා පරිසරය රකින එක හොඳයි කියලා. ඒ අස්සේ කියනවා ට්‍රම්ප් ජනාධිපතිතුමා පළමුවෙනි පැන් පහරින් කරපු එකත් හරි කියලා. එතුමා කළේ මොකක්ද? ලෝකයේ උණුසුම වළක්වන්න හදපු ජාත්‍යන්තර සම්මුතියක් තමයි Paris Agreement එක. එතුමා ඒකෙන් අයින් වුණා. ලෝක සෞඛ්‍ය සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක්ද? ට්‍රම්ප් ජනාධිපතිතුමා මේ සභාවේ නැහැ. මට එතුමාත් එක්ක ප්‍රශ්නයකුත් නැහැ. මම මේක අහන්නේ සමගි ජන බලවේගයේ ලොක්කන්ගෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ට්‍රම්ප් ජනාධිපතිතුමා transitional period එකක් ගිහින් තමයි 75 දවසකට පස්සේ වැඩ බාර ගත්තේ. අපි කැබිනට් එක හරියට පිහිටුවලා දවස් 63යි. ඒක අගය කරන්න පුරුදු වෙන්න. ඒක අගය කරන්න නිහතමානි වෙන්න. ඒකට ලජ්ජා වෙන්න එපා. අනුර දිසානායක, හරිනි අමරසූරිය, නලින්ද ජයතිස්ස කියන්නේ ලංකාවේ මිනිස්සු මිස by-products නොවෙයි. ඒ අය genuine politics කරලා මේක ඇතුළෙන් නිර්මාණය වූ මේ ලංකාවේ සාමාන්‍ය මිනිසුන්ගේ ළමයි. ඒක අගය නොකර ඇයි මේ සභාවට ඇවිල්ලා ට්‍රම්ප්ට කඩේ යන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවින්ද හේෂාන් ජයවර්ධන මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. අපි road safetyවලට ඉතා බර තියලා තිබෙනවා. ළඟදී World Bank team එකක් ආවා. අපි එතුමන්ලාට road safety ගැන කිව්වා. මේ, මම ගැන කරන boasting එකක් නොවෙයි. මට ඒ වාගේ කිසිම අදහසක් නැහැ. මා අමතක කරලා මේ කරුණු කිව්වත් කමක් නැහැ. මොකද, මම කරන්නේ මගේ පෞද්ගලික දෙයක් නොවෙයි. ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අපි ක්‍රියාත්මක කරන්නේ. අපි World Bank team එකත් එක්ක road safety ගැන කථා කළාම, ඔවුන් කිව්වා කාලයකට පස්සේ එතුමන්ලාගේ මුළු region එකෙන්ම road safety ගැන කථා කරන ප්‍රවාහන අමාත්‍යාංශයක් හම්බ වුණා කියලා! ඒක මගේ පක්ෂයේ සංකල්පයක් මිස මගේ පෞද්ගලික දෙයක් නොවෙයි. අපි road safetyවලට මහන්සි වෙනවා. අපි දැනටමත් RDA එක දැනුවත් කරලා තිබෙනවා; අනතුරුදායක ස්ථාන හඳුනාගෙන තිබෙනවා. ඒ ගොල්ලන් නම් කියන්නේ ඒවාට කියන්නේ blackspots කියලා. නමුත් එතැන blackspot කථාවක් නැහැ. එවැනි අනතුරුදායක ස්ථාන හතක් හැර, -බිලියන ගණන් වියදම් වෙන පාලම් ටිකක් තිබෙනවා, වංගු ටිකක් තිබෙනවා- අනෙක් සියල්ලම විසඳන්න තීන්දු කරලා, දැන් වැඩ පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම මට මතක විධියට මේ 30වෙනි දා ලංකාවේ private sector එකේ ඉහළම අය කැඳවලා තිබෙනවා, road safetyවලට private sector එක සම්බන්ධ කර ගන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අපට දුකයි අපේ වැරැද්දකින් අනතුරක් වුණොත්. ගන්දරදී බස් අනතුර වුණාම මම ඉස්සෙල්ලාම NTC Chairman, Dr. Dileepa Witharanaට කථා කරලා කිව්වා - එතුමා transport expert කෙනෙක් - එතැනට team එකක් යවන්න කියලා. එතුමා ඒ team එක යවලා report එක අරගෙන ඇවිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවංකවම මම හැම දාම උදේට කරන දෙයක් තිබෙනවා. වෙන කිසි දෙයක් කරන්න කලින් මම බලන්නේ මොකක්ද? Accident එකක් වෙලා තිබෙනවාද, ඒකට ප්‍රවාහන අමාත්‍යාංශයේ වැරැද්දක් තිබෙනවාද කියන එක. මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා මේ සභාවේ ඉන්නවා නම් එතුමා දන්නවා, දික්ඔය බස් එක පෙරළුණාම මම එතුමාට කථා කළා, ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමියට කථා කළා. ඒ සියලුදෙනාම යැව්වා hospital එකට. අපි පොලීසියෙන් ඇහුවා මොනවා හරි වැරැද්දක් තිබෙනවාද කියලා අපෙන් වෙච්ච. ඒක තමයි Clean Sri Lanka කියන්නේ; having integrity, being true to your word.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක lifestyle එකක්. මේ ඇමතිකම් මොනවාද අපට? මේ ඇමති කටු නේ! මේවා ජනතාව දීලා තිබෙන වගකීම්. මේවා වගකීම්. මේවාට ගොනාට අඳින්න? අපේ ජීවිත කැප කරන්න ඇමතිකමකට, වාහනයකට, ලොකු මන්දිරයකට, ඩොලර් බිලියනයකට දෙකකට? මම මහා මාර්ග ඇමති; සතියෙන් ලංකාවේ ලොකුම පොහොසතා වෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* සතියෙන් පොහොසත් වෙන්න පුළුවන්. නමුත් අපට එහෙම හිතෙන්නේවත් නැහැ. ඔබතුමන්ලාට හිතා ගන්නත් බැහැ. ඔබතුමන්ලා භය වෙලා තිබෙන්නේ ඒකයි. ඒකයි හනීෆ් යූසුෆ් මැතිතුමා වියදම් කළා කිව්වාම ඔබතුමන්ලා කලබල වෙන්නේ. මොකද, ඔබතුමන්ලා ගණන කථා කරන්න නේ දන්නේ. ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ පරිත්‍යාගශීලිව, ස්වේච්ඡාවෙන් වැඩ කරන එක. එහෙම ගත්තොත් ඔබතුමන්ලාගේ ගොඩක් අය politically, socially ඉන්නේ ආලෝක වර්ෂයක් විතර පස්සේ. මේ හැම කෙනාම නොවෙන්න පුළුවන්.

අපි අපේ lifestyle එක විකුණන්නේ නැහැ. අපේ අවංකභාවය, කැපවීම, වචනයට වගවීම, ඒක lifestyle එකක්. ඒ lifestyle එක මේ ඇමති කට්ටකට විකුණන්න, ආණ්ඩු බලයකට විකුණන්න? පිස්සු! එහෙම වෙන්නේ නැහැ. අපි කරන්න හදන්නේ මොකක්ද? අපේ ජනතාව අපිට සහතිකයක් දීලා තිබෙනවා, "ඔබතුමන්ලා ගෙනයන මේ ප්‍රතිපත්තීන්, කණ්ඩායමක් විධියට ඔය ගොල්ලන්ගේ personal and political life එක හොඳයි. ඒ නිසා අපි ඔයගොල්ලන්ට ඡන්දය දෙනවා" කියලා. හරි, දැන් මොකක්ද කරන්න හදන්නේ? අපේ පෞද්ගලික දේවල් මිනිස්සුන්ගේ ඔළුව මත පටවන්න නොවෙයි. මිනිස්සු මේ valuesවලට ආදරය කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 5ක් නොවෙයි, අවුරුදු 10ක් හෝ අවුරුදු 15ක් වැඩ කරලා මේක new normal කරන්න අපි උත්සාහ කරනවා. දැන් අපි ඉන්න වළේ ඉඳලා culturally ඉස්සරහට යන, මිනිස්සු ගැන හිතන, ජාතිවාදය නැති හොඳ සමාජයක් හදන්න ඕනෑ.

කාන්තාවෝ ගැන කිව්වා. මම දන්නේ නැහැ කාවින්ද මන්ත්‍රීතුමා ළඟකදී බස් එකක ගිහිල්ලා තිබෙනවාද කියලා. නමුත්, බස් එකක ගියේ නැති වුණත් එතුමාගේ ප්‍රශ්නය හොඳයි. එවැනි ප්‍රවාහන සේවයක් හදන්න, එවැනි සමාජයක් හදන්න තමයි අපි මහන්සි වෙන්නේ. අපේ Hon. (Dr.) Sathiyalingam මැතිතුමා කිව්වා, දෙමළ භාෂාවෙන් Clean Sri Lanka වැඩසටහන නැහැ කියලා. මම පෙන්නුවා, website එකේ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම Clean Sri Lanka වැඩසටහනේ දෙමළ භාෂාවෙන් තිබෙන PowerPoint presentation එකේ දෘඪ පිටපතක් ගෙනාවා. මම Clean Sri Lanka වැඩසටහන ගැන දෙමළ භාෂාවෙන් තිබෙන ඒ PowerPoint presentation එකේ දෘඪ පිටපත **සභාගත*** කරනවා.

මෙහි පිටපතක් සත්‍යලිංගම් මැතිතුමාට යවන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. නමුත්, අපි දන්නවා සමහර ස්ථානවල දෙමළ භාෂාවෙන් තිබෙන්න ඕනෑ තැන්වල නැති බව. කොළඹ ප්‍රධාන පෙළේ පෞද්ගලික රෝහල්වලත් Dutchවලින් තිබෙනවා, Spanishවලින් තිබෙනවා, Chineseවලින් තිබෙනවා. නමුත්, දෙමළ භාෂාවෙන් නැහැ. Roomsවලට ගිහිල්ලා බලන්න!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ කිව්වා අපේ ගරු අග්‍රාමාත්‍යතුමිය Clean Sri Lanka ගැන කථා කළේ නැහැ මනෝ ගනේසන් මැතිතුමා සමඟ එල්ලුණා කියලා. මේ මගේ අතේ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තිබෙන්නේ 2025 ජනවාරි 8වන දා හැන්සාඩ් වාර්තාව. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා Clean Sri Lanka ව්‍යාපෘතිය ගැන ගරු අගමැතිතුමියගෙන් එදින ප්‍රශ්නයක් ඇහුවා. ඒ, අහන්නේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම අහන්නේ අපට දැන ගන්න විතරක් නොවෙයි. රටේ ජනතාවටත් දැන ගන්න අවස්ථාව සලසන්නයි. 2025.01.08වන දින හැන්සාඩ් වාර්තාවෙන් උපුටා ගන්නා ලද තීරු අංක 174 සිට 180 දක්වා ඒ පිළිබඳව සඳහන් කොටස මම මේ අවස්ථාවේ දී **සභාගත*** කරනවා.

ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා ඇතුළු හැන්සාඩ් වාර්තාව නොකියවපු අනෙක් අයට මෙය කියවා ගන්න පුළුවන්. එදා ගරු අගමැතිතුමිය ඉතා පැහැදිලි පිළිතුරක් දුන්නා. ඉතින් හැම දාම එකම දේ කියන්න බැහැ නේ. තමන්ටත් වගකීමක් තිබෙනවා නේ, පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉගෙන ගන්න. ඉතින්, මේ තිබෙන්නේ 2025 ජනවාරි 8නක දා හැන්සාඩ් වාර්තාව. අපි Clean Sri Lanka වැඩසටහන launch කළේ ජනවාරි පළමුවෙනිදා. ජනවාරි 8වැනි දා පැහැදිලි පිළිතුරක් දීලා තිබෙනවා. ඒ වාගේම මෙහි සංවිධාන ව්‍යුහය ගැනත් අපි ඉතා පැහැදිලිව කියලා තිබෙනවා. අපි පිළිගන්නවා. අපි තවම මේ මාසයේ මේ වැඩසටහන ගැන දැනුවත් කරන අවධියකයි ඉන්නේ කියලා. ඒ නිසා ක්‍රියාකරකම් පිළිබඳව ගොඩාක් අත්දැකීම් අපේ මන්ත්‍රීතුමියලාට, මන්ත්‍රීතුමන්ලාට නැහැ. ඒගොල්ලන් දැන් මේ ගැන සංවිධානය කරනවා; පොත්වල අඳිනවා; views එකතු කරනවා; private sector එකත් එක්ක කථා කරනවා; රජයේ දෙපාර්තමේන්තුවලට ගිහිල්ලා Clean Sri Lanka වැඩසටහනට අදාළ දේවල් plan කරනවා. ඒ නිසා කියන්න තරම් තොරතුරු ගොඩාක් නැහැ. හැබැයි, ඔබතුමා බලන්න. පෙබරවාරි පළමුවෙනි දා ඉඳලා මුළු රටේම Clean Sri Lanka වැඩසටහන Twenty20 match එකක් වාගේ පටන් ගන්නවා. Exhibition එකක් වෙනවා, බලන්න.

අපි විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත් ආරාධනා කරනවා, ඔබතුමන්ලාගේ ආසනවල එම කටයුත්ත කරද්දී. ඔබතුමන්ලා ජනතා ඡන්දයෙන් පත් වෙච්ච අය. විපක්ෂය කියලා කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ගරු කරනවා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ආසනයේ - ගාල්ලේ- වැඩ කටයුතු කරගන්න එන්න, කිසි ප්‍රශ්නයක් නැහැ. ඒවායේ දේශපාලනය නැහැ. ඒවායේ මොකක්ද තිබෙන්නේ? ගම දක්වාම කටයුතු කිරීමයි තිබෙන්නේ. ගමේ මිනිස්සුන්ගේ බලය. ගමේ මිනිස්සු තමයි තීන්දු කරන්නේ. එහෙම නැතිව කොළඹ ඉඳගෙන කවුරුත් කියන්නේ නැහැ, මේ station එක මෙහෙම හදන්න, මේ bus stand එක මෙහෙම හදන්න කියලා. ජනතාව සම්බන්ධ කරගෙන ඒ කටයුත්ත පටන් ගන්නේ, සමහර විට ශ්‍රමදානයකින් වෙන්න පුළුවන්. අපිට සමහර දේවල් වැඩ කරද්දි තමයි ඉගෙන ගන්න පුළුවන් වෙන්නේ. Clean Sri Lanka කියලා හදපු පොතක් නැහැ; වෙනම අච්චු පොතක් නැහැ. පැහැදිලි ක්‍රියාමාර්ග ප්‍රමාණයක් තිබෙනවා. ගැසට් කරලා තිබෙනවා. මේක මොකක් හෝ thesis එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ආවර්තිතා වගුව වාගෙයි. Mendeleeveගේ ආවර්තිතා වගුව හදද්දී මොකක්ද කළේ? එයා හොයා ගත්ත තැන් ටික හරියට place කළා. හොයා ගත්ත නැති ඒවාට එතුමා හිස්තැන් තැබුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මහාචාර්යවරයෙක් වශයෙන් ඒ ගැන දන්නවා ඇති, හිස්තැන් තියපු එකෙන් තමයි ගොඩ ගියේ. ඒ නිසා අලුත් එකක් ලැබුණාම, "ආ මේක අලුත් එකක්" කියලා ඒ අලුත් එක තමන් දන්න එකට ඔබන්න ගියේ නැහැ. ඒ අලුත් එක ආවර්තිතා වගුවේ හිස්තැන තැබුවා. Clean Sri Lanka කියන්නේ එහෙම එකක්. Perfect නැහැ. දැන් මේක අරගෙන voice-cut එකක් දාන්න පුළුවන් වෙයි "perfect නැහැ" කිව්වා කියලා. මිනිස්සු කරන කිසි දෙයක් සියයට සියයක් perfect නැහැ! Clean Sri Lanka කිව්වාම, එයට කර්තෘවරයෙක් නැහැ. මෙය මහජන ව්‍යාපාරයක ප්‍රතිඵලයක්. ඒක පුරවන්නේ, perfect කරන්නේ මිනිස්සු. සමහරු බලාපොරොත්තු වෙනවා, "අ" යන්නේ ඉඳලා, - A to Z - ඔක්කෝම ලියලා කරයි කියලා. එහෙම තමයි හිතන විධිය. එහෙම නැහැ; it evolves.

ඒ වාගේම තමයි දේශපාලන සදාචාරය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි Clean Sri Lanka පටන් ගත්තේ දේශපාලන සදාචාරයෙන්. සුද්ධ කළා. කාවින්ද ජයවර්ධන මැතිතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. මුළු coastal belt එකම සුද්ධ වෙලා එතුමා යන්තම් බේරිලා ඉන්නවා. ඒ දේශපාලන සදාචාරය. අපි අද ගරු කථානායකතුමාට දැන්වූවා, - මේ පාර්ලිමේන්තුව සදාචාර සම්පන්න කරන්න අපි කවුරුත් වගකීමෙන් වැඩ කරනවා. ඇමතිවරු බංගලා අරගෙන නැහැ; super luxury වාහන අරගෙන නැහැ. ඒවායේ යන්න බැරිකමක් අපට නැහැ. සමහර මන්ත්‍රීවරු ඉන්නවා, එතුමන්ලාගේ ගෙවල්වල මර්සිඩීස් රථ දෙක තුන තිබෙනවා. ඒවායේ යන්න අපට බැරිකමක් නැහැ. එහෙම අමුතු රෝගයක් අපට නැහැ. නමුත් මහජන මුදලින් ඒවායේ යන්නේ නැහැ, අපි දුප්පත් නිසා; ඔබතුමන්ලා අපව දුප්පත් කළ නිසා. ලංකාව පොහොසත් වුණාම, මහජන මන්ත්‍රීවරු ඊට වඩා හොඳ වාහනවල -නාස්තිකාර වාහන නොවෙයි- ගියාට අපට ප්‍රශ්නයකුත් නැහැ.

මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් අහෝසි කරනවාය කියලා අපි කිව්වා. ඒ සඳහා අදාළ පනත් කෙටුම්පත එනවා. අනිවාර්යයෙන් එය අහෝසි කරනවා. මහජන සේවයට පෙන්ෂන් ඕනෑ නැහැ. මැරෙනකොට මිනිසුන්ට වැඩ කළාය කියන හැඟීම තිබුණාම මදිද, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා? ඇති. ඒක තමයි මම කියන්නේ. ඒකයි මම ඔබතුමාට කිව්වේ. මම වෙන අයට ඇඟිල්ල දිගු කරලා ඒක අහන්නේ නැහැ. ඔබතුමා ඉස්සරහ ඉන්න නිසාම නොවෙයි මම ඔබතුමාගෙන් ඇහුවේ.

අපි අද ගරු කථානායකතුමාට දැන්වූවා, පාර්ලිමේන්තුවේ කෑම ගැන. එක මන්ත්‍රීවරයෙක් කිව්වා මම දැක්කා, අපේ මන්ත්‍රීවරු ඇවිල්ලා උදේටත් කාලා, දවල්ටත් කාලා, රෑටත් කාලා, ඔතාගෙනත් යනවාය කියලා. මම ලජ්ජා වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආර්ථික මට්ටම් උස් පහත් වෙන්න පුළුවන්. හැබැයි අපේ values පොඩ්ඩක්වත් දුප්පත් නැහැ. අපි එහෙම අය නොවෙයි. ඒ වාගේ තුට්ටු දෙකේ - මම ඒ මන්ත්‍රීතුමා දන්නවා. එතුමා eliteද? එතුමා born eliteද? මට ඒක කියන්න පුළුවන්, මම එතුමාත් එක්ක එක දිස්ත්‍රික්කයේ ඉඳලා තිබෙනවා. හැබැයි මේ පාර්ලිමේන්තුවට මම 2000දී එනකොට මට මතක විධියට කෑම එකක් රුපියල් 15ට තිබුණේ. උදේ කෑම එක රුපියල් 6යි. දවල් කෑම එක රුපියල් 15යි. ඒ වෙලාවේ අපි - ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු දසදෙනා - තමයි තීන්දු කළේ, ඒ කෑම එකේ මිල වැඩි කරන්න කියලා. මේ පාර්ලිමේන්තුව සාක්ෂියි. ඔය රනිල්ලා, චන්ද්‍රිකාලා මේවායේ පැල් බැඳගෙන හිටියා. සල්ලිකාරයෝ කියලා කියන අය, නොමිලේ කන්න තමයි ලැහැස්ති වෙලා හිටියේ. ඒ නිසා අපි ගරු කථානායකතුමාට කියලා තිබෙනවා, මන්ත්‍රීවරුන් සියලුදෙනාගේම උදේ කෑම එක, තේ එක, දවල් කෑම එක - ඔක්කෝම - cost-reflective වෙන්න ඕනෑ. එය රුපියල් 3,000ද, ප්‍රශ්නයක් නැහැ, ගෙවලා කන්න. ඒ කොන්ද තිබුණේ නැහැ, රනිල් වික්‍රමසිංහට. ඔය elite කියලා හිතාගෙන ඉන්න අලුත් eliteලාට, හොර eliteලාට තිබුණේ නැහැ. මම හිතන විධියට ගෘහ්‍ය කාරක සභාව හෙට රැස් වෙනවා. හෙට ඒ යෝජනාව අනුමත කරලා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු අගමැතිතුමිය, නැත්නම් පාර්ලිමේන්තු

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

කටයුතු භාර ඇමතිතුමා ඊළඟ දවසේ කැබිනට් මණ්ඩලයට එය ඉදිරිපත් කරනවා. ඊට පස්සෙ රුපියල් 3,000 හෝ 2,500 හෝ කියන ගණනට කනවා. එහෙම කරලා බලමු. හොඳයි නේ. එහෙම තමයි. ඔබතුමන්ලාට කෝ ඒ කොන්ද ? ඒක කළේ නැහැ නේ. ඊට පස්සේ අපි බලමු, කොහොමද ඒක ඊළඟ තලවලට ගෙන යන්නේ කියලා. ඉතින් ඒ නිසා අපි දේශපාලන සදාචාරයෙන් පටන් අරගෙන තිබෙනවා.

ඒ වාගේම අපි කියන දේ කරන්න උත්සාහ කරමින් ඉන්නවා. අපෙන් වෙච්ච පොඩි පොඩි technical faults ටිකක් තිබෙනවා. දැන් බලන්න, ජනතා ඡන්දයෙන් පත්වෙලා ආපු මේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා දිහා. කොච්චර වැදගත් දෙයක්ද, ජනතා ඡන්දයෙන් පත්වෙනවා කියන්නේ? මම නම් ඡන්දයෙන් පත්වෙලා එන ඕනෑ මිනිහෙකුට ගරු කරනවා, truly respect කරනවා. 2004දී මම නියෝජ්‍ය ඇමතිවරයෙකු වශයෙන් සිටියදී මගේ කාර්යාලයේ වෙනම ෆයිල් එකක් තිබුණා, මහජන නියෝජිතයන් සඳහා. මම එතුමන්ලාට truly respect කරනවා. හැබැයි ඔබතුමන්ලා මොනවාද කථා කළේ? ත්‍රී වීල්වල කැලි ගලවන ඒවා ගැන. මොනවාද මේ? අපි පුන පුනා කිව්වා, ඒක අපි කරපු දෙයක් නොවෙයි කියලා. මම ඒකයි කියන්නේ, third-class attack එකක් තමයි අපට ආවේ. එකම දේ කියනවා. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියන්න කැමැතියි, එහෙම එකක් නැහැ කියලා. Clean Sri Lanka කියන්නේ lifestyle එකක්. ඒ lifestyle එක එක්කෙනෙකුගේ lifestyle එකක් නොවෙයි. සමාජයම එකතු කරගෙන, ජනතාවගේ කැමැත්ත තිබෙන, versatile, qualitatively, උඩින් තියෙන lifestyle එකක් හදන්න අපි try කරනවා. ඒ උත්සාහය තේරෙන්නේ නැතුව නොවෙයි නේ, තේරෙනවා නේ. තේරෙද්දී තමයි මෙහෙම කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට බණ කියන අය ගැනත් අවසාන වශයෙන් වචනයක් කිව්වේ නැත්නම් හොඳ නැහැ.

විදුලි බිල සම්බන්ධයෙන් දැන් ගරු ඇමතිතුමාට විවේචන ඉදිරිපත් කළා. එතුමා පැහැදිලිව කියලා තිබෙනවා, ඒක වැරැදියි කියලා. ඒ සම්බන්ධයෙන් එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කළා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ වරප්‍රසාද ප්‍රශ්නයට පිළිතුරක් ලැබෙයි කියලා. දැන් වෙන්නේ මොකක්ද? ජනක රත්නායක මහතා විදුලි බිල අඩු කරන්න කිව්වාට පස්සේ මෙතැනදී එතුමාව හම ගහලා, දණ ගස්වලා තනතුරෙන් අස් කළා. කවුද එහෙම කළේ? විදුලි බිල අඩු කරන්න කිව්වාට පස්සේ ජනක රත්නායකව මෙතැනදී ඡන්දයෙන් ගෙදර යවපු අය කවුද? චමල් රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ, ජීවන් තොණ්ඩමන්, කංචන විජේසේකර. මේ තිබෙන්නේ ඒ හැන්සාඩ් වාර්තාව. ඒ වාගේම කාදර් මස්තාන්, චාමර සම්පත් දසනායක, රෝහිත අබේගුණවර්ධන, නාමල් රාජපක්ෂ. ඒගොල්ලන් එහෙමයි කියන එක අපි ඔබතුමන්ලාට කියන්න කැමැතියි.

තව පිරිසක් සම්බන්ධ වුණු කාරණයක් තිබෙනවා. මා ළඟ තිබෙනවා, Bond Scam එක සම්බන්ධ විවාදය දවසේ හැන්සාඩ් වාර්තාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, footnote කල්ලිය කියලා පිරිසක් මහ බැංකු වංචාවේ - Bond Scam එකේ - සිටි බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමනි, කාලය අවසන් වෙලා තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම තව තත්පර 30කින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Footnote කල්ලියක් සිටියා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාව නැඟිට්ටවලා එතැනින් යැව්වා. රනිල් රකින්න තමන්ගේ දැනුම පාවිච්චි කළා, හර්ෂ ද සිල්වා. මම ඒක වගකීමෙන් කියනවා. මම මේ ගැන හැමදාම කියලා තිබෙනවා. Footnote කල්ලිය කවුද? රවීන්ද්‍ර සමරවීර, සුජීව සේනසිංහ, වසන්ත අලුවිහාරේ, ආචාර්ය හර්ෂ ද සිල්වා, අජිත් පී. පෙරේරා, අශෝක් අබේසිංහ, අබ්දුල්ලා මහරූෆ්, හෙක්ටර් අප්පුහාමි සහ හර්ෂණ රාජකරුණා. මේ තමයි, 2015දී රුපියල් බිලියන 1,048ක හොරකම රැකපු, රනිල් රැකපු අය. ඉතින්, මේක clean කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි කියන්නේ, මේ පාරෙන් එන්න, සදාචාර සම්පන්න quality පාරෙන් එන්න කියලායි. නිකම් චූටි චූටි කැලි අල්ලාගෙන, ස්ටිකර් කැලි, අරවා මේවා අල්ලාගෙන ඉන්න එපා. රාජපක්ෂ එක්කත් හිටගන්නවා, රනිල් එක්කත් හිටගන්නවා, ඊට පස්සේ පෙන්වන්න හදනවා, කවුද මිනිස්සු එක්ක ඉන්නේ කියලා. ඒ අයට sorryම තමයි. ඔවුන්ට සදහටම ඔතැන ඉන්න වෙනවා කියන එක මතක් කරමින්, අපි Clean Sri Lanka වැඩසටහන කරනවා කියන එකත් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට අවශ්‍ය නම් නැවතත් මාර්තු මාසයේදී මේ ගැන දවස් දෙකක් debate කරන්න අපි අවස්ථාව දෙනවා. විවේචන ඉදිරිපත් කරන්න, ඒවා අපට අවශ්‍යයි. රාහුල කුමාරයා කිව්වා වාගේ අඩු පාඩු දැනගන්න අවශ්‍යයි. හැබැයි, නිකම් සිල්ලර ඇටැක්වලට නම් එන්න එපා කියන ඉල්ලීමත් කරමින් මා නිහඬ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ජනවාරි 23වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே, மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், 2025 சனவரி 23, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.., The HON PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Thursday, 23rd January, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.